මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය - 2019

සහ

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව

V වන කොටස

පර්යේෂණ අංශය
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
ආරක්ෂක අමාත්‍යාංශය
383, කෝට්ටේ පාර, රාජගිරිය

දුරකථන : 0112 868794 - 6 ෆැක්ස් : 0112 868791 - 2
ක්ෂණික ඇමතුම : 1927 (පැය 24 පුරා)
වෙබ් : www.nddcb.gov.lk
ඊමේල් : mail@nddcb.gov.lk
ෆේස්බුක් : nddcb.lk

මුද්‍රණය : 2020
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
ආරක්ෂක අමාත්‍යාංශය
383, කෝට්ටේ පාර,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

ISBN 978-955-9137-45-0

සම්පාදනය :- **භද්‍රානි සේනානායක**
නිලූක්ෂි තිසේරා

සෝදුපත් බැලීම :- **තුෂාරි වලස්මුල්ලගේ**
භාග්‍යා හේරත්
හංසිකා කේතුමාලි

මුද්‍රණය
EPA මුද්‍රණාලය

පෙරවදන

"ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව" නමැති මෙම ග්‍රන්ථය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය විසින් සිදු කරන ලද පර්යේෂණ හා සමීක්ෂණ වාර්තා කිහිපයක එකතුවකි.

මෙම ග්‍රන්ථයේ ප්‍රථමයෙන්ම ඉදිරිපත් කර ඇත්තේ 2019 වර්ෂයේදී සිදු කරන ලද **මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණයේ** අනාවරණයන් ය. එහිදී ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජන සංඛ්‍යාව භූගෝලීය ප්‍රදේශ මට්ටමින් ඇස්තමේන්තු ගත කිරීම සහ ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හඳුනා ගැනීම, ස්ත්‍රී පුරුෂභාවය සහ වයස වැනි ප්‍රජා විද්‍යාත්මක නිර්ණායක අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සංසන්දනාත්මකව මිණුම් කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත රටා සහ ප්‍රවණතා අනුව මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය සංඛ්‍යාත්මකව ඇස්තමේන්තු ගත කිරීම මෙම සමීක්ෂණය තුළින් සිදුකර ඇත.

මෙම ග්‍රන්ථයේ දෙවනුව ඉදිරිපත් කර ඇත්තේ **පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා හා එහි උපනතීන්** පිළිබඳ සමීක්ෂණයේ අනාවරණයන් ය. ඒ අනුව පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය පිළිබඳ අනාවරණ, දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය, මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක, සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකරන්නේ නම් එය භාවිත නොකිරීමට හේතු, මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන් තුළ පැවති දැනුම හා ආකල්ප යනාදී කරුණු රැසක් මෙම සමීක්ෂණය තුළින් හෙළි වී ඇත.

එමෙන්ම 2017 වර්ෂයේ **කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදයන්වල මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය** මෙහි තෙවන සමීක්ෂණ අනාවරණයයි. එහිදී ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා රාත්‍රී සමාජශාලාවල භාවිත වන මත්ද්‍රව්‍ය (Club drugs) භාවිතයේ ස්වභාවය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා හඳුනා ගැනීම, රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ උපසංස්කෘතික සාධක සහ පුද්ගල චර්යාවන්වල ස්වභාවය අධ්‍යයනය කිරීම, රාත්‍රී සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ (Socio – demographic profile) නිර්ණය කර ගැනීම, ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා සමාජශාලාවල භාවිත වන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවත්නා විවිධ මිත්‍යා මත හඳුනා ගැනීම, ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හා සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා නිවාරණය උදෙසා සුදුසු උපායමාර්ග සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ මෙම සමීක්ෂණය තුළින් ඉදිරිපත් කරනු ලබයි.

අනතුරුව, **ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධ කාලීන ප්‍රවණතා හඳුනා ගැනීම පිළිබඳ අධ්‍යයනය** ඉදිරිපත් කර ඇත. එහි නීත්‍යනුකූල නොවන සහ අයථා ක්‍රම වලට අබිං පරිභෝජනයක් සිදුවන්නේද? යන්න සොයා බැලීම, ලංකාවේ දැනට අබිං භාවිත කරනු ලබන්නේ නම් එම පුද්ගලයන්ගේ භාවිත රටාවන් හා කාලීන ප්‍රවණතා හඳුනා ගැනීම, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අබිං යොදා ගැනීම ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධව විධිමත් වැඩපිළිවෙළක් සැකසීම සඳහා අවශ්‍ය පූර්ව නිර්දේශයන් මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කර ඇත.

මීට අමතරව මෙම ග්‍රන්ථයේ, **මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ප්‍රවණතා සහ රටා පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනය** තුළ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස දිස්ත්‍රික්ක 10 ක් තෝරා ගත් අතර එම දිස්ත්‍රික්කවල ජීවත්වන පුද්ගලයින්ගෙන් මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින් 1000 ක නියැදියක් අධ්‍යයනයට ලක් කර ගත් අනාවරණ මෙහිදී ඇතුළත් කර ඇත.

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා හඳුනා ගැනීම සඳහා **කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය** තුළින් ලබා ගත් අනාවරණ ද මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කරනු ලබයි.

ඉහතින් දක්වන ලද පර්යේෂණ හා සමීක්ෂණවල සංකලනයෙන් යුත් මෙම ග්‍රන්ථය මඟින් මත්ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සහ බාහිර සේවා වැඩසටහන් සැලසුම් කිරීමටත්, ඊට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමටත්, මෙම ග්‍රන්ථය අදාළ ක්ෂේත්‍රයේ නියැළි රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ට පදනමක් හා මූලාශ්‍රයක් වනු ඇතැයි විශ්වාස කරමි.

විශේෂඥ වෛද්‍ය ලක්නාත් වෙලගෙදර
සභාපති

අපගේ ප්‍රණාමය

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වත්මන් සභාපති විශේෂඥ වෛද්‍ය ලක්නාත් වෙලගෙදර මහතාට,

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හිටපු සභාපති සමන් අබේසිංහ මහතාට,

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) ආලෝක බණ්ඩාර මහතාට,

- මණ්ඩලයේ අධ්‍යක්ෂ (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) ටී. ඩබ්. ප්‍රේමසිරි මහතා හා ප්‍රතිකාර මධ්‍යස්ථානවල කළමනාකාරවරු ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට,

- මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (නිවාරක අධ්‍යාපන හා පුහුණු) ප්‍රදීප් කොහොලානේගෙදර මහතා ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට,

- මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක පර්යේෂණ) පබසරා වීරසිංහ මහත්මිය ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට,

- මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (බාහිර සේවා) ඩබ්. මාරසිංහ මහතා ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට,

- මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) වජිරා ඇලන් කුමාරි මහත්මිය ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට,

- මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරිනී ශකිලා වැරණියගොඩ සහ අභ්‍යන්තර විගණක මධුෂානි ගමගේ යන මහත්මීන්ට,

- මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) සජානි කලුබෝවිල මහත්මිය ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට,

- මණ්ඩලයේ සහකාර නීති නිලධාරිනී සඳුනි හපුආරච්චි මහත්මියට,

- වාර්තාව සකස් කිරීමෙහිලා සහාය වූ පර්යේෂණ අංශයේ සියලුම කාර්යය මණ්ඩලයට සහ සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරිනී දිල්හාරා වරාගොඩ මහත්මියට,

- සමීක්ෂණයට සහභාගී වූ සියලුම දත්තදායකයින්ට,

භද්‍රානි සේනානායක
අධ්‍යක්ෂ - පර්යේෂණ

පටුන

පිටු අංක

1. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය 1

සාරාංශය 2

1. හැඳින්වීම 6

1.1 අධ්‍යයන පසුබිම 6

1.2 අධ්‍යයනයේ අරමුණු 7

1.3 අධ්‍යයන ක්‍රමවේදය 7

1.4 දත්ත සකස් කිරීම සහ විශ්ලේෂණය 9

1.5 උපයෝගීතාව 10

1.6 ආචාරධර්ම ආරක්ෂා කිරීම පිළිබඳ අවධානය 10

1.7 තාක්ෂණික සීමා 10

2. ප්‍රතිඵල 11

2.1 ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය 11

2.2 ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය (ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 14 ට වැඩි සමස්ත ජනගහනයට ප්‍රතිශතයක් වශයෙන්) 13

2.3 ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය - සමස්ත ජනගහනයෙන් මිලියනයකට (1,000,000) 14

2.4 වයස් මට්ටම් සහ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂභාවය අනුව ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය 14

2.5 භාවිත කරන රටාව අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය 15

2.6 පළාත් මට්ටමින් ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය 15

2.7 දිස්ත්‍රික්ක මට්ටමින් ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය 16

2.8 ප්‍රතිකාර සඳහා යොමුවීමේ ප්‍රවණතාවය 21

2.9 බන්ධනාගාර ගතවීමේ ප්‍රවණතාවය 22

3. නිගමන 22

4. යෝජනා 22

5. ආශ්‍රිත ග්‍රන්ථ 23

2. පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා හා එහි උපනතීන් 25

සාරාංශය 26

1. හැඳින්වීම **28**

1.1 අධ්‍යයන පසුබිම 28

1.2 අධ්‍යයනයේ අරමුණු 30

1.3 අධ්‍යයන ක්‍රමවේදය 30

1.4 දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම 31

1.5 දත්ත විශ්ලේෂණය 32

2. පර්යේෂණ ප්‍රතිඵල **32**

2.1 ප්‍රජා විද්‍යාත්මක තොරතුරු 32

2.2 පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය පිළිබඳ අනාවරණ 36

2.3 දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය 40

2.4 දිස්ත්‍රික්ක අනුව එක් එක් මත්ද්‍රව්‍ය වර්ගවල ප්‍රචලිත බව 53

2.5 මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මකසාධක 57

2.6 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු 74

2.7 මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන් තුළ පැවති දැනුම හා ආකල්ප 75

3. නිගමන **83**

4. යෝජනා **84**

5. ආශ්‍රිත ග්‍රන්ථ **85**

3. කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදයන්වල මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය **86**

1. හැඳින්වීම **87**

1.1 අධ්‍යයන පසුබිම 87

1.2 පර්යේෂණ ගැටලුව 88

1.3 පර්යේෂණ අරමුණු 88

1.4 පර්යේෂණ ප්‍රශ්න 88

1.5 පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව 88

1.6 පර්යේෂණ ක්‍රමවේදය 89

1.7 අධ්‍යයන ක්ෂේත්‍රය 89

1.8 අධ්‍යයන නියැදිය 90

1.9 දත්ත රැස්කිරීම 90

1.10 දත්ත විශ්ලේෂණය 91

2. රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා කාලීන ප්‍රවණතා (දේශීය හා ගෝලීය සන්දර්භය ඇසුරින්) 92

2.1 සමාජශාලා මත්ද්‍රව්‍ය (club drugs/ party drugs/ dance drugs) පිළිබඳ පාරිභාෂිතය 92

2.2 ගෝලීය සන්දර්භය තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය 93

2.3 ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතාවය 94

2.4 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ ලක්ෂණ හා චර්යාත්මක ස්වභාවය 94

2.5 සමාජශාලා මත්ද්‍රව්‍ය (Club drugs) භාවිතයට යොමුවීමේ බලපෑම් සහගත සාධක 95

2.6 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම 96

3. අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව 97

3.1 ප්‍රතිචාරකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ 97

3.2 රාත්‍රී සමාජශාලා සාදවලට සහභාගී වන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ රටාවන් 100

3.3 රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පුද්ගල චර්යාවේ ස්වාභාවය 108

3.4 මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකරන ආකාරය 111

3.5 මත්ද්‍රව්‍ය භාවිතය : සෞඛ්‍යය හා සමාජ බලපෑම් 114

4. සාකච්ඡාව 115

5. නිගමන 117

6. යෝජනා 118

7. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 118

4. ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධ කාලීන ප්‍රවණතා හඳුනා ගැනීමේ අධ්‍යයනය 120

1. හැඳින්වීම 121

1.1 පර්යේෂණ ගැටලුව 123

1.2 පර්යේෂණ අරමුණු 123

1.3 පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රමය 123

1.4 පර්යේෂණ ක්ෂේත්‍රය 124

1.5 නියැදිය තෝරා ගැනීම 124

1.6 දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම 125

1.7 දත්ත විශ්ලේෂණය 125

2. ප්‍රතිඵල 125

2.1 අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ 125

2.2 අධ්‍යයනයට භාජනය කළ පුද්ගලයින්ගේ අබිං භාවිතය පිළිබඳ තත්ත්වය 130

2.3 අබිං භාවිත කරමින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා 134

3. සාකච්ඡාව 137

4. නිගමන 139

5. යෝජනා 139

6. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 140

5. මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතය ආශ්‍රිත ප්‍රවණතා 141

සාරාංශය 142

1. හැඳින්වීම 144

1.1 අධ්‍යයන පසුබිම 144

1.2 පර්යේෂණ ගැටලුව 146

1.3 පර්යේෂණ අරමුණු 146

1.4 පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රමය 146

1.5 පර්යේෂණ ක්ෂේත්‍රය සහ නියැදිය තෝරා ගැනීම 146

1.6 දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම 147

1.7 දත්ත විශ්ලේෂණය කිරීම 147

2. මාදක සහ මනෝවර්තක භාවිතයෙහි ප්‍රවණතා සහ රටා (සංකල්ප නිර්වචනය, දේශීය සහ ගෝලීය අධ්‍යයන ඇසුරෙනි) 147

2.1 සංකල්ප නිර්වචනය 147

2.2 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයෙහි ගෝලීය ප්‍රවණතා සහ සිදු කළ අධ්‍යයන 148

2.3 මාදක සහ මනෝවර්තක දුර්භාවිතයෙහි දේශීය ප්‍රවණතා 149

3. ප්‍රතිඵල හා සාකච්ඡාව 151

3.1 මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සහ සමාජ විද්‍යාත්මක පැතිකඩ 151

3.2 දත්තදායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත ඉතිහාසය 157

3.3 එක් එක් මාදක මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය ආරම්භ කළ වයස 161

3.4 ප්‍රථම වතාවට භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග 161

3.5 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ප්‍රථම භාවිතය 162

3.6 ඖෂධ වර්ග භාවිත කිරීමේ ප්‍රථම අත්දැකීම 164

3.7 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමට බලපා ඇති හේතු සාධක 165

3.8 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයේ වර්තමාන තත්ත්වය 166

3.9 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගන්නා ආකාරය 172

3.10 මාදක සහ මනෝවර්තක ඖෂධ මිලදී ගැනීමේ ස්වභාවය 173

3.11 නීත්‍යනුකූල නොවන ආකාරයෙන් මිලදී ගැනීමේ සංයුතිය 174

3.12 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමේ සුලභතාව 174

3.13 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතය සහ සෞඛ්‍ය ගැටලු 177

3.14 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය නතර කිරීම ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමුවීම 178

4. නිගමන හා යෝජනා **179**

4.1 නිගමන 179

4.2 යෝජනා 180

5. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය **181**

6. කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය **182**

සංක්ෂිප්තය **183**

1. හැඳින්වීම **185**

1.1 අධ්‍යයන පසුබිම 185

1.2 පර්යේෂණ ගැටලුව 186

1.3 පර්යේෂණ අරමුණු 186

1.4 පර්යේෂණ ප්‍රශ්න 187

1.5 පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව 187

1.6 පර්යේෂණ ක්‍රමවේදය 188

1.7 අධ්‍යයන ක්ෂේත්‍රය 188

1.8 අධ්‍යයන නියැදිය 188

1.9 දත්ත රැස්කිරීම 189

1.10 දත්ත විශ්ලේෂණය 189

2. අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව **189**

2.1 දත්තදායකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ 190

2.2 ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන් 197

2.3 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම 198

2.4 කම්කරුවන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය 198

2.5 ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක 199

2.6 ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව 200

2.7 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම 200

2.8 කම්කරුවන් විසින් පසුගිය වසර තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය 201

2.9 කම්කරුවන් විසින් පසුගිය තෙමස තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය 202

2.10 කම්කරුවන් විසින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග 203

2.11 කම්කරුවන්ගේ සිගරැට්/දුම්වැටි සහ මද්‍යසාර ආශ්‍රිත ප්‍රවණතා 204

2.12 කම්කරුවන්ගේ ගංජා භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ රටා 204

2.13 කම්කරුවන්ගේ හෙරොයින් භාවිත ප්‍රවණතා සහ රටා 207

2.14 කම්කරුවන් අතර ඖෂධ (පෙති වර්ග/ සිරප් වර්ග) අවභාවිතය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා 208

2.15 කම්කරුවන් අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන සහ එල්.එස්.ඩී භාවිතය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා 209

2.16 කම්කරුවන් මත්ද්‍රව්‍ය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය 209

2.17 මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කම්කරුවන් මුදල් උපයාගන්නා ආකාරය 209

2.18 ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල ස්වභාවය හා කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාවේ ස්වභාවය 210

2.19 කම්කරුවන් සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍යවල සුලබතාවය 211

2.20 මත්ද්‍රව්‍ය භාවිතය සමග කම්කරුවන් සිදුකරන ලද නීතිවිරෝධී ක්‍රියා සහ ඔවුන්ට ඒ සඳහා ලැබී ඇති දඬුවම් 216

2.21 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී තිබෙන ගැටලු 218

2.22 සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් පනවා ඇති රීති හා මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි වැළැක්වීමට ගෙන ඇති වෙනත් ක්‍රියා මාර්ග 218

2.23 කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන්ගේ දැනුවත්භාවය හා ඒ සමඟ ගෙන ඇති පියවර 219

2.24 සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග 220

2.25 කම්කරුවන් දිනපතා භාවිත කරන මත්ද්‍රව්‍ය සහ පදිංචි වාසස්ථානය 220

2.26 කම්කරුවන් විසින් සිදුකරන ලද නීතිවිරෝධී ක්‍රියා සහ ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය 223

2.27 කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා අධිමාත්‍රාවීම 224

2.28 කම්කරුවන් සිය මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම සඳහා ප්‍රතිකාර ලබාගැනීම 224

2.29 මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති සෞඛ්‍ය ගැටලු 225

3. නිගමන 226

4. යෝජනා 227

5. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 228

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය - 2019

National Prevalence Survey on Drug Use - 2019

நாடளாவிய விதத்தில் போதைவஸ்து நுகர்வு கணிப்பாய்வு - 2019

වාර්තාව සම්පාදනය

පර්යේෂණ අංශය
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2019

Executive Summary

The non-availability of updated estimation on the number of drug users in Sri Lanka was one of the major problem related to the control of drug abuse. The drug use profile was already captured through number of research studies and surveys conducted by National Dangerous Drugs Control Board (NDDCB) and it was limited to sample frame selected from limited locations. There was a need in conducting national level size estimation survey on drug use population with the above situation.

The NDDCB in collaboration with the Presidential Task Force on Drug Prevention and Sri Lanka Police has done a survey to estimate the drug use population in the country. Islandwide size estimation on drug use population would be the foundation for further programme planning and implementation. Also drug abuse management mechanism would be strengthening with the updated estimation of drug use population in Sri Lanka.

Highly stigmatised and illegal behaviours, such as drug use, can be extremely challenging to survey. Since any single direct or indirect method has inherent limitations in reliably estimating drug use prevalence, a multi-faceted approach was adopted where several methods were combined such as head counting of target population (direct method) and Benchmark-multiplier and Capture-recapture method (Indirect).

Key Findings

- Cannabis is the most commonly used illicit drug, with a prevalence of 1.9% of the total population of above 14 years. An estimated 301,898 persons are cannabis users.
- An estimated 92,540 or 0.6% of population of above 14 years are heroin users in Sri Lanka.
- Heroin use among male population (above 14 years) is 1.2% and among female population (above 14 years) is 0.018 percent.
- Approximately 0.2% of total population (above 14 years) are abuse any pharmaceutical drug.
- Polly drug use is common among drug users.
- An estimated 70,862 or 77% are regular heroin users and 178,643 are regular cannabis users in Sri Lanka.

- An estimated 19.9% and 15.8% of male population (above 14 years) are cigarette and alcohol users respectively.
- The highest prevalence of drug use was found in Western province and Colombo district.

සාරාංශය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය පිළිබඳ යාවත්කාලීන වූ ඇස්තමේන්තු අගයක් නොපැවතීම මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටලුවක් බවට පත්ව තිබිණි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ පැතිකඩ පිළිබඳව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් විවිධ පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ හරහා අනාවරණය කරගෙන තිබුණ ද එය තෝරාගත් නියැදියට හෝ යම් ප්‍රදේශයකට සීමා විය. මෙම තත්ත්වය සමග ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය පිළිබඳ ජාතික මට්ටමේ ඇස්තමේන්තුගත කිරීමක් සිදුකිරීමේ අවශ්‍යතාවයක් මතුවිය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය සහ ශ්‍රී ලංකා පොලීසිය සමග සහයෝගීත්වයෙන් මත්ද්‍රව්‍ය භාවිත ජනගහනය ඇස්තමේන්තු කිරීම සඳහා සමීක්ෂණයක් ක්‍රියාත්මක කරන ලදි. ඉදිරි වැඩසටහන් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දිවයිනම ආවරණය කරමින් කරන ලද ඇස්තමේන්තු අගයන් පදනමක් වනු ඇත. එමෙන්ම යාවත්කාලීන වූ ඇස්තමේන්තු අගයන් සමග මත්ද්‍රව්‍ය දුර්භාවිතය කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම ද සිදුවනු ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය වැනි ඉහළ මට්ටමෙන් සමාජ අවමානයට පාත්‍රවන සහ නීතිවිරෝධී චර්යාවන් සමීක්ෂණයට භාජනය කිරීම අභියෝගාත්මක වේ. සෘජු හෝ වක්‍ර ඇස්තමේන්තුගත කිරීමේ ක්‍රම එකක් භාවිත කිරීම තුළ වලංගුතාවයේ සීමාකම් මතුවන අතර ඉලක්කගත ජනගහණය ගණනය කිරීම වැනි සෘජු ක්‍රම සහ Benchmark – Multiplier සහ Capture – Recapture වැනි වක්‍ර ක්‍රම ඇතුළත් බහුවිධ ප්‍රවේශයකින් යුතු ක්‍රම අනුගමනය කරමින් මෙම සමීක්ෂණය සිදුකරන ලදි.

ප්‍රධාන අනාවරණ

- බහුලවම භාවිත වන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ගංජා වන අතර වයස අවුරුදු 14 ට වැඩි ජනගහනයෙන් 1.9% ක ප්‍රතිශතයක් ගංජා භාවිත කරනු ලබයි. ඇස්තමේන්තුගත ගංජා භාවිත කරන පුද්ගල සංඛ්‍යාව 301,898 ක් වේ.
- ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 14 ට වැඩි ජනගහනයෙන් 92,540 හෝ 0.6% ප්‍රතිශතයක් හෙරොයින් භාවිත කරන පුද්ගලයින් වේ.
- පිරිමි ජනගහනය අතර (වයස අවුරුදු 14 ට වැඩි) හෙරොයින් භාවිතය 1.2% ක් වන අතර ස්ත්‍රී ජනගහනය අතර 0.018% ක් වේ.
- වයස අවුරුදු 14 ට වැඩි ජනගහනයෙන් 0.2% ක ප්‍රතිශතයක් කුමන හෝ වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ වර්ගයක් අවභාවිත කරනු ලබයි.

- මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතර බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය පොදු ප්‍රවණතාවක් වේ.
- ශ්‍රී ලංකාවේ පුද්ගලයින් 70,862 ක් දිනපතා හෙරොයින් භාවිත කරන පුද්ගලයින් වන අතර පුද්ගලයින් 178,643 ක් දිනපතා ගංජා භාවිත කරන පුද්ගලයින් වේ.
- වයස අවුරුදු 14 ට වැඩි පුරුෂ ජනගහනයෙන් 19.9% ක ප්‍රතිශතයක් සහ 15.8% ප්‍රතිශතයක් සිගරට් සහ මද්‍යසාර භාවිත කරනු ලබයි.
- මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් බස්නාහිර පළාත සහ කොළඹ දිස්ත්‍රික්කයෙන් අනාවරණය වී ඇත.

நிறைவேற்றுச் சுருக்கம்

இலங்கையில் போதைவஸ்து பயன் படுத்துபவர்களின் எண்ணிக்கை தொடர்பான புதுப்பிக்கப்பட்ட மதிப்பீடுகள் இல்லாமையானது, போதை வஸ்து கட்டுப்பாட்டில் உள்ள பாரியதொரு பிரச்சினைகளில் ஒன்றாகும். தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டு சபை நடாத்திய பல்வேறு பட்ட ஆய்வுகள் மற்றும் கணிப்பாய்வுகள் மூலம் போதைவஸ்து நுகர்வின் வடிவம் தற்போதே பெறப்பட்டுள்ளது என்ற போதிலும், இது குறிப்பிட்ட சில பகுதிகளுக்கான மாதிரிகளுக்கு மாத்திரம் மட்டிடப்பட்டதாகும்.

தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டு சபை, போதைவஸ்து தடுப்பு ஜனாதிபதி விசேட அதிரடிப் படை மற்றும் போலிஸ் திணைக்களத்துடன் இணைந்து இலங்கையில் போதைவஸ்து பயன் படுத்துவபர்களின் எண்ணிக்கையை கணக்கெடுப்பதற்கு கணிப்பாய்வு ஒன்றை நடாத்தியது. இவர்களின் நாடளாவிய ரீதியான எண்ணிக்கையே போதைவஸ்து தொடர்பான திட்டங்களை வகுப்பதற்காக அஸ்திவாரத்தை உருவாக்கும். மேலும் இலங்கையில் போதைவஸ்து பயன் படுத்துபவரிகளின் மேம்படுத்தப்பட்ட எண்ணிக்கையை அறிந்து கொள்வதானது போதைவஸ்து துஷ்பிரயோக முகாமைத்துவ பொறிமுறையை பலமூட்டவும் துணை புரியும்.

போதைவஸ்து பயன்பாடு போன்ற சட்ட விரோத மற்றும் வெளிப்படுத்துவதற்கு தயங்கும் ஒரு இழிவான பழக்கத்தை கணிப்பாய்வு செய்வதென்பது மிக மிக சிரமமான ஒரு கருமமாகும். தனியான நேரடி மற்றும் மறைமுக அனுகுமுறை ஒன்றில் பல கட்டுப்பாடுகள் இருக்கின்றமையால் அது போன்றதொரு கணிப்பாய்வு மூலம் நம்பகமான தரவுகளை பெறுவத அசாத்தியமாகும். எனவே பன்முக அனுகுமுறை ஒன்றை பயன் படுத்த தற்போது திட்டமிடப்பட்டுள்ளது. இதன் மூலம் இலக்கு குழுவினரின் எண்ணிக்கையை கணக்கிடுவது (நேரடி முறைமை) மற்றும் மட்டக்குறி பெருக்கி மற்றும் பிடித்தல் -மீண்டும் பிடித்தல் முறைமை (மறைமுக) போன்ற பல முறைமைகள் ஒன்றிணைக்கப்பட்டன.

முக்கிய அவதானிப்புக்கள்

- பொதுவாக அதிகம் நுகரப்படும் சட்ட விரோத போதைவஸ்து கஞ்சாவாகும். 14 வயது மற்றும் அதை விட அதிக வயதுள்ள 301,898 நபர்கள் அன்னளவாக நாடளாவிய விதத்தில் கஞ்சாவை பயன் படுத்துவதோடு இது மொத்த ஜனத்தொகையில் 1.9% ஆகும்.
- 14 வயது மற்றும் அதை விட அதிக வயதுள்ள 92,540 நபர்கள் அன்னளவாக நாடளாவிய விதத்தில் ஹெரொயினை பயன் படுத்துவதோடு இது மொத்த ஜனத்தொகையில் 0.6% ஆகும்.
- 14 வயது மற்றும் அதை விட அதிக வயதுள்ள ஆண்கள் மத்தியில் ஹெரொயின் நுகர்வு 1.2% ஆவதுடன், 14 வயது மற்றும் அதை விட அதிக வயதுள்ள பெண்கள் மத்தியில் ஹெரொயின் நுகர்வு 0.018% ஆகும்.
- இதே வேளை, மொத்த ஜனத்தொகையில் 0.2% 14 வயது மற்றும் அதை விட அதிக வயதுள்ளவர்கள் ஏதேனும் ஒரு மருந்து வகையை போதைவஸ்துவாக பயன் படுத்துகின்றார்கள்.
- பல வகை மருந்துக்களை உட்கொள்வது போதைவஸ்து நுகர்பவர்களிடையே பரவலாக காணப்படுகின்றது.
- இலங்கையில் சுமார் 70,862 பேர் தொடர்ச்சியாக ஹேரோயின் உட்கொள்பவர்கள் ஆவதுடன், சுமார் 178,643 பேர் தொடர்ச்சியாக கஞ்சா நுகர்பவர்கள் ஆவர்.
- இதே வேளை, 14 வயது மற்றும் அதை விட அதிக வயதுள்ள 19.9% மற்றும் 15.8% ஆண்கள் முறையே மதுபானம் மற்றும் சிகரட் பயன் படுத்துகின்றனர்.
- அதி கூடிய போதைவஸ்து நுகர்வு மேல் மாகாணத்தில் கொழும்பு மாவட்டத்தில் பதிவாகியது.

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජනගහනය අතර මත්ද්‍රව්‍ය භාවිතය ක්‍රමානුකූලව වර්ධනය වීම සහ ව්‍යාප්ත වීම සම්බන්ධයෙන් විවිධ මූලාශ්‍ර මඟින් අනාවරණය කර ඇත. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගල සංඛ්‍යාව, අත්අඩංගුවට පත්වන මත්ද්‍රව්‍ය ප්‍රමාණ, ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලට ඇතුළත් වන පුද්ගල සංඛ්‍යාව සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා බන්ධනාගාර ගතවන පුද්ගල සංඛ්‍යාව පිළිබඳ නිල සංඛ්‍යාලේඛන වාර්තා විශ්ලේෂණය කිරීමේදී මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තියෙහි වැඩිවීම හඳුනාගත හැකිය.

ඉහත එක් එක් නිර්ණායක යටතේ සංඛ්‍යාත්මක වර්ධනයක් පෙන්නුම් කළ ද මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගල සංඛ්‍යාව සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද නිල සංඛ්‍යාලේඛන පිළිබඳ ජාතික වශයෙන් අවශ්‍යතාවයක් පවතී. ප්‍රදේශ මට්ටමින් එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව සහ අදාළ පුද්ගලයින්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු වලට අදාළව යාවත්කාලීන වූ සංඛ්‍යා දත්ත සංචිතයක් පැවතීම ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා ශක්තිමත් පදනමක් සපයනු ලබයි.

මෙම ජාතික අවශ්‍යතාවය හඳුනාගනිමින් සහ ඊට අනුෂාංගික කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකාය සහ ශ්‍රී ලංකා පොලීසිය යන ආයතන ඒකාබද්ධව මෙම ජාතික සමීක්ෂණය ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයට අදාළ ඇස්තමේන්තු අගයන්, ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස් මට්ටම් අනුව ව්‍යාප්තිය, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීයලේකම් කොට්ඨාස මට්ටමින් පවත්නා ව්‍යාප්තිය සහ භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග අනුව ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත මෙමඟින් ඉදිරිපත් කර ඇත. මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ අවශ්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් සැලසුම් කිරීමේදී ප්‍රදේශ මට්ටමින් මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ප්‍රවණතාව පදනම් කරගත හැකිය.

1.1 අධ්‍යයන පසුබිම

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා නිර්ණායක සහ දර්ශක කිහිපයක් ඔස්සේ ප්‍රමාණාත්මකව මිණුම් කළ හැකි අතර ඒ සඳහා භාවිත කළ හැකි ප්‍රධාන නිර්ණායක 02 කි.

i. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට පත්වීම්
ii. ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්ට ඇතුළත් වීම

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ප්‍රමාණාත්මක ලෙස මිණුම් කිරීමේදී එක් ප්‍රධාන නිර්ණායකයක් ලෙස මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වීම් සැළකිය හැකිය. 2015-2019 පළමු කාර්තුව දක්වා මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවට අදාළ දත්ත විශ්ලේෂණයේදී පැහැදිලි වර්ධනයක් හඳුනාගත හැකිය. 2015 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය තුළ හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 54% කින් සහ ගංජා සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 5% කින් වැඩි වී ඇත.
එමෙන්ම අත්අඩංගුවට පත්වන මත්ද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී 1991 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා (අවුරුදු 27 ක කාල පරාසය තුළ) අත්අඩංගුවට පත්වූ හෙරොයින් ප්‍රමාණය අනුව වැඩිම හෙරොයින් මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් (739 kg) 2018 වර්ෂයේද අත්අඩංගුවට පත්ව ඇත.

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්ට ඇතුළත් වීම පිළිබඳ සංඛ්‍යා දත්ත විශ්ලේෂණය මඟින් ද මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ නිර්ණය කළ හැකිය. අනුගාමී වසර 05 ක ප්‍රතිකාර දත්ත සංසන්දනය කිරීම මඟින් ප්‍රතිකාර සේවාවන් වලට ඇතුළත් වන පුද්ගල සංඛ්‍යාවේ වර්ධනයක් හඳුනාගත හැකිය.

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ඉහත දත්ත විශ්ලේෂණයත් සමඟ පැහැදිලි කරගත යුතු ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලු 02ක් ඇත. එනම්,

01. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් කොපමණ සාමාජිකයින් පිරිසක් මත්ද්‍රව්‍ය භාවිත කරන්නේද?
02. එම සංඛ්‍යාත්මක අගය වෙනස් වෙමින් පවතින්නේද? යන්නයි.

මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව ගණනය කිරීම හරහා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සමාජයට ඇති විය හැකි බලපෑම තක්සේරු කිරීමට හැකියාව ලැබේ. බලපෑම තක්සේරු කිරීමට අමතරව මත්ද්‍රව්‍ය ගැටලුවට අදාළ ගතිකත්වයන් අවබෝධ කර ගනිමින් වඩාත් බලපෑම් සහගත තත්ත්වයන් සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා සහ නිවාරණය සම්බන්ධයෙන් අවශ්‍ය මූලික විකල්පයන් යෝජනා කිරීමට ද හැකියාව ලැබේ. මත්ද්‍රව්‍ය ගැටලුව පාලනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී සහ අදාළ සම්පත් සහ ආයෝජනයන් යෙදවීමේදී මත්ද්‍රව්‍ය ගැටලුව පිළිබඳ විවිධ දිශානතීන් පිළිබඳ පවත්නා පූර්ව තක්සේරු කිරීම් පාදක කරගත යුතුය.

වසංගත විද්‍යාත්මක නිර්වචනය අනුව (Epidemiological) ඉහත ගැටලු දෙක හා සම්බන්ධ වන ප්‍රධාන යෙදුම් 02 ක් ඇත. එනම්, "සිද්ධීන්" (Incident) හා "ව්‍යාප්තිය" (Prevalance) යන්නයි. "සිද්ධීන්" යම් සෞඛ්‍ය ගැටලුවක් හෝ සූදානම් අවදානම් චර්යාවන්ට අදාළව කරනු ලබන නව හඳුනාගැනීම් අදහස් වන අතර "ව්‍යාප්තිය" යන්නෙන් නව හඳුනාගැනීම් සහ පූර්වයෙන් කරන ලද හඳුනාගැනීම් ඇතුළත්ව සමස්ත සංඛ්‍යාව අදහස් වේ. එවැනි අනුපාතයන්/ සංඛ්‍යාවන් ගණනය කිරීම භූගෝලීය ප්‍රදේශ අනුව නිර්ණය කරන ලද ජනගහනය මත පදනම්ව සිදුකරනු ලබන අතර නිශ්චිත කාල පරාසයන්ට අදාළ වයස සහ ස්ත්‍රී පුරුෂභාවය වැනි නිර්නායක අනුව අදාළ ගණනය කිරීම සිදුකළ යුතුය.

1.2 අරමුණු

- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජන සංඛ්‍යාව භූගෝලීය ප්‍රදේශ මට්ටමින් ඇස්තමේන්තු ගත කිරීම සහ ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හඳුනා ගැනීම.
- ස්ත්‍රී පුරුෂභාවය සහ වයස වැනි ප්‍රජා විද්‍යාත්මක නිර්ණායක අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සංසන්දනාත්මකව මිණුම් කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත රටා සහ ප්‍රවණතා අනුව මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය සංඛ්‍යාත්මකව ඇස්තමේන්තු ගත කිරීම.

1.3 ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය ඇස්තමේන්තු ගත කිරීම සඳහා පහත ප්‍රධාන ක්‍රමවේද දෙක භාවිත කරන ලදි.

01.) ඇස්තමේන්තු ගත කිරීමේ සෘජු ක්‍රමය - (Direct Estimation Method)

02.) ඇස්තමේන්තු ගත කිරීමේ වක්‍ර ක්‍රමය - (Indirect Estimation Method)

1.3.1 ඇස්තමේන්තු ගත කිරීමේ සෘජු ක්‍රමය (Direct Method)

මෙහිදී ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් සිටින එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරන ජනගහනය සංඛ්‍යාත්මකව ගණනය කිරීමේ ක්‍රමය (Head counting of target population) අනුගමනය කර ඇත.

නියැදි සමීක්ෂණ/ ගෘහස්ථ සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම හරහා හෙරොයින්/ගංජා වැනි නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමේ පවත්නා සීමාකම් සහ ලැබෙන තොරතුරුවල පවත්නා ඌණතාවන් පිළිබඳ පූර්ව සමීක්ෂණ තුළින් ලද අත්දැකීම් පාදක කර ගනිමින් නියැදි සමීක්ෂණයක් වෙනුවට ඉලක්ක ගත ජනගහනය (Target population) පිළිබඳ ගණනය කිරීමේ ක්‍රමය අනුගමනය කරන ලදි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ගණනය කිරීමේදී කාණ්ඩ සහ නිර්ණායක කීපයක් භාවිත කර ඇත.

* මත්ද්‍රව්‍ය වර්ගය - (හෙරොයින්/ගංජා/මද්‍යසාර/සිගරැට්/වෙනත්)
* වයස - (අවුරුදු 18 ට අඩු/අවුරුදු 18 ට හෝ ඊට වැඩි)
* ස්ත්‍රී පුරුෂභාවය
* භාවිත කරන රටාව

දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු හරහා මෙම ගණනය කිරීම සිදුකර ඇත. අදාළ කමිටුව රැස්වීම මඟින් එක් එක් සාමාජිකයින්ගේ දැනුවත්භාවය හා පූර්ව හඳුනා ගැනීම් පාදක කර ගනිමින් නිශ්චිත, පූර්වයෙන් පරීක්ෂා කරන ලද ආකෘතියක් භාවිත කරමින් මත්ද්‍රව්‍ය භාවිත කරන ජන සංඛ්‍යාව ගණනය කිරීම සිදුකර ඇත. ගණනය කිරීම් සිදුකිරීමේ ක්‍රමවේදය, ආචාර ධර්ම පිළිබඳ දක්වන අවධානය සහ එකම පුද්ගලයා නැවත වරක් ගණනය වීම වැනි තාක්ෂණික දෝෂ අවම කරගැනීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

1.3.2 ඇස්තමේන්තු ගත කිරීමේ වක්‍ර ක්‍රමය (Indirect Method)

මෙහිදී මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් කරන ලද ගණනය කිරීම් වලට අදාළ දත්ත වලට අමතරව මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සම්බන්ධයෙන් දැනට පවතින දත්ත භාවිත කිරීම මඟින් ඇස්තමේන්තු ගත අගයන් සකස් කිරීම සිදුවේ. නිශ්චිත කාල පරිච්ඡේදයකට අදාළව කලින් හඳුනාගත් දත්ත භාවිත කරමින් ඉලක්ක ගත ජනගහනය පිළිබඳ ගණනය කිරීම කර ඇත. වක්‍ර ක්‍රම යටතේ ප්‍රධාන ක්‍රම 02 ක් භාවිත කර ඇත.

1. Benchmark – Multiplier Method
2. Capture – Recapture Method

1. Benchmark – Multiplier Method

ඉලක්කගත ජනගහනයට අදාළ දැනට පවත්නා දත්ත පද්ධති භාවිත කරමින් මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ ඇස්තමේනතු අගයන් සකස් කිරීමේදී විවිධ නිර්ණායකවලට සහ උප කණ්ඩායම්වලට අදාළව පවත්නා දත්ත ඇසුරින් ලබාගත් සත්‍ය අගය (Fix value) සහ අදාළ නිර්ණායක සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත සමානුපාතිකය (Estimated propotion) භාවිත කර ඇත. ඒ සඳහා භාවිත කළ මූලාශ්‍ර/ පහත දක්වා ඇත.

01. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත පද්ධතිය (Drug Abuse Monitoring System – DAMS) මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත සහ ප්‍රතිකාර වලට ඇතුළත්වීම් පිළිබඳ දත්ත
02. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ වාර්ෂික දත්ත (2014 - 2018)
03. ඉලක්කගත ජනගහනය (මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්) නියැදිය වශයෙන් යොදාගත් පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ වලට අදාළ දත්ත (2017/2018 වර්ෂ තුළ)

    මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය (n = 1079)

    මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතය පිළිබඳ සමීක්ෂණය (n = 2000)

    කාන්තාවන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය (n = 150)

2. Capture – Recapture Method

ඉලක්ක ගත ජනගහනය සම්බන්ධ ලැයිස්තු භාවිත කරමින් නැවත ඇතුළත් වීම් ඉවත් කර සත්‍ය අගය ගණනය කිරීම සහ ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයට ඇස්තමේන්තු කිරීම මෙහිදී සිදුවේ. මේ සඳහා භාවිත කළ මූලාශ්‍ර කිහිපයකි.

01. වසර 05 කට අදාළව මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සංඛ්‍යාව අත්අඩංගුවට පත් පුද්ගලයින් සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය පොලිස් කොට්ඨාස මට්ටමින් සකස් කරන ලද දත්ත ගොනුව.
02. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා නිලධාරීන් විසින් ක්ෂේත්‍රය තුළ හඳුනාගත් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ලැයිස්තුව.
03. 2018 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත පද්ධතියට පොලිස් ස්ථාන වලින් වාර්තා වූ අත්අඩංගුවට පත්වූවන් පිළිබඳ දත්ත ගොනුව

1.4 දත්ත සකස් කිරීම සහ විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණයට ප්‍රථම දිවයින පුරා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිදු කරන ලද ගණනය කිරීම් වලට අදාළව ලබාගත් දත්ත අදියර 03 ක් යටතේ විශ්ලේෂණයට අවශ්‍ය පරිදි සකස් කිරීම කරන ලදි.

01. Screening Phase - දිවයිනේ සියලු ග්‍රාම නිලධාරී වසම්වලට අදාළ දත්ත ඇතුළත් දත්ත ගොනුවෙහි මූලික පරීක්ෂාවක් සිදු කිරීම.
02. Diagnostic Phase - දත්ත ගොනුවෙහි පවත්නා ගැටලු හඳුනා ගැනීම.
03. Treatment Phase - අවශ්‍ය දත්ත සංස්කරණ කටයුතු සිදු කිරීම සහ හඳුනාගත් ගැටලු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

සමීක්ෂණයට අදාළ දත්ත විශ්ලේෂණය සඳහා SPSS පරිගණක මෘදුකාංගය භාවිත කර ඇති අතර ඇස්තමේන්තු අගයයන් සකස් කිරීමට අදාළ ද්විතීයික දත්ත මූලාශ්‍ර භාවිත කිරීමේදී Benchmark – Multiplier ක්‍රමය සහ Capture - Recapture ක්‍රමය මත පදනම්ව දත්ත විශ්ලේෂණය සිදුකර ඇත.

1.5 උපයෝගීතාව

ශ්‍රී ලංකාවේ පළාත් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සැළකිල්ලට ගනිමින් නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ දැනට ක්‍රියාත්මක වන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මෙම දත්ත පාදක කරගත හැකිය.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ආරම්භ කිරීමේදී මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ඉහළ ප්‍රදේශ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය. මත්ද්‍රව්‍ය ගැටලුව පාලනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ ආයෝජන වෙන් කිරීමේදී මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ මෙම වාර්තාව මගින් සම්පාදනය කර ඇති ඇස්තමේන්තු අගයයන් පාදක කර ගත හැකිය.

එමෙන්ම ඉලක්කගත ජනගහනය පිළිබඳව සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත වෙනත් ගණනය කිරීම් සඳහා මෙම සංඛ්‍යාත්මක අගයයන් භාවිත කළ හැකිය. මත්ද්‍රව්‍ය ගැටලුව පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය වශයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධ වූ යාන්ත්‍රණයක් සකස් කිරීම සහ ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පූර්ව පදනමක් ලෙස මෙම දත්ත භාවිත කළ හැකිය.

1.6 ආචාරධර්ම ආරක්ෂා කිරීම පිළිබඳ අවධානය

ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිදුකරන ලද ගණනය කිරීමේදී නැවත ගණනය වීම වැළැක්වීම සඳහා පමණක් පුද්ගලයින් නාමිකව ලැයිස්තුගත කිරීම සිදුකර ඇති අතර අවසන් ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේදී පුද්ගලයින්ගේ නම් හෝ කිසිඳු අනන්‍යතාවයක් හෙළිවන ආකාරයට දත්ත එක් රැස් කිරීමක් සිදුකර නොමැත. මෙහිදී අනාවරණය වන මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ නම් හෝ අදාළ සංඛ්‍යා පිළිබඳ රහස්‍යතාව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදි. ද්විතීයික මූලාශ්‍ර ලෙස දත්ත පද්ධති භාවිත කිරීමේදී ද එම සිද්ධාන්තයම අනුගමනය කරන ලදි.

1.7 තාක්ෂණික සීමා

- වසංගතමය අධ්‍යයන (Epidemiological studies) අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනයට ලක් කළ ද සමාජ පර්යේෂණ වලදී මත්ද්‍රව්‍ය භාවිතය නිර්ණය කර ගැනීමට රෝග විනිශ්චය ආකෘතිය භාවිත කළ නොහැක.
- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයෙන් බහුතරයක් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (Poly drug users) වන බැවින් එක් එක් ඇස්තමේන්තු අගයයන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් නියෝජනය වීම.
- නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතය සමාජ අවමානයට පාත්‍රවන කරුණක් වන බැවින් සමීක්ෂණ වලදී විශේෂයෙන් ඉලක්කගත ජනගහනයට අදාළ ගණනය කිරීම් වලදී යම් සීමාකම් මතු වී ඇත.
- සාමාන්‍ය ජනගහන සමීක්ෂණ (General population survey) මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට භාවිත කරන පොදු ශිල්ප ක්‍රමයක් වූවත් හෙරොයින්, ගංජා වැනි මත්ද්‍රව්‍ය වර්ග භාවිතය පිළිබඳ දත්ත එවැනි ගෘහස්ථ සමීක්ෂණ හරහා වාර්තා වීම සීමා සහිත වේ.එම නිසා ගෘහස්ථ සමීක්ෂණ වෙනුවට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින්

ඉලක්කගත ජනගහනය ගණනය කිරීමේ ක්‍රමයක් මෙහිදී භාවිත කර ඇත. එමෙන්ම ව්‍යාප්තිය ඇස්තමේන්තුගත කිරීමේ වක්‍ර ක්‍රම භාවිත කර ඇත.

02. ප්‍රතිඵල

මෙම පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයට අදාළ ඇස්තමේන්තු අගයයන් පහත නිර්ණායක ඔස්සේ ඉදිරිපත් කර ඇත.

1. ස්ත්‍රී පුරුෂභාවය අනුව
2. වයස් මට්ටම අනුව - වයස අවුරුදු 18 ට අඩු සහ අවුරුදු 18 හෝ ඊට වැඩි වශයෙන්
3. මත්ද්‍රව්‍ය වර්ග අනුව - සිගරට්/ මද්‍යසාර/ හෙරොයින්/ ගංජා/ වෙනත්/ පෙති වර්ග
4. භූගෝලීය ප්‍රදේශ අනුව - පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්

මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සම්බන්ධ ඇස්තමේන්තු අගයයන් තුළ පසුගිය මාස 12 ඇතුළත අවම වශයෙන් එක් වරක් හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ පුද්ගලයින් අන්තර්ගත වන අතර බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් නියෝජනය වේ.

2.1 ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

වගු අංක 01 - ස්ත්‍රී පුරුෂභාවය අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

මත්ද්‍රව්‍ය වර්ගය (Drug type)	ස්ත්‍රී (Female)*	පුරුෂ (Male)*	එකතුව (Total)*
සිගරට්/ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (Cigerette / Tobacco products)	23,566	2,383,015	2,406,581
මද්‍යසාර (Alcohol)	20,586	3,014,557	3,035,143
හෙරොයින් (Heroin)	1,384	91,156	92,540
ගංජා (Cannabis)	1,564	300,334	301,898
ඖෂධමය පෙති වර්ග (Pharmaceutical Tablets)	290	23,921	24,211
වෙනත් (Other)	4,265	111,059	115,324

**** ඉහත අගයයන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (Poly drug users) නියෝජනය වේ. වෙනත් කාණ්ඩයේ එක්ස්ටසි වැනි ඇම්පිටමින් කාණ්ඩයේ උත්තේජක, කොකේන්, මෙතම්පිටමින්, හෂීස්/ මදනමෝදක වැනි ගංජා ආශ්‍රිත නිෂ්පාදන, බාබුල්, මාවා වැනි පුවක් විශේෂ, ආස්‍රාණික වර්ග ඇතුළත් වේ.***

නීත්‍යානුකූල ලෙස පාලනයට ලක් කර ඇති සිගරට් සහ මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් ස්ත්‍රීන් සහ පුරුෂයින් අතර ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරන අතර ස්ත්‍රීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව අවධානය යොමු කිරීමේදී සිගරට් සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සම්බන්ධයෙන් වැඩි ප්‍රවණතාවයක් පවතින බව පැහැදිලි වේ.

ප්‍රස්තාර අංක 01 - ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය



ඉහත ඇස්තමේන්තු අගයයන් අනුව නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අතරින් ගංජා භාවිත කරන පුද්ගලයින්ගේ ඉහළ ව්‍යාප්තියක් හඳුනාගත හැකිය. දෙවනුවට වැඩිම ව්‍යාප්තිය පෙන්නුම් කරනුයේ, හෙරොයින් සම්බන්ධයෙනි. ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය පොදු ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි අතර අවස්ථානුකූලව එක් මත්ද්‍රව්‍ය වර්ගයක් හෝ වර්ග කිහිපයක් භාවිත කරනු ලබයි. විශේෂයෙන් හෙරොයින් භාවිත කරන පුද්ගලයින් අතර ඖෂධමය පෙති වර්ග අවභාවිතය සම්බන්ධයෙන් ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

ප්‍රස්තාර අංක 02 - ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුරුෂ ජනගහනය



හෙරොයින්, ගංජා සහ ඖෂධමය පෙති වර්ග අවභාවිත කිරීම සම්බන්ධයෙන් පුරුෂ ජනගහනයට සාපේක්ෂව ස්ත්‍රීන් අතර අවම ව්‍යාප්තියක් හඳුනා ගත හැකිය.

ප්‍රස්තාර අංක 03 - ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ස්ත්‍රී ජනගහනය



2.2 ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය (ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 14 ට වැඩි සමස්ත ජනගහනයට ප්‍රතිශතයක් වශයෙන්)

වගු අංක 02 - ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය සමස්ත ජනගහනයට ප්‍රතිශතයක් ලෙස

මත්ද්‍රව්‍ය වර්ගය **Drug type**	වයස අවුරුදු 14 ට වැඩි ස්ත්‍රී ජනගහනයට ප්‍රතිශතයක් ලෙස **(As a percentage for total female population of above 14 years)%**	වයස අවුරුදු 14 ට වැඩි පුරුෂ ජනගහනයට ප්‍රතිශතයක් ලෙස **(As a percentage for total male population of above 14 years) %**	වයස අවුරුදු 14 ට වැඩි සමස්ත ජනගහනයට ප්‍රතිශතයක් ලෙස **(As a percentage for total population of above 14 years) %**
සිගරැට් (Cigerette)	0.3	32.32	15.80
මද්‍යසාර (Alcohol)	0.26	40.89	19.93
හෙරොයින් (Heroin)	0.018	1.24	0.61
ගංජා (Cannabis)	0.02	4.07	1.98
ඖෂධමය පෙති වර්ග (Pharmaceutical Tablets)	0.004	0.32	0.16
වෙනත් (Other)	0.054	1.51	0.76

** ජන හා සංඛ්‍යාලේඛන දත්ත, 2012 අනුව*

වයස අවුරුදු 14 ට වැඩි පුරුෂ ජනගහනය අතර මද්‍යසාර සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි.

2.3 ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය - සමස්ත ජනගහනයෙන් මිලියනයකට (1,000,000)

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 14 ට වැඩි සමස්ත ජනගහනයට සාපේක්ෂව මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ජනගහනයෙන් පුද්ගලයින් මිලියනයකට හෙරොයින් භාවිත කරන පුද්ගලයින් 6,000 ක් ද, ගංජා භාවිත කරන පුද්ගලයින් 19,000 ක් ද සහ ඖෂධමය පෙති වර්ග භාවිත කරන පුද්ගලයින් 2,000 ක් ද සිටින බවට ඇස්තමේන්තුගත කළ හැකිය.

ප්‍රස්තාර අංක 04 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගල සංඛ්‍යාව - ජනගහනයෙන් මිලියනයකට



2.4 වයස් මට්ටම් සහ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂභාවය අනුව ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

වගු අංක 03 - වයස් මට්ටම් සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

මත්ද්‍රව්‍ය වර්ගය **Drug type**	වයස අවුරුදු 18 ට අඩු **(Below 18 years)**		වයස අවුරුදු 18 හෝ ඊට වැඩි **(18 years and above)**		එකතුව
	ස්ත්‍රී (Female)	**පුරුෂ (Male)**	**ස්ත්‍රී (Female)**	**පුරුෂ (Male)**	**Total**
සිගරැට් (Cigerette)	282	122,432	23,284	2,260,583	2,406,581
මද්‍යසාර (Alcohol)	906	121,170	19,680	2,893,387	3,035,143
හෙරොයින් (Heroin)	64	6,147	1,320	85,009	92,540
ගංජා (Cannabis)	81	30,421	1,483	269,913	301,898
ඖෂධමය පෙති වර්ග (Pharmaceutical Tablets)	71	4,628	219	19,293	24,211
වෙනත් (Other)	265	9,636	4,000	101,423	115,324

**** ඉහත අගයයන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (Poly drug users) නියෝජනය වන අතර එක් එක් වයස් කාණ්ඩ යටතේ මත්ද්‍රව්‍ය භාවිත කරන සමස්ත පුද්ගල සංඛ්‍යාව ගණනය කළ නොහැක.***

වයස් මට්ටම් අනුව මත්ද්‍රව්‍ය/ මද්‍යසාර භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව විශ්ලේෂණය කිරීමේදී වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් අතර සිගරැට් සහ මද්‍යසාර සම්බන්ධයෙන් සැළකිය යුතු ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර මාදක සහ මනෝවර්තක කාණ්ඩයේ මත්ද්‍රව්‍ය අතරින් ගංජා සහ ඖෂධමය පෙති වර්ග අතර සැළකිය යුතු ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

2.5 භාවිත කරන රටාව අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

වගු අංක 04 - භාවිත කරන රටාව අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

මත්ද්‍රව්‍ය වර්ගය **Drug type**	භාවිත කරන රටාව **Drug use pattern**		එකතුව **Total***
	දිනපතා **Daily**	අවස්ථානුකූලව **Occasionaly**	
සිගරැට් (Cigerette)	1,613,777	792,804	2,406,581
මද්‍යසාර (Alcohol)	1,063,383	1,971,760	3,035,143
හෙරොයින් (Heroin)	70,862	21,678	92,540
ගංජා (Cannabis)	178,643	123,255	301,898
ඖෂධමය පෙති වර්ග (Pharmaceutical Tablets)	12,932	11,279	24,211

**** ඉහත අගයයන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (Poly drug users) නියෝජනය වේ.***

භාවිත කරන රටාව අනුව පුද්ගලයින් සංඛ්‍යාව විශ්ලේෂණය කිරීමේදී මද්‍යසාර හැර අනෙක් සියලු මත්ද්‍රව්‍ය වර්ගවල දිනපතා භාවිත කරන පුද්ගල සංඛ්‍යාවේ වැඩි අගයයක් පෙන්නුම් කරයි. මද්‍යසාර භාවිත කරන පුද්ගලයින් අතරින් අවස්ථානුකූලව භාවිත කරන කණ්ඩායමේ වැඩි ප්‍රතිශතයක් නියෝජනය වේ.

2.6 පළාත් මට්ටමින් ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

වගු අංක 05 - පළාත් මට්ටමින් ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

පළාත	මද්‍යසාර		සිගරැට්		ගංජා		හෙරොයින්		පෙති		වෙනත්	
	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ
බස්නාහිර	7435	916,852	6964	705,968	944	99,984	977	62,619	192	14,288	1743	30,760
දකුණ	1827	375,573	2882	299,283	121	38,611	101	8144	28	1292	325	8154
වයඹ	2211	292,506	2764	192,115	118	33,442	92	6192	19	3115	596	9697
මධ්‍යම	2500	442,529	2964	373,251	76	23,541	75	4165	23	1210	173	13,058
සබරගමුව	2052	322,223	2253	223,694	74	32,189	53	4676	11	1366	338	11,780
උතුර	1335	126,267	1212	106,169	74	7534	12	475	2	72	190	12362
නැගෙනහිර	1181	123,730	1677	124,946	57	11,836	29	683	4	205	344	7685
ඌව	943	206,937	1428	174,247	54	19,395	15	687	4	163	521	12,843
උතුරු මැද	1102	207,940	1422	183,342	46	33,802	30	3515	7	2210	35	4720

පළාත් මට්ටමින් මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයේ ව්‍යාප්තිය විශ්ලේෂණය කිරීමේදී බස්නාහිර පළාත තුළ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.

පළාත් මට්ටමින් මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයේ ව්‍යාප්තිය විශ්ලේෂණය කිරීමේදී බස්නාහිර පළාත තුළ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.

2.7 දිස්ත්‍රික්ක මට්ටමින් ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

වගු අංක 06 - දිස්ත්‍රික්ක මට්ටමින් ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනය

	මද්‍යසාර		සිගරට්		ගංජා		හෙරොයින්		පෙති		වෙනත්	
	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ
අම්පාර	398	51906	709	50739	7	6103	7	315	1	107	0	2402
අනුරාධපුර	722	139,069	967	123044	26	23767	22	3012	5	1897	10	3235
බදුල්ල	797	137,186	929	108047	28	8464	7	361	1	95	489	9207
මඩකලපුව	403	37640	573	29565	18	773	12	48	2	14	275	2490
කොළඹ	3959	360,103	2782	307680	769	53489	757	40858	142	7425	1149	12541
ගාල්ල	1006	156,045	1248	124944	78	15842	67	5316	21	906	249	2523
ගම්පහ	2128	375,315	2751	262689	143	30627	187	17844	38	5796	266	9889
හම්බන්තොට	489	87,359	679	80421	32	11450	19	1196	4	202	6	2910
යාපනය	810	47,397	701	35902	25	1405	2	302	0	28	36	3874
කළුතර	1348	181434	1431	135599	32	15868	33	3917	12	1067	328	8330
මහනුවර	812	193,654	1608	174486	34	11378	53	3147	15	792	126	5148
කෑගල්ල	664	125,988	999	91361	22	10653	20	1811	4	579	192	2876
කිලිනොච්චිය	117	18,876	117	10809	18	1005	2	28	1	2	19	1276
කුරුණෑගල	988	201,474	1908	131920	76	19843	65	4234	14	1345	174	6129
මන්නාරම	172	17,865	106	17988	21	1217	2	63	0	17	10	731
මාතලේ	278	82,800	557	66864	17	7675	18	837	5	357	47	6008
මාතර	332	132,169	955	93918	11	11319	15	1632	3	184	70	2721
මොණරාගල	146	69,751	499	66200	26	10931	8	326	3	68	32	3636
මුලතිව්	107	16,323	96	12999	5	927	2	14	0	8	0	26
නුවරඑළිය	1410	166,075	799	131901	25	4488	4	181	3	61	0	1902
පොළොන්නරුව	380	68,871	455	60298	20	10035	8	503	2	313	25	1485
පුත්තලම	1223	91,032	856	60195	42	13599	27	1958	5	1770	422	3568
රත්නපුර	1388	196,235	1254	132333	52	21536	33	2865	7	787	146	8904
ත්‍රිකුණාමලය	380	34,184	395	44642	32	4960	10	320	1	84	69	2793
වවුනියාව	129	25,806	192	28471	5	2980	4	68	1	17	125	6455

දිස්ත්‍රික්ක මට්ටමින් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී නීත්‍යානුකූල සහ නීතිවිරෝධී යන මත්ද්‍රව්‍ය කාණ්ඩ දෙකටම අයත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉහළ ව්‍යාප්තියක් කොළඹ දිස්ත්‍රික්කය තුළ හඳුනාගත හැකිය.

හෙරොයින් භාවිතයේ ව්‍යාප්තිය අනුව ගම්පහ දිස්ත්‍රික්කය තුළ දෙවනුවට වැඩිම ව්‍යාප්තියක් හඳුනාගත හැකි අතර ව්‍යාප්තියේ අනුපිළිවෙළ අනුව තෙවැනි දිස්ත්‍රික්කය ලෙස ගාල්ල දිස්ත්‍රික්කය හඳුනාගත හැකිය. එක් එක් මත්ද්‍රව්‍ය වර්ග අනුව භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය පහත ප්‍රස්තාර මගින් නිරූපණය කර ඇත.

සිතියම් අංක 01 - දිස්ත්‍රික්ක මට්ටමින් මද්‍යසාර භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය



සිතියම් අංක 02 - දිස්ත්‍රික්ක මට්ටමින් සිගරැට් භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය



සිතියම් අංක 03 - දිස්ත්‍රික්ක මට්ටමින් හෙරොයින් භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය



සිතියම් අංක 04 - දිස්ත්‍රික්ක මට්ටමින් ගංජා භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය



සිතියම් අංක 05 - දිස්ත්‍රික්ක මට්ටමින් ඖෂධමය පෙති වර්ග භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය



2.8 ප්‍රතිකාර සඳහා යොමුවීමේ ප්‍රවණතාවය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයෙන් වාර්ෂිකව ප්‍රතිකාර සහ පුනරුත්ථාපන සේවාවන් සඳහා ඇතුළත් වන ප්‍රතිශතය 7% ක් වේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ දිනපතා හෙරොයින් භාවිත කරන පුද්ගලයින්ගෙන් ප්‍රතිකාර අවශ්‍ය ප්‍රතිශතය 77% ක් ලෙස ඇස්තමේන්තුගත කළ හැකිය.

2.9 බන්ධනාගාර ගතවීමේ ප්‍රවණතාවය

ශ්‍රී ලංකාවේ හෙරොයින් භාවිත කරන ජනගහනයෙන් බන්ධනාගාරගත වන ප්‍රතිශතය 8% ක් වන අතර ගංජා භාවිත කරන පුද්ගලයින්ගෙන් බන්ධනාගාරගත වන ප්‍රතිශතය 2% කි. දැනට බන්ධනාගාරගත පුද්ගලයින් අතරින් හෙරොයින් භාවිත කරන හෝ භාවිත කළ පුද්ගල සංඛ්‍යාව 7,205 ක් වන අතර ගංජා භාවිත කරන හෝ භාවිත කළ පුද්ගලයින් සංඛ්‍යාව 5,575 ක් ලෙස අනාවරණය වී ඇත.

3. නිගමන

- නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය කාණ්ඩයට ගැනෙන සිගරැට් සහ මද්‍යසාර භාවිතය වයස අවුරුදු 18 ට අඩු සහ 18 හෝ ඊට වැඩි වයස් කාණ්ඩ අතර මෙන්ම ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශ්වය අතර ද ඉහළ ව්‍යාප්තියක් ඇත.
- නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අතරට ගැනෙන මත්ද්‍රව්‍ය වර්ග අතරින් ගංජා භාවිතය සම්බන්ධයෙන් ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරන අතර හෙරොයින් දෙවැනි වැඩිම ව්‍යාප්තියක් සහිත නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකිය.
- ඖෂධමය පෙති වර්ග අවභාවිතය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අවස්ථානුකූලව මත්ද්‍රව්‍ය වර්ග එකක් හෝ කිහිපයක් භාවිත කරනු ලබයි. ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයෙන් බහුතරයක් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වේ (Polly drug users).
- කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය සහ කුරුණෑගල දිස්ත්‍රික්කය හොරොයින් භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක ලෙස වාර්තා වී ඇති අතර ගංජා භාවිතයේ ව්‍යාප්තිය අනුව අනුපිළිවෙළින් කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය සහ රත්නපුර දිස්ත්‍රික්කය ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක ලෙස වාර්තා වී ඇත.
- මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයෙන් ප්‍රතිකාර සඳහා ඇතුළත්වන ප්‍රතිශතය 7% ක් වන අතර ප්‍රතිකාර අවශ්‍ය පුද්ගලයින්ට සාපේක්ෂව එය ඉතා අඩු අගයක් බව නිගමනය කළ හැකිය.

4. යෝජනා

- වඩාත් ඵලදායී ලෙස මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන් සැලසුම් කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී මෙම ජාතික සමීක්ෂණය මගින් අනාවරණය කර ඇති මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නව ප්‍රවණතා සැළකිල්ලට ගත යුතුය.
- මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් තවදුරටත් වැඩි කළ යුතු අතර එහිදී පහත ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
    - මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ආකෘතිය මත පදනම් වූ ප්‍රතිකාර මධ්‍යස්ථාන ප්‍රජා මට්ටමින් ආරම්භ කිරීම.
    - දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවල ධාරිතාවය ඉහළ නැංවීම.
    - ප්‍රතිකාර වැඩසටහන් සඳහා රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ දායකත්වය තවදුරටත් ලබාගැනීම.

- බන්ධනාගාරගතව සිටින පුද්ගලයින් නේවාසික ප්‍රතිකාර වැඩසටහන් සඳහා තවදුරටත් ඇතුළත් කර ගැනීම.

5. ආශ්‍රිත ග්‍රන්ථ

Department of Mental Helath and Substance Dependance Non-communicable Disease and Mental Health Cluster, World Helath Organization. (2000). *Guide to Drug Abuse Epidemiology*. WHO

Johnton L.D. (1980). *Review of General population Survey of Drug Abuse*. WHO offset publication No.52.

Rootman I., and Hughes, P.G. (1980). *Drug Abuse Reporting system*. WHO offset publication No.55, WHO, Geneva.

UNODC. (2002). *Developing an integrated drug information system*: Global Assessment programme on drug abuse (GAP), Toolkit module 1.

UNODC. (2003). *Estimating prevalence: Indirect methods for estimating the size of the drug problem*. Global Assessment programme on drug abuse (GAP), Toolkit module 2.

UNODC. (2004). *Ethical challenges in drug epidemiology: issues, principles and guidelines*. Global Assessment programme on drug abuse (GAP), Toolkit module 7.

UNODC. (2012). *National drug use survey Maldives 2011/2012*. United Nations Office on Drugs and Crimes.

UNODC. (2013). Drug use in Pakistan 2013. UNODC.

සමීක්ෂණ කමිටුව

මහාචාර්ය සමන් අබේසිංහ මහතා - හිටපු සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

එස්. ආලෝක බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන), අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

භද්‍රානි සේනානායක මහත්මිය - අධ්‍යක්ෂ (පර්යේෂණ), අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

වෛද්‍ය සමන්ත කිතලවආරච්චි මහතා - අධ්‍යක්ෂ (හිටපු), මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය

දේශබන්දු තෙන්නකෝන් මහතා - නියෝජ්‍ය පොලිස්පති, අපරාධ/අපරාධ බුද්ධි සහ ප්‍රජා පොලිස් දිසාව

ආචාර්ය සන්ක්ෆිකා මර්ලින් යන්ග් මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තාක්ෂණ පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

ආචාර්ය කුලරත්න ජී. මොහොට්ටාලෙගෙදර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්ව විද්‍යාලය

එච්.එම්. තිලකරත්න මහතා - ජ්‍යෙෂ්ඨ මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරී, මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය

තමර දර්ශන මහතා - පර්යේෂණ නිලධාරී, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

සුපුන් ප්‍රියදර්ශන මහතා - පර්යේෂණ නිලධාරී, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

ස්තුතිය

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රජා පොලිස් ඒකකවල සියලුම කාර්යය මණ්ඩලයට සහ දිවයින පුරා සියලු පොලිස් ස්ථානවල නිලධාරීන්ට,

සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සම්බන්ධීකරණ නිලධාරීන්ට සහ සියලු ග්‍රාම නිලධාරීන්ට,

පොලිස් මූලස්ථානයේ තොරතුරු තාක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂතුමා ඇතුළු සියලු කාර්යය මණ්ඩලයට,

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශයේ සියලුම නිලධාරීන්ට,

මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකායේ සියලු කාර්යය මණ්ඩලයට,

බන්ධනාගාර කොමසාරිස්තුමා සහ සියලුම බන්ධනාගාර කාර්යය මණ්ඩලයට,

සමීක්ෂණ කමිටුව

පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා හා එහි උපනතීන්

ප්‍රධාන පර්යේෂක
භද්‍රානි සේනානායක
සුපුන් ප්‍රියදර්ශන

සහාය පර්යේෂක කණ්ඩායම

හිරුණි වත්සලා
නිලූකා සංජීවනී
දිල්හාරා වරාගොඩ
නිලුක්ෂි තිසේරා
වසන්ත ප්‍රදීප් කුමාර

සෝදුපත් බැලීම
නිලානි රේණුකා

සාරාංශය

වර්තමානයේ දී ගෝලීය වශයෙන් පුළුල්ව සාකච්ඡාවට බඳුන් වෙමින් පවතින සමාජ ප්‍රශ්න අතර මත්ද්‍රව්‍ය දුර්භාවිතය ප්‍රමුඛතාවයක් ගෙන ඇත. වර්තමාන ශිෂ්‍ය පරපුර හා තරුණ තරුණියන් රටක මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැනි සමාජ අපගාමී ක්‍රියාවන්වල නිරතවීම රටක ඉදිරි අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාවයන් මතුවීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැකිය. නව යොවන කණ්ඩායම් තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ කිසියම් උපනතියක් පවතී ද? යන්න ගෝලීය වශයෙන් විශේෂ අවධානයක් යොමුකර ඇති අතර විවිධ රටවල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ විවිධ සමීක්ෂණ සිදුකර ඇත. නමුත් ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධව සිදුකර ඇති සමීක්ෂණ විරල වේ. තවද පාසැල් සිසුන් අතර මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ කිසියම් ප්‍රවණතාවක් පවතින බවට නිල නොලත් පුවත් හා වාර්තා මගින් හෙළිකර ඇති අතර, ඒ අනුව මෙහි සම්බන්ධව සොයා බැලීමට මෙම සමීක්ෂණය සිදු කරන ලදි.

පාසැල් සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග, මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ රටාවන්, උපනතීන්, මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට බලපාන ලද සාධක හා මත්ද්‍රව්‍ය අත්හදා බැලීම් වැළැක්වීම මෙන්ම මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම කිරීමට ගතයුතු ප්‍රතිපත්ති, සැලසුම් හා ක්‍රියාමාර්ග හඳුනා ගැනීම ද මෙම සමීක්ෂණයේ අරමුණු විය. පර්යේෂණ විධි ක්‍රමය ලෙස නියැදි සමීක්ෂණ ක්‍රමය (Sampling Survey Method) යොදා ගන්නා ලදි. එක් එක් දිස්ත්‍රික්ක තුළ පාසල් හා එම පාසල් වලින් සිසුන් තෝරා ගැනීමේදී සම්භාවිතා නියැදීම් ක්‍රමයක් (Random Sampling Method) යොදාගනු ලැබූ අතර සමස්ත නියැදියේ විශාලත්වය සිසුන් 5075 කි. දත්ත එක්රැස් කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රම යොදා ගත් අතර දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක හා අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම (Descriptive & Inferential Statistical Methods) යොදා ගන්නා ලදි.

සමීක්ෂණය තුළ නියැදියට සසම්භාවී ලෙස තේරී පත්වූ මුළු සිසුන්ගෙන් 16% (787) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබුණු අතර එම සිසුන්ගෙන්, එක් දිනක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 47% (371) ක් ද, දින කිහිපයක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 27% (210) ක් ද, ඉඳහිට මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 20% (159) ක් ද, නිතර මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 6% (47) ක් ද බව අනාවරණය විය. මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 5.52% (280) ක් සිගරැට් ද, 5.08% (258) ක් මද්‍යසාර ද, 2.25% (114) ක් බියර් ද 3.03% (154) ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) ද, 1% (51) ක් පුවක් වර්ග ද අත්හදා ඇති බවයි. තවද එක් දිනක් හෝ ගංජා භාවිත කළ 0.51% (26) ක් ද එක් දිනක් හෝ හෙරොයින් භාවිත කළ සිසුන් 02 (0.04%) ක් ද මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) භාවිත කළ 0.16% (8) ක් ද අනාවරණය විය.

සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස **දැනට (ඉඳහිට හෝ නිතර) කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්** 4% (206) ක් බවත් එය 3.46% - 4.54% අතර පරාසයේ පවතින බවත් හෙළිවිය. සිසුන්ගෙන් 2.1% (106) ක් සිගරැට් ද, 1.6% (82) ක් මද්‍යසාර ද, 1.03% (52) ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) ද, බියර් 0.78% ක් ද, පුවක් වර්ග 0.45% ක් ද, බාබුල් 0.14% ක් ද හා මදනමෝදක 0.08% ක් ද ලෙස විය. තවද 0.3% (15) ක් දැනට ගංජා භාවිත කරන අතර මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) 0.06% (3) ක් ද විය.

මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන්ගෙන් බහුතරයක් උත්සව අවස්ථාවලදී, විනෝද චාරිකාවල දී, පාසැලේ විවිධ අවස්ථාවල දී මෙන්ම ගමේ දී විවිධ අවස්ථාවල දී ද මත්ද්‍රව්‍ය අත්හදා බලා ඇති බවත් එහිදී ඔවුන් වැඩි වශයෙන් මද්‍යසාර, සිගරැට් හා බියර් ද අත්හදා බලා ඇති බව හෙළිවිය.

මත්ද්‍රව්‍ය භාවිතයේ භූගෝලීය ව්‍යාප්තිය සළකන විට දී, සෑම දිස්ත්‍රික්කයකම ඉහළම ප්‍රවණතාවක් සිගරැට් සම්බන්ධව පවතින බවත්, සිගරැට් භාවිතයේ ඉහළම ප්‍රචලිත බව අනුරාධපුර, මොණරාගල හා කොළඹ දිස්ත්‍රික්ක වලින් ද, මද්‍යසාර සම්බන්ධව ඉහළම ප්‍රචලිත බවක් මොණරාගල, පුත්තලම හා මහනුවර දිස්ත්‍රික්ක තුළින් ද පෙන්නුම් කර ඇත. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වල ඉහළම ප්‍රචලිත බව මොණරාගල, රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුළින් ද දක්නට ලැබිණි. ගංජා භාවිතයේ ඉහළම ප්‍රචලිත බව පුත්තලම දිස්ත්‍රික්කය ද, ඊට අමතරව මොණරාගල, යාපනය, කොළඹ හා ගම්පහ

දිස්ත්‍රික්කවල ද මනෝවර්තක ගණයේ ඖෂධ කොළඹ හා මහනුවර දිස්ත්‍රික්ක තුළ කිසියම් ප්‍රවණතාවක් වාර්තා විය.

ශිෂ්‍යයින්ට සාපේක්ෂව ශිෂ්‍යයාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ පහළ ප්‍රවණතාවක් දක්නට ඇති අතර මුළු ශිෂ්‍යයින්ගෙන් 5.7% (182) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර සිසුවියන් සඳහා එම අගය 1.2% (24) ක් විය. සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන්ගේ පරිසරය ඔවුන් ඇසුරු කරන සමීපතම ඥාතීන් හා මිතුරන්ගේ ඇසුර බලපෑම් කර ඇති බවත්, විනෝදාංශයක් නොමැතිව කාලය ගත කරන හෝ මිතුරන් ඇසුරු කරමින් චිත්‍රපට නැරඹීම, ක්‍රීඩා කිරීම වැනි විනෝදාංශවල යෙදෙන සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යම් ප්‍රවණතාවක් පවතින බවත්, ඉහළ අධ්‍යාපන මට්ටම්වලට සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටම්වලින් යුතු දෙමාපියන්ගේ දරුවන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි වැඩි ප්‍රවණතාවක් පෙන්වා ඇති අතර තවද පියා පුහුණු ශ්‍රමික (වඩුවැඩ /පෙදරේරු/ ජලනල/ විදුලි/ ව්‍යාපාරික හෝ ස්වයංරැකියා, කෘෂිකාර්මික ආදී) හෝ නුපුහුණු ශ්‍රමික වැනි රැකියාවල නිරත හෝ මව ගෘහණියක් ලෙස සිටින පවුල්වල සිටින සිසුන් වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ හා යොමුවීමේ ප්‍රවණතාවක් ද ඇති බව අනාවරණය විය.

තවද මෙහිදී දරුවන් සමඟ දෙමාපියන් දක්වන සම්බන්ධතාවයන්හි තීව්‍රතාව ද සිය ගැටලු ඉදිරිපත් කිරීමට හා සාකච්ඡා කිරීමට සිටින පාර්ශ්වයන්ගේ මැදිහත්වීම් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කර ඇති බව ද මෙහිදී අනාවරණය විය. මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට සිය ගැටලු විසඳා ගැනීමට මැදිහත්කරුවන් බොහෝ විට නොසිටි අතර සිටින මැදිහත්කරුවන් ද සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අනුබල ලබා දෙන බව මෙම සමීක්ෂණයෙන් හෙළිවිය. සිසුන්ගෙන් බහුතර පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ තුළින් පුද්ගලයාට හා සමාජයට ඇතිවන හානිකර තත්ත්වය පිළිබඳව නිවැරදි කරුණු හා මතයන් සඳහන් කර තිබුණු අතර සිසුන්ගෙන් සුළු පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ වැරදි මත/මිත්‍යා මත වල එල්බ සිටින බවත් අනාවරණය විය. සිසුන්ගෙන් 51% ක් නිවාරණ වැඩසටහන් මගින් මත්ද්‍රව්‍ය සම්බන්ධව දැනුවත් වී තිබූ අතර සිසුන්ගෙන් 81% (4088) ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගීවීමට කැමැත්ත ප්‍රකාශ කර තිබුණි.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් සෞඛ්‍යයට අහිතකර නිසා මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවත්, මත්ද්‍රව්‍ය භාවිතයෙහි අහිතකර ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ලබා ඇති අවබෝධය, මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු නොවී සිටීමට හේතු වී ඇති බව අවබෝධ කරගෙන ඇති බවත් මෙහිදී තවදුරටත් අනාවරණය විය. ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ වර්ධනයක් තිබෙන බවත් මෙහිදී සමීක්ෂණය මඟින් හෙළි වූ අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් පාර්ශ්වකරුවන් ඒකරාශී කරගනිමින් මෙයට සෘජුවම මැදිහත් වී පාසැල් සිසුන් සඳහා සැලසුම්ගත මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

01. හැඳින්වීම

රටක ජීවනාලිය තරුණ පරපුර බැවින් නව යෞවන හා යෞවන වයස්වල සිටින පුද්ගලයින්ගේ යහපැවැත්ම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. UNDESA ට අනුව යෞවන වයස යනු පුද්ගලයෙකු දරුවෙකුගේ සිට වැඩිහිටියෙකු දක්වා පරිවර්තනය වන කාලයයි. මෙම කාල වකවානුව තුළ ඔවුන් වේගවත් මානසික හා භෞතික සංවර්ධනයක් අත්කරගන්නා අතර මෙය රටකින් රටකට වෙනස් වන අතර ඔවුන්ගේ භූමිකාව අනුව ද වෙනස් වේ. මෙම වයස් වල පසුවන පුද්ගලයින්, රටක ආර්ථික කටයුතු වල යෙදීමට හෝ සමාජයීය වගකීම් දැරීමට තරම් ශාරීරික හෝ මානසික පරිණතභාවයකින් යුක්ත නොවන බැවින් ඔවුන් ඒ සඳහා අවශ්‍ය නිපුණතාවන් ඇතිකරගනු වස් පූර්ණකාලීන පාසැල් හෝ වෘත්තීමය අධ්‍යාපන කටයුතු වල නිරත වේ. ඒ අනුව ඔවුනොවුන්ගේ නිවැරදි ක්‍රියාකාරීත්වය, රටක ඉදිරි සංවර්ධනය කෙරෙහි සෘජුවම බලපෑම් කරන බැවින් ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ (UNDESA, 2013, January). http://www.hss.ruh.ac.lk/index.php/staff/academic-staff/sociology

නව යෞවන වයසේ පසුවන පාසැල් සිසුන් යනු, රටක අනාගත ආර්ථික ශක්‍යතාව වන අතර ඔවුන් වර්තමාන සමාජය තුළ පවත්නා හර පද්ධතීන් හා වටිනාකම් සුරක්ෂිතව අනාගතයට ගෙන යන පිරිසකි. එබැවින් ඔවුන්ව ආරක්ෂා කිරීම මෙන්ම ඔවුන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය කෙරෙහි නිරන්තර අවධානය යොමු කිරීම වර්තමාන සමාජය විසින් පැහැර නොහැරිය යුතු වගකීමක් වේ.

ගෝලීය වශයෙන් නව යෞවන පිරිස් පුළුල්ව අන්තර්ජාල භාවිතය කෙරෙහි යොමු වීම, රාත්‍රී සමාජශාලා වෙත පිවිසීම, අඩු වයසින් ලිංගික අත්හදා බැලීම් හා සූදුව වැනි සමාජ අපගාමී ක්‍රියා වලට යොමුවීම මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, අලෙවිය හා ජාවාරම් සඳහා යොමුවීම/ යොමු කරගැනීම තරුණ පිරිස් ශාරීරික හා මානසිකව පිරිහීමට මූලික වශයෙන් හේතු වී ඇති අතර මෙවැනි හේතූන් උග්‍ර සමාජ ගැටලු ඇතිකරවීමට මූලික වන බව දැක්විය හැකිය. මෙවැනි සමාජයීය ගැටලු වලට ගෝලීය වශයෙන් විසඳුම් සෙවීම සඳහා එක්සත් ජාතීන් ඇතුළු විවිධ සංවිධාන වර්තමානය වන විට විවිධ පර්යේෂණ සිදුකරමින් ගත යුතු විධිමත් පියවර හා අවශ්‍ය සැලසුම් සකස් කරමින් සිටියි.

වර්තමානයේදී ශ්‍රී ලංකාව තුළ ද නව යෞවනයින්ගේ අනාගත සමාජයීය යහපැවැත්මෙහි බිඳවැටීම් කෙරෙහි ඉහත සාධක බලපා ඇති බව පැහැදිලි වේ. නව යෞවන වයසේ සිටින ඇතැම් පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය වර්ග භාවිතය කෙරෙහි යොමුවීමක් පවතින බව වාර්තා වේ. මේ පිළිබඳව පාසැල්වලින් මහජනතාවගෙන් සහ විවිධ පාර්ශ්වයන්ගෙන් පැමිණිලි ලැබී ඇත. ඒ අනුව මෙම ගැටලුව සඳහා හේතු වූ සාධක විමසා බැලීමටත්, ඒ තුළින් වඩාත් ප්‍රශස්ත විසඳුම් ඉදිරිපත් කිරීමත් උදෙසා මෙම සමාජ විද්‍යාත්මක පර්යේෂණය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය මගින් සිදුකරන ලදි.

1.1 අධ්‍යයන පසුබිම

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ නිරන්තර සාකච්ඡාවට ලක් වී ඇති ප්‍රධාන මාතෘකාවක් ලෙස පාසල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හැඳින්විය හැකිය. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් විවිධ උපක්‍රම භාවිත කර පාසල් සිසුන්ට මත්ද්‍රව්‍ය බෙදාහරිනු ලබයි. පැණි බීම, ටොෆි, චොකලට් ආදී කෑම වර්ගවලට ගංජා, දුම්කොළ ආදි විවිධ මත්ද්‍රව්‍ය අඩංගු කරමින් පාසල් ළමුන්ට විකිණීම මෙම ජාවාරම්කරුවන්ගේ එක් උපක්‍රමයකි. තවද මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ පවතින මිත්‍යා මත විවිධ පුද්ගලයින් හරහා සිසුන් තුළ ස්ථාපිත කිරීම ද තවත් උපක්‍රමයකි.

පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ විවිධ පුවත් හා නිල නොලත් තොරතුරු, විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ නිතර අනාවරණය වූ අතර ඇතැම් පාර්ලිමේන්තු සැසි වලදී ද මේ පිළිබඳව සාකච්ඡාවට බඳුන් වී ඇත. දිවයිනේ ප්‍රදේශ ගණනාවකින් මෙවැනි පැණි බීම සහ කෑම වර්ගවලට විවිධ මත්ද්‍රව්‍ය අන්තර්ගත කර පාසල් ළමුන්ට අලෙවි කළ පුද්ගලයින් මෙන්ම විවිධ මත්ද්‍රව්‍ය සෘජුවම සිසුන්ට අලෙවි කරන පුද්ගලයින් ද පොලිස් අත්අඩංගුවට පත් වී ඇති බව වාර්තාවලින් සනාථ වී තිබේ. මෙවැනි ජාවාරම්කරුවන් නීතියේ රැහැනට හසුවුව ද පාසල් ළමුන් ඉලක්ක කර ගනිමින් මත්ද්‍රව්‍ය අලෙවිය හා ජාවාරම් කිරීම තවදුරටත් පැවතීම ගැටලුවට කරුණකි.

පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අවධිමත් ලෙස තොරතුරු අනාවරණය වීම ද ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර භාවිතය සම්බන්ධ තොරතුරු වැඩි වශයෙන් වාර්තා වන්නේ කොළඹ, ගම්පහ, ගාල්ල, කුරුණෑගල, කළුතර, අනුරාධපුර, රත්නපුර, මහනුවර, පුත්තලම හා යාපනය යන දිස්ත්‍රික්ක වලිනි.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් ගත්කළ කොළඹ දිස්ත්‍රික්කය පළමු ස්ථානය ගන්නා අතර අනෙකුත් දිස්ත්‍රික්ක අතුරින් ගම්පහ, කළුතර, ගාල්ල, කුරුණෑගල, මහනුවර, අනුරාධපුර, රත්නපුර, හම්බන්තොට, පුත්තලම හා යාපනය යන දිස්ත්‍රික්ක තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වැඩි ප්‍රමාණයක් වාර්තා වේ (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2017).

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට ලැබෙන මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට පත් පුද්ගලයින් සම්බන්ධ දත්ත විශ්ලේෂණය අනුව 2012 සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ අත්අඩංගුවට පත් අවුරුදු 19 ට අඩු පුද්ගලයින් ප්‍රමාණයෙහි ක්‍රමිකව වැඩිවීමේ උපනතියක් දක්නට ඇත.

ප්‍රස්තාරය 01 : මත්ද්‍රව්‍ය සඳහා අත්අඩංගුවට පත් වූ අවුරුදු 19 ට අඩු තරුණයින් (2012 - 2016)



මූලාශ්‍රය : (මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2016)

එසේම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට ලැබෙන දත්ත විශ්ලේෂණය අනුව ප්‍රතිකාර සඳහා ඇතුළත් වන අවුරුදු 19 ට අඩු පිරිස ගත් කල එහිද වැඩිවීමක් දක්නට ලැබේ. 2015 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු පිරිස 74 දෙනෙකු වූ අතර එය 2016 වර්ෂය අවසානයේදී 137 දක්වා ඉහළ ගොස් තිබේ. තවද 2016 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු පිරිස, 2015 වර්ෂයට සාපේක්ෂව 85% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙමගින් ද පැහැදිලි වන්නේ, පාසල් යන වයසේ සිසුන් සුළු පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතය නිසා තම අධ්‍යාපනය නවතා දමා ඇති බවත්, නීතියේ රැහැනට හසුවීම හෝ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට ඇතුළත් කිරීම සිදුවී ඇති බවත් ය. එම වැඩි වීම පහත වගුව මඟින් මනාව පැහැදිලි වේ.

වගුව 01 - 2012 - 2016 දක්වා කාලය තුළ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු තරුණයින්

වර්ෂය	2012		2013		2014		2015		2016	
වයස	සංඛ්‍යාව	*ප්‍රතිශතය	සංඛ්‍යාව	*ප්‍රතිශතය	සංඛ්‍යාව	*ප්‍රතිශතය	සංඛ්‍යාව	*ප්‍රතිශතය	සංඛ්‍යාව	*ප්‍රතිශතය
0 - 14	**9**	0.8	**6**	0.4	**20**	1.2	**6**	0.4	**7**	0.3
15 -18	**58**	5.2	**50**	3.7	**85**	5.2	**68**	5	**130**	6
> 19	**67**	6	**56**	4.1	**105**	6.4	**74**	5	**137**	6

***ප්‍රතිශතය - ප්‍රතිකාර ලබාගත් මුළු පුද්ගලයින්ට ප්‍රතිශතයක් ලෙස**

මූලාශ්‍රය: (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2015)

මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් හා ප්‍රතිකාර සඳහා ඇතුළත් වන පුද්ගලයින් පිළිබඳ තොරතුරු මගින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ දළ අදහසක් ලබාගත හැකි නමුත් භූගෝලීය වශයෙන් මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ විශාලත්වය, මත්ද්‍රව්‍ය දුර්භාවිතය සඳහා යොමුවීමට හේතුවන සාධක හා එහි උපනතින් පිළිබඳව නිශ්චිත නිගමන වලට එළඹීම හා මේ සම්බන්ධ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමට එය ප්‍රමාණවත් නොවේ. එබැවින් මෙහිදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත සමීක්ෂණයක් සිදුකර එම තොරතුරු අනාවරණය කර ගත යුතු වේ.

ඒ අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය විසින් දිස්ත්‍රික්ක 12 කින් සසම්භාවී ලෙස තෝරාගත් පාසැල් 100 ක් ඇසුරෙන් මෙම සමීක්ෂණය සිදුකරන ලදි.

1.2 අධ්‍යයනයේ අරමුණු

- පාසැල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක හඳුනා ගැනීම සහ භාවිත රටාවන්, මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
- පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීමට අදාළ ප්‍රතිපත්ති හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.3 අධ්‍යයන ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය (Survey Method) යොදා ගන්නා ලද අතර නියැදිය තුළ වූ සිසුන්, ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් සම්මුඛ සාකච්ඡාවට ලක්කර ලබාගත් ආනුභවික දත්ත විශ්ලේෂණය කිරීමෙන් අධ්‍යයනයේ නිගමන කරා එළඹුණි.

2014 වර්ෂයේ සංඛ්‍යාලේඛන හා වාර්තා පදනම් කරගනිමින් හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගත් පුද්ගලයින් සහ අවුරුදු 19 ට අඩු ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින්ගේ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරන දිස්ත්‍රික්ක හඳුනා ගන්නා ලදි. ඒ අනුව ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක 12 ක් මෙම සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදි. එක් එක් දිස්ත්‍රික්කය තුළ පාසැල් හා එම පාසැල් වල සිසුන් තෝරා ගැනීමේදී සම්භාවිතා නියැදුම් ක්‍රමයක් (Random Sampling) යොදාගනු ලැබීය. නාගරීකරණය මත සමාජ ව්‍යුහයේ සිදුවී ඇති වෙනස්කම්, මත්ද්‍රව්‍ය දුර්භාවිතය, මත්ද්‍රව්‍ය ජාවාරම් හා අත්අඩංගුවට පත්වීම් වල ව්‍යාප්තිය එක් එක් දිස්ත්‍රික්ක අතර විෂමජාතීය මට්ටමක ඇති බැවින් එම එක් එක් දිස්ත්‍රික්කය තුළින් පාසැල් තෝරා ගැනීමේදී නියැදුම් ක්‍රමවේදය ලෙස ස්තෘත සසම්භාවී නියැදීම (Stratified Random Sampling) යොදාගන්නා ලදි. එක් එක් දිස්ත්‍රික්ක උපසංගහන ලෙස සළකමින් තෝරාගත් පාසල්වල මුළු ළමුන්ට ප්‍රතිශතයක් ලෙස 6 වසර සිට 13 වසර දක්වා සිටින මුළු ළමුන්ට සමානුපාතික වන ලෙස අධ්‍යයන නියැදිය සකස් කරන ලද අතර මෙහිදී සමානුපාතික විභේදනය යොදා ගනු ලැබීය. තෝරාගත් එක් එක් පාසැල් වල සිසුන් නියැදියට ඇතුළත් කරගැනීමේදී සරල සසම්භාවී නියැදි ක්‍රමය භාවිත කරන ලදි. එය පහත පරිදි වේ.

$$n_0 = \frac{Z^2.P.Q}{d^2}$$

$$n_0 = \frac{1.96^2 * 0.5 * 0.5}{0.0140^2} = 5091$$

$$n = \frac{n_0}{1 + \frac{n_0 - 1}{N}}$$

$$n = \frac{5091}{1 + \frac{5091 - 1}{1603467}} = 5075$$

සංගණනයේ මූලික නියැදි ඒකකය පාසැලක් ලෙස සැලකූ අතර තෝරාගත් පාසල් 100 ක් තුළ ළමුන් 51 ක් බැගින් වූ සරල සසම්භාවී නියදින් 100 ක එකතුවක් ලෙස මුළු නියැදිය සකස්කර ගනු ලැබීය.

ඒ අනුව සමස්ත නියැදියේ විශාලත්වය සිසුන් 5075 ක් විය. දෝෂ ආන්තිකය 0.014 (d), P = 0.5 දී 95% විශ්‍රම්භ ප්‍රාන්තරයේ (C.I.) අගය t = 2 ලෙස ගතහොත් නියැදි 71 න් එකකදී හැර තොරතුරු සත්‍ය වන බව 95% ක විශ්වාසයකින් ප්‍රකාශ කළ හැකිය.
දිස්ත්‍රික්ක අනුව පාසැල් හා ළමුන් තෝරාගත් ආකාරය පහත වගුව මඟින් දැක්වේ.

වගුව 02 - දිස්ත්‍රික්ක අනුව නියැදියට තෝරාගත් පාසැල් සිසුන්

දිස්ත්‍රික්කය	තෝරාගත් පාසැල් සංඛ්‍යාව	නියැදියට ඇතුළත් කරගත් සිසුන් සංඛ්‍යාව
කොළඹ	16	822
ගම්පහ	13	651
කුරුණෑගල	13	645
මහනුවර	10	527
ගාල්ල	08	401
කළුතර	08	394
රත්නපුර	08	410
අනුරාධපුර	05	251
පුත්තලම	06	309
යාපනය	05	249
හම්බන්තොට	05	258
මොණරාගල	03	158
එකතුව	**100**	**5075**

සමීක්ෂණය සඳහා සිසුන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හා අධ්‍යාපන කටයුතු වලට බාධා නොවන ආකාරයට සිසුන් තෝරා ගැනීමට හා තොරතුරු ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබුණි. සමීක්ෂණය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සමීක්ෂණයේ ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීම උදෙසා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සැසි කිහිපයකදී සාකච්ඡා කෙරුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිඛිත අවසරය මත සමීක්ෂණය සිදු කෙරෙනු ලැබීය.

1.4 දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම

නියැදියට ඇතුළත් කරගත් පාසැල් සිසුන් 5075 කගේ තොරතුරු ලබා ගැනීමේදී ව්‍යුහගත ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රම භාවිත කරමින් දත්ත රැස් කිරීම සිදුකරන ලදි. මූලික තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබාගත් අතර මේ සඳහා අදාළ පාසැලේ ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් සම්බන්ධ කර ගන්නා ලදි.

අධ්‍යයනය සඳහා පාසැල් තෝරා ගැනීම, නියැදියට දත්තදායකයන් ලෙස ළමුන් ඇතුළත් කර ගැනීම සහ ළමුන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කළ ශිල්ප ක්‍රම හා ප්‍රශ්නාවලි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පූර්ව එකඟතාවයකට පැමිණි අතර ඔවුන්ගේ අනුමැතිය යටතේ පාසැල් තෝරා ගැනීම සිදුවිය.

සිතියම 01 - සමීක්ෂණය සඳහා නියැදිය මඟින් ආවරණය වූ දිස්ත්‍රික්ක



1.5 දත්ත විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණය සඳහා Microsoft Excel හා SPSS 16 මෘදුකාංගය භාවිත කළ අතර විශ්ලේෂණය සඳහා විස්තරාත්මක හා අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම (Descriptive and Inferential Statistical Methods) යොදා ගෙන ඇත.

02. පර්යේෂණ ප්‍රතිඵල

ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමේ ප්‍රවණතාවයක් පවතින්නේ දැයි සොයා බැලීම මෙම සමීක්ෂණයේ මුඛ්‍ය අරමුණ වූ අතර එහිදී මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් සමීක්ෂණය තුළින් අනාවරණය කර ගැනීමත්, ඔවුන්ගේ සමාජ හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, මත්ද්‍රව්‍ය භාවිත රටා හා භාවිතය සඳහා බලපාන සාධක හඳුනා ගැනීමත් මෙම සමීක්ෂණයේ උපඅරමුණු විය.

සමස්ත පර්යේෂණ වාර්තාව තුළ විවිධ විචල්‍යයන්ට අදාළ දත්ත විශ්ලේෂණය කිරීමේදී සමීක්ෂණය සඳහා නියැදියට ඇතුළත් වූ **එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ**, **දැනට මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදෙන** හා **මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කෙදිනකවත් යොමු වී නොමැති** එක් එක් ශිෂ්‍ය කාණ්ඩ පදනම් කරගන්නා ලද අතර පර්යේෂණ ප්‍රතිඵල විවරණය කිරීමේදී ද එම එක් එක් ශිෂ්‍ය කාණ්ඩ අනුව සිදුකරන ලදි.

2.1 ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

සමීක්ෂණය සඳහා ඉලක්ක කර ගත් නියැදියේ දත්තදායකයින් පිළිබඳ සමාජ හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු පහත පරිදි අනාවරණය විය.

සමීක්ෂණය සඳහා පාසැල් 100 ක සසම්භාවී නියැදියක් පදනම් කරගත් අතර ඒ තුළ සිසුන් 62% (3166) ක් හා සිසුවියන් 38% (1909) ක් ද නියැදිය තුළ නියෝජනය විය.

ජනවර්ග අනුව අධ්‍යයනයට භාජනය වූ සිසුන්ගේ ව්‍යාප්තිය සැළකූ විටද, බහුතරයක් එනම්, 79.2% (4022) ක් සිංහල ජාතික සිසුන් විය. 9% (467) ක් ද්‍රවිඩ ජාතික සිසුන් ද, 11% (546) ක් මුස්ලිම් ජාතික සිසුන් ද, 1% (40) ක් වෙනත් ජාතික සිසුන් ද නියැදිය තුළ නියෝජනය විය.

ආගම අනුව නියැදියේ සංයුතිය සළකා බලන විටදී, සිසුන්ගේ 73.3% (3724) ක් බෞද්ධ ආගමික සිසුන් ද, 11.2% (569) ක් ඉස්ලාම් ආගමික සිසුන් ද, 7.7% (391) ක් හින්දු ආගමික සිසුන් ද, ක්‍රිස්තියානි ආගමික සිසුන් 3.1% (159) ක් හා රෝමානු කතෝලික ආගමික සිසුන් 4.6% (231) ක් ද වශයෙන් නියැදිය තුළ නියෝජනය විය.

වගුව 03 - සමීක්ෂණයට ලක්කළ සිසුන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

		සිසුන් ගණන	ප්‍රතිශතය
ස්ත්‍රී පුරුෂ භාවය	පුරුෂ	3166	62%
	ස්ත්‍රී	1909	38%
	එකතුව	**5075**	**100%**
ජනවර්ගය	සිංහල	4022	79.2%
	දෙමළ	467	9.0%
	මුස්ලිම්	546	11.0%
	බර්ගර්	15	0.3%
	මැලේ	22	0.4%
	වෙනත්	3	0.1%
	එකතුව	**5075**	**100%**
ආගම	බෞද්ධ	3724	73.3%
	හින්දු	391	7.7%
	ඉස්ලාම්	569	11.2%
	ක්‍රිස්තියානි	159	3.1%
	රෝ.කතෝලික	231	4.6%
	වෙනත්	1	0.02%
	එකතුව	**5075**	**100.0%**

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන්ගේ වයස් ව්‍යාප්තිය සළකන විටදී වයස අවුරුදු 10 - 19 ත් අතර සිසුන් පමණක් නියැදිය තුළ නියෝජනය වූ අතර වයස සඳහා ප්‍රතිචාර නොදක්වා ඇති සිසුන් ප්‍රතිශතය 1% (75) ක් විය. ප්‍රතිචාර දක්වන ලද සිසුන් 99% (5000) ක් වන අතර ඉන් වයස අවුරුදු 13 හෝ 13 ට අඩු සිසුන් 11% (545) ක් ද, අවුරුදු 14 - 15 අතර සිසුන් 52% (2626) ක් ද, සිසුන්ගෙන් 29% (1449) ක් වයස අවුරුදු 16 - 17 අතර ද, 7% (380) ක් වයස අවුරුදු 18 - 19 ත් අතර ද විය. ඒ අනුව සමීක්ෂණයට ඇතුළත් වූ සිසුන්ගේ බහුතරය වයස අවුරුදු 14 - 16 ත් අතර විය. තවද සමීක්ෂණය සඳහා සහභාගි වූ සිසුවෙකුගේ සාමාන්‍ය වයස් අගය අවුරුදු 15 ක් බව සමීක්ෂණ තොරතුරු තුළින් අනාවරණය විය.

ප්‍රස්තාර 02 - සිසුන්ගේ වයස් සංයුතිය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

2.1.1 විවේක කාලය ගත කරන ආකාරය/ විනෝදාංශ

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ සිසුන්ගෙන් 99% (5036) ක් කිසියම් විනෝදාංශයක නිරත වී ඇති අතර 1% (39) ක් කිසිඳු විනෝදාංශයක යෙදී නොමැත. තවද සිසුන්ගේ විනෝදාංශ පිළිබඳ අධ්‍යයනය කළ විටදී ඔවුන් බහුවිධ විනෝදාංශ වල නිරත වී ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාරය 03 - සිසුන්ගේ විනෝදාංශ



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

විවේක කාලයේදී කිසියම් විනෝදාංශයක යෙදුණු සිසුන් සැළකූ විටදී ඔවුන්ගෙන් 59% (2985) ක් සිය විනෝදාංශය ලෙස ක්‍රීඩා කටයුතුවල යෙදී ඇති බවත්, සිසුන් 36% (1801) ක් රූපවාහිනී නැරඹීමත්, 33% (1656) ක් පොත්පත් කියවීමත් තම විනෝදාංශය කරගෙන ඇති බව අනාවරණය විය. මිතුරන් ඇසුරු කිරීම හා චිත්‍රපට නැරඹීම සිය විනෝදාංශ කරගත් සිසුන් පිළිවෙළින් 23% (1169) ක් හා 20% (1010) ක් වූ අතර සිසුන් ගායනය/ වාදනය හෝ නර්තනය වැනි විනෝදාංශ කෙරෙහි ද යොමු වී ඇති අතර ඒ සඳහා යොමු වූ පිරිස එක් එක් විනෝදාංශය සඳහා 20% ක ට වඩා අඩු අගයක් ගෙන ඇති බව අනාවරණය විය.

2.1.2 සිසුන්ගේ පවුල් පසුබිම

සමීක්ෂණය තුළ නියැදියට ඇතුළත් වූ සිසුන්ගෙන් (5075) 92.3% (4682) ක් සිය දෙමාපියන් සමඟ තම නිවසේ ජීවත් වන අතර සිසුන් 3.3% (169) ක් තම ආච්චි/සීයා සමඟ ද, 1.4% (70) ක් වෙනත්

ඥාතියෙකුගේ නිවසේ ද, සිසුන් 3% (148) ක් කුඩම්මා හෝ සුළු පියාගේ නිවස/ බෝඩිමක/ පාසැල් නේවාසිකාගාරයක හෝ යහළුවෙකුගේ නිවසක ජීවත් වන බව අනාවරණය විය. මේ අනුව සිසුන්ගෙන් 7.2% (393) ක් දෙමාපියන් නොවන වෙනත් පිරිස් සමඟ ද ජීවත් වන බව මෙහිදී හෙළි විය.

2.1.3 දහම් පාසැල් අධ්‍යාපනය

සමීක්ෂණය තුළ නියෝජනය වූ පාසැල් සිසුන්ගේ දහම් පාසැල් අධ්‍යාපනය පිළිබඳ විමර්ශනය කරන ලද අතර සමීක්ෂණයට ඇතුළත් සමස්ත සිසුන්ගෙන් සිසුන් 67% (3423) ක් දහම් පාසැල් අධ්‍යාපනය ලබන අතර සිසුන් 1652 (33%) ක් දහම් අධ්‍යාපනය නොලබන බව සමීක්ෂණය තුළින් අනාවරණය විය. පාසැල් සිසුන් දහම් පාසැල් අධ්‍යාපනය ලැබීම සහ දහම් අධ්‍යාපනය නොලැබීම සම්බන්ධ හේතු සමීක්ෂණයේ දී තවදුරටත් විමසා බලන ලද අතර එයට හේතු ලෙස සිසුන් ඉදිරිපත් කරන ලද අදහස් පහත පරිදි විය.

වගුව 04 - පාසැල් සිසුන්ගේ දහම් පාසැල් අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය

දහම් පාසැල් අධ්‍යාපනය ලැබීමට හේතු	දහම් පාසැල් අධ්‍යාපනය නොලැබීමට බලපා ඇති හේතු
➢ ගුණ දහම්/ හොඳ පුරුදු ඉගෙන ගැනීමට	➢ දහම් අධ්‍යාපනය ලැබීමට ඇති අකැමැත්ත
➢ දහම් අවබෝධය ලබාගැනීමට	➢ පාසැල් අධ්‍යාපනය නිසා අවිවේකී වීම
➢ ගුණ ගරුක දරුවකු වීමට	➢ උපකාරක පංතිවලට සහභාගී වීම
➢ හොඳ නරක ඉගෙන ගැනීමට	➢ අ.පොෘ.ස. (සා/පෙළ, (උ/පෙළ) විභාග සඳහා සූදානම් වීම
➢ දහම් අධ්‍යාපනය ලැබීමට තිබෙන කැමැත්ත නිසා	➢ තමා ජීවත්වන ප්‍රදේශයේ ආසන්න ආගමික ස්ථානයක් නොමැති වීම
➢ ධර්මය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කරගැනීමට	➢ අවශ්‍ය පොත්පත්, ඇඳුම් මිලදී ගැනීමට මුදල් නොමැති වීම
➢ ධර්මාචාර්ය විභාගයට වැදගත් වන නිසා	➢ දහම් අධ්‍යාපනය ලබාදීම සඳහා ආගමික ස්ථානයේ ගුරුවරුන් නොමැති වීම
➢ පාසල් අධ්‍යාපනයට වැදගත් වන නිසා	➢ පදිංචි ස්ථානය මාරු වීම
➢ දහම් අවබෝධය ජීවිතයට අවශ්‍ය නිසා	➢ උසස් පෙළට නියමිතව දහම් පාසල් නොපැවැත්වීම
➢ මනස දියුණු කරගැනීම සඳහා	➢ උදාසීන බව
➢ ජීවිතය සාර්ථක කරගැනීමට	
➢ ආගමික භක්තිය නිසා	

මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

දහම් පාසැල් අධ්‍යාපනය ලබන සිසුන් තුළ දහම් අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් ධනාත්මක සිතුවිලි පවතින බව ඉහත ප්‍රකාශ තුළින් පැහැදිලි වේ.

දහම් පාසැල් අධ්‍යාපනය නොලබන්නේ යැයි ප්‍රකාශ කළ බහුතරයක් සිසුන්ගෙන් දහම් පාසැල් අධ්‍යාපනය නොලැබීමට හේතු ලෙස "පාසැල් අධ්‍යාපනය නිසා අවිවේකී වීම", "උපකාරක පංතිවලට සහභාගී වීම", "විභාග සඳහා සූදානම් වීම (අ.පොෘ.ස. සා/පෙළ , අ.පොෘ.ස. උ/පෙළ)" වැනි කරුණු අධ්‍යයනය තුළින් අනාවරණය විය. පවතින තරගකාරී පාසැල් අධ්‍යාපන ක්‍රමය සමඟ බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි සිසුන්ගේ උනන්දුව අඩුවීම හමුවේ දහම් අධ්‍යාපනය ලැබීමට සිසුන් යොමු වීමේ අඩු ප්‍රවණතාවක් දක්නට ඇත.

සමාජ විරෝධී සහ නීතිවිරෝධී චර්යාවන්ට යොමු නොවී යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට පුද්ගලයා තුළ අධ්‍යාත්මික නැඹුරුව ඇති කරගැනීම ඉතා වැදගත් අතර එමෙන්ම පුද්ගලයා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු නොවී සිටීමට දහම් පාසැල් අධ්‍යාපනය වැදගත් වන බව බොහෝ විද්වතුන්ගේ අදහසයි.

2.2 පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය පිළිබඳ අනාවරණයන්

අධ්‍යයනයට භාජනය කළ පාසැල් සිසුන් 5,075 ක් අතර **කෙදිනක හෝ කිසියම් මත්ද්‍රව්‍යයක්** අත්හදා බලා තිබේ ද? යන්නත්, **දැනට** සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වරූපය කෙබඳුද? යන්නත් පිළිබඳව මෙහිදී විමර්ශනය කරන ලදි.

සමීක්ෂණය තුළ නියැදියට සසම්භාවී ලෙස තේරී පත් වූ මුළු සිසුන්ගෙන් 16% (787) ක් කිසියම් දිනක කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබුණු අතර සිසුන්ගෙන් බහුතරයක් එනම් 84% (4288) ක් කිසිඳු දිනක කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කර නොතිබුණ බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. මෙයින් පැහැදිලි වන්නේ, බහුතරයක් සිසුන් මත්ද්‍රව්‍ය සඳහා යොමු වී නොමැති බවයි.

2.2.1 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ සංයුතිය

එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබූ (787) සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ වර්තමාන තත්ත්වය සළකා බලන විටදී, එක් දිනක් පමණක් මත්ද්‍රව්‍ය භාවිතය අත්හදා බැලූ සිසුන් 47% (371) ක් ද, දින කිහිපයක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 27% (210) ක් ද, අවස්ථානුකූලව මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 20% (159) ක් ද, නිතරම මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 6% (47) ක් ද අනාවරණය විය. ඒ අනුව එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ගෙන් බහුතරය මත්ද්‍රව්‍ය අත්හදා බැලීම පමණක් සිදුකර ඇති අතර සෙසු පිරිස වර්තමානයේ දී (දැනට) මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් බව මෙහිදී නිගමනය කළ හැකිය.

ප්‍රස්තාරය 04 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ස්වභාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

තවද සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 7% (371) ක් වූ බවත්, එය 6.3% - 7.7% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවත් ප්‍රකාශ කළ හැකිය. තවද දින කිහිපයක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 4% ක් වූ අතර එය 3.46% - 4.54% ත් අතර පරාසයේ පවතී. ඉඳහිට මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 3% ක් සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එය 2.53% - 3.47% ත් අතර පරාසයක පවතී. සමීක්ෂණය තුළ කිසියම් හෝ මත්ද්‍රව්‍යක් නිතරම භාවිත කරන සිසුන් 1% ක් වූ අතර එය 0.73% - 1.27% ත් අතර පරාසයේ පවතින බවත් අනාවරණය විය.

සමස්තයක් ලෙස ගත් විට, දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 4% ක් වූ අතර එය 3.46% - 4.54% ත් අතර පරාසයේ පවතියි. දැනට මත්ද්‍රව්‍ය භාවිත නොකරන කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් අත්හදා බැලීම පමණක් කළ සිසුන් 11.4% ක් බව සමීක්ෂණය තුළින් අනාවරණය විය. තවද එය 10.53% - 12.27% ත් අතර පරාසයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය.

2.2.2 සිසුන්ගේ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය

සිසුන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සැළකූ විටදී, සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ සිගරැට් භාවිත කර ඇති සිසුන් 5.52% (280) ක් වූ අතර එය 4.89% - 6.15% ත් අතර පරාසයේ පවතී. මද්‍යසාර භාවිත කළ සිසුන් 5.08%(258) ක් සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එය 4.48% - 5.69% ත් අතර පරාසයේ පවතී. තවද එක් දිනක් හෝ බියර් භාවිත කර ඇති සිසුන් 2.25% (114) ක් වූ අතර එය 1.84% - 2.65% ත් අතර පරාසයේ පවතී.

වගුව 05 - එක් දිනක් හෝ භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ ඇස්තමේන්තුගත ප්‍රතිශතයන්

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත ඇස්තමේන්තුගත ප්‍රතිශතය %	පහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය % (95% CI)	ඉහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය % (95% CI)
සිගරැට්	5.52%	4.89%	6.15%
මද්‍යසාර	5.08%	4.48%	5.69%
දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන	3.03%	2.56%	3.51%
බියර්	2.25%	1.84%	2.65%
බාබුල්	0.69%	0.46%	0.92%
පුවක් වර්ග (මාවා)	1.00%	0.73%	1.28%
මදනමෝදක	0.12%	0.02%	0.21%
ගංජා	0.51%	0.32%	0.71%
කොරෙක්ස් ඩී	0.02%	0.00%	0.06%
පෙතිවර්ග	0.16%	0.05%	0.27%
හෙරොයින්	0.04%	0.00%	0.09%
වෙනත්	0.67%	0.45%	0.89%

මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සිගරැට්, බියර් හා මද්‍යසාර හැරුණු විට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා විවිධ පුවක් වර්ග භාවිත කිරීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය. එක් දිනක් හෝ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කර ඇති සිසුන් 3.03% (154) ක් සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර එය 2.56% ත් 3.51% ත් අතර පරාසයක පවතී. එක් දිනක් හෝ පුවක් වර්ග භාවිත කර ඇති සිසුන් 1% (51) ක් සිටි අතර එය 0.73% ත් 1.28% ත් අතර ප්‍රාන්තරයේ පවතින බව අනාවරණය විය. තවද සිසුන් අතර බාබුල්, මදනමෝදක හා කොරෙක්ස් ඩී (පැණි වර්ග) ද එක් දිනක් හෝ භාවිත කර ඇති සිසුන් ද සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රතිශත අගයන් පිළිවෙළින් 0.69% ක්, 0.12% ක් හා 0.02% ක් විය.

සිසුන් අතර අන්තරායකර ඖෂධ ලෙස ගැනෙන ගංජා හා මනෝවර්තක ගණයේ ඖෂධවල ද කිසියම් ව්‍යාප්තියක් පෙන්නුම් කළ අතර සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.51% (26) ක් එක් දිනක් හෝ ගංජා භාවිත කර ඇති අතර එය 0.32% ත් 0.71% ත් අතර පරාසයේ පිහිටන අතර 0.04% (02) ක් එක් දිනක් හෝ හෙරොයින් භාවිත කර ඇති අතර එය 0.09% ක් දක්වා උපරිම විය හැකිය. එක් දිනක් මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) අනිසි ලෙස භාවිත කර ඇති සිසුන් 0.16% (8) ක් අනාවරණය වූ අතර එය 0.05% - 0.27% ත් අතර පරාසයේ පැවතිණි.

සිසුන් එක් දිනක් හෝ භාවිත කර ඇති එක් එක් මත්ද්‍රව්‍ය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයේ දී සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළම ප්‍රචලිත අගය සිගරැට් වන අතර ඊට අමතරව මද්‍යසාර, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව ද ප්‍රවණතාවයක් පවතින බව අනාවරණය විය.

සිසුන් අතර බාබුල්, ගංජා හා විවිධ පුවක් වර්ග භාවිතයේ ද යම් ප්‍රවණතාවක් පවතින නමුත් එය සිගරැට්, මද්‍යසාර හා බියර් භාවිතයේ ප්‍රවණතාවට වඩා සාපේක්ෂව අඩු ප්‍රවණතාවක් පෙන්වා ඇත. මදනමෝදක හා මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) සම්බන්ධව ද ඉතා සුළු ප්‍රවණතාවක් පවතින බවත් අනාවරණය විය.

වගුව 06 - දැනට භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ ඇස්තමේන්තුගත ප්‍රතිශතයන්

මත්ද්‍රව්‍ය වර්ගය	දැනට භාවිත කරන ඇස්තමේන්තුගත ප්‍රතිශතය %	පහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය% (95% C.I)	ඉහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය % (95% C.I)
සිගරැට්	2.09%	1.70%	2.48%
මද්‍යසාර	1.62%	1.27%	1.96%
බියර්	0.79%	0.54%	1.03%
දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන	1.02%	0.75%	1.30%
බාබුල්	0.14%	0.04%	0.24%
මදනමෝදක	0.08%	0.00%	0.16%
පුවක් වර්ග (මාවා)	0.45%	0.27%	0.64%
ගංජා	0.30%	0.15%	0.44%
පෙති වර්ග	0.06%	0.00%	0.13%
වෙනත්	0.18%	0.06%	0.29%

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ වර්තමාන තත්ත්වය සළකන විටදී, සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරැට් භාවිත කරන සිසුන් 2.1% (106) ක් වාර්තා වී ඇති අතර එය 1.7% - 2.5% ත් අතර පරාසයේ පවතී. දැනට මද්‍යසාර භාවිත කරන සිසුන් 1.6% (82) ක් සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර, එය 1.3% - 2.0% ත් අතර ප්‍රාන්තරයේ පැවති බවත්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව එම අගය 1.03% (52) ක් වූ අතර එය 0.75% - 1.3% ත් අතර ප්‍රාන්තරයේ පවතින බව අනාවරණය විය. ඒ අනුව දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රතිශත අගය සිගරැට් සම්බන්ධයෙන් ද, ඊට අමතරව මද්‍යසාර හා දුම්කොළ ආශ්‍රිතව පවතින බව ද අනාවරණය විය. සිසුන් තුළ දැනට භාවිතයේ පවතින අඩු ප්‍රචලිත බවක් පෙන්වන අනෙකුත් මත්ද්‍රව්‍ය අතර බියර් (0.78%) හා පුවක් වර්ග (මාවා) (0.45%) ද දැක්විය හැකිය. බාබුල් (014%) හා මදනමෝදක (0.08%) සම්බන්ධයෙන් ද සිසුන් අතර ඉතා සුළු ප්‍රචලිත බවක් ඇති බව හඳුනාගත හැකි අතර එය දැනට භාවිතයේ ඇති එක් එක් මත්ද්‍රව්‍ය අතර අඩුම ප්‍රචලිත බව පෙන්නුම් කරනු ලැබේ.

ප්‍රස්තාරය 05 - සිසුන් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.3% (15) ක් ගංජා භාවිත කරන ලද අතර එය 0.15% - 0.45% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවත් සංඛ්‍යානමය වශයෙන් තහවුරු කර ගන්නා ගන්නා ලදි. ගංජා වලට අමතරව සිසුන් අතර මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) භාවිතයේ ද ඉතා සුළු ප්‍රවණතාවක් ඇතිබව අනාවරණය විය. එය සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.06% (3) ක් විය.

2.2.3 සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට පෙළඹුණු සාධක හා ස්ථාන

පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමට පෙළඹී ඇත්තේ කුමන අවස්ථා වලදී ද යන්න සමීක්ෂණය තුළින් විමසා බලන ලද අතර එය පහත පරිදි වේ. එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන්ට (787) ප්‍රතිශතයක් ලෙස බහුතරයක්, එනම් 45% (353) ක් විවාහ උත්සව, අවමඟුල් උත්සව වැනි උත්සව අවස්ථා වලදී මත්ද්‍රව්‍ය අත්හදා බලා තිබුණි. 33% (262) ක් විනෝද චාරිකා අවස්ථා වලදී ද 21% (168) ක් ගමේදී යහළුවන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. 19% (146) ක් පාසැලේ විවිධ අවස්ථාවලදී ද, 5% (41) ක් දුම්රිය හෝ බස් නැවතුම්පළේදී ද, 10% (79) ක් වෙනත් විවිධ මත්ද්‍රව්‍ය ද අත්හදා තිබුණ බව අනාවරණය විය.

ප්‍රස්තාරය 06 - සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට යොමු වී ඇති අවස්ථා



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

එක් දිනක් හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ගෙන් බහුතරයක් විවාහ උත්සව, අවමඟුල් උත්සව වැනි අවස්ථාවන්හි දී කුමන හෝ මත්ද්‍රව්‍යයක් අත්හදා බලා තිබුණි. එවැනි අවස්ථාවන්හි දී මත්ද්‍රව්‍යයක් අත්හදා බැලූ සිසුන්ගෙන් 31% (117) ක් සිගරැට් භාවිත කර තිබුණු අතර, මද්‍යසාර 31% (110) සහ බියර් 25% (89) භාවිත කර තිබූ බවට තොරතුරු අනාවරණය විය.

තවද විනෝද චාරිකා අවස්ථා වලදී මත්ද්‍රව්‍ය අත්හදා බලන ලද සිසුන්ගෙන් ද ඉහළම ප්‍රතිශතයක් එනම්, 47% (124) ක් සිගරැට් ද, 24% (65) ක් මද්‍යසාර ද අත්හදා ඇති අතර පාසැලේ විවිධ අවස්ථාවලදී දී මත්ද්‍රව්‍ය අත්හදා බලන ලද සිසුන්ගෙන් ඉහළම ප්‍රතිශතය, එනම් 54% (79) ක් සිගරැට් සඳහා ද, 30% (44) ක් මද්‍යසාර සඳහා ද විය.

මේ අනුව විවිධ උත්සව අවස්ථා, විනෝද චාරිකා හා පාසැලේ විවිධ අවස්ථාවලදී ද ප්‍රධාන වශයෙන් සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට යොමු වී තිබුණ බවත්, එහිදී ඔවුන් වැඩිම වශයෙන් සිගරැට් සඳහා පෙළඹී තිබුණ අතර ඊට අමතරව මද්‍යසාර, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ද අත්හදා බලා තිබුණ බව අනාවරණය විය.

2.3 දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය

එක් එක් දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය, භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ගයන් හා එහි ව්‍යාප්තිය පහත වගුව මඟින් නිරූපණය කරයි. තවද එමඟින් සිසුන් විසින් දැනට (ඉඳහිට හෝ නිතරම) භාවිත මත්ද්‍රව්‍ය වර්ග, එක් එක් දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට සහභාගි කරගත් මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දක්වා ඇති අතර 95% විශ්‍රම්භ මට්ටමක් (Confidence Intervel) යටතේ එම ප්‍රතිශතයන්හි ඉහළ හා පහළ අගයන් ද දක්වා ඇත.

වගුව 07 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා භූගෝලීය ව්‍යාප්තිය

		සිගරට්	මද්‍යසාර	බියර්	ගුම්කුඩු	බාබුල්	මෝදක	පුවක්	ගංජා	පෙති	වෙනත්
කොළඹ	තනි	3.16%	1.58%	0.24%	0.49%	0.24%	-	0.61%	0.37%	0.24%	-
	පහළ	1.97%	0.73%	0.00%	0.01%	0.00%	-	0.08%	0.00%	0.00%	-
	ඉහළ	4.36%	2.43%	0.58%	0.96%	0.58%	-	1.14%	0.78%	0.58%	-
ගම්පහ	තනි	1.54%	1.84%	1.08%	0.61%	0.31%	-	0.77%	0.15%	-	-
	පහළ	0.59%	0.81%	0.28%	0.01%	0.00%	-	0.10%	0.00%	-	-
	ඉහළ	2.48%	2.88%	1.87%	1.22%	0.73%	-	1.44%	0.45%	-	-
කළුතර	තනි	1.27%	0.76%	0.76%	1.52%	-	-	0.51%	-	-	-
	පහළ	0.16%	0.00%	0.00%	0.31%	-	-	0.00%	-	-	-
	ඉහළ	2.37%	1.62%	1.62%	2.73%	-	-	1.21%	-	-	-
ගාල්ල	තනි	1.25%	0.50%	-	-	-	-	-	-	-	0.25%
	පහළ	0.16%	0.00%	-	-	-	-	-	-	-	0.00%
	ඉහළ	2.33%	1.19%	-	-	-	-	-	-	-	0.74%
හම්බන්තොට	තනි	2.71%	1.94%	-	1.94%	-	-	-	-	-	-
	පහළ	0.73%	0.26%	-	0.26%	-	-	-	-	-	-
	ඉහළ	4.70%	3.62%	-	3.62%	-	-	-	-	-	-
කුරුණෑගල	තනි	0.78%	1.09%	0.78%	1.24%	0.16%	-	0.31%	-	-	0.16%
	පහළ	0.10%	0.29%	0.10%	0.39%	0.00%	-	0.00%	-	-	0.00%
	ඉහළ	1.45%	1.89%	1.45%	2.09%	0.46%	-	0.74%	-	-	0.46%
පුත්තලම	තනි	1.94%	3.24%	2.91%	0.65%	0.32%	0.97%	1.29%	1.29%	-	0.65%
	පහළ	0.40%	1.26%	1.04%	0.00%	0.00%	0.00%	0.03%	0.03%	-	0.00%
	ඉහළ	3.48%	5.21%	4.79%	1.54%	0.96%	2.06%	2.56%	2.56%	-	1.54%
මහනුවර	තනි	2.66%	2.66%	1.33%	1.52%	0.19%	-	0.95%	0.76%	0.19%	0.19%
	පහළ	1.28%	1.28%	0.35%	0.47%	0.00%	-	0.12%	0.02%	0.00%	0.00%
	ඉහළ	4.03%	4.03%	2.31%	2.56%	0.56%	-	1.78%	1.50%	0.56%	0.56%
මොණරාගල	තනි	3.17%	3.80%	3.80%	2.53%	-	-	-	1.27%	-	0.63%
	පහළ	0.44%	0.82%	0.82%	0.08%	-	-	-	0.00%	-	0.00%
	ඉහළ	5.89%	6.78%	6.78%	4.98%	-	-	-	3.01%	-	1.87%
රත්නපුර	තනි	0.24%	0.24%	0.24%	1.95%	-	0.24%	-	0.00%	-	-
	පහළ	0.00%	0.00%	0.00%	0.61%	-	0.00%	-	0.00%	-	-
	ඉහළ	0.72%	0.72%	0.72%	3.29%	-	0.72%	-	0.00%	-	-
අනුරාධපුර	තනි	5.98%	2.39%	-	1.20%	-	-	-	-	-	1.20%
	පහළ	3.04%	0.50%	-	0.00%	-	-	-	-	-	0.00%
	ඉහළ	8.91%	4.28%	-	2.54%	-	-	-	-	-	2.54%
යාපනය	තනි	2.81%	1.21%	-	-	-	-	-	0.40%	-	-
	පහළ	0.76%	0.00%	-	-	-	-	-	0.00%	-	-
	ඉහළ	4.86%	2.56%	-	-	-	-	-	1.19%	-	-

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

2.3.1 අනුරාධපුර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවලිත බවක් ඇති දිස්ත්‍රික්ක තෝරාගෙන මෙම සමීක්ෂණය සිදුකරනු ලැබිණ. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට (251) ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 24% (61) ක් වාර්තා වූ අතර එය 19% - 30% ත් අතර පරාසයේ පවතින බවට තහවුරු වී ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවලිත බව සිගරැට් සම්බන්ධව පැවති අතර එය සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 18.3% (46) ක් විය. මද්‍යසාර සඳහා එම අගය 6.4% (16) ක් ද, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු/ දුම්කොළ) 4.8% (12) ක් ද අනාවරණය විය. තවද බාබුල් භාවිතයේ කිසියම් ප්‍රවණතාවක් පවතින අතර එම අගය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.8% (2) ක් විය. තවද ගංජා භාවිතයේ ද යම් ප්‍රවණතාවක් ද පවතින බවට කරුණු හෙළි විය. ගංජා සඳහා එම අගය 0.4% (1) ක් වන අතර එය උපරිම වශයෙන් 1.17% දක්වා වෙනස්විය හැකි බව ද ප්‍රකාශ කළ හැකිය.

වගුව 08 - අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	18.3%	5.98%
මද්‍යසාර	6.4%	2.39%
බියර්	0.4%	-
දුම්කුඩු	4.8%	1.20%
බාබුල්	0.8%	-
මෝදක	0.0%	-
පුවක්	0.0%	-
ගංජා	0.4%	-
පෙති	0.0%	-
වෙනත්	2.4%	1.20%

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට ලක් කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 7.2% (18) ක් සිටින අතර එය 4.0% - 10.4% ත් අතර පරාසයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

සිසුන් විසින් දැනට භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය පිළිබඳව සැළකූ විටදී, මෙම දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට (251) ප්‍රතිශතයක් ලෙස 6% (15) ක් දැනට සිගරැට් භාවිත කරන අතර එය 3% - 8.9% ත් අතර ප්‍රාන්තරයේ පවතින අතර මෙම දිස්ත්‍රික්කයේ සිසුන් තුළ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර සිගරැට් භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් දැකිය හැකිය. සිගරැට් වලට අමතරව මද්‍යසාර 2.3% (6) ක් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු - 1.19% (3)) වලද යම් ප්‍රවණතාවක් දක්නට ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

2.3.2 මොණරාගල දිස්ත්‍රික්කය

අනුරාධපුර දිස්ත්‍රික්කය හැරුණ විටදී මොණරාගල දිස්ත්‍රික්කය තුළ ද සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවලිත බවක් දක්නට ලැබුණි. මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන් (158) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 19% (30) ක් සිටින බවට අනාවරණය වූ අතර එය 13% - 25% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 9.5% (15) ක් එක් දිනක් හෝ මද්‍යසාර වර්ග භාවිත කර ඇති අතර එම අගය 4.92% - 14.06% ත් අතර පවතී. තවද සිගරැට්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බියර් යන එක් එක් මත්ද්‍රව්‍ය වර්ග කෙරෙහි ද ප්‍රවණතාවක් පවතී. එම අගයන් පිළිවෙළින් 8.2% (13), 7.6% (12) හා 8.9% (14) ක් විය. එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 1.3% ක්

සිටින බව අනාවරණය විය. එම අගය උපරිම වශයෙන් 3.0% ක් දක්වා වෙනස් විය හැකි බවට ප්‍රකාශ කළ හැකි විය.

වගුව 09 - මොණරාගල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	8.2%	3.17%
මද්‍යසාර	9.5%	3.80%
බියර්	8.9%	3.80%
දුම්කුඩු	7.6%	2.53%
බාබුල්	0.0%	-
මෝදක	0.6%	-
පුවක්	0.0%	-
ගංජා	1.3%	1.27%
පෙති	0.0%	-
වෙනත්	0.6%	0.63%

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන් (158) ට ප්‍රතිශතයක් ලෙස දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 7.0% (11) ක් වන අතර එය 3.0% - 10.9% ත් අතර ප්‍රාන්තරයේ පිහිටා ඇත. මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඉහළම ප්‍රවණතාව මද්‍යසාර හා බියර් සඳහා පවතින අතර මද්‍යසාර හා බියර් සඳහා එම අගයන් 3.8% බැගින් විය. තවද සිගරැට් හා දුම්කොළ නිෂ්පාදන සම්බන්ධව ද යම් ප්‍රවණතාවක් පවතින අතර මෙම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරැට් භාවිත කරන සිසුන් 3.2% (5) ක් ද, දුම්කොළ නිෂ්පාදන (දුම්කුඩු) භාවිත කරන සිසුන් 2.5% (4) ක් ද වශයෙන් අධ්‍යයනය තුළින් අනාවරණය විය.

මොණරාගල දිස්ත්‍රික්කය තුළ සිසුන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයෙහි ගංජා භාවිතයේ ද යම් ප්‍රවණතාවක් හඳුනා ගත හැකි අතර එය ප්‍රතිශතයක් ලෙස 1.27% (2) ක් බවත් හෙළි විය.

2.3.3 පුත්තලම දිස්ත්‍රික්කය

සමීක්ෂණයට භාජනය කළ අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව පුත්තලම දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ තරමක ඉහළ ප්‍රවණතාවක් දක්නට ඇත. පුත්තලම දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (309) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 19.1% (59) ක් අනාවරණය වූ අතර, එම අගය 15% - 23% ත් අතර පරාසයේ පවතී. පුත්තලම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන් ප්‍රතිශතයක් ලෙස 5.8% (18) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර, එම අගය 3.2% - 8.4% ත් අතර පවතී.

වගුව 10 - පුත්තලම දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	4.5%	1.94%
මද්‍යසාර	8.7%	3.24%
බියර්	4.5%	2.91%
දුම්කුඩු	2.6%	0.65%
බාබුල්	1.3%	0.32%
මෝදක	1.0%	0.97%
පුවක්	1.9%	1.29%
ගංජා	1.6%	1.29%
පෙති	0.3%	-
වෙනත්	2.3%	0.65%

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

පුත්තලම දිස්ත්‍රික්කය තුළ සිසුන් එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතරින් ඉහළම ප්‍රචලිත බවක් මද්‍යසාර සම්බන්ධයෙන් පවතින අතර එය 8.7% (27) කි. තවද එම අගය 5.58% - 11.88% ත් අතර පවතින බවට ප්‍රකාශ කළ හැකිය. මද්‍යසාර වලට අමතරව සිගරැට් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කළ සිසුන් පුත්තලම දිස්ත්‍රික්කය තුළින් හමු වූ අතර දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් 4.5% (14) ක් හා 2.6% (8) ක් විය. තවද බියර් සඳහා එම අගය 4.5% (14) ක් ද, බාබුල් 1.3% (4) ක් ද, පුවක් වර්ග 1.9% (6) ක් ද බව සමීක්ෂණය තුළින් හෙළිවිය. සමීක්ෂණය තුළින් පුත්තලම දිස්ත්‍රික්කයේ එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 1.6% (5) ක් අනාවරණය වූ අතර එම ප්‍රතිශත අගය 3.02% දක්වා උපරිම විය හැකි බව සංඛ්‍යානමය වශයෙන් ප්‍රකාශ කළ හැකිය. ඊට අමතරව විවිධ ඖෂධ (පෙති වර්ග) අනිසි ලෙස භාවිත කළ සිසුන් ද 0.3% (1) ක් අනාවරණය වූ අතර එය උපරිම වශයෙන් 0.95% ක් දක්වා වෙනස් විය හැකිය. තවද මදනමෝදක හා වෙනත් මත්ද්‍රව්‍ය එක් දිනක් හෝ භාවිත කළ සිසුන් ඉතා සුළු වශයෙන් පුත්තලම දිස්ත්‍රික්කය තුළින් අනාවරණය විය.

පුත්තලම දිස්ත්‍රික්කයේ සිසුන් අතර දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර වඩා ප්‍රචලිතම මද්‍යසාර බව හෙළි විය. එය 3.24% (10) ක් විය. මද්‍යසාර හැරුණු විට බියර් හා සිගරැට් සම්බන්ධව ද යම් ප්‍රවණතාවක් පවතින අතර බියර් හා සිගරැට් සඳහා එම අගයන් පිළිවෙළින් 2.9% (9) ක් හා 1.9% (6) ක් විය. තවද දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, පුවක් වර්ග, බාබුල් හා මදනමෝදක යන මත්ද්‍රව්‍ය ද මෙම දිස්ත්‍රික්කය තුළ ප්‍රචලිතව පවතින අතර එම එක් එක් මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිශත අගයන් පිළිවෙළින් 0.65% (2), 1.3% (4), 0.3% (1) හා 1% (3) ක් විය. තවද එම දිස්ත්‍රික්කයේ දක්නට ලැබූ සුවිශේෂී තත්ත්වයක් වන්නේ, සිසුන් තුළ දැනට ගංජා භාවිතයේ සැළකිය යුතු ප්‍රවණතාවක් පැවතීමයි. සමීක්ෂණයට ලක් කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 1.3% (4) ක් දැනට ගංජා භාවිත කරන බවත්, එය 0.03% - 2.5% ත් අතර පරාසයේ පවතින බවත් ප්‍රකාශ කළ හැකිය.

2.3.4 හම්බන්තොට දිස්ත්‍රික්කය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය අනුරාධපුර, මොණරාගල, පුත්තලම යන දිස්ත්‍රික්ක වලට වඩා අඩු ප්‍රචලිත බවක් දක්නට ලැබුණ ද, තෝරාගත් අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රතිශත අගයන් පෙන්වයි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 10.9% (28) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බව අනාවරණය විය.

එක් දිනක් හෝ භාවිත කළ එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සැළකූ විටදී, ඉහළ ප්‍රචලිත බවක් සිගරැට් සම්බන්ධව දැකිය හැකි අතර, එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 5.0% (13) ක් වූ අතර, එය 2.37% - 7.70% ත් අතර පවතී. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍යවල ව්‍යාප්තිය, අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව අඩු බවක් දක්නට ඇති අතර ළමුන් අතර

මද්‍යසාර, දුම්කොළ ආශ්‍රිත මත්ද්‍රව්‍ය හා බාබුල් සඳහා ප්‍රචලිත බවක් දක්නට ලැබුණි. දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙළින් 2.7% (7), 2.3% (6) ක් හා 0.4% (1) ක් විය. තවද එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.4% (1) ක් මෙහිදී අනාවරණය වූ අතර එම අගය උපරිම වශයෙන් 1.14% ක් දක්වා වෙනස් විය හැකි බව ද ප්‍රකාශ කළ හැකිය.

වගුව 11 - හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	5.0%	2.71%
මද්‍යසාර	2.7%	1.94%
බියර්	0.0%	-
දුම්කුඩු	2.3%	1.94%
බාබුල්	0.4%	-
මෝදක	0.0%	-
පුවක්	0.0%	-
ගංජා	0.4%	-
පෙති	0.0%	-
වෙනත්	0.0%	-

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (258) ට ප්‍රතිශතයක් ලෙස 5% (13) ක් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් දැනට භාවිත කරන අතර එය 2.4% - 7.7% ත් අතර ප්‍රාන්තරයක පවතින බව හෙළිවිය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 5.0% (13) ක් වූ අතර එම අගය 2.4% - 7.7% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය. මෙම දිස්ත්‍රික්කය තුළ සිසුන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අවධානය යොමු කරන විටදී සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඉහළම ප්‍රවණතාව සිගරැට් (2.7% (7) සම්බන්ධව දැකිය හැකි අතර මද්‍යසාර (1.9%) හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (1.9%) සඳහා ද කිසියම් ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

2.3.5 කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණය සඳහා සිසුන් 822 ක් සහභාගී වූ අතර එම සිසුන් අතරින් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 17.4% (143) ක් වාර්තා වූ අතර එය 15% - 20% ත් අතර පරාසයේ පවතී.

කොළඹ දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතර සිගරැට් සම්බන්ධයෙන් ඉහළම ප්‍රචලිත බවක් අනාවරණය වූ අතර එය කොළඹ දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 6.7% (55) ක් වූ අතර, එය 4.98% - 8.39% ත් අතර පවතී. සිගරැට් හැරුණු විටදී, මද්‍යසාර 4.5% (37) ක් ද, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) 2.7% (22) ක් ද, බියර් 1.5% (12) ක් ද සිසුන් භාවිත කළ බවට අනාවරණය විය. තවද සිසුන් බාබුල් 1.3% (11), පුවක් වර්ග (මාවා) 1.7% (14) වැනි මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි.

වගුව 12 - කොළඹ දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	6.7%	3.16%
මද්‍යසාර	4.5%	1.58%
බියර්	1.5%	0.24%
දුම්කුඩු	2.7%	0.49%
බාබුල්	1.3%	0.24%
මෝදක	0.0%	-
පුවක්	1.7%	0.61%
ගංජා	0.9%	0.37%
පෙති	0.6%	0.24%
හෙරොයින්	0.2%	-
වෙනත්	0.4%	-

මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සෙසු දිස්ත්‍රික්කයන් හා සසඳන විටදී, කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතර ගංජා, හෙරොයින් හා පෙති වර්ග කෙරෙහි යොමුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණු අතර, එම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.9% (7) ක් ද, විවිධ මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) 0.6% (5) ක් ද, හෙරොයින් අත්හදා බැලූ සිසුන් 0.2% (02) ක් ද ලෙස වාර්තා විය. තවද සමීක්ෂණයට ලක්කළ අනෙකුත් දිස්ත්‍රික්ක හා සංසන්දනය කළ විටදී, කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් තුළ එක් දිනක් හෝ මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) භාවිතයේ ඉහළම ප්‍රවණතාවය දක්නට ඇත.

කොළඹ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ පාසල් සිසුන්ගෙන් 4.5% (37) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 3.1% - 5.9% ත් අතර පවතී.

මෙම දිස්ත්‍රික්කය තුළ ද වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළම ප්‍රවණතාව සිගරැට් වන අතර, දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 3.1% (26) ක් දැනට සිගරැට් භාවිත කරන අතර එය 1.9% - 4.4% ත් අතර පරාසයේ පවති. සිගරැට් වලට අමතරව මද්‍යසාර 1.58% (13) ක් ද, බියර් 0.24% (2) ක් ද, විවිධ පුවක් වර්ග භාවිත කළ සිසුන් 0.6% (5) ක් ද, බාබුල් භාවිත කරන සිසුන් 0.24% (2) ක් ද සමීක්ෂණය තුළින් අනාවරණය විය.

තවද කොළඹ දිස්ත්‍රික්කය තුළ ගංජා හා විවිධ ඖෂධ වර්ග (පෙති වර්ග) අනිසි භාවිතයක් දක්නට ඇති අතර එය කොළඹ දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට ගංජා භාවිත කරන සිසුන් 0.36% (3) ක් අනාවරණය වූ අතර එය 0.7% දක්වා උපරිම විය හැකි බව ප්‍රකාශ කළ හැකිය. තවද ඖෂධ අනිසි භාවිතය මෙම දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට ලක් කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.24% (2) ක් වන අතර එය 0.58% ක් දක්වා උපරිම විය හැකි බව ද ප්‍රකාශ කළ හැකිය.

අනෙකුත් දිස්ත්‍රික්ක හා සසඳන විටදී කොළඹ දිස්ත්‍රික්කය තුළ පාලනයට යටත් (සිගරැට්/මද්‍යසාර යනාදී) මත්ද්‍රව්‍ය වලට සිසුන්ගේ අඩු ප්‍රවණතාවක් පැවතිය ද නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය එනම්, අන්තරායකර ඖෂධ (ගංජා, පෙති වර්ග) වලට යොමුවීමේ සාපේක්ෂ ඉහළ ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය.

කෙසේ නමුත් කොළඹ දිස්ත්‍රික්කය තුළ නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය හා පාලනයට යටත් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ව්‍යාප්තියක් පවතින බව ප්‍රකාශ කළ හැකිය. කොළඹ දිස්ත්‍රික්කය තුළ බහුවිධ මත්ද්‍රව්‍යය වර්ග ව්‍යාප්තියක් අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.

2.3.6 මහනුවර දිස්ත්‍රික්කය

මහනුවර දිස්ත්‍රික්කය තුළ සිසුන් 527 දෙනෙකු සමීක්ෂණයට භාජනය කළ අතර එම සිසුන්ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් 13.1% (69) ක් බව හෙළි වූ අතර එම අගය 10% - 16% ත් අතර පරාසයේ පවතී.

මහනුවර දිස්ත්‍රික්කය තුළ සිසුන් එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතර සමීක්ෂණයට භාජනය කළ මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 5.5% (29) ක් මද්‍යසාර භාවිත කර ඇති අතර එය 3.55% - 7.45% ත් අතර පවතින බව අනාවරණය විය. තවද එක් දිනක් හෝ සිගරැට් භාවිත කළ සිසුන් සඳහා එම අගය 5.1% (27) ක් බව ද හෙළි විය. ඉහත මත්ද්‍රව්‍ය වලට අමතරව මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් එක් දිනක් හෝ බියර්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බාබුල් භාවිත කර ඇති බව සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර එම අගයයන් පිළිවෙළින් 2.1% (11), 1.9% (10) හා 0.4% (2) ක් බව අනාවරණය විය.

වගුව 13 - මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	5.1%	2.66%
මද්‍යසාර	5.5%	2.66%
බියර්	2.1%	1.33%
දුම්කුඩු	1.9%	1.52%
බාබුල්	0.4%	0.19%
මෝදක	0.0%	-
පුවක්	0.9%	0.95%
ගංජා	0.8%	0.76%
පෙති	0.2%	0.19%
වෙනත්	0.2%	0.19%

මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

එක් දිනක් හෝ ගංජා හා පෙති වර්ග භාවිත කළ සිසුන් මහනුවර දිස්ත්‍රික්කය තුළින් අනාවරණය වූ අතර දිස්ත්‍රික්කයේ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් ගංජා හා පෙති සඳහා පිළිවෙළින් 0.8% (4) හා 0.2% (1) ක් විය.

මහනුවර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 4.7% (25) ක් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් දැනට භාවිත කරන බවත්, එය 2.9% ත්, 6.6% ත් අතර පරාසයේ පවතී. මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන් තුළ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාව සිගරැට් හා මද්‍යසාර සම්බන්ධව පවතින අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 2.66% (14) ක් බැගින් විය. දැනට බියර්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, පුවක් වර්ග හා බාබුල් භාවිතයේ ප්‍රවණතාවක් පවතින අතර මහනුවර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කළ සිසුන් පිළිවෙළින් 1.3% (7), 1.5% (8), 0.9% (5) හා 0.19% (1) ක් විය.

නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය ලෙස ගංජා හා විවිධ ඖෂධ (පෙති) වර්ග අනිසි භාවිතය කෙරෙහි ද සිසුන්ගේ යොමුවීමක් දක්නට ලැබේ. එම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.76% (4) ක් දැනට ගංජා භාවිත කරන බවත්, එය 0.02% - 1.5% ත් අතර පරාසයේ පිහිටා ඇත. තවද මහනුවර දිස්ත්‍රික්කය තුළ පෙති වර්ග භාවිතයේ ප්‍රවණතාවක් දක්නට ඇති බවත්, එය 0.19% (1) ක් වන අතර උපරිම වශයෙන් 0.56% ක් විය හැකිය.

2.3.7 ගම්පහ දිස්ත්‍රික්කය

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (651) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් 17.5% (114) ක් සිටි අතර එය 15% - 20% ත් අතර ප්‍රාන්තරයේ පවතී. ගම්පහ දිස්ත්‍රික්කයේ එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන්, භාවිත කළ

එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සළකන විටදී, එම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 6.9% (45) ක් මද්‍යසාර භාවිත කර ඇති අතර, එය 4.96% - 8.86% ත් අතර පවතී. එක් දිනක් හෝ සිගරැට්, බියර්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බාබුල් භාවිත කළ සිසුන් ද ගම්පහ දිස්ත්‍රික්කය තුළින් හමු වූ අතර එම අගයන් පිළිවෙළින් 4.3% (28), 3.6% (24), 2.5% (16) හා 1.5% (10) ක් විය. තවද ගම්පහ දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ පුවක් වර්ග (1.2% (8)) සහ කොරෙක්ස් ඩී (0.15% (1)) වැනි ඖෂධ භාවිත කළ සිසුන් ද, දින කීපයක් ගංජා අත්හදා තිබූ සිසුන් 0.2% (1) ක් ද සිටි බව අනාවරණය විය.

වගුව 14 - ගම්පහ දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	4.3%	1.54%
මද්‍යසාර	6.9%	1.84%
බියර්	3.7%	1.08%
දුම්කුඩු	2.5%	0.61%
බාබුල්	1.5%	0.31%
මෝදක	0.0%	-
පුවක්	1.2%	0.77%
ගංජා	0.2%	0.15%
පෙති	0.0%	-
වෙනත්	0.8%	-

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (651) ගෙන් 3.7% (24) දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 2.2% - 5.1% ත් අතර පරාසයේ පවතී.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිසුන් දැනට භාවිත කරන එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සැළකූ විටදී, මද්‍යසාර සම්බන්ධව සාපේක්ෂව ඉහළ අගයක් දක්නට ඇත. සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 1.8% (12) ක් මද්‍යසාර භාවිත කරන බවත්, මද්‍යසාර වලට අමතරව සිගරැට් භාවිතයෙහි ද යම් ප්‍රවණතාවක් පවතින බවත්, එය 1.5% (10) ක් විය හැකි බවත් ප්‍රකාශ කළ හැකිය. තවද දැනට බියර් භාවිත කරන සිසුන් 1% (7) ක් ද, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන සිසුන් 0.6% (4) ක් ද, විවිධ පුවක් වර්ග භාවිත කරන සිසුන් 0.77% (5) ක් ද හා බාබුල් භාවිත කරන සිසුන් 0.31% (2) ක් ද සමීක්ෂණය තුළින් අනාවරණය විය.

වර්තමානයේ ගංජා භාවිත කරන සිසුන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ අනාවරණය වූ අතර ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.15% (1) ක් දැනට ගංජා භාවිත කරන බවත්, එය 0.45% ක් දක්වා උපරිම විය හැකි බවත් ප්‍රකාශ කළ හැකිය. ගම්පහ දිස්ත්‍රික්කය තුළ ද සිසුන්ගේ වර්තමාන බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ සාපේක්ෂ ඉහළ පැතිරීමක් දක්නට ඇති අතර එය කොළඹ දිස්ත්‍රික්කයේ පැතිරීමට වඩා අඩු මට්ටමක පවතී. තවද කොළඹ දිස්ත්‍රික්කය තුළ සිසුන්ගේ ඖෂධ අනිසි භාවිතයේ ප්‍රවණතාවක් (පෙති භාවිතය) දක්නට ලැබුණි.

2.3.8 කුරුණෑගල දිස්ත්‍රික්කය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිසුන් 645 ක් සමීක්ෂණයට ලක් කළ අතර එම සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 14.3% (92) ක් විය. තවද එය 12% - 17% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට සංඛ්‍යානමය වශයෙන් ප්‍රකාශ කළ හැකිය.

එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සැළකූ විටදී, ඉහළම ප්‍රචලිත බව මද්‍යසාර 4.8% (31) සම්බන්ධව පවතින අතර මද්‍යසාර වලට අමතරව සිගරැට්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බියර් භාවිතයේ ද ප්‍රවණතාවක් පවතින බවට අනාවරණය වූ අතර මුළු සිසුන්ට

ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙළින් 4.0% (26), 4.0% (26) හා 2.0% (13) ක් විය. තවද විවිධ පුවක් වර්ග 0.9% (6) ක් ද හා බාබුල් 0.5% (3) ක් ද භාවිත කළ බවත් අනාවරණය විය.

වගුව 15 - කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	4.0%	0.78%
මද්‍යසාර	4.8%	1.09%
බියර්	2.0%	0.78%
දුම්කුඩු	4.0%	1.24%
බාබුල්	0.5%	0.16%
මෝදක	0.0%	-
පුවක්	0.9%	0.31%
ගංජා	0.3%	-
පෙති	0.2%	-
වෙනත්	0.5%	0.16%

මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිසුන් අතර විෂ මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන ගංජා හා විවිධ ඖෂධ (පෙති) වර්ග අනිසි ලෙස භාවිතයේ යම් ප්‍රවණතාවක් දක්නට ඇති අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.3% (2) ක් විය. එය 0.74% දක්වා උපරිම ද විය හැකි බව ප්‍රකාශ කළ හැකිය. තවද විවිධ ඖෂධ (පෙති) වර්ග එක් දිනක් හෝ අනිසි ලෙස භාවිත කළ සිසුන් 0.15% (1) ක් වූ අතර එය 0.46% දක්වා උපරිම විය හැකිය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට දායක කරගත් සිසුන්ගෙන් 3.3% (21) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 2% - 4.6% ත් අතර පරාසයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය. මෙම දිස්ත්‍රික්කයේ සිසුන් තුළ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව පවතින අතර මෙම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 1.2% (8) ක් දුම්කුඩු භාවිත කරන බවත්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වලට අමතරව සිගරැට් (0.78% (5)) හා මද්‍යසාර (1.1% (7)) සම්බන්ධව ද යම් ප්‍රචලිත බවක් දක්නට ඇති බවත් අනාවරණය විය. තවද සිසුන් වර්තමානය තුළ බියර්, විවිධ පුවක් වර්ග හා බාබුල් වැනි මත්ද්‍රව්‍ය භාවිත කරන අතර එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රතිශත අගයයන් පිළිවෙළින් 0.78% (5), 0.31% (2), හා 0.15% (1) ක් විය.

2.3.9 රත්නපුර දිස්ත්‍රික්කය

රත්නපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට දායක කරගත් මුළු සිසුන් (410) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් 13.2% (54) ක් බවත් එය 10% - 16% ත් අතර පරාසයේ පවතින බව දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය විය.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් අතර ඉහළම ප්‍රචලිත බව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා බව අනාවරණය විය. සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 4.9% (20) ක් එක් දිනක් හෝ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන අත්හදා බැලූ සිසුන් වන අතර එය 2.8% - 7.0% ත් අතර පරාසයේ පවතී.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ දක්නට ඇති විශේෂත්වය වන්නේ, අනෙකුත් දිස්ත්‍රික්ක වල මත්ද්‍රව්‍ය සම්බන්ධ ඉහළ ප්‍රවණතාව සිගරැට් හෝ මද්‍යසාර සම්බන්ධව වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව ඉහළ ප්‍රවණතාවක් පවතින බව ද හඳුනාගත හැකි විය.

දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) වලට අමතරව සිගරැට්, මද්‍යසාර හා බියර් භාවිතයේ ප්‍රවණතාවක් පවතින බවත්, මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම එක් එක් මත්ද්‍රව්‍ය එක් දිනක් හෝ භාවිත කළ සිසුන් පිළිවෙළින් 2.4% (10), 0.4% (2) හා 0.4% (2) ක් විය. තවද බාබුල් 0.2% (1) ක් හා මදනමෝදක 0.5% (2) ක් වූ අතර විෂ මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන ගංජා එක් දිනක් හෝ භාවිත කළ සිසුන් 0.2% (1) ක් අනාවරණය වූ අතර එය 0.72% ක් දක්වා උපරිම විය හැකි බව මෙහිදී හෙළි විය.

වගුව 16 - රත්නපුර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	2.4%	0.24%
මද්‍යසාර	0.5%	0.24%
බියර්	0.5%	0.24%
දුම්කුඩු	4.9%	1.95%
බාබුල්	0.2%	-
මෝදක	0.5%	0.24%
පුවක්	0.0%	-
ගංජා	0.2%	0.00%
පෙති	0.0%	-
වෙනත්	0.5%	-

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

රත්නපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ගෙන් 2.9% (12) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 1.3% - 4.6% ත් අතර පරාසයේ පවතී. සමීක්ෂණයට පදනම් කරගත් දිස්ත්‍රික්ක වලින් මත්ද්‍රව්‍ය භාවිතයේ අඩු ප්‍රතිශතයක් දක්වන දිස්ත්‍රික්ක අතර රත්නපුර දිස්ත්‍රික්කය හඳුනාගත හැකි විය.

සිසුන් අතර දැනට භාවිතයේ ප්‍රචලිත වී ඇති මත්ද්‍රව්‍ය සළකා බලන විටදී, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව ප්‍රමුඛතාවක් ගෙන ඇත. මෙම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා එම අගය 1.9% (8) ක් විය. තවද සිගරැට්, මද්‍යසාර, බියර් හා මදනමෝදක සඳහා වූ ප්‍රතිශතයන් 0.25% ට වඩා අඩු අගයයන් ගන්නා බැවින් එම මත්ද්‍රව්‍ය සම්බන්ධව සුළු ප්‍රවණතාවක් හඳුනාගත හැකි විය. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක හා සසඳන විට රත්නපුර දිස්ත්‍රික්කයේ සිසුන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පහළ මට්ටමක ඇති බව සමීක්ෂණ දත්ත තුළින් අනාවරණය විය.

2.3.10 යාපනය දිස්ත්‍රික්කය

යාපනය දිස්ත්‍රික්කය තුළ සිසුන් 249 ක් සමීක්ෂණයට භාජනය කළ අතර ඔවුන්ගෙන් 10% (25) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර එය 6% - 14% ත් අතර පරාසයේ පැවතිණි. යාපනය දිස්ත්‍රික්කයේ සිසුන් තුළ අනෙකුත් දිස්ත්‍රික්කවල මෙන් බහුවිධ මත්ද්‍රව්‍යයන්හි ඉහළ ව්‍යාප්තියක් දක්නට නොමැති අතර එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතරින් ඉහළම ප්‍රචලිත බව සිගරැට් සම්බන්ධයෙන් අනාවරණය විය. එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 6.4%(16) ක් වූ අතර එය 3.4% - 9.5% ත් අතර පරාසයේ පවතී. සිගරැට් වලට අමතරව මද්‍යසාර හා බියර් භාවිතයේ ද ප්‍රවණතාවක් පවතින අතර මද්‍යසාර හා බියර් සඳහා පිළිවෙළින් 3.6% (9) ක් 0.4% (1) ක් ද විය.

වගුව 17 - යාපනය දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	6.4%	2.81%
මද්‍යසාර	3.6%	1.21%
බියර්	0.4%	-
දුම්කුඩු	0.0%	-
බාබුල්	0.0%	-
මෝදක	0.0%	-
පුවක්	0.0%	-
ගංජා	0.4%	0.40%
පෙති	0.0%	-
වෙනත්	0.0%	-

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් යාපනය දිස්ත්‍රික්කයෙන් හමුවූ අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.4% (1) ක් බව සමීක්ෂණ දත්ත තුළින් අනාවරණය විය.

දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාවය සිගරැට් සම්බන්ධව දැකිය හැකි අතර එය ප්‍රතිශතයක් ලෙස 2.8% (7) ක් වූ අතර එය 0.8% - 4.9% ත් අතර පරාසයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය. තවද මද්‍යසාර සඳහා එම අගය 1.2% (3) ක් වේ.

දිස්ත්‍රික්කයේ සිසුන්ගෙන් 0.4% (1) ක් දැනට ගංජා භාවිතයේ ද කිසියම් ප්‍රවණතාවක් පවතින අතර එය අතර එය 1.19% ක් දක්වා ඉහළ අගයක් ද විය හැකිය.

2.3.11 කළුතර දිස්ත්‍රික්කය

කළුතර දිස්ත්‍රික්කය තුළ සිසුන් 394 ක් සමීක්ෂණයට ලක්කළ අතර ඔවුන්ගෙන් 15.7% (62) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර, එය 12% - 19% ත් අතර පරාසයේ පවතී.

කළුතර දිස්ත්‍රික්කයේ එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් අතර ඉහළම ප්‍රචලිත බව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව පවතින අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 4.6% (18) ක් වන අතර 2.5% - 6.6% ත් අතර ප්‍රාන්තරයේ පවතී. ඊට අමතරව මද්‍යසාර (4.3% (17)) හා සිගරැට් (3.5% (14)) සඳහා ද ප්‍රචලිත බවක් දැකිය හැකි විය. තවද සිසුන්ගෙන් බියර් සඳහා 3.0% (12) ක් ද විවිධ පුවක් වර්ග සඳහා 3.0% (12) ක් ද වශයෙන් අනාවරණය වූ අතර බාබුල් (0.3% (1) සඳහා ඉතා සුළු ප්‍රවණතාවක් ද හඳුනාගත හැකි විය. මෙම දිස්ත්‍රික්කය තුළ අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තියේ ඉහළ ප්‍රවණතාවක් දක්නට නොලැබිණි.

වගුව 18 - කළුතර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

මත්ද්‍රව්‍ය වර්ගය	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	3.6%	1.27%
මද්‍යසාර	4.3%	0.76%
බියර්	3.0%	0.76%
දුම්කුඩු	4.6%	1.52%
බාබුල්	0.3%	-
මෝදක	0.0%	-
පුවක්	3.0%	0.51%
ගංජා	0.0%	-
පෙති	0.0%	-
වෙනත්	1.0%	-

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන්ගෙන් 2.8% (11) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 1.2% - 4.4% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

දිස්ත්‍රික්කය තුළ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළම අගය සිගරැට් සම්බන්ධව දැකිය හැකි අතර එම අගය 1.26% (5) ක් විය. සිගරැට් වලට අමතරව මද්‍යසාර හා බියර් සම්බන්ධ යම් ප්‍රවණතාවක් දක්නට ඇති අතර සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස මද්‍යසාර හා බියර් සඳහා පිළිවෙළින් 0.76% (3) හා 0.76% (3) ක් විය. තවද සිසුන් අතර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා විවිධ පුවක් වර්ග භාවිතයේ ප්‍රවණතාවක් පවතින අතර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) හා පුවක් වර්ග සඳහා එම අගයන් පිළිවෙළින් 1.5% (6) ක් හා 0.51% (2) ක් විය.

2.3.12 ගාල්ල දිස්ත්‍රික්කය

ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 12.5% (401) ක් සමීක්ෂණය තුළින් අනාවරණය විය. එය 9% ත් 16% ත් අතර පරාසයේ පිහිටන බව ප්‍රකාශ කළ හැකිය.

ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ සිසුන් භාවිත කර ඇති මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාව මද්‍යසාර සඳහා වූ අතර එය 5.75% (23) විය. තවද එය 3.5% - 8% අතර පරාසයේ ද පවතින බව ද අනාවරණය විය. මද්‍යසාර වලට අමතරව සිගරැට් භාවිත කළ සිසුන් 4.5% (18) ක් ද, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිත කළ සිසුන් පිළිවෙළින් 2.5% ක් හා 1% ක් ද විය.

වගුව 19 - ගාල්ල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

	එක් දිනක් හෝ භාවිත කළ	දැනට භාවිත කරන
සිගරැට්	4.5%	1.25%
මද්‍යසාර	5.7%	0.50%
බියර්	2.5%	-
දුම්කුඩු	1.0%	-
බාබුල්	0.0%	-
මෝදක	0.0%	-
පුවක්	0.0%	-
ගංජා	0.2%	-
පෙති	0.0%	-
වෙනත්	0.5%	0.25%

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.2% (1) ක් වාර්තා වූ අතර වර්තමානයේ ගංජා භාවිත කරන සිසුන් ගාල්ල දිස්ත්‍රික්කය තුළින් අනාවරණය නොවිණි.

ගාල්ල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණය සඳහා දායක කරගත් සිසුන්ගෙන් 2.2% (9) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 0.8% ත් 3.7% ත් අතර ප්‍රාන්තරයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය. දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර සිගරැට් හා මද්‍යසාර පිළිබඳව පමණක් මෙම දිස්ත්‍රික්කය තුළ අනාවරණය විය. ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 1.25% (5) ක් සිගරැට් භාවිතයේ යෙදෙන බවත් මද්‍යසාර සඳහා එම අගය 0.5% (2) ක් බවත් හෙළි විය.

2.4. දිස්ත්‍රික්ක අනුව එක් එක් මත්ද්‍රව්‍ය වර්ගවල ප්‍රචලිත බව

සමස්තයක් ලෙස සමීක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ තෝරාගත් සියලුම දිස්ත්‍රික්කවල සිසුන් භාවිත කළ මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රචලිත බව අනාවරණය වූයේ, සිගරැට් සම්බන්ධව ය. එය සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 2.1% (106) ක් වන අතර එය 1.7% - 2.5% ත් අතර පරාසයේ පවතින බව ද අනාවරණය විය.

2.4.1 දිස්ත්‍රික්ක අනුව සිගරැට් භාවිතයේ ප්‍රචලිත බව

එක් එක් දිස්ත්‍රික්ක තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සිගරැට් භාවිතය සළකා බලන විටදී, ඉහළ ප්‍රචලිත බව අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් අනාවරණය වූ අතර ඊට අමතරව මොණරාගල හා කොළඹ දිස්ත්‍රික්කය තුළින් ද හෙළි විය.

සිතියම 02 - සිගරැට් භාවිතයේ ප්‍රවණතාව (දිස්ත්‍රික්ක අනුව)



සිගරැට් භාවිතය අඩුම ප්‍රචලිත බව රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබිණ.

2.4.2 මද්‍යසාර භාවිතයේ ප්‍රචලිත බව (දිස්ත්‍රික්ක අනුව)

සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තෝරාගත් සියලුම දිස්ත්‍රික්ක වල සිසුන් භාවිත කරන මත්ද්‍රව්‍ය අතර දෙවන ස්ථානය මද්‍යසාර සම්බන්ධව දක්නට ලැබුණු අතර එය මුළු ළමුන්ගේ ප්‍රතිශතයක් ලෙස 1.6% (82) ක් විය.

එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින් මද්‍යසාර සම්බන්ධව ප්‍රචලිත බව සළකා බැලීමේදී, ඉහළම ප්‍රචලිත බව මොණරාගල දිස්ත්‍රික්කයෙන් හඳුනාගත හැකි අතර ඊට අමතරව පුත්තලම දිස්ත්‍රික්කය තුළින් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් ද හඳුනාගත හැකිය. මද්‍යසාර සම්බන්ධ අඩුම ප්‍රචලිත බව රත්නපුර දිස්ත්‍රික්කය පෙන්නුම් කර ඇත.

සිතියම 03 - දිස්ත්‍රික්ක අනුව මද්‍යසාර භාවිතයේ ප්‍රවණතාව



2.4.3 දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිතයේ ප්‍රචලිත බව (දිස්ත්‍රික්ක මට්ටමෙන්)

සමීක්ෂණය සඳහා පදනම් කරගත් එක් එක් දිස්ත්‍රික්ක වල සිටි මුළු ළමුන්ට ප්‍රතිශතයක් ලෙස සිගරැට් හා මද්‍යසාර හැරුණු විට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සඳහා ද සිසුන් තුළ වැඩි ප්‍රවණතාවක් පැවතිණි.

ඒ අනුව මුළු සිසුන්ගෙන් 1.02% (52) ක් දුම්කුඩු භාවිත කරන බවත්, එය 0.15% - 1.3% ත් අතර පරාසයේ පවතින බවත් ප්‍රකාශ කළ හැකිය. එක් එක් දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවල ඉහළම ප්‍රචලිත බව මොණරාගල දිස්ත්‍රික්කය තුළින් ද, රත්නපුර

හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුළින් ද දක්නට ලැබිණි. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවල දැනට භාවිත සිසුන් ගාල්ල හා යාපනය දිස්ත්‍රික්ක තුළින් අනාවරණය නොවීය.

සිතියම 04 - දිස්ත්‍රික්ක අනුව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිතයේ ප්‍රවණතාව



2.4.4 දිස්ත්‍රික්ක අනුව ගංජා භාවිතයේ ප්‍රචලිත බව

ශ්‍රී ලංකාව තුළ සමීක්ෂණයට තෝරාගත් සියලුම දිස්ත්‍රික්කවල අධ්‍යයනයට භාජනය කළ සියලුම සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.3% (15) ක් දැනට ගංජා භාවිත කරන අතර එය 0.15% - 0.45% ත් අතර පරාසයේ පවතී.

එක් එක් දිස්ත්‍රික් මට්ටමින් ගත්කළ ගංජා භාවිතයේ ඉහළම ප්‍රචලිත බව පුත්තලම දිස්ත්‍රික්කයෙන් ද, ඊට අමතරව මොණරාගල දිස්ත්‍රික්කය තුළින් ද හඳුනාගත හැකි විය. පුත්තලම දිස්ත්‍රික්කය තුළ ගංජා භාවිතය ඉහළ යාමට හේතුව ශ්‍රී ලංකාවේ වයඹ දිග මුහුදු තීරය තුළින් රට තුළට ගංජා ඇතුළුවීමත්, මොණරාගල දිස්ත්‍රික්කය තුළ ගංජා භාවිතයේ ප්‍රවණතාවය ඉහළ යාමට හේතුව ලෙස නීත්‍යානුකූල නොවන ගංජා වගා කිරීම හා ඒ ආශ්‍රිත ජාවාරම් වල ප්‍රබලතාවය ලෙසත් දැක්විය හැකිය.

සිතියම 05 - දිස්ත්‍රික්ක අනුව ගංජා භාවිතයේ ප්‍රවණතාව



පුත්තලම හා මොණරාගල දිස්ත්‍රික්ක හැරුණු විටදී යාපනය, කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක වලද දැනට ගංජා භාවිතයේ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත. සමීක්ෂණය තුළ තෝරාගත් අනෙකුත් දිස්ත්‍රික්ක තුළ දැනට ගංජා භාවිත කරන සිසුන් අනාවරණය නොවීය.

2.4.5 දිස්ත්‍රික්ක අනුව වෙනත් මත්ද්‍රව්‍ය වර්ග භාවිතයේ ප්‍රචලිත බව

විෂ මත්ද්‍රව්‍ය ලෙස සිසුන් තුළ දැනට ගංජා භාවිතයේ යම් ප්‍රවණතාවක් පවතින අතර ගංජා වලට අමතරව විවිධ මනෝවර්තක ගණයේ ඖෂධ භාවිතයේ ද සුළු ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදි. සමීක්ෂණයට භාජනය කළ දිස්ත්‍රික්ක අතර දැනට මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති) භාවිතයේ ප්‍රවණතාවක් ඇති දිස්ත්‍රික්ක ලෙස කොළඹ හා මහනුවර අනාවරණය වූ අතර මෙම දිස්ත්‍රික්ක දෙකෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ සාපේක්ෂව ඉහළ ප්‍රචලිත බවක් දක්නට ඇත.

මෙම අධ්‍යයනයේ නියැදිය තුළ හෙරොයින් අත්හදා බැලූ සිසුන් දෙදෙනෙකු පමණක් හමුවිය. ඔවුන් කොළඹ දිස්ත්‍රික්කයේ වන අතර අනෙකුත් කිසිඳු දිස්ත්‍රික්කයක නියැදිය තුළ හෙරොයින් භාවිත කළ සිසුන් අනාවරණය නොවුණි.

බියර් භාවිතය සළකන විටදී, දිස්ත්‍රික්ක අතරින් ඉහළම ප්‍රවණතාව මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින අතර දෙවනුව පුත්තලම දිස්ත්‍රික්කය තුළ දක්නට ඇත. සමීක්ෂණයට භාජනය කළ දිස්ත්‍රික්ක අතරින් අනුරාධපුර, හම්බන්තොට, ගාල්ල හා යාපනය යන දිස්ත්‍රික්කවල දැනට බියර් භාවිත කරන සිසුන් පිළිබඳ අනාවරණය නොවීය.

විවිධ පුවක් වර්ග, බාබුල් හා මදනමෝදක වල ඉහළම ප්‍රචලිත බව පුත්තලම දිස්ත්‍රික්කය තුළ අනාවරණය විය. පුත්තලම දිස්ත්‍රික්කය හා කොළඹ දිස්ත්‍රික්කය තුළ බාබුල් හා පුවක් වර්ගවල ඉහළ ප්‍රචලිත බවක් දක්නට ලැබිණ.

මදනමෝදක සම්බන්ධයෙන් පුත්තලම දිස්ත්‍රික්කය හැරුණුවිට රත්නපුර දිස්ත්‍රික්කය තුළ දැනට භාවිතයේ ප්‍රචලිත බවක් දක්නට ඇත.

2.5. මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක

2.5.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා

පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා සළකා බැලීමේදී, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ස්ත්‍රී පුරුෂභාවය කෙතරම් දුරට බලපෑමක් සිදුකර තිබේද? යන්න මෙම සමීක්ෂණයේදී සළකා බලන ලදි.

සමීක්ෂණය සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවලින් සිසුන් 3166 ක් හා සිසුවියන් 1909 දෙනෙකු ගෙන් යුත් නියැදියේ සිසුන්ගෙන් 5.7% (182) ක් **දැනට** කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත්, සිසුවියන් සඳහා එම අගය 1.2% (24) ක් බවත් අනාවරණය විය.

සිසුන් හා සිසුවියන් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත ප්‍රතිශතවල වෙනසක් පවතින බව ප්‍රකාශ කළ හැකිය. එම ප්‍රතිශතයන්හි වෙනස 4.2% ක් විය. තවද එය 3.2% ත්, 5.1% ත් අතර පරාසයේ පවතින බවට ද ප්‍රකාශ කළ හැකිය. මේ අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට වඩා සිසුවියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ඉතා පහළ අගයක් ගන්නා බවට සංඛ්‍යානමය වශයෙන් ප්‍රකාශ කළ හැකිය. අවම වශයෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබූ ශිෂ්‍යයින් ප්‍රතිශතය 20% (642) ක් වූ අතර ශිෂ්‍යාවන් සඳහා එම අගය 7.5% (145) ක් විය.

ප්‍රස්තාරය 07 - මත්ද්‍රව්‍ය භාවිතය හා ස්ත්‍රී පුරුෂභාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් භාවිත කළ එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සංසන්දනය කරන විටදී සමීක්ෂණයට භාජනය කළ නියැදියේ මුළු ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන්ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරට් භාවිත කරන ප්‍රතිශත පිළිවෙළින් 2.9% (89) ක් හා 0.79% (13) ක් විය. මද්‍යසාර හා බියර් භාවිත කරන ලද ශිෂ්‍යයින් 2.3% (72) ක් හා 1.3% ක් වූ අතර ශිෂ්‍යාවන් සඳහා එම අගයන් පිළිවෙළින් 0.42% (4) හා 0.0% ක් විය. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත ශිෂ්‍යයින් 1.6% (50) ක් වූ අතර ශිෂ්‍යාවන් සඳහා එම අගය 0.1% (2) ක් විය.

ගංජා භාවිතය සළකා බැලීමේදී, සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට ගංජා භාවිත කරන ශිෂ්‍යයින් 0.4% (12) ක් වූ අතර ශිෂ්‍යාවන් 0.05% (1) ක් ද විය.

පාසැල් ශිෂ්‍යයින් විසින් ගංජා භාවිත කර තිබුණ අතර ගංජා භාවිත කළ මුළු සිසුන්ගෙන් 79% (11) ක් දේශීය ගංජා භාවිත කර තිබූ අතර 21% (3) ක් කේරළ ගංජා භාවිත කර තිබුණි. කේරළ ගංජා භාවිත

කළ සිසුන් බස්නාහිර පළාත තුළින් පමණක් වාර්තා වූ අතර දේශීය ගංජා භාවිත කළ සිසුන් සමීක්ෂණයට භාජනය කළ සියලුම පළාත් වලින් වාර්තා විය. ගංජා භාවිත කරන එක් සිසුවියක් පමණක් යාපනය දිස්ත්‍රික්කයෙන් අනාවරණය විය.

සමස්තයක් ලෙස එක්දිනක් හෝ ගංජා අත්හදා බැලූ සිසුන් සළකන විටදී, සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.72% (24) ක් එක් දිනක් හෝ ගංජා භාවිත කර තිබූ බවත්, කේරළ ගංජා සහ දේශීය ගංජා යන ගංජා දෙවර්ගයම භාවිත කළ සිසුන් 0.06% (2) ක් ද, දේශීය ගංජා භාවිත කළ සිසුන් 0.6% (20) ක් ද, කේරළ ගංජා භාවිත කළ සිසුන් 0.2% (6) ක් ද සිටි බව අනාවරණය විය. තවද හෙරොයින් එක් දිනක් හෝ අත්හදා බැලීමක් සිදුකරන ලද සිසුන් 0.06% (2) ක් සමීක්ෂණය තුළින් අනාවරණය නොවුණි.

මනෝවර්තක ගණයේ විවිධ ඖෂධ (මත්පෙති) අනිසි ලෙස භාවිත කළ සිසුන් සිටින බවට සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර සමීක්ෂණයට භාජනය කළ මුළු ශිෂ්‍යයින්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මනෝවර්තක ගණයේ ඖෂධයක් අත්හදා බැලූ සිසුන් 0.25% (8) ක් විය. ඔවුන්ගෙන් 37.5% (3) ක් දැනට මනෝවර්තක ගණයේ ඖෂධ භාවිත කරන බව මෙහිදී අනාවරණය විය. දැනට එය මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.09% (3) ක් විය. සිසුවියන් මනෝවර්තක ඖෂධ අනිසි ලෙස භාවිත කරන බවට තොරතුරු අනාවරණය නොවිණි.

සමීක්ෂණයට ලක්කළ ශිෂ්‍යයින් අතර විවිධ පුවක් වර්ග (මාවා) භාවිතයේ ද ව්‍යාප්තියක් දක්නට ඇති බව අනාවරණය විය. තවද බාබුල්, මදනමෝදක (ගංජා ආශ්‍රිත නිෂ්පාදන) භාවිත කළ ශිෂ්‍යයින් ද සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර සිසුවියන් තුළ මෙවැනි මත්ද්‍රව්‍යවල භාවිතයක් දක්නට නොලැබිණි.

මුළු ශිෂ්‍යයින් (3166) ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ පුවක් වර්ග අත්හදා බලන ලද ශිෂ්‍යයින් 1.4% (46) ක් බවත් ඔවුන්ගෙන් 50% (23) ක් දැනටත් පුවක් වර්ග භාවිත කරන බව ද හෙළි විය. සමීක්ෂණයට භාජනය කළ මුළු ශිෂ්‍යයින්ට ප්‍රතිශතයක් ලෙස දැනට (මාවා) පුවක් වර්ග භාවිත කරන ශිෂ්‍යයින් ප්‍රතිශතය 0.72% (23) ක් ද, (මාවා) පුවක් වර්ග අත්හදා බැලීමක් පමණක් සිදුකළ සිසුවියන් 0.26% (5) ක් ද සමීක්ෂණය තුළින් හඳුනාගත හැකි වූ අතර දැනට භාවිත කරන ශිෂ්‍යාවන් නියැදිය තුළ හමුනොවුණි. සමීක්ෂණයට භාජනය කළ මුළු ශිෂ්‍යයින්ට ප්‍රතිශතයක් ලෙස බීඩි හෝ සුරුට්ටු එක් දිනක් හෝ භාවිත කළ ශිෂ්‍යයින් 0.69% (23) ක් විය. දැනට බීඩි හෝ සුරුට්ටු භාවිත ශිෂ්‍යයින්ගේ ප්‍රතිශතය 0.3% (10) ක් වන අතර සිසුවියන් සඳහා එම අගයන් පිළිවෙළින් 0.21% (4) ක් හා 0.1% (2) ක් විය.

2.5.2 ජනවර්ගය අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා

සමීක්ෂණයට භාජනය කළ නියැදිය තුළ බහුතරය සිංහල (4022) ජනවර්ගය නියෝජනය කළ සිසුන් වූ අතර මුස්ලිම් හා දෙමළ ජාතික සිසුන් පිළිවෙළින් 546 ක් හා 467 ක් විය. තවද නියැදිය තුළ බර්ගර් සිසුන් 15 ක් හා මැලේ සිසුන් 22 ක් ද, වෙනත් ජාතික සිසුන් 03 ක් ද නියෝජනය විය.

නියැදිය තුළ නියෝජනය වූ මුළු සිංහල සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 15.3% (614) ක් වූ අතර මුස්ලිම් හා දමිළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙළින් 17.8% (97) ක් හා 14.6% (68) ක් විය. තවද බර්ගර් ජාතික හා මැලේ ජාතික සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 26.7% (4) ක් හා 13.6% (3) ක් විය.

ප්‍රස්තාරය 08 - ජනවර්ගය අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සමීක්ෂණයට ඇතුළත් මුළු සිංහල සිසුන්ට ප්‍රතිශතයක් ලෙස වර්තමානයේ කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිංහල සිසුන් 3.8% (153) ක් ද, දෙමළ හා මුස්ලිම් සිසුන් සඳහා එම අගයන් පිළිවෙළින් 4.1% (19 ක් හා 6.0% (33) ක් ද විය.

එසේ වුවත් වර්තමානය තුළ එක් එක් ජාතීන් අනුව බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වරූපය සළකා බලන විටදී, එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය අනුව එය තරමක් වෙනස් වේ. සිංහල හා දෙමළ ජාතික සිසුන්ට සාපේක්ෂව මුස්ලිම් ජාතික සිසුන් අතර සිගරැට්, පුවක් වර්ග හා විවිධ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතයේ ඉහළ ප්‍රචලිත බවක් දක්නට ලැබිණ. සමීක්ෂණයට භාජනය කළ මුළු මුස්ලිම් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරැට් භාවිත කරන සිසුන් 4% (22) ක් ද, පුවක් වර්ග හා පෙති භාවිතය සඳහා එම අගයන් පිළිවෙළින් 0.5% (3) ක් හා 0.37% (2) ක් ද අනාවරණය විය. එසේ වුවත් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු), මද්‍යසාර හා බියර් භාවිතය සළකන විටදී, මුස්ලිම් හා දෙමළ සිසුන්ට සාපේක්ෂව සිංහල සිසුන්ගේ ඉහළ ප්‍රචලිත බවක් දක්නට ඇත. සමීක්ෂණය සඳහා සහභාගි කරගත් මුළු සිංහල සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර හා බියර් භාවිත සිසුන් පිළිවෙළින් 1.2% (48) ක්, 1.7% (68) ක් හා 1% (40) ක් ද විය.

ප්‍රස්තාරය 09 - ජනවර්ගය අනුව සිසුන් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

ගංජා භාවිතයේ ඉහළම ප්‍රචලිත බව දමිළ (0.6%, (3)) සිසුන් තුළ ද, දෙවනුව මුස්ලිම් සිසුන් (0.4%, (2)) හා තෙවනුව සිංහල (0.2%, (10)) සිසුන් තුළ ද දක්නට ලැබිණ.

2.5.3 ආගම අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා

එක් එක් ආගම් වලට අදාළව සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන්ගේ ඉහළම ප්‍රතිශතය ක්‍රිස්තියානි ආගමට අයත් සිසුන්ගෙන් වන අතර එය, 25.8% (41) කි. 23.4% (54) ක් රෝමානු කතෝලික ආගමට අයත් සිසුන් වූ අතර, ඉස්ලාම් ආගමට අයත් සිසුන් 17.6% (100) ක් ද, බෞද්ධ (14.7% (547)) හා හින්දු ආගමික (11.3% (44)) සිසුන් තුළ මෙම අගය සාපේක්ෂව පහළ අගයක් ගෙන තිබුණු බව ද අනාවරණය විය.

එසේ වුවත් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ට අදාළ ආගම විශ්ලේෂණය කර බැලීමේ දී, සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඉස්ලාම් ආගමික සිසුන් 6.8% (33) කින් ප්‍රමුඛතාවය ගෙන තිබිණ. ක්‍රිස්තියානි 5.7% (9) හා රෝමානු කතෝලික සිසුන් 4.8% (11) ක් ද, බෞද්ධ සිසුන් 3.7% (138) ක් ද විය. සමීක්ෂණයට භාජනය කළ හින්දු ආගමට අයත් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 3.6% (14) ක් වාර්තා විය. ඒ අනුව නියැදිය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ අඩුම ප්‍රචලිත බව හින්දු ආගමට අයත් සිසුන්ගෙන් වාර්තා විය.

ප්‍රස්තාරය 10 - ආගම අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

එක් එක් ආගම හා ඔවුනොවුන් විසින් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය අධ්‍යයනය කළ විටදී, සමස්තයක් ලෙස සියලුම ආගම්වල සිසුන් තුළ සිගරැට් භාවිතයේ කිසියම් ප්‍රචලිත බවක් දක්නට ඇති අතර එම තත්ත්වය ඉස්ලාම් භක්තික සිසුන් 3.87% (22) තුළ ඉහළ අගයක් ද, ක්‍රිස්තියානි භක්තික සිසුන් 3.77% (6) ක් ද, හින්දු 2.81% (11) ක් ද, කතෝලික 2.16% (5) ක් ද, සිසුන් තුළ සාපේක්ෂ අඩු තත්ත්වයක් දක්නට ලැබිණ. සිගරැට් භාවිතයේ අඩුම ප්‍රචලිත බව බෞද්ධ සිසුන් (1.66% (62)) තුළින් දක්නට ලැබිණ.

එසේ වුවද බෞද්ධ සිසුන් අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන (1.24%) භාවිතයේ ඉහළම ප්‍රචලිත බවක් දක්නට ඇති අතර බෞද්ධ සිසුන්ගේ මද්‍යසාර (1.66%), බියර් (0.96%) භාවිතයේ ද සුළු ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය. හින්දු හා ඉස්ලාම් භක්තික සිසුන් අතර බියර් හා මද්‍යසාර භාවිතයේ පහළ ප්‍රවණතාවක් පවතින අතර බියර් හා මද්‍යසාර භාවිතයේ ඉහළම ප්‍රචලිත බව ක්‍රිස්තියානි හා රෝමානු කතෝලික සිසුන් අතර දක්නට ඇති බව සමීක්ෂණය තුළින් අනාවරණය විය.

ප්‍රස්තාරය 11 - ආගම අනුව සිසුන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන් අතර ගංජා භාවිතයේ ද සුළු ප්‍රවණතාවක් පවතින අතර ක්‍රිස්තියානි හා හින්දු ආගමට අයත් සිසුන් අතර ඉහළ අගයක් පැවතුණ අතර, බෞද්ධ සිසුන් අතර පහළ අගයක් ද පෙන්නුම් කරනු ලැබීය.

2.5.4 මත්ද්‍රව්‍ය භාවිතය හා සිසුන්ගේ විනෝදාංශ අතර සහසම්බන්ධතාවය

මත්ද්‍රව්‍ය භාවිත කිරීම හෝ මත්ද්‍රව්‍ය අත්හදා බැලීම කෙරෙහි ශිෂ්‍යයෙකුගේ විනෝදාංශය බලපෑමක් ඇති කරයි ද යන්න සමීක්ෂණය තුළ අධ්‍යයනයට ලක්කළ අතර එහි දී අනාවරණය වූයේ ඇතැම් විනෝදාංශ, සිසුන්ගේ මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හා වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාම කෙරෙහි තුඩු දුන් බවයි.

එක් එක් විනෝදාංශය සඳහා යොමු වූ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන්ගේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබන්නේ චිත්‍රපට නැරඹීම (20.3% (205)) හා මිතුරන් ඇසුරු කිරීම (19.9% (233)) වැනි විනෝදාංශවල දී බව හෙළි විය. විනෝදාංශයක් නොමැති සිසුන් 25.6% (10) ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ පිරිසෙහි ඉහළම අගයක් ගැනීම ද මෙහිදී අනාවරණය වූ තවත් විශේෂ කරුණකි. මීට අමතරව ක්‍රීඩා කිරීම (17% (507)) හා වාදනය (17.8% (97)) සිය විනෝදාංශය කරගත් සිසුන් අතර ද මත්ද්‍රව්‍ය භාවිතයේ යම් ප්‍රවණතාවක් පැවතිණ. ගායනය, නර්තනය හා කියවීම වැනි විනෝදාංශවල නියැළෙන සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අඩු ප්‍රවණතාවක් පෙන්වන බව ද අනාවරණය විය.

ප්‍රස්තාරය 12 - මත්ද්‍රව්‍ය භාවිතය හා විනෝදාංශ අතර සම්බන්ධතාව



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

එක් එක් විනෝදාංශයේ යෙදුණ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස වර්තමානයේ එනම්, දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් සළකා බැලූ විටදී ද පැහැදිලි වන්නේ චිත්‍රපට නැරඹීම, මිතුරු ඇසුර හා ක්‍රීඩා කිරීම යනාදී විනෝදාංශවල යෙදෙන සිසුන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය අනෙකුත් විනෝදාංශවල නියැළි සිසුන්ට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බවයි. එම එක් එක් විනෝදාංශවල යෙදුණු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙළින් 5.5% (56), 6.1% (71) හා 4.3% (128) වේ. තවද විනෝදාංශයක් නොමැති සිසුන් තුළ මේ සම්බන්ධ ඉහළම අගය 12.8% (5) ලෙස ද අනාවරණය විය.

තවද පොත්පත් කියවීම, නර්තනය වැනි විනෝදාංශවල යෙදුණු සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අඩු ප්‍රවණතාවක් අනාවරණය වී ඇති අතර එම අගයන් පිළිවෙළින් 1.9% (32) ක් හා 2.1% (12) ක් වේ.

මෙම ඉහත දත්ත විශ්ලේෂණය කර බැලීමේදී පැහැදිලි වන්නේ, විනෝදාංශයක් නොමැතිව කාලය ගත කරන හෝ මිතුරන් ඇසුරු කරන, චිත්‍රපට නැරඹීම, ක්‍රීඩා කිරීම වැනි විනෝදාංශවල යෙදෙන සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි නැඹුරුවීමේ වැඩි අවදානමක් පවතින බවත්, එවැනි තත්ත්වයන් මත්ද්‍රව්‍ය භාවිතයට සුදුසු අවස්ථාවන් නිර්මාණය කළ හැකි සාධක ලෙස නිර්ණය කළ හැකි බවයි. සෞන්දර්ය කටයුතු වල යෙදීම හා ක්‍රීඩා කිරීම සෞඛ්‍යමත් දිවියකට අඩිතාලමක් වුවද එවැනි අවස්ථා වලදී මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන් නිතර මුණගැසෙන බැවින් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ඉඩ ප්‍රස්ථා වැඩි වී ඇති බවද අනාවරණය වී ඇත.

2.5.5 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි බලපෑම

දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කළ හැකි බැවින් ඒ පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කළ අතර සමීක්ෂණය තුළ අධ්‍යාපනය නොලද දෙමාපියන්ගේ සිට උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් දක්වා උගත් දෙමාපියන් සිටි බව අනාවරණය විය.

සමීක්ෂණය තුළින් පාසල් අධ්‍යාපනය නොලද දෙමාපියන් සිටි බවට තොරතුරු ලැබුණු අතර සිසුන්ගෙන් 3.8% (194) දෙනෙකුගේ පියවරුන් පාසල් අධ්‍යාපනය ලබා නොතිබුණු අතර අධ්‍යාපනය නොලද පියවරුන් සිටින සිසුන්ගෙන් 22% (42) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බවත්, 5% (10) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත් අනාවරණය විය. නියැදිය තුළ සිසුන් 4.2% (216) දෙනෙකුගේ මව්වරුන් පාසල් අධ්‍යාපනය ලබා නොතිබුණ අතර එසේ අධ්‍යාපනය නොලැබූ මව්වරුන් සිටින සිසුන්ගෙන් 18% (39) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර එයින් දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන ප්‍රතිශතය 6% (13) කි.

ප්‍රාථමික අධ්‍යාපනය පමණක් ලැබූ පියවරුන් සිටින සිසුන් 496 ක් නියැදිය තුළ සමීක්ෂණයට භාජනය වූ අතර ඔවුන්ට ප්‍රතිශතයක් ලෙස 19% (92) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර ඉන් 5% (25) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බව ද අනාවරණය විය. ප්‍රාථමික අධ්‍යාපනය දක්වා පමණක් අධ්‍යාපනය ලැබූ මව්වරුන් සිටින පවුල්වල සිසුන් 360 තුළින් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 22% (78) ක් වූ අතර දැනට මත්ද්‍රව්‍ය භාවිත ප්‍රතිශතය 6% (20) ක් විය.

6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනයක් ලද දෙමාපියන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යක් භාවිත කළ සිසුන් 17% (236) ක් ද, අ.පොස. (සා/පෙළ) සමත් හා අ.පොස. (උ/පෙළ) සමත් පියවරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙළින් 14% (213) ක් හා 13% (114) ක් විය. උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් ලබා ඇති පියවරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 12% (44) ක් දක්වා අඩු වීමක් දක්නට ඇත.

6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද මව්වරුන් සිටින සිසුන්ගෙන් 16% (199) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර අ.පොස. (උ/පෙළ) සමත්, උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් දක්වා අධ්‍යාපනය ලද මව්වරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයයන් පිළිවෙළින් 12% (121) ක් හා 10% (30) ක් වශයෙන් අඩුවීමක් දක්නට විය.

ප්‍රස්තාරය 13 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි බලපෑම



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා දෙමාපියන්ගේ එක් එක් අධ්‍යාපන මට්ටම් සළකා බලන විට, ඉහළ අධ්‍යාපන මට්ටම්වලට සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටම්වලින් යුතු දෙමාපියන්ගේ දරුවන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි වැඩි ප්‍රවණතාවක් දක්වන බව මෙයින් අනාවරණය විය.

අධ්‍යාපනය නොලද මව්වරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස, ඔවුන් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රතිශත අගය 6% (13) ක් වන අතර අධ්‍යාපනය නොලද පියෙක් සිටින සිසුන්ගේ එම අගය 5% (10) ක් විය. උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් වල නිරත වූ මවක් සිටින සිසුන් තුළ දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රතිශතය 2% (7) ක් වන අතර උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් වල නිරත වූ පියෙක් සිටින සිසුන් සඳහා එම අගය 3% (9) ක් විය. ඒ අනුව අධ්‍යාපනය නොලද දෙමාපියන් සිටින සිසුන්ට වඩා ඉහළ අධ්‍යාපන මට්ටම් වල නිරත දෙමාපියන් සිටින සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ සාපේක්ෂ අඩු ප්‍රවණතාවක් පවතින බව නිගමනය කළ හැකිය. ඉහත ප්‍රස්තාර සටහන නිරීක්ෂණය කිරීමෙන් එය තවදුරටත් පැහැදිලි කරගත හැකිය.

පියාගේ හා මවගේ අධ්‍යාපන මට්ටම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් කරන බවත්, මවගේ අධ්‍යාපන මට්ටම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් කරන බවත් සංඛ්‍යානමය වශයෙන් සනාථ විය.

ඒ අනුව පැහැදිලි වන්නේ, දෙමාපියන් ඉහළ අධ්‍යාපන මට්ටම් වලින් පරිපූර්ණ වන විට එම පවුල්වල සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීම කෙරෙහි ඇති ප්‍රවණතාව ද ක්‍රමයෙන් අඩුවන බවයි. එබැවින් අඩු අධ්‍යාපන මට්ටම්වල සිටින දෙමාපියන්ගේ දරුවන්, ඉහළ අධ්‍යාපන මට්ටම්වල සිටින දෙමාපියන්ගේ දරුවන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බවත්, සිසුන්ගේ දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම් හා සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය අතර අන්තර් සම්බන්ධයක් පවතින බවත් නිගමනය කළ හැකිය.

2.5.6 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ රැකියා තත්ත්වයේ බලපෑම

වර්තමානය තුළ කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 206 දෙනෙකු සිටින බවට සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර ඔවුන්ගෙන් දෙමාපියන්ගේ රැකියාව කෙබඳු ද? යන්න මෙහිදී සළකා බැලිණි.

නියැදිය තුළ දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ගෙන් 20% (41) කගේ පියවරු පුහුණු ශ්‍රමිකයින් (විදුලි/ජලනල/පෙදරේරු) වන අතර 16% (32) කගේ පියවරුන් කෘෂිකාර්මික හෝ ධීවර වෘත්තියෙහි නිරත වී ඇත. තව ද නුපුහුණු ශ්‍රමිකයින් (කම්කරු/කුලීවැඩ) හා ව්‍යාපාරික/ ස්වයං රැකියාවන්හි නිරත පියවරුන් සිටින, දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 13% කින් ද රාජ්‍ය

හෝ පෞද්ගලික අංශවල විවිධ රැකියාවල නියුතු පියවරුන් සිටින සිසුන් 12% (24) කින් ද සමන්විත වූහ. දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ගෙන් 10% (20) කගේ පියවරු රියදුරු වෘත්තියෙහි නිරත වී ඇති අතර සිසුන්ගෙන් 11% (23) ක් පියාගේ රැකියාව පිළිබඳව සඳහන් කර නොතිබුණි.

ප්‍රස්තාරය 14 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි පියාගේ රැකියාවේ බලපෑම



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

3% (7) ක් වෛද්‍ය, ඉංජිනේරු හෝ එවැනි වෘත්තිමය ක්ෂේත්‍රවල රැකියා කරන පියවරුන් සිටින සිසුන් ද මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇති නමුත් එය වෙනත් රැකියාවල නිරත පියවරුන් සිටින සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට වඩා අඩු ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය.

සමීක්ෂණය තුළ දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 206 දෙනාට ප්‍රතිශතයක් ලෙස සිසුන්ගේ මව්වරුන්ගේ රැකියාව පිළිබඳ අවධානය යොමු කරන විට දැකිය හැකි විශේෂත්වය වන්නේ, දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 59% (121) කගේ මව්වරුන් ගෘහණියන් වීමයි. තවද වෘත්තිමය රැකියාවල නිරත වන මව්වරුන් සිටින කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 7% (14) ක් ද, නුපුහුණු ශ්‍රමික (කම්කරු/කුලීවැඩ) වැනි වෘත්තීන්හී නිරත මව්වරුන් සිටින කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 6% (13) ක් ද, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වෘත්තිමය නොවන රැකියාවන්හි නියුතු මව්වරුන් සිටින මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 4% (9) ක් ද, නුපුහුණු ශ්‍රමික, ව්‍යාපාර, ස්වයං රැකියා, ගෘහ සේවිකා වැනි වෘත්තීන් වල නිරත මව්වරුන් ද සිටින මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් සඳහා 3% (7) ක් ද අනාවරණය වූ අතර දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ගෙන් 9% (18) ක් මවගේ රැකියාව පිළිබඳ තොරතුරු ලබාදී නොතිබුණි.

ප්‍රස්තාරය 15 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මවගේ රැකියාවේ බලපෑම



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

මේ අනුව පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා දෙමාපියන්ගේ රැකියා තත්ත්වය පිළිබඳව සැළකිමේදී නිගමනය කළ හැකි වන්නේ, මත්ද්‍රව්‍ය සඳහා යොමු වූ බහුතරයක් සිසුන්ගේ දෙමාපියන්ගේ රැකියා ස්වභාවය ගත්කළ පියවරුන් පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් බවත්, මව්වරුන් ගෘහණියන් වන බවත්, එම පවුල්වල දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇති බවත් ය. මව්වරුන් ගෘහණියන් වන විටදී දරුවන් නිරීක්ෂණය සඳහා වැඩි අවකාශයක් තිබියදීත් දරුවන් එසේ මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමට හේතුව ලෙස, ගෘහණියන් අඩු අධ්‍යාපන මට්ටම්වල සිටීමත් හා මත්ද්‍රව්‍ය භාවිතයේ යාවත්කාලීන වූ දැනුමෙහි පවතින දුර්වලතා බවත් නිගමනය කළ හැකිය.

පුද්ගලයෙකු මත්ද්‍රව්‍යයට යොමුවීම කෙරෙහි විවිධ සාධක බලපාන බව විද්‍යාත්මකව සනාථ කර ඇති අතර එම සාධක අතර ජානමය ලක්ෂණ හා පාරිසරික සාධක වැදගත් ස්ථානයක් ගෙන ඇත. පාරිසරික සාධක ලෙස පුද්ගලයා ජීවත්වන අවට පරිසරය, පාසල හා නිවස තුළ සම්බන්ධතා පවත්වනු ලබන එක් එක් පිරිස් මගින් ඇතිකරන බලපෑම වේ. පරිසර සාධක, පුද්ගලයාගේ මානසික හා ශාරීරික සංවර්ධනය කෙරෙහි ධනාත්මක හෝ ඍණාත්මක අයුරින් බලපෑම් කළ හැකිය. අසල්වැසි පුද්ගලයන්, යහළුවන්, වැඩිහිටි සහෝදර සහෝදරියන් හා දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ හැසිරීම් රටාවන්, සිසුන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය කෙරෙහි බලපෑම් කළ හැකි අතර කිසියම් පුද්ගලයෙකු කෙරෙහි ජානමය සාධක හා පාරිසරික සාධක යන ද්විත්වයම ඒකාබද්ධ වූ විටදී එය ඔහු මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානමෙන් හරි අඩක් (50%) පමණ වේ (Lewis, August, 2017).

2.5.7 පරිසර සාධක හා මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතා

සිසුන් ජීවත් වන ප්‍රදේශයේ වාසය කරන මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් නිසා සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කිසියම් හෝ බලපෑමක් සිදුවී ඇත් ද? යන්න මෙම සමීක්ෂණය තුළ දී සළකා බලන ලදි. සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන්ගේ බලපෑමක් සිදුවී ඇති බව සංඛ්‍යානමය වශයෙන් තහවුරු විය.

දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ට (206) ප්‍රතිශතයක් ලෙස 77% (159) ක් ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් හඳුනාගෙන ඇති අතර එසේ හඳුනා නොගත් සිසුන් 23% (47) ක් විය. මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් 63% (2667) ක් ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව හඳුනන බවත්, 37% (1584) ක් එවැනි පුද්ගලයින් නොහඳුනන බවත් ප්‍රකාශ කරන ලදි.

ප්‍රස්තාරය 16 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිත හා භාවිත නොකරන සිසුන් තමා ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් පිළිබඳව පවතින දැනුවත්භාවය සන්සන්දනය කරන විට දී මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්, මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා තමා ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පිළිබඳව ඉහළ

දැනුවත්භාවයකින් පසුවන බව අනාවරණය විය. තව ද මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්, මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට වඩා ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පිළිබඳ අඩු දැනුවත්භාවයකින් පසුවන බවත් හෙළිවිය.
මෙමඟින් හෙළිවන සුවිශේෂී කරුණ වන්නේ, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් බලපෑමක් ඇතිවන බවයි.

2.5.8 මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සමඟ සිසුන් පවත්වන අන්තර් සබඳතා

මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සහ සිසුන් අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පිළිබඳව මෙම අධ්‍යයනය තුළින් විමසන ලදි. එහිදී සිසුන්ගෙන් 92% (4673) ක් ප්‍රකාශ කර තිබුණේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් ඔවුන්ට පෞද්ගලිකව මුණගැසී ඇති බවයි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් මුණගැසී ඇති බව පැවසූ සිසුන්ගෙන් බහුතරයක් එනම් 63% (2961) ක් උත්සව අවස්ථාවලදී එවැනි පුද්ගලයන් මුණගැසී ඇති බව ප්‍රකාශ කර තිබිණ. සිසුන්ගෙන් 56% (2604) ක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් තමා ජීවත්වන ප්‍රදේශය තුළින් ද මුණගැසී ඇති බව ප්‍රකාශ කරන ලදි.

ප්‍රස්තාරය 17 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුණගැසී තිබෙන ස්ථාන/ අවස්ථා



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුණගැසී ඇති සිසුන් සම්බන්ධයෙන් ගත්කල, සිසුන්ගෙන් 54% (2505) ක් පොදු ස්ථානවල දී ද, 34% (1601) ක් බස් නැවතුම්පොළේ දී ද, 14% (644) ක් දුම්රියපොළේ දී ද යන්න අනාවරණය විය. පොදු ස්ථානයක දී සිසුවෙකුට සාමාන්‍යයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 9 ක් පමණ මුණ ගැසෙන බවත් දුම්රියපොළ, බස් නැවතුම්පොළ යනාදී ස්ථානවල සාමාන්‍යයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් දෙදෙනෙක් වැනි අඩු පුද්ගල සංඛ්‍යාවක් මුණ ගැසී තිබුණු බවත් සංඛ්‍යානමය වශයෙන් තහවුරු කර ගත හැකිය.

සිසුන් විසින් නිරීක්ෂණය කරන ලද මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ යැයි සැළකෙන පුද්ගලයින් භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග කෙරෙහි අවධානය යොමු කරන විටදී සිසුන්ගෙන් බහුතරයක් සිගරට් (74%, 3447) හා මද්‍යසාර (64%, 2975) භාවිත කරන පුද්ගලයින් නිරීක්ෂණය කර තිබුණි. 18% (825) ක් බියර් ද, 13% (611) ක් ගංජා ද, 10% (448) ක් හෙරොයින් ද 1% (62) ක් විවිධ ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කරන බව ද 8% (352) ක් කසිප්පු ද, 6% (286) ක් දුම්කුඩු භාවිත කරන පුද්ගලයින් ද ඔවුන් නිරීක්ෂණය කර තිබුණි. තවද ඔවුන් රා, පුවක් වර්ග, කොකේන්, මදනමෝදක, බාබුල් ආදිය ද භාවිත කරන බව සිසුන්ට නිරීක්ෂණය වූ බව සිසුන් විසින් ප්‍රකාශ කර තිබුණි.

මේ අනුව පැහැදිලි වන්නේ, මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වැඩි ප්‍රමාණයක් උත්සව අවස්ථා වලදී, පොදු ස්ථාන, ගමේදී හා බස් නැවතුම්පළ තුළ නිරීක්ෂණයට ලක්වන බවයි. සිසුන් ජීවත්වන පරිසරය/ වටපිටාව, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බහුල වීම, ඔවුන්ගේ චර්යා රටා නිරීක්ෂණය වීම යනාදිය සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි පෙළඹීමටත්, ඒ සඳහා දැඩි අවදානමක් පවතින බවත් අනාවරණය විය.

2.5.9 සිසුන් සහ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතර සම්බන්ධතාවය

සිසුන් බහුතරයක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව දැන සිටි බැවින් භාවිත කරන්නන් අතර සිසුන්ගේ සමීපතම මිතුරන්/ඥාතීන්/අසල්වැසියන් සිටීදැයි විමසන ලදි. මෙහිදී සිසුන්ගෙන් 55% (2780) ක් තම සමීපතම පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රකාශ කරන ලදි. සිසුන්ගෙන් 45% (2295) ක් තමන්ගේ සමීපතම පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත නොකරන බව ද ප්‍රකාශ කරන ලදි. තවද මෙහිදී සිසුන් සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන බහුවිධ සමීපතම පුද්ගලයින් සිටි බවත් මෙහිදී අනාවරණය විය.

ප්‍රස්තාරය 18 - මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින්



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සමීපතම පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට පැවසූ සිසුන්ගෙන් 44% (1233) කගේ සිය අසැල්වැසියන් ද, 34% ක් තම ඥාතීන් ද, 23% (630) කගේ තම මිතුරන් ද මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය. තවද පියා මත්ද්‍රව්‍ය භාවිත කරන බව, සිසුන්ගෙන් 10% (270) ක් ප්‍රකාශ කර තිබුණි.

සමීපතම පුද්ගලයින් භාවිත කරන ලද එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය සම්බන්ධයෙන් විමසීමේදී අදහස් ප්‍රකාශ කළ සිසුන්ගෙන් බහුතරයක් එනම්, 71% (1981) ක් තම සමීපතමයින් සිගරැට් භාවිත කරන බව ද, 61% (1689) ක් මද්‍යසාර ද, 21% (583) ක් බීඩි ද, 19% (534) ක් බියර් ද, 10% (282) ක් ගංජා ද, 8% (211) ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ද, 6% (163) ක් හෙරොයින් ද, 6% (158) ක් විවිධ පුවක් වර්ග ද භාවිත කරන බව ද ප්‍රකාශ කර තිබිණ. එය පහත ප්‍රස්තාර සටහනින් වඩාත් පැහැදිලි වේ.

ප්‍රස්තාරය 19 - සිසුන්ගේ සමීපතම පුද්ගලයින් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සිය සමීපතම පුද්ගලයින් විසින් භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ප්‍රමුඛතාව පිළිවෙළින් සිගරැට්, මද්‍යසාර, බීඩි, බියර් සම්බන්ධ ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය. ගංජා, හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිසුන්ගේ සමීපතමයින් වශයෙන් අඩු ප්‍රතිශතයක් සිටීමට හේතු වී තිබෙනුයේ

මාදක ගණයේ මත්ද්‍රව්‍ය නීත්‍යානුකූල නොවීමත්, සමාජය තුළ සුලභව දක්නට නොලැබීමත් සහ එය සැඟවුණු උපසංස්කෘතියක් තුළ භාවිත කිරීමත් බව මෙහිදී තහවුරු කරගත හැකි විය.

2.5.10 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඔවුන් ජීවත්වන පරිසරයේ බලපෑම

මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් යොමුවීමට බලපෑම් කරන තවත් එක් සාධකයක් ලෙස සිසුන් ජීවත්වන පරිසරය දැක්විය හැකි අතර සිසුන් සිය දෙමාපියන් සමඟ නිවසේ ජීවත් වන්නේ නම් මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට ඇති ඉඩ ප්‍රස්ථා අවම විය හැකිය. මේ පිළිබඳව සමීක්ෂණය තුළින් අනාවරණය කරගැනීමට හැකිවිය.

දෙමාපියන් සමඟ ජීවත් වන සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් අත්හදා බැලූ සිසුන් 14.9% (698) ක් විය. තම කුඩම්මා හෝ සුළු පියා සමඟ ජීවත්වන සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 31.8% (7) ක් ද, නැදෑයකුගේ නිවසේ සිටි සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 32.9% (70) ක් ද, යහළුවෙකුගේ නිවසේ සිටි සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 33.3% (5) ක් ද, මිතුරන් සමඟ නවාතැන් ගත් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 26.7% (8) ක් ද, පාසල් නේවාසිකාගාරයේ සිටි සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 28.6% (4) ක් ද, සිය සහෝදර සහෝදරියන් සමඟ බෝඩිමක සිටින සිසුන්ගෙන් 28% (2) ක් ද එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාරය 20 - මත්ද්‍රව්‍ය භාවිතය හා පාරිසරික සාධක අතර සම්බන්ධතාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

තවද කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් දැනට භාවිත කරන සිසුන් ද සැළකූ විටදී, දෙමාපියන් සමඟ ජීවත් වන සිසුන්ට වඩා දෙමාපියන් නොවන වෙනත් පිරිස් සමඟ ජීවත් වනවිට මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කර තිබුණි. එනම් දෙමාපියන් සමඟ ජීවත් වන මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස වර්තමානයේ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ගේ ප්‍රතිශතය 3.8% (179) ක් විය. දෙමාපියන් හැර වෙනත් පිරිස් සමඟ ජීවත් වන එක් එක් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සැළකූ විටදී, එනම්, පාසල් නේවාසිකාගාරයේ ජීවත් වන සිසුන්ගෙන් 14.3% ක් ද, කුඩම්මා හෝ සුළු පියා සමඟ ජීවත් වන සිසුන්ගෙන් 9.1% ක් ද, ආච්චි හෝ සීයා සමඟ ජීවත්වන සිසුන්ගෙන් 8.9% ක් ද හා සහෝදර සහෝදරියන් සමඟ නවාතැනක ජීවත්වන සිසුන්ගෙන් 14.3% ක් ද වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇත.

දෙමාපිය ආදරය හා රැකවරණය අවම මට්ටමක පවතින අවස්ථාවන්හිදී හා දෙමාපිය ආදරය, රැකවරණය නොමැති පරිසරයන්හි දී සිසුන් මත්ද්‍රව්‍ය වලට යොමුවීමේ ප්‍රවණතාවක් පවතින බව මෙහිදී අනාවරණය විය.

2.5.10.1 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි බලපෑම

සිසුන් ජීවත්වන නිවස හා ඒ අවට පරිසරයේ ජීවත්වන පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කිරීම තුළින් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් සිදු වී ඇති බව සංඛ්‍යානමය වශයෙන් නිගමනය කළ හැකි විය.

දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට (206) ප්‍රතිශතයක් ලෙස එනම්, 99% (203) කට තම නිවස අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් නිතර මුණගැසී ඇති අතර සිසුන් 1% (3) කට එසේ මුණගැසී නොමැත.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට (4251) ප්‍රතිශතයක් ලෙස තමා ජීවත්වන නිවස හා ඒ අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් නිතර හමු වී ඇති බව පැවසූ සිසුන් 91% (3884) ක් සිටි අතර, 9% (367) කට එසේ මුණගැසී නොමැත.

ප්‍රස්තාරය 21 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

මත්ද්‍රව්‍ය භාවිත කරන හා භාවිත නොකරන සිසුන් දැක්වූ ප්‍රතිශත අගයන් සන්සන්දනය කළ විට දී අනාවරණය වුයේ, මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් වැඩි වශයෙන් තමා ජීවත්වන නිවස හා අවට පරිසරය තුළින් හමුවී තිබෙන බවයි. ඒ අනුව පැහැදිලි වන්නේ, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් ජීවත්වන නිවස හා ඒ අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් නිතර නිතර මුණගැසීම තුළින් කිසියම් බලපෑමක් කළ හැකි බවයි. තව ද කිසිදිනක මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන්ගෙන් 91% (3884) කගේ නිවස හා ඒ අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් බහුලව වාසය කර ඇති බව ඉහත දී අනාවරණය විය. ඒ අනුව නිතර නිතර මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් හා ඔවුන්ගේ හැසිරීම් රටාවන් සිසුන්ට නිරීක්ෂණය වීම, සිසුන් කිසියම් මත්ද්‍රව්‍යයක් අත්හදා බැලීම හෝ භාවිතය කෙරෙහි ද යොමුවිය හැකි පරිසර සාධකයක් බව මෙහි දී පෙන්වා දිය හැකිය.

සිසුන් ජීවත් වන පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සැළකීමේදී තම නිවස අවට පරිසරය තුළ මද්‍යසාර හා සිගරැට් භාවිත කරන්නන් බහුලව මුණගැසී ඇත. නිවස අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිටි බව ප්‍රකාශ කළ සිසුන්ට (4644) ප්‍රතිශතයක් ලෙස සිසුන්ගෙන් 78% (3627) කගේ අවට ජීවත්වන පුද්ගලයින් සිගරැට් භාවිත කරන පුද්ගලයින් බවත්, 68% (3166) කගේ මද්‍යසාර භාවිත කරන පුද්ගලයින් සිටින බවත් අනාවරණය විය. තවද ගංජා සඳහා එම අගය 15% (705) ක් ද, හෙරොයින් සඳහා 10% (448) ක් ද, දුම්කොළ ආශ්‍රිත

නිෂ්පාදන සඳහා 6% (286) ක් ද වශයෙන් අනාවරණය විය. අවට ප්‍රදේශය තුළ බාබුල්, මදනමෝදක, පුවක් වර්ග, විවිධ පැණි වර්ග හා ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කරන පුද්ගලයින් ද සිසුන් ජීවත්වන පරිසරය තුළ හමුවන බවත්, එය 5% ක් වැනි සුළු අගයක පැවති බවත් හෙළි විය.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා භාවිත කරන සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වැඩි වශයෙන් හමුවන බව අනාවරණය විය. එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය අත්හදා බැලූ සිසුන් (789) ගෙන් සිසුන් 67% (531) ක ට මද්‍යසාර ද, 80% (630) ක ට සිගරැට් ද, 21% (164) ක ට ගංජා ද භාවිත කළ පුද්ගලයින් සිසුන් ජීවත්වන ප්‍රදේශය තුළින් හමුවී ඇති බව හෙළි විය. එය පහත ප්‍රස්තාර සටහන හා දත්ත මගින් තවදුරටත් පැහැදිලි කර ගත හැකිය.

ප්‍රස්තාරය 22 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය හා අසල්වැසියන් විසින් භාවිත කළ විවිධ මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඔවුන් ජීවත්වන නිවස හා ඒ අවට පරිසරය තුළ මද්‍යසාර භාවිත කරන 62% (2620) ක් ද, සිගරැට් භාවිත කරන 70% (2979) ක් ද හා ගංජා භාවිත කරන 13% (541) ක් ද සිටින බව වාර්තා විය.

2.5.10.2 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතමයින්ගේ බලපෑම

සිසුන් ඇසුරු කරන සමීපතමයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් සිදුකරන බව සංඛ්‍යානමය වශයෙන් තහවුරු විය.

සමීක්ෂණය සඳහා සහභාගි කරගත් සිසුන්ගෙන් 55% (2780) කගේ සමීපතම කිසිවකු හෝ මත්ද්‍රව්‍ය භාවිත කරන බවත්, 45% (2295) කගේ සමීපතමයින් මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවත් අනාවරණය විය.

දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් (206) සැළකූ විට ඔවුන්ගේ සමීපතමයින් බහුලව භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය අතර සිගරැට් 86% (177) ක් ද, මද්‍යසාර 53% (130) ක් ද හා බියර් 23% (47) ක් ද වශයෙන් ඉහළ ප්‍රවණතාවයක් පවතින බව සිසුන් ප්‍රකාශ කර තිබිණ. තවද එම මත්ද්‍රව්‍යවලට අමතරව සමීපතම පුද්ගලයින් ගංජා (29% (59)), හෙරොයින් (7% (15)), දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) (11% (22)), බාබුල් (7% (15)) හා පුවක් වර්ග (15% (31)) ද සුළු වශයෙන් මදනමෝදක හා පෙති වර්ග භාවිත කරන බව සිසුන් ප්‍රකාශ කරන ලදි.

ප්‍රස්තාරය 23 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය හා සමීපතමයන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ගයන්



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

කිසිදිනෙක මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති සිසුන් (4251) සැළකූ විටදී, ඔවුන්ගෙන් 50% කගේ සමීපතම පුද්ගලයින් කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත්, 50% ක් එසේ නොවන බවත් දත්ත විශ්ලේෂණය මගින් හෙළිවිය. කිසිදිනක මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන් (4251) ගේ මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතමයින් භාවිත කරන ලද බහුවිධ මත්ද්‍රව්‍ය අතර සිගරැට් භාවිත කළ 70% (2979) ක් ද, මද්‍යසාර භාවිත කළ 32% (1377) ක් ද හා බියර් භාවිත කළ 9% (390) ක් ද සිටින බව සිසුන් විසින් ප්‍රකාශ කර ඇත. එම මත්ද්‍රව්‍ය වලට අමතරව සමීපතමයින් ගංජා භාවිත කළ බවට 13% (541) ක් ද, හෙරොයින් භාවිත කළ බවට 3% (111) ක් ද, දුම්කුඩු භාවිත කළ බවට 3% (143) ක් ද හා පුවක් වර්ග භාවිත කළ බවට 2% (79) ක් ද වශයෙන් හා ඉතා සුළු වශයෙන් බාබුල්, මදනමෝදක, පැණි වර්ග හා පෙති වර්ග ද භාවිත කරන සමීපතම පුද්ගලයින් ද සිටි බව සිසුන් ප්‍රකාශ කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් වැඩි සංඛ්‍යාවක් මුණගැසෙන බව ඉහත දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය විය. ඒ අනුව සමීපතම පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිත කිරීම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි බලපෑමක් කරන බවත්, සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ප්‍රවණතාව අඩු හෝ වැඩිවීම කෙරෙහි සිසුන්ගේ සමීපතම පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදීමෙහි අඩු හෝ වැඩි වීම බලපෑම් කළ හැකිය.

දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්, මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් සමඟ දැක්වූ සහසම්බන්ධතාව සළකන විටදී කිසියම් මත්ද්‍රව්‍යක් දැනට භාවිත කරන සිසුන් (206) ට ප්‍රතිශතයක් ලෙස සිසුන්ගෙන් 6% (13) කගේ පියවරුන් ද, 24% (50) කගේ ඥාතීන් ද, 36% (75) කගේ තම අසල්වැසියන් ද, 35% (73) කගේ මිතුරන් ද, 3% (6) කගේ සිය සහෝදරයන් ද මත්ද්‍රව්‍ය භාවිත කරන බව ද හෙළි විය. ඒ අනුව දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ගේ සමීපතම මත්ද්‍රව්‍ය භාවිත කරන පාර්ශ්වයන් අතර ඉහළ ප්‍රතිශතයන් මිතුරන් හා අසල්වැසියන් වන අතර මීට අමතරව මත්ද්‍රව්‍ය භාවිත කළ සිය ඥාතීන් හා පවුලේ සාමාජිකයින් සමඟ ද සම්බන්ධතා පැවති බවත් දැක්විය හැකිය.

ප්‍රස්තාරය 24 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් අතර සම්බන්ධතාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

කෙදිනක හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති සිසුන්, මත්ද්‍රව්‍ය භාවිත කළ සමීපතම පුද්ගලයින් සමඟ දැක්වූ සහසම්බන්ධතාව සළකන විටදී කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් කිසිදිනක භාවිත කර නොමැති සිසුන් (4251) ට ප්‍රතිශතයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිත කරන පියවරුන් සිටින සිසුන් 5% (207) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන ඥාතීන් සිටින සිසුන් 17% (729) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන තම අසල්වැසියන් සිටින සිසුන් 23% (995) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන් සිටින සිසුන් 10% (409) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන සිය සහෝදරයන් සිටින සිසුන් 0.5% (21) ක් ද බව මෙහිදී අනාවරණය විය. කිසිඳු දිනෙක මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති සිසුන්ගේ සමීපතම මත්ද්‍රව්‍ය භාවිත කරන පාර්ශ්වයන් අතර ඉහළ ප්‍රතිශතයන් අසල්වැසියන් හා ඥාතීන් සම්බන්ධව පවතින අතර ඒ හැරුණු විට දී මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන් හා පවුලේ සාමාජිකයින් ද සිටින බවත් අනාවරණය විය.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයන් ලෙස මිතුරන් සමඟ දක්වන සබඳතා වල ඉහළ ප්‍රතිශත අගයක් දක්නට ලැබීම මෙහිදී හඳුනාගත හැකි විශේෂත්වයකි. මේ අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කළ එක් සාධකයක් ලෙස මිතුරු ඇසුර ද දැක්විය හැකිය.

2.5.11 සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානම් තත්ත්වය

සමීක්ෂණයට ලක්කළ සිසුන්ගෙන් 98% (4956) කට සිය ජීවිතය සම්බන්ධ පෞද්ගලික ගැටලු ඇති වූ විට සවන්දීමට හා ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු සිටින බවත්, 2% (119) කට එසේ කිසියම් හෝ පුද්ගලයෙකු නොසිටි බවත් ප්‍රකාශ කරන ලදි.

සිය ගැටලු සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු නොමැති සිසුන් (119) සැළකිල්ලට ගත් විටදී, ඔවුන්ගෙන් 18% (21) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් වන අතර 4% (5) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන අය වේ. තවද සිය ගැටලු සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු නොමැති සිසුන්ගෙන් 79% (94) ක් මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් වුවද ඔවුන්ට සිය ගැටලු සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු නොමැති බැවින් ඔවුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීම, මත්ද්‍රව්‍ය භාවිතය හෝ වෙනත් සමාජ අපචාර ක්‍රියාවන්ට කිසියම් පිරිස් විසින් පොළඹවා ගැනීමේ අවදානමක් පවතින බවට අනාවරණය විය. සිසුන්ගේ ගැටලුවලදී සවන්දීමට පුද්ගලයෙකු නොමැති සිසුන්ගෙන් 3% (4) ක් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ප්‍රතිචාර දක්වා නොමැත.

ප්‍රස්තාරය 25 - ගැටලු විසඳා ගැනීමට උපකාරීවන සහාය කණ්ඩායමේ සංයුතිය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සිය ගැටලු විසඳීමට හෝ සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු සිටි සිසුන් (4956) ගෙන් 84% (4157) ක් එක් දිනක් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන් වූ අතර 15% (766) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් විය. ගැටලු විසඳීමට හෝ සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු සිටි සිසුන්ගෙන් 4% (201) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් විය. මේ අනුව පැහැදිලි වන්නේ, මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ සිසුන්ට සාපේක්ෂව කිසිඳු මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන් සඳහා සිය ගැටලු විසඳාගැනීමට වැඩි අවස්ථාවක් ලැබී ඇති බවයි.
සිසුන්ගේ ගැටලු විසඳීමට සහාය වූ එක් එක් පුද්ගලයන්ගේ බහුවිධ ස්වරූප කෙරෙහි අවධානය යොමු කරන විට එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත (787) කළ, දැනට භාවිත කරන (206) හා කිසිඳු මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ (4251) එක් එක් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සැළකූ විටදී පහත තොරතුරු අනාවරණය විය.

දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් ට (206) ප්‍රතිශතයක් ලෙස සිසුන්ගේ සිය පෞද්ගලික ගැටලු විසඳීමට දෙමාපියන් සිටි බවට 66% (135) ක් ද, සහෝදරයෙකු හෝ සහෝදරියක සිටි බවට 26% (53) ක් ද, පාසලේ මිතුරෙකු හෝ මිතුරියක සිටි බවට 43% (88) ක් ද, ඥාතියෙකු සිටි බවට 14% (28) ක් ද, ගුරුවරයකු සිටි බවට 15% (31) ක් ද, වෙනත් කිසිවකු සිටි බවට 7% (15) ක් ද ලෙස ප්‍රකාශ කර තිබුණි.

මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්ට (4251) ප්‍රතිශතයක් ලෙස 84% (3569) කට පෞද්ගලික ගැටලු විසඳීමට හෝ සාකච්ඡා කිරීමට දෙමාපියන් සිටි බව ද, 22% (915) ක් සඳහා සහෝදරයෙකු හෝ සහෝදරියක සිටි බව ද, 29% (1218) කට පාසලේ මිතුරෙකු හෝ මිතුරියක සිටි බව ද ප්‍රකාශ කළ අතර, ඥාතියෙකු සිටි බවට 10% (423) ක් ද, ගුරුවරයෙකු සිටි බවට 16% (661) ක් ද, වෙනත් පුද්ගලයෙකු සිටි බවට 2% (81) ක් ද ලෙස තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාරය 26 - සිසුන්ගේ ගැටලු විසඳීමට සහාය වූ පුද්ගලයන්ගේ සංයුතිය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

වර්තමානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ හා භාවිත නොකළ සිසුන් තම ගැටලු විසඳා ගැනීමට හෝ සාකච්ඡා කිරීමට සහාය ලබාගත් එක් එක් පාර්ශ්වයන්හි ඉහත ප්‍රතිශත අගයන් සන්සන්දනාත්මකව විශ්ලේෂණය කිරීමේ දී සිය ගැටලු විසඳා ගැනීමට දෙමාපියන් හෝ ගුරුවරුන් සිටින බවට, මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් දැක්වූ ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන ඇත. දෙමාපියන් හෝ ගුරුවරුන් හැර සෙසු පාර්ශ්වයන්ගෙන් ගැටලු විසඳාගැනීමට හෝ සාකච්ඡා කිරීමට සහාය ලබාගත් සිසුන් පිළිබඳව සැළකිල්ලට භාජනය කළ විට දී, මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට සාපේක්ෂ මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් දක්වන ප්‍රතිශත අගයන්හි ඉහළ බවක් දක්නට ඇත. මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් සිය ගැටලු විසඳා ගැනීමට හෝ සාකච්ඡා කිරීමට දෙමාපියන් නොමැති විට දී වැඩි වශයෙන් මිතුරන්ගේ සහාය ලබාගෙන ඇති බවත්, මිතුරන් ද නොමැති විට දී වෙනත් පිරිස් සමග සිය ගැටලු විසඳා ගැනීමට ඔවුන් යොමු වී තිබුණ බවත් අනාවරණය විය.

මේ අනුව පැහැදිලි වන්නේ, සිසුන් සිය ගැටලු වලට විසඳුම් සෙවීමේදී සමවයස් කණ්ඩායම් සමග සාකච්ඡා කිරීම මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීමේ අවධානම වැඩි කරන සාධකයක් බවයි.

2.6 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු

සමීක්ෂණය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 4% (206) ක් වූ අතර 96% (4869) ක් දැනට මත්ද්‍රව්‍ය භාවිත නොකරන බව සමීක්ෂණය තුළින් අනාවරණය විය. මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු වූ කරුණු විමසා බැලීමේදී පහත තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාරය 27 - සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු සාධක



මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් 72% ක් මත්ද්‍රව්‍ය ශරීර සෞඛ්‍යයට අහිතකර නිසාත්, 38% ක් මත්ද්‍රව්‍ය භාවිතය නරක පුරුද්දක් ලෙස සළකන නිසාත්, භාවිත නොකරන බවට ප්‍රකාශ කර තිබුණි. ඊට අමතරව මත්ද්‍රව්‍ය වැඩසටහන් තුළින් ලැබී ඇති දැනුම නිසා 36% ක් ද, දෙමාපියන්ගේ අවවාද පිළිපදින නිසා 28% ක් ද, මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලැබූ දැනුම නිසා 36% ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන පරිසරයක් තමාගේ නිවස හා පවුල තුළ නොමැති නිසා බවත් 38% ක් ද මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවට අනාවරණය විය.

මේ අනුව සමීක්ෂණය තුළ මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් බහුතරයකට මත්ද්‍රව්‍ය භාවිතයෙහි අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ ලබා ඇති අවබෝධය, මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු නොවී සිටීමට හේතුවී ඇති බව මෙහිදී නිගමනය කළ හැකිය.

2.7 මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන් තුළ පැවති දැනුම හා ආකල්ප

2.7.1 මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන්ගේ දැනුම

මත්ද්‍රව්‍ය භාවිතය හා භාවිතය තුළින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳ පාසල් සිසුන් සතු දැනුම පරීක්ෂා කිරීම ද මෙම සමීක්ෂණය තුළින් සිදු කරන ලදි. නියැදියට අයත් පාසල් සිසුන් 5,075 අතුරින් 4,423 දෙනෙකු එනම්, 87% ක් මත්ද්‍රව්‍ය පිළිබඳව අසා තිබුණි. 13% (652) ක් මත්ද්‍රව්‍ය පිළිබඳ නොදන්නා බව ප්‍රකාශ කර තිබුණි.

"ඕනෑම මනෝකාරක ද්‍රව්‍යයක් වූ කලී රෝගයක් වැළැක්වීම හෝ සමනය කිරීමේ විභව්‍යතාවයකින් යුතු හෝ කායික හෝ මානසික සුවතාව වැඩිදියුණු කළ හැකි විභව්‍යතාවක් සහිත ද්‍රව්‍යය" මත්ද්‍රව්‍යය ලෙස වෛද්‍ය විද්‍යාව තුළ අර්ථකථනය කර ඇත (ISSUP,2014, Universal Treatment Curriculum No 01).

ඖෂධවේදී විග්‍රහයට අනුව "ජෛව රසායනිකව හෝ ශරීරයේ පටක හෝ ඉන්ද්‍රියන්ගේ ක්‍රියාවලිය කායික විද්‍යාත්මකව වෙනසකට ලක් කරන ඕනෑම රසායනයක් ඖෂධයක් ලෙස හැඳින්විය හැකිය" (ISSUP,2014, Universal Treatment Curriculum No 01).

තවද පොදු විග්‍රහයට අනුව "වෛද්‍යමය නොවූ හේතු මත භාවිත කරනු ලබන්නා වූ ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය ලෙස හැඳින්විය හැකිය (ISSUP, 2014, Universal Treatment Curriculum No 01).

සිසුන් තුළ මත්ද්‍රව්‍ය පිළිබඳ මෙම මූලික අදහස කෙබඳු ආකාරයෙන් ස්ථාපිත වී ඇද්ද? යන්න මෙම සමීක්ෂණය තුළ සළකනු ලැබිය.

මත්ද්‍රව්‍ය යනු කුමක්ද? යන්න සම්බන්ධයෙන් සිසුන් විසින් ඉදිරිපත් කර ඇති අදහස් විශ්ලේෂණය කිරීමේදී ඔවුන් මත්ද්‍රව්‍ය යන්න බහුවිධ දෘෂ්ටි කෝණයන් තුළින් හඳුනා ගෙන තිබූ බව අනාවරණය විය. එහිදී බහුතර සිසුන් පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පුද්ගලයාගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට, සමාජයට ඇතිවන හානිකර තත්ත්වය පිළිබඳව නිවැරදි කරුණු හා මත සඳහන් කර තිබුණි. එම කරුණු හා මත පහත පරිදි විය.

මත්ද්‍රව්‍ය භාවිතය මඟින් පුද්ගලයාගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට, සමාජයට ඇතිවන බලපෑම පිළිබඳ නිවැරදි කරුණු හා මත

"ශරීරය සහ මනස රෝගී කරන මෙන්ම අඩපණ කරන, පවුල් ප්‍රශ්න හා සමාජ ගැටලු, සෞඛ්‍ය ගැටලු ඇති කරන සිත හා මනස රවටන මත්වන විටෙක මරණය පවා ගෙන දෙන ද්‍රව්‍යයක් ...

නීත්‍යානුකූල නොවන දෙයක්...

ලෝකයට තර්ජනයක්ව පවතින ද්‍රව්‍යයකි ...

මිනිසාට ලංවීමටවත් නොදිය යුතු දෙයක් ...

ශරීරයට අහිතකර වූ රසායන ද්‍රව්‍ය වලින් නිපදවා ඇති, මිනිසුන් නොමඟ යවන, ජීවිතය විනාශ කරන දෙයක් ...

ජීවිතය වෙනස්ම මට්ටමකට ගෙනෙන විෂ ජාතියක්...

ළමා පරිභෝජනයට නුසුදුසු මිනිස් මනස විකෘති කරන දෙයක්...

අපව ගිල දැමීමට එන මාරයා...

මිනිසුන්ගේ ජීවිතය කෙළසන ඔවුන්ගේ සැප සම්පත් නැති කරන රාක්ෂයෙකි...

උසස් මනසකින් යුතු මනුෂ්‍ය වර්ගයාව පිළිකුලට පත්කරන, ප්‍රශ්න ඇති කරන, ලෙඩ රෝග බෝ කරන රාක්ෂයෙක්...

මිනිස් ශරීරයත්, මනසත්, මනුසත්කමත්, සමාජයත් විනාශ කිරීමට මිනිසා තාවකාලිකව පිස්සෙක් බවට පත් කිරීමට ගන්නා ද්‍රව්‍යයක්...

මේ ලෝකයම, ඒ වගේම කුඩා ළමුන් පවා වැරදි ක්‍රියාවන් සඳහා පොළඹවන දෙයක්...

තමන්ට තමන්ව පාලනය කළ නොහැකි ද්‍රව්‍යයක්...

මත්ද්‍රව්‍ය භාවිතය කළහොත් මත්වී දිගටම එයට ඇබ්බැහි වන දෙයක්...

මුදල් නිකරුනේ වැය කිරීමට සිදුවන දෙයකි...

මිනිසුන් තම මානසික තත්ත්වය සහමුලින්ම කනපිට හරවාගෙන ආතතියෙන් කටයුතු කරන තත්ත්වයට පත්කරන දෙයක්...

මිනිස් ජීවිත වලට ආරවුල් ගෙනෙන, ළමුන් නොමඟ යැවීමට නිෂ්පාදනය කර ඇති, මිනිසා මුළුමනින්ම ගිල දමන මත් රකුසෙකි...

මානසික වශයෙන් පහළ මට්ටමක සිටින පිරිස් මිත්‍යා අදහස් නිසා භාවිත කරන දෙයක්...

තමන්ගේ දුර්වලකම් නවතා ගන්න සමාජයේ place එකක් ගන්න පාවිච්චි කරන දෙයක්...

ජීවිතය විනාශ කරන මෙන්ම සතුට නැති කරන විෂ ද්‍රව්‍යයක්... "

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

මත්ද්‍රව්‍ය සම්බන්ධ අදහස් ඉදිරිපත් කළ සිසුන් අතර ඇතැම් සිසුන් මත්ද්‍රව්‍ය වර්ග හා මත්ද්‍රව්‍ය භාවිත කරන ක්‍රම පිළිබඳව ද තොරතුරු දක්වා තිබුණි. එවැනි අදහස් අතර,

මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳව සිසුන් දක්වා තිබූ අදහස්

"දුම්වැටි, කුඩු, හොරොයින්, KG, තුල්, මාවා, බියර්, අරක්කු, රම්, විස්කි ආදිය...

අරක්කු කුඩු ගංජා වැනි ඇබ්බැහි වන දේවල්...

මත්වීමට ගන්නා කෑමක් හෝ බීමක්...

එන්නත් කරගැනීමෙන්, පානය කිරීමෙන් හෝ ආඝ්‍රාණය කිරීමෙන් ශරීරගත කරගන්නා දෙයකි...

දීර්ඝකාලීන අතුරු ආබාධ ඇති කරන, නිකොටින් ආදී විවිධ ද්‍රව්‍ය යොදා සකස් කරනු ලබන දෙයකි...

ශරීරයට අහිතකර වූ ඇබ්බැහිකම මත පාවිච්චිය සඳහා යොමුවන දියරයක්, කුඩු වර්ගයක් හෝ පෙති වර්ගයක් ...

පිටරටින් අප රටට ගෙන එන ද්‍රව්‍යයකි..."

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

මෙහිදී ඇතැම් සිසුන් මත්ද්‍රව්‍ය වර්ග හා මත්ද්‍රව්‍ය භාවිත කරන ආකාරය පිළිබඳව අදහස් ඉදිරිපත් කර තිබූ අතර එමගින් පැහැදිලි වන්නේ, ඔවුන් ජීවත්වන තම පරිසරය හා ඇසුරු කරන පුද්ගලයින්ගේ චර්යා රටාවන් තුළ එවැනි දෑ නිරීක්ෂණය කර ඇති බවයි.

තවද මත්ද්‍රව්‍යවල ඇති ඡේව විද්‍යාත්මක බලපෑම හා එහි රසායනික සංයුතිය පිළිබඳව ද සිසුන් විසින් අදහස් දක්වා තිබුණි.

ඇතැම් සිසුන් විසින් ඉදිරිපත් කළ පහත අදහස් විශ්ලේෂණය කළ විටදී අනාවරණය වන්නේ, සිසුන් මීට පෙර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් තුළින් පෝෂණය වී ඇති බවයි.

ඡේව විද්‍යාත්මක බලපෑම හා එහි රසායනික සංයුතිය පිළිබඳ දැක්වූ අදහස්

"රුධිර පීඩන මට්ටම වැඩි කරන හෝ ශරීරයට යම් උත්තේජනයක් ලබාදෙන ද්‍රව්‍යයක්...

සෞඛ්‍යට හානි පමුණුවන රසායනික ද්‍රව්‍යයක්...

විෂ රසායනිකයක්...

මිනිසාගේ ශරීරයට අහිතකර මානසික සිහිය නැති කරන/විකෘති කරන ද්‍රව්‍යයක්...

ඇබ්බැහි වන දෙයක් ..."

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

බහුතර සිසුන් පිරිසක් මත්ද්‍රව්‍ය වල අයහපත් පැතිකඩ පිළිබඳ නිවැරදි අදහස් ඉදිරිපත් කළත් ඇතැම් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ වැරදි මත, එනම් මිත්‍යා මත වල තවදුරටත් එල්බ සිටින බව සිසුන් ඉදිරිපත් කළ පහත ආකාරයේ ප්‍රකාශ වලින් තහවුරු වේ.

මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ දක්වා තිබූ මිත්‍යා මත

"මිනිසුන්ට කළ නොහැකි දේ කරන අත්භූත භයානක ද්‍රව්‍යයක්...

මත්වන දෑ එකතුකොට යම්කිසි රසවින්දනයක් ලබාදීමට තිබෙන දෑ...

විවිධ පුද්ගලයින් තමන්ට ඇති ශක්තිය, හීනකම නිසා මත්වීමට ගන්නා විවිධ ද්‍රව්‍ය...

ක්ෂණිකව උත්තේජනයන්ට ක්‍රියාකර ශරීරය අවනත කරන දෙයකි...

මත්වන දෑ එකතු කොට යම්කිසි රසවින්දනයක් ලබාදීමට තිබෙන දෑ...

කායික මානසික අවශ්‍යතා ඉටුකරගැනීමට භාවිත කරන විෂ සහිත ද්‍රව්‍ය...

අත්‍යවශ්‍ය දෙයක්...

මිනිසුන් විනෝදයට/ආශ්වාදයක් සඳහා භාවිත කරන ද්‍රව්‍යයක් ලෙස...

තාවකාලික විනෝදයක් ලබාගැනීම සඳහා නිපදවූ දේවල්...

ආශාවන් ඉටුකරගැනීමට භාවිත කරන දෑ...

කෙටිකාලීන සතුටට පත්වන යමක්...

ළමා මට්ටමෙන් පරිභෝජනය කිරීමට නුසුදුසු දේවල්...

මූලාශ්‍රයඃ (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන් විසින් ඉදිරිපත් කර ඇති ඉහත අදහස් විශ්ලේෂණය කර බලන විට සිසුන් මෙවැනි අදහස් වල එල්බ ගෙන සිටිනුයේ කිසියම් මත්ද්‍රව්‍යක් භාවිතයෙන් ලද වැරදි අත්දැකීම් හෝ සිය මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන්, පවුලේ සමාජිකයින් හෝ සිය සමීපතම පුද්ගලයින් හරහා ලද මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අත්දැකීම් සහ මිත්‍යා මත ඔවුන් තුළ ස්ථාපිත වීමේ ප්‍රතිඵලයක් ලෙස බව ප්‍රකාශ කළ හැකිය.

2.7.2 මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත්භාවය හා දැනුම ලබාගත් මූලාශ්‍ර

මත්ද්‍රව්‍ය භාවිත කිරීම තුළින් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව හෝ, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමට අවශ්‍ය උපදෙස්, දැනුම, ලබා දෙන්නා වූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සිසුන් සම්බන්ධ වී තිබේ ද? යන්න සමීක්ෂණයේ දී විමසා බලන ලද අතර ඒ අනුව සිසුන්ගෙන් 74% (3,741) ක් කුමන හෝ දැනුවත්කිරීමේ වැඩසටහනකට සම්බන්ධ වී තිබූ අතර සිසුන්ගෙන් 26% (1,334) ක් දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගි වී නොතිබුණි. කුමන හෝ නිවාරණ වැඩසටහනකට සහභාගී වූ සිසුන් අතරින් 70% (2,601) ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනකට සහභාගී වී තිබූ බව අනාවරණය විය. 11% (395) ක් මත්ද්‍රව්‍ය වලින් වැළකීම සඳහා උපදෙස් ලබා දෙන වැඩසටහන්වලට සහභාගි වී තිබූ අතර 10% (381) ක් මත්ද්‍රව්‍ය සම්බන්ධ විෂයානුබද්ධ පාඩම්වලට සහභාගී වී තිබුණි. 9% (354) ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන සෞඛ්‍ය ගැටලු පිළිබඳව දැනුවත් වී තිබූ බව අනාවරණය විය.

ප්‍රස්තාරය 28 - මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

"මත්ද්‍රව්‍ය නිවාරණය" යනු මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ කිරීම වැළැක්වීමට ගන්නා ක්‍රියාවලියක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධ ගැටලු වර්ධනය සීමා කිරීමක් වන අතර නිවාරණ ප්‍රයත්නයන්හිදී පුද්ගලයා හෝ ඔවුන්ගේ වටපිටාව කෙරෙහි අවධානය යොමු කළ හැකිය." (SCODC, September, 2008)

කිසියම් පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය අත්හදා බැලීමෙන් වළක්වා ගත හැකි නම් ඔහු එම මත්ද්‍රව්‍යය සඳහා ඇබ්බැහි වීමෙන්ද වලක්වා ගත හැකිය. ඇබ්බැහි වීමෙන් පසු ප්‍රතිකාර කිරීමට වඩා මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීමට පෙර ඉන් වළක්වා ගැනීම, වඩාත් ප්‍රශස්ත වූත් ප්‍රායෝගික වූත් උපක්‍රමය ලෙස දැක්විය හැකිය. (Prevention is better than cure) එබැවින් පාසැල් සිසුන් තුළ "මත්ද්‍රව්‍ය නිවාරණය" පිළිබඳ වඩාත් ධනාත්මක අදහසක් ස්ථාපනය වී තිබීම වැදගත් වන අතර මෙම සමීක්ෂණයේදී පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ දැනුම හා අවබෝධය විමසනු ලැබූ අතර එහිදී සිසුන් " මත්ද්‍රව්‍ය නිවාරණය" යන්න පහත පරිදි විග්‍රහ කර තිබුණි.

සමීක්ෂණය තුළ නියැදියට සම්බන්ධ වූ සිසුන් අතරින් බහුතරයක් නිවාරණය සම්බන්ධයෙන් නිවැරදි අදහස් දක්වා තිබුණ ද මත්ද්‍රව්‍ය නිවාරණය යන්න වඩාත් පරිපූර්ණ අර්ථ නිරූපණයක් ඔවුන්ගේ පිළිතුරු තුළින් විද්‍යමාන නොවූ බව ප්‍රකාශ කළ හැකිය.

සිසුන්ගෙන් බහුතරයක් "මත්ද්‍රව්‍ය නිවාරණය" යන්න "මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ දැනුම හා උපදෙස් ලබාදෙන ප්‍රතිකාර ක්‍රියාවලියක්" ලෙස අර්ථකථනය කර ඇති බව පහත අදහස් විශ්ලේෂණ කිරීමෙන් නිගමනය කළ හැකිය.

" මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ අයට මත්ද්‍රව්‍ය මගින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව අවබෝධයක් ලබාදී එයින් වැළකීම...

මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සමාජයක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් දැනුවත් කිරීම...

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට ප්‍රතිකාර කිරීම...

මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූ පුද්ගලයන් ඉන් මුදවා ගැනීමට හා භාවිතය අවම කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම මෙන්ම ප්‍රායෝගිකව එය ක්‍රියාත්මක කිරීම...

මත්ද්‍රව්‍ය භාවිතයෙන් පීඩා විඳින්නන් යහමඟට ගැනීම...

මත්ද්‍රව්‍ය වලට පෙළඹුණ පුද්ගලයින් ඉන් මුදවාගැනීම, මත්ද්‍රව්‍ය තුරන් කිරීම, බෙදාහරින්නන් හා ගෙන්වන්නන් මර්දනය කිරීම ආශ්‍රිත ක්‍රියාවලියකි...

මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම..."

"මත්ද්‍රව්‍ය නිවාරණය" යන්න මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ අවබෝධයක් ලබා දෙන පුද්ගලයා හා ප්‍රජාව පදනම් කරගත් ප්‍රායෝගික ක්‍රියාවලියක් ලෙස ද සිසුන් සුළු පිරිසක් විසින් හඳුනාගෙන ඇති බව පහත අදහස් මගින් පැහැදිලි වේ.

"මත්ද්‍රව්‍ය වලින් සිදුවන අහිතකර ප්‍රතිවිපාක වලින් වැළකී සිටීමට දායක වන ප්‍රායෝගික වැඩපිළිවෙළකි...

මත්ද්‍රව්‍ය හේතුවෙන් ඇතිවන ශාරීරික, මානසික, සමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් වූ අහිතකර බලපෑම් මැඩපැවැත්වීමට කටයුතු කිරීම...

මත්ද්‍රව්‍ය වලින් ඈත් වී ජීවිතය විනාශ කරගැනීමෙන් වැළකී සිටින්නට උපදෙස් ලබාදීම...

යම් ප්‍රදේශයක හෝ ස්ථානයක මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගල සංඛ්‍යාව අඩු කිරීම හා එම ප්‍රදේශයෙන් මත්ද්‍රව්‍ය ඉවත් කිරීම...

මත්ද්‍රව්‍ය භාවිතය තමාගෙනුත්, අන් අයගෙනුත්, සමාජයෙනුත් ඉවත්කර දැමීමට කටයුතු කිරීම...

මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට පිළියම් යෙදීම සහ එයින් ඇතිවන අහිතකර බලපෑම් නිරාකරණය කිරීමට යොදාගන්නා උපක්‍රමයක්...

මත්ද්‍රව්‍ය නැති කිරීම...

"මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි නොවූ අයට මත්ද්‍රව්‍ය මගින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව අවබෝධයක් ලබා දී එයින් වැළකීම...

මත්ද්‍රව්‍ය ආදීනව සම්බන්ධව ප්‍රජාව දැනුවත් කර ඔවුන් එයින් මුදවා ඒවායින් වළකාලීම/ මුදවා ගැනීම.

සමීක්ෂණය තුළ සිසුන්ගෙන් බහුතරයක් "මත්ද්‍රව්‍ය" යනු කුමක්ද? යන්න පිළිතුරු දක්වා තිබුණ ද මත්ද්‍රව්‍ය නිවාරණය යනු කුමක්ද? යන්න සම්බන්ධව සාපේක්ෂව අඩු ප්‍රතිචාර ප්‍රමාණයක් දක්වා තිබිණි. තවද මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව සිසුන් විසින් ඉදිරිපත් කළ එක් එක් අදහස් විශ්ලේෂණය කළ විටදී මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පෙර සඳහන් පොදු අර්ථකථන හා සසඳන කල්හි සිසුන්ගෙන් සුළු පිරිසක් මත්ද්‍රව්‍ය නිවාරණය නිවැරදි ලෙස හඳුනාගෙන තිබූ නමුත් බහුතරයක් තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් පරිපූර්ණ අවබෝධයක් නොතිබුණ බව ඔවුන්ගේ අදහස් තුළින් විද්‍යමාන විය.

මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් සිසුන් තුළ පූර්ණ අවබෝධයක් නොමැති වීමෙන් සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ අබණ්ඩ භාවිතය කෙරෙහි යොමුවිය හැකි ය. මේ නිසා සිසුන් තුළ තවදුරටත් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ දැනුම යාවත්කාලීන කළ යුතුව ඇත.

2.7.3 සිසුන් ජීවත්වන ප්‍රදේශ තුළ පවතින සමාජ හා සෞඛ්‍ය ගැටලු පිළිබඳ දැනුවත් බව

මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන සෞඛ්‍ය, සමාජ, පාරිසරික ගැටලු හා ඒ ආශ්‍රිත නීතිවිරෝධී ක්‍රියාකාරකම් හා අපචාරී ක්‍රියා පිළිබඳව සිසුන්ගේ දැනුම විමසා බැලූ අතර සිසුන්ගෙන් 53% (2694) ක් එවැනි ක්‍රියා පිළිබඳ දැනුවත් වී තිබුණු අතර 47% (2381) ක් ඒ පිළිබඳව නොදන්නා බව ප්‍රකාශ කර තිබුණි.

ප්‍රස්තාරය 29 - සමාජ අපගාමී හා සමාජ අපචාරී ක්‍රියා පිළිබඳ සිසුන්ගේ දැනුම



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

සිසුන් ප්‍රකාශ කළ පරිදි ඔවුන් ජීවත්වන සමාජ පරිසරය තුළ ප්‍රධාන වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතය නිසා සමාජයීය හා පාරිසරික ගැටලු මෙන්ම වෙනත් නීතිවිරෝධී ක්‍රියා සිදුවන බව අනාවරණය විය.

නියැදිය තුළ එවැනි ගැටලු ඇතැයි ප්‍රකාශ කළ සිසුන්ගෙන් 47% (1265) ක් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ගැටලු පවතින බව ප්‍රකාශ කර තිබිණ. සිසුන් ජීවත්වන පරිසරය අවට මිනිසුන් මත්ද්‍රව්‍ය අලෙවිය හා ජාවාරම වැනි කටයුතු වල නිරත වන බව සිසුන්ගෙන් 22% (592) ක් ද, අඩදබර හා කළකෝලාහල පවතින බවට 13% (344) ක් ද, පරිසර දූෂණයක් සිදුවන බවට 7% (183) ක් ද, සෞඛ්‍ය ගැටලු පවතින බවට 7% (189) ක් ද ප්‍රකාශ කර තිබුණි. තවද ළමා අපචාර/අපයෝජන, ස්ත්‍රී දූෂණ, ගණිකා වෘත්තිය, සොරකම් කිරීම්, වංචා කිරීම් වැනි සමාජ විරෝධී ක්‍රියාවන් ද, දරිද්‍රතාවය වැනි ගැටලු ද සිසුන්ට නිරීක්ෂණය වී ඇති අතර එවැනි දෑ 2% ක් හෝ ඊට අඩු මට්ටමක පවතින බවත් අනාවරණය විය.

2.7.4 මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය

සිසුන් ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලු වලට මුහුණ දුන් පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය පිළිබඳව විමසන ලදි. සිසුන්ගෙන් 65% (3275) ක් මත්ද්‍රව්‍ය භාවිතය නිසා විපතට පත් එවැනි පුද්ගලයින් තම ගම් ප්‍රදේශවල ජීවත්වන බවට තමා දැනුවත් බවත් සිසුන්ගෙන් 35% (1800) ක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව නොදන්නා බවත් ප්‍රකාශ කර තිබුණි.

ප්‍රස්තාරය 30 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

ජීවත් වන ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ගැටලුවලට මුහුණ දුන් පුද්ගලයින් සිටින බවට දැනුවත් සිසුන්ගෙන් 56% (1846) ක් සිය අසල්වැසියන් එවැනි ගැටලුවලට මුහුණ දී ඇති බව ප්‍රකාශ කර ඇත. තවද සිසුන්ගෙන් 11% (351) ක් තම යහළුවන් ද, 9% (308) ක් තම ඥාතීන් ද මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලුවලට මුහුණ දී ඇති බව ප්‍රකාශ කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ, සිසුන්ගේ පවුලේ

සාමාජිකයින්, ඥාතීන් හා අසල්වැසියන්, මිතුරන් මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් ඔවුන් එවැනි පරිසරයක් තුළ ජීවත් වන බවත්ය.

වගුව 20 - ජීවත් වන ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලුවලට මුහුණ දුන් පුද්ගලයින් පිළිබඳ දැනුවත්භාවය

තමා දන්නා පුද්ගලයින්ගේ සම්බන්ධතාවය	සංඛ්‍යාව	ප්‍රතිශතය%
පවුලේ සාමාජිකයින්	136	4%
අසල්වැසියන්	1,846	56%
ඥාතීන්	308	9%
යහළුවන්	351	11%
පිළිතුරු නොදුන් සංඛ්‍යාව	876	27%
එකතුව	**5075**	**100%**

මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

2.7.5 පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවල සාමාජිකත්වය

සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ඉඩකඩ අවම කිරීම උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ඇතුළු රජයේ සහ රාජ්‍ය නොවන ආයතන විසින් පාසල් සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. තවද සිසුන්ගේ දැනුම කුසලතා, නිපුණතා සංවර්ධනය කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා ඇති අතර මෙම කමිටු වල (School Quality Society) සාමාජිකත්වය පිළිබඳව සිසුන්ගෙන් විමසන ලදි.

සිසුන්ගෙන් 8% (408) ක් පමණක් දැනට මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවල සාමාජිකයන් වූ අතර 92% (4667) ක් ම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවලට සහභාගී වී හෝ සාමාජිකත්වය ලබා නොතිබුණි.

2.7.6 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා සහභාගි වීමට සිසුන් තුළ ඇති අවශ්‍යතාවය

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගී වීමට සිසුන් තුළ ඇති කැමැත්ත හා අවශ්‍යතාවය පිළිබඳව මෙම සමීක්ෂණයේ දී විමර්ශනය කළ අතර එවැනි වැඩසටහන් සඳහා සහභාගීවීමට සිසුන් 81% (4088) ක් තම කැමැත්ත ප්‍රකාශ කර තිබිණ. සිසුන් 19% (987) ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගීවීමට අකමැත්ත ප්‍රකාශ කර තිබිණ. මේ අනුව පැහැදිලි වන්නේ, සිසුන් තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සම්බන්ධයෙන් විෂය පිළිබඳ දැනුම ලබාගැනීමට අවශ්‍යතාවක් පවතින බවයි.

ප්‍රස්තාරය 31 - සිසුන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමේ සංයුතිය



මූලාශ්‍රය: (සමීක්ෂණ දත්ත, 2016/17)

මත්ද්‍රව්‍ය භාවිත කිරීම හෝ නොකිරීම මඟින් මත්ද්‍රව්‍ය නිවාරණය කෙරෙහි සිසුන් දක්වන කැමැත්ත වෙනස්විය හැකි ද යන්නත් මෙහිදී අධ්‍යයනය කළ අතර ඒ සඳහා එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ, දැනට මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදෙන හා මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කෙදිනකවත් යොමු වී නොමැති එක් එක් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සලකමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සිසුන් 24% ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමට සිය අකමැත්ත ප්‍රකාශ කර තිබිණි. එමෙන්ම දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 26% ක් මෙවැනි වැඩසටහන් වලට සහභාගි වීමට අකමැත්ත ප්‍රකාශ කර තිබූ අතර කිසිදිනක මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සිසුන් 18% ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගිවීමට සිය අකමැත්ත ප්‍රකාශ කර තිබිණ. මේ අනුව පැහැදිලි වන්නේ, කිසිදිනෙක මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්, එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ හා දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට වඩා අඩු ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමට අකමැත්ත ප්‍රකාශ කර තිබූ බවයි. මේ අනුව එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ හෝ දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පවතින නැඹුරුතාව, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමට දක්වන අකමැත්ත තුළින් තවදුරටත් පැහැදිලි කර ගතහැකි වේ.

එවැනි වැඩසටහන් වලට සහභාගී වීමට කැමැත්ත ප්‍රකාශ කළ සිසුන්ගෙන් ඒ සඳහා පහත හේතු සාධක ඉදිරිපත් කර තිබුණි.

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සිසුන් සහභාගි වීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ලබාගැනීමටත්, මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවිය හැකි අවදානම් සහිත සිසුන්ට එයින් වැළකී සිටීමටත් අවස්ථාවක් වනු ඇත. එය සිසුන්ට පෞද්ගලික වශයෙනුත්, සමාජයීය වශයෙනුත් ඉතා වටිනා අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගී වීමට කැමැත්ත ප්‍රකාශ කළ සිසුන් එයට හේතු ලෙස ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි ප්‍රධාන අංශ 2 ක් යටතේ විශ්ලේෂණය කරන ලදි.

- **දැනුම ලබා ගැනීමට**

"මත්ද්‍රව්‍ය උවදුර ගැන දැනගෙන ඒවා භාවිත කරන්නන් ඉන් මුදවා ගැනීමට...
සමස්ත සමාජයම දැනුවත් කිරීමට...
මත්ද්‍රව්‍ය වල අහිතකරභාවය පිළිබඳ අවබෝධයක් ලබා දෙන නිසා...
මත්ද්‍රව්‍ය වල අහිතකර ප්‍රතිඵල අන්අයට කියා දිය හැකි නිසා...
මත්ද්‍රව්‍ය පිළිබඳ නොදන්නා කරුණු දැන ගැනීමට...
මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමට උපදෙස් ලබා ගැනීම සඳහා ...
රට තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සිදුකරන අන්දම ඉගෙන ගැනීමට...
මත්ද්‍රව්‍යය වලින් ඇතිවන රෝගාබාධ දැනගැනීමට...
මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැන ගැනීමට...
මත්ද්‍රව්‍ය ශරීරයට අහිතකර වන්නේ ඇයි ද? යන්න අවබෝධ කර ගැනීමට... "

- **අන් අය මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීම හා සමාජ යහපත උදෙසා**

"සමාජයේ යහපත උදෙසා...
යහපත් පුරවැසියෙක් ලෙස ජීවත් වීමට...
මත්ද්‍රව්‍ය නිවාරණයට සහාය වීමට...
මත්ද්‍රව්‍ය නිසා සිදුවන දුරාචාරය හා සෞඛ්‍යයට සිදුවන හානිය වැළැක්වීමට...
සමාජයට අප විසින් කළ යුතු වගකීමක් ලෙස සිතා...
රටේ ජනතාවගේ හොඳ සෞඛ්‍ය ආරක්ෂාව උදෙසා...
මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන විපත් අවම කර ගැනීමට...
අයහපත් දේට අකමැති නිසා යහපත් දේ ලබා ගැනීමට ..."
"මත්ද්‍රව්‍ය භාවිතය නැති කිරීමට...
මත්ද්‍රව්‍යයෙන් තොර රටක් බිහිකිරීම සඳහා ...
පාසැල තුළ මත්ද්‍රව්‍යයට යොමු වී සිටින අය ඉන් මුදවා ගැනීම...
මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට සහාය විය හැකි නිසා...
මත්ද්‍රව්‍ය වලින් තොර ලොවක් මතු පරපුරට ලබාදීම උදෙසා...
මත්ද්‍රව්‍ය භාවිත කරන අයට ආදර්ශයක් වීමට... "

ඉහත ප්‍රකාශ කර ඇති කරුණු තුළින් පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම තුළින් ලැබිය හැකි ප්‍රතිඵල සම්බන්ධයෙන් සිසුන් තුළ යම් අවබෝධයක් තිබූ බවයි. එවැනි අවබෝධයක් සිසුන් තුළ පැවතීම පුද්ගලිකව ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු නොවී වැළකි සිටීමට හේතු වී ඇති බවයි.

3. නිගමන

සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය අනුව පහත නිගමනවලට එළඹිය හැකිය.

- පාසැල් සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව දත්ත විශ්ලේෂණය කළ විට මෙම නියැදිය තුළින් සුළුතරයක් සිසුන් කුමන හෝ මත්ද්‍රව්‍යයක් එක්වරක් හෝ භාවිත කර තිබුණි. එය 16% කි. නිතර මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 6% ක් නියැදියෙන් හමුවිය. මේ අනුව පාසැල් සිසුන් සුළුතරයක් මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් එම සුළුතරය විසින් පාසැල තුළ සිදුකරනු ලබන පෙළඹවීම් මත හා විවිධ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පාසැල් සිසුන්ට විවිධ මත්ද්‍රව්‍ය හඳුන්වා දීමට කටයුතු කිරීමත් යන ප්‍රබල සාධක මත මත්ද්‍රව්‍ය භාවිත කරන පාසැල් සිසුන්ගේ සංඛ්‍යාව මෑත කාලීනව ක්‍රමික වර්ධනයක් දැකගත හැකි බව නිගමනය කළ හැකිය.
- මත්ද්‍රව්‍ය අත්හදා බැලූ හෝ දැනට භාවිත කරන සිසුන් ගත්කල, බහුතරයක් සිසුන් අතර දුම්බීමේ (සිගරට්) 5.52% ක ප්‍රවණතාවයක් පෙන්වූ අතර දෙවනුව මද්‍යසාර/බියර් 4.6% ක් ද සහ තෙවනුව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) 3% ක ප්‍රවණතාවයක් දක්නට ලැබුණි.

- අධ්‍යයනයට ලක්කළ දිස්ත්‍රික්ක අතුරින් කොළඹ, මහනුවර හා පුත්තලම යන දිස්ත්‍රික්ක සැළකිල්ලට ගත් විටදී, සිසුන්ගේ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ඉහළ යෑමක් ඇති බව නිගමනය කළ හැකිය.
- සමීපතම පුද්ගලයින් හරහා සිසුන් වැඩි වශයෙන් සිගරැට්, මද්‍යසාර, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) වැනි ප්‍රාථමික මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීම නිසා සිසුන්ගෙන් බහුතරයක් අනෙකුත් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව සිගරැට්, මද්‍යසාර, බියර් හා දුම්කුඩු වැනි මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමක් දක්නට ඇත. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් ද ඉහත මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ භාවිතය කෙරෙහි යොමුවීමේ ඉහළ අවදානමක සිටින බවත් මෙහිදී නිගමනය කළ හැකිය.
- පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට පරිසර සාධක ඉතා ඉහළින් බලපා ඇති බවත් සිසුන් ඇසුරු කරන සමීපතම මිතුරන්, සිසුන් ජීවත්වන නිවසේ සමාජිකයින්, අසල්වැසියන් හා ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වයන්, ඔවුන්ගේ හැසිරීම් රටාවන් හා ඔවුනොවුන්ගේ මත්ද්‍රව්‍ය සම්බන්ධ ආකල්ප, කිසියම් සිසුවෙකු මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ භාවිත කිරීම කෙරෙහි සෘජුවම බලපාන බව විශ්ලේෂිත තොරතුරු මගින් නිගමනය කළ හැකි විය. ඒ අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඔවුන්ගේ පරිසරය විශාල බලපෑමක් කරන බව අනාවරණය විය.
- සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීමට දෙමාපියන්ගේ ආදරය හා රැකවරණය අත්‍යවශ්‍ය බව මෙහිදී අනාවරණය වූ අතර දෙමාපියන්ගේ ආදරය හා රැකවරණය අවම මට්ටමක පවතින අවස්ථාවන්හිදී හා එවැනි අවස්ථාවන්හි දී සිසුන් මත්ද්‍රව්‍ය වලට යොමුවීමේ ප්‍රවණතාවක් පවතින බව නිගමනය කළ හැකි විය.
- තවද සිසුන්ගේ දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කළ හැකි බවත් නිගමනය කළ හැකි විය.
- සිසුන් ඉලක්ක කරගනිමින් විවිධ පිරිස් විසින් මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකරන බවත්, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ අනිසි බලපෑම් ද හේතුවී ඇති බවත් නිගමනය කළ හැකි විය.
- ඇතැම් පාසැල්වල මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ව පාසැල් තුළ ප්‍රසිද්ධ කිරීම, දඬුවම් කිරීම හා පාසැලේ ශිෂ්‍යභාවයෙන් ඉවත් කිරීම් ආදි සිදුවීම් සිදුව ඇති බවට තොරතුරු අනාවරණය කර ගත හැකි විය. එසේ කිරීම තුළින් සිසුන් තවදුරටත් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීමේ ඉඩ ප්‍රස්ථා වැඩිවන බව තහවුරු විය.

4. යෝජනා

- ✓ **අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් පාර්ශ්වකරුවන් ඒකරාශී වීමෙන් සමස්ත පාසැල් පද්ධතිය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කළහැකි මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහනක් ස්ථාපිත කිරීම.**

  කොළඹ, මහනුවර හා පුත්තලම යන දිස්ත්‍රික්ක වල අන්තරායකර ඖෂධ වන ගංජා හා මනෝවර්තක ගණයේ ඖෂධ (පෙතිවර්ග) ක්‍රමයෙන් ප්‍රචලිතවීමේ ප්‍රවණතාවක් දක්නට ඇති බැවින් එම දිස්ත්‍රික්කයන් සඳහා විශේෂ අවධානයක් යොමු කර ගංජා හා මනෝවර්තක ගණයේ ඖෂධ භාවිතය තුරන් කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ආරම්භ කළ යුතු වේ. නියැදියේ හෙරොයින් අත්හදා බැලූ සිසුන් දෙදෙනෙකු හමුවුව ද කොළඹ දිස්ත්‍රික්කයේ හෙරොයින් සුලභතාවය සහ භාවිතයේ වර්ධනය සමඟ පාසැල් සිසුන් කෙරෙහි ද අවධානමක් ඇත. එබැවින් මේ පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

- ✓ **මත්ද්‍රව්‍ය නිවාරණය හා එහි වැදගත්කම පිළිබඳව සිසුන්ගේ මනසේ වඩාත් අවධාරණය වන පරිදි දැනුම් පරිචයන් පාසැල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම.**

  මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවූ සිසුන් පාසැලේ ශිෂ්‍යභාවයෙන් ඉවත් කිරීම, ප්‍රසිද්ධ කිරීම හෝ දඬුවම් කිරීම වැනි ක්‍රියාමාර්ග මේ සඳහා සාර්ථක විසඳුම් නොවන බැවින් ඔවුන්ට මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් වීමට හා මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ ඔවුන්ගේ පෞද්ගලික ගැටලු විසඳා ගැනීමට අවස්ථා උදා කර දිය යුතුය. ඒ සඳහා උපදෙස් හා අවශ්‍ය පරිසරය

සකසා දීම වඩාත් ප්‍රතිඵලදායක වන අතර මේ සඳහා පාසලේ සුදුසුකම් ලත් ගුරුවරයෙකු උපදේශකවරයෙකු ලෙස පුහුණු කිරීම හෝ සෑම පාසැලකටම උපදේශන ගුරුවරුන් බඳවා ගැනීම.

- ✓ **නීතිය ක්‍රියාත්මක ආයතන මෙම ජාවාරම් සම්බන්ධව විශේෂ අවධානයක් යොමුකර ජාවාරම් සම්බන්ධ ඉහළ පෙළ පුද්ගලයින් හඳුනා ගැනීම හා නීතිය ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු වේ.** පාසැල් කාලයෙන් අනතුරුව සිසුන් ගැවසෙන ස්ථාන හා උපකාරක පන්ති අවට මත්ද්‍රව්‍ය අලෙවි කරන වෙළඳසැල් ඇද්දැයි හඳුනා ගැනීම හා එවැනි ස්ථාන සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ වැඩසටහනක් නීතිය ක්‍රියාත්මක හා බලාත්මක ආයතන ඒකාබද්ධව සැලසුම් කිරීම හා කඩිනමින් ක්‍රියාත්මක කිරීම.

5. ආශ්‍රිත ග්‍රන්ථ

UNDESA, (January, 2013). Retrieve from http://www.un.org/esa/socdev/documents/youth/fact-sheets/ youth - definition.pdf

ISSUP, (2014).Universal Treatment Curriculum No 01, Physiology, and Pharmacology for Addiction Professionals Publication of United States of America

SCODC, (September, 2008). Retrieved from http://www.scodc.org/tag/drug-prevention/

Lewis, (August, 2017). Retrieved from https://www.livestrong.com/article/79017-factors-influence-drug-abuse/

National Dangerous Drugs Control board. Handbook of Drug Abuse Information in Sri Lanka. Rajagiriya: National Dangerous Drugs Control Board; 2017. 70 p.

කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදයන්වල මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය

ප්‍රධාන පර්යේෂක
භද්‍රානි සේනානායක
තමර දර්ශන

1 හැඳින්වීම

1.1 අධ්‍යයන පසුබිම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත ප්‍රකාරව මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ ඒ ආශ්‍රිතව මතුවන ආර්ථික, සමාජ, වෛද්‍යමය, නෛතික හා වසංගතමය තත්ත්වයන් පිළිබඳව පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම පර්යේෂණ අංශය මඟින් සිදුකරනු ලබයි. මෙම දිශානතීන් තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත විවිධ තේමාවන් හා කාලීන ප්‍රවණතාවයන් හඳුනා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණවල අනාවරණයන් මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය හා නිවාරණය උදෙසා ක්‍රියාත්මක වන යාන්ත්‍රණය සක්‍රීය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවරයන් සඳහා නිර්දේශ ලෙස ඉදිරිපත් කරනු ලබයි.

පුළුල් වර්ගීකරණයකට ලක් කළ හැකි මත්ද්‍රව්‍ය විෂය තුළ ප්‍රකටව හඳුනාගත හැකි සහ නිලීන ප්‍රවණතාවයන් කාලීනව උද්ගත වෙමින් පවතියි. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමේ දී කාලානුරූපිව අන්තරායකර ඖෂධ අතුරින් හෙරොයින් හා ගංජා සම්බන්ධ ඉහළ ප්‍රවණතාවයක් හා ව්‍යාප්තියක් හඳුනාගත හැකි අතර ඊට අමතරව ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා වෙනත් වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ පෙති වර්ග අවභාවිත කිරීම් සම්බන්ධ ප්‍රවණතාවයන් ද නිර්මාණය වෙමින් පවතින බව තහවුරු වෙයි. නීතිය ක්‍රියාත්මක කරන අංශවල වාර්තා වලට අනුව මෙවැනි මත්ද්‍රව්‍ය විශේෂයන්වල ව්‍යාප්තිය ගංජා සහ හෙරොයින් ව්‍යාප්තිය තරම් නොවූව ද මේ තුළ හඳුනාගත හැකි අවදානම් සහගත තත්ත්ව රාශියක් ඇත.

ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගෝලීය මට්ටමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවට ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව ඇතුළු සංඛ්‍යාලේඛන සාක්ෂි දරන අතර ඒ සම්බන්ධ කලාපීය මට්ටමින් ද පුළුල් කතිකාවන් සහ නෛතික ක්‍රියාමාර්ග පුළුල් කිරීම සිදුවෙමින් පවතී. අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ (INCB) 2016 වාර්ෂික වාර්තාවට අනුව දකුණු ආසියාතික කලාපය විශේෂයෙන් මියන්මාරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය තුළ ඇම්පිටමින් වර්ගයේ පෙති වර්ග ජාවාරම ඉහළ ගොස් ඇති බවට වාර්තා වෙයි.

ලංකාව තුළ ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ යම් යම් සිද්ධීන් පසුගිය අවුරුදු කිහිපය තුළ වාර්තා වී ඇති නමුත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි අනාවරණයක් සහිත අධ්‍යයනයක් හෝ පර්යේෂණයක් මේ වනවිට ක්‍රියාත්මක කර නැත. මත්ද්‍රව්‍ය ආශ්‍රිත පර්යේෂණ ක්ෂේත්‍රය තුළ අන්තරායකර ඖෂධ අවභාවිතය පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයන සිදු වී ඇති නමුත් මෙවැනි ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හෝ වෛද්‍යමය අරමුණු වලට අදාළ ඖෂධ අවභාවිතය පිළිබඳ ප්‍රමාණවත් දත්ත වාර්තා ප්‍රකාශයට පත් වී නොමැත. එමෙන්ම පොදුවේ රාත්‍රී සමාජශාලා හෝ වෙරළ සාද වැනි පරිශ්‍රවල අවභාවිතවීමක් සිදුවන මත්ද්‍රව්‍ය වර්ග හඳුනා ගැනීම සම්බන්ධයෙන් ද පවත්නා මූලාශ්‍ර ප්‍රමාණවත් නොවන නිසා මෙම අධ්‍යයනය තුළ එවැනි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රධාන අවධානයක් යොමු කරන ලදි.

මෙම ඌණතාවය පූරණය කිරීමේ අරමුණින් පර්යේෂණ අංශය විසින් රාත්‍රී සමාජශාලා සාද සහ වෙරළ සාද (Night club parties & beach parties) ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි.

ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා ඖෂධ වර්ග අවභාවිතය පිළිබඳ අධ්‍යයනය සඳහා රාත්‍රී සමාජශාලා සාද, වෙරළ සාද වැනි සන්දර්භයක් තෝරා ගැනීමෙහි පසුබිම වූයේ දැනට ලංකාවේ පෙති වර්ග භාවිතය හා ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය භාවිතය එතරම් ප්‍රකටව පෙනෙන ප්‍රවණතාවක් නොවන අතර එවැනි ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය බොහෝවිට රාත්‍රී සමාජශාලා සාද වැනි සමාජ අවස්ථාවන් (Social events) වලට වැඩි වශයෙන් සීමා වී පැවතීමයි. එමෙන්ම රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදවල වැඩි වශයෙන් මෙවැනි ද්‍රව්‍ය සංසරණය වීම සහ භාවිතය සිදුවන බවට තොරතුරු මාධ්‍ය මඟින් වාර්තා වුව

ද විද්‍යාත්මක පදනමක් මත සිට එවැනි අවස්ථාවන් හෝ ප්‍රවණතාවන් පිළිබඳ අධ්‍යයනය සිදු වී නොමැත.

අදාළ අවකාශ තුළ භාවිත වන මත්ද්‍රව්‍ය වර්ග, ඒවා භාවිත කරන පුද්ගලයින්ගේ සමාජ, ආර්ථික පැතිකඩ හා ඔවුන්ගේ චර්යාවන්වල ස්වභාවය, අදාළ සාද වල මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය හා ඒ සඳහා අභිප්‍රේරණයක් ඇති කිරීම සඳහා නිර්මාණය කරගෙන ඇති උපසංස්කෘතික අගයන් හා ධර්මතාවන් (Sub cultural norms and values) මොනවාද? යන්න හඳුනාගැනීමේ මුඛ්‍ය අරමුණු සහිතව මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත.

1.2 පර්යේෂණ ගැටලුව

රාත්‍රී සමාජශාලා සාද හා වෙරළ සාද ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතා මොනවාද?, අදාළ සන්දර්භ තුළ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත උපසංස්කෘතික චර්යා රටාවල ස්වභාවය සහ ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන්නේ කෙසේද? යන ගැටලු ද්විත්වය අධ්‍යයනය කිරීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. විශේෂයෙන් මෙවැනි ස්ථාන වල මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා සහ වෙනත් ද්විතියික මාර්ග ඔස්සේ තොරතුරු වාර්තා වුව ද ඒවායේ විශ්වසනීයභාවය හා වලංගුභාවය පිළිබඳ ගැටලු මතු වේ. මේ නිසා ඉහත සඳහන් පරිශ්‍ර තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතා මෙන්ම ඒ ආශ්‍රිතව නිර්මාණය වී ඇති උපසංස්කෘතික චර්යා රටා පිළිබඳ විද්‍යාත්මක පදනමකින් අධ්‍යයනය කිරීම මෙහි දී සිදුකර ඇත.

1.3 පර්යේෂණ අරමුණු

- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා රාත්‍රී සමාජශාලාවල භාවිත වන මත්ද්‍රව්‍ය (Club drugs) භාවිතයේ ස්වභාවය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා හඳුනා ගැනීම.
- රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ උපසංස්කෘතික සාධක සහ පුද්ගල චර්යාවන්වල ස්වභාවය අධ්‍යයනය කිරීම.
- රාත්‍රී සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ (Socio – demographic profile) නිර්ණය කර ගැනීම.
- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා සමාජශාලාවල භාවිත වන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවත්නා විවිධ මිත්‍යා මත හඳුනා ගැනීම.
- සමාජශාලා මත්ද්‍රව්‍ය සහ අනෙක් නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය වර්ග භාවිතය අතර සබඳතාවයක් පවතින්නේ නම් එය හඳුනා ගැනීම.
- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හා සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා නිවාරණය උදෙසා සුදුසු උපායමාර්ග සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.4 පර්යේෂණ ප්‍රශ්න

- රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිතව භාවිත වන මත්ද්‍රව්‍ය වර්ග, ඒවා භාවිත කරන රටාවන් සහ ඒ ආශ්‍රිත චර්යාවන් වල ස්වභාවය කෙබඳුද?
- රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ නව ප්‍රවණතා මොනවාද?
- සමාජශාලා ආශ්‍රිතව මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන උපායමාර්ග මොනවාද?
- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධව පුද්ගලයින් විසින් නිර්මාණය කරගෙන ඇති මිත්‍යා විශ්වාස මොනවාද?
- සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සමාජ පැතිකඩ සකස් වී ඇත්තේ කෙසේද?

1.5 පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව

ලෝකයේ මෙන්ම ලංකාවේ ද බොහෝ ප්‍රධාන නගරවල රාත්‍රී සමාජශාලා කේන්ද්‍ර කරගත් විනෝදකාමී ක්‍රියාකාරකම් මත පදනම් වූ ආර්ථික රටාවන් වර්ධනය වෙමින් පවතින බවට විවිධ අධ්‍යයන හරහා පෙන්වා දී ඇත. එමෙන්ම මෙවැනි රාත්‍රී සමාජශාලා අංගයන් හරහා විවිධ ස්වරූපයේ උපසංස්කෘතික

චර්යා රටාවන් සහ සමාජ ජාල නිර්මාණය වී ඇත. විශේෂයෙන් hip-hop (HH) සහ විද්‍යුත් නර්තන සංගීත (EDM - Electronic Dance & Music) වැනි අංග යොදා ගනිමින් තරුණ පිරිස් එවැනි සාද වලට ආකර්ෂණය කරගන්නා අතර ඒ හරහා උපසංස්කෘතියක් ගොඩනගා ගෙන ඇත. රාත්‍රී සමාජශාලා වල මෙවැනි විශේෂාංග පැවැත්වීම තුළ වෙනම විනෝදකාමී කර්මාන්තයක් (Leisure Industry) බිහිවෙමින් පවතින අතර එය විවිධ සමාජ ගැටලු නිර්මාණය වීමට ද හේතු පාදක වී ඇත. මෙවැනි රාත්‍රී සමාජ ශාලා තුළ අපරාධ චර්යා, මත්ද්‍රව්‍ය අලෙවිය සහ භාවිතය වැනි ක්‍රියා ප්‍රවර්ධනය කරනු ලබන අවස්ථා බහුල වශයෙන් ඇති බවට ද ද්විතියික මූලාශ්‍ර ඔස්සේ සනාථ වී ඇත. බොහෝ සමාජශාලා වලින් තරුණයින් වෙනුවෙන් සහ තරුණයින් ඉලක්ක කර ගනිමින් විවිධ අංග (Events) පිළිගැන්වීම තුළින් ඔවුන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත නීතිවිරෝධී ක්‍රියාකාරකම් වලට පෙළඹවීමක් සිදුවෙමින් පවතී.

තරුණ කණ්ඩායම් අපගාමී ක්‍රියාවන්ට යොමු කරවන මෙවැනි අවස්ථා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය තුළ යොමුව ඇත්තේ අඩු අවධානයකි. මෙම තත්ත්වය තුළ ඉහත කී ආකාරයේ අවදානම් සහගත ප්‍රවණතා තවදුරටත් අනාගතයේදී වර්ධනය විය හැකි බැවින් මේ පිළිබඳව මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය කිරීමේ යාන්ත්‍රණය තුළ අවධානයට ලක්විය යුතුය. ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි මත පදනම් වූ කරුණු (Evidence based facts) අත්‍යවශ්‍ය බැවින් මෙවැනි අධ්‍යයනයක් ක්‍රියාත්මක කිරීම වඩාත් ප්‍රායෝගික හා කාලානුරූපී ක්‍රියාවක් වේ.

අධ්‍යයන අනාවරණ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහ නිවාරණ ක්‍රියාකාරකම් බලගැන්වීම සඳහා ඉදිරිපත් කෙරෙන අතර නිවාරණය තුළ නාගරික තරුණ කණ්ඩායම් කෙරෙහි පවත්නා අවධානය පුළුල් කිරීම ද අත්‍යවශ්‍ය වේ. තවද සෞඛ්‍යමය වශයෙන් හඳුනාගත් අවදානම් සහගත ක්‍රියාවන් ඉලක්ක කර ගනිමින් සෞඛ්‍යය වැඩසටහන් සැලසුම් කිරීමට සහ නීතිය ක්‍රියාත්මක කරන අංශ වලට අවශ්‍ය ඉදිරි සැලසුම් සකස් කිරීමට ද පදනමක් වශයෙන් යොදාගත හැකිය.

1.6 පර්යේෂණ ක්‍රමවේදය

රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිතව ගොඩනැගී ඇති උපසංස්කෘතික චර්යා රටා, එවැනි පරිශ්‍ර තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සමාජ ආර්ථික පැතිකඩ, ඔවුන්ගේ අත්දැකීම්, එකිනෙකා අතර ගොඩනගාගෙන ඇති සබඳතා ජාල සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා වැනි ප්‍රපංච වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා මෙහිදී ප්‍රපංචවේදීමය පර්යේෂණ ක්‍රමවේදය (Phenomenological research methodology) යොදාගෙන ඇත. එම පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණ ක්‍රමය වශයෙන් සමීක්ෂණ ක්‍රමය (Survey method) සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයන (Case study method) ක්‍රමය යොදා ගෙන ඇත. පර්යේෂණ ක්‍රම දෙකක් මිශ්‍රිතව යොදා ගැනීම තුළ උක්ත ප්‍රපංච පිළිබඳ ප්‍රමාණාත්මක ආකාරයෙන් මෙන්ම ගුණාත්මක ආකාරයෙන් අධ්‍යයනය කිරීමට අවකාශය සැලසුණු අතර මතුපිටට දෘශ්‍ය නොවන අන්තර් සබඳතා සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව ගොඩනැගුණු සබඳතා ජාල පිළිබඳව ගැඹුරින් ග්‍රහණය කරගැනීමට අවකාශය සැළසිණි.

1.7 අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍රය ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික හා උපනාගරික ප්‍රදේශ තෝරාගන්නා ලදි. එහිදී කොළඹ දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ප්‍රදේශ ද අධ්‍යයන ක්ෂේත්‍රයට ඇතුළත් කරගෙන ඇත. කොළඹ දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනීමට පාදක වූ නිර්ණායක කීපයක් ඇත. එනම්, සංඛ්‍යාලේඛන වලට අනුව ගංජා, හෙරොයින් ඇතුළු අන්තරායකර ඖෂධ වල ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරනුයේ කොළඹ දිස්ත්‍රික්කය තුළයි. එමෙන්ම ඖෂධමය පෙති වර්ග අවභාවිත කිරීම සම්බන්ධ සිද්ධීන් බහුල වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.
රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදවල ව්‍යාප්තිය පිළිබඳ සැළකීමේදී ද කොළඹ දිස්ත්‍රික්කය තුළ දේශීය මෙන්ම විදේශීය පුද්ගලයින්ට විවෘත වූ සමාජශාලා රැසක් ක්‍රියාත්මක වේ.

ඒ අනුව ඉහළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සහ රාත්‍රී සමාජශාලා වැඩි වශයෙන් ස්ථානගත වී පැවතීම හේතුවෙන් කොළඹ දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදා ගන්නා ලදි.

1.8 අධ්‍යයන නියැදිය

සසම්භාවී නොවන නියැදි ක්‍රම අතුරින් (Non Random Sampling technique) ප්‍රධාන වශයෙන් නියැදි ක්‍රම දෙකක් මෙම අධ්‍යයනයේ දත්තදායකයින් තෝරා ගැනීම සඳහා උපයෝගී කරගෙන ඇත.

- හිමබෝල නියැදි ක්‍රමය (Snowball Sampling) යොදා ගනිමින් තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළ රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙක් අධ්‍යයන නියැදියට ඇතුළත් කරගන්නා ලදි. එහිදී පූර්වයෙන් ගොඩනගාගත් සබඳතා මත සම්බන්ධ කරගත් එක් පුද්ගලයෙක් මාර්ගයෙන් අනෙක් දත්තදායකයින් අධ්‍යයනයට සම්බන්ධ කරගන්නා ලදි.
- අරමුණු සහගත නියැදි ක්‍රමය (Purposive sampling) භාවිත කරමින් මූලික තොරතුරු සපයන්නන් (Key informants) අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලදි. එහිදී මූලික අධ්‍යයන නියැදියෙන් තෝරාගත් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 05 දෙනෙක්, අදාළ ප්‍රදේශයේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් 05 දෙනෙක්, ඖෂධහල් හිමියන්/ ඖෂධවේදීන් 02 දෙනෙක්, රාත්‍රී සමාජශාලා වල කළමනාකරීත්වය ඇතුළු සේවකයින් වැනි පාර්ශ්ව අධ්‍යයනයට සම්බන්ධ කරගන්නා ලදි.

1.9 දත්ත රැස් කිරීම

ප්‍රපංචවේදීමය පර්යේෂණ ක්‍රමවේදය යටතේ වඩාත් ගැඹුරින් සහ ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා අධ්‍යයන අරමුණු වලට වඩාත් ගැළපෙන අයුරින් දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම තෝරාගන්නා ලදි. එහිදී ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම 04 ක් පහත පරිදි උපයෝගී කරගන්නා ලදි.

1.9.1 ව්‍යූහගත ප්‍රශ්නාවලී ශිල්ප ක්‍රමය (Structured Questionnaire)

දත්තදායකයින් ලෙස මෙහිදී රාත්‍රී සමාජශාලා වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් යොදාගත් අතර ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය පිළිබඳව විශ්ලේෂණයේ පහසුව සඳහා පොදු ආකෘතියකට අනුව තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වූ බැවින් ව්‍යූහගත ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදි. ඊට අමතරව අදාළ පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා ද මෙම ප්‍රශ්නාවලිය යොදාගන්නා ලද අතර මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සෞඛ්‍යමය පැතිකඩ සහ ප්‍රතිකාර ලබාගැනීම ආදිය පිළිබඳව ද මෙහිදී තොරතුරු ලබාගන්නා ලදි.

1.9.2 ගැඹුරු සම්මුඛ සාකච්ඡා (Indepth Interviews)

මෙහිදී මූලික තොරතුරු සපයන්නන් වශයෙන් තෝරාගත් පුද්ගලයින් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගන්නා ලදි. අධ්‍යයන අරමුණු වලට අනුව සකසාගත් තේමාවන් කිහිපයක් ඔස්සේ සම්මුඛ සාකච්ඡාවන් සිදුකරන ලද අතර විශේෂයෙන් අවදානම් සහගත චර්යා, මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම, මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සබඳතා ජාලය, නූතන සන්නිවේදන තාක්ෂණය මෙම ක්‍රියාවලියට යොදාගන්නා ආකාරය, සමාජශාලා සාද සංවිධානය වන ආකාරය සහ මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන ආකාරය වැනි අංශ කෙරෙහි මෙහිදී අවධානය යොමු කරන ලදි. පහත මූලික තොරතුරු සපයන්නන් (Key informants) සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි.

- ✦ රාත්‍රී සමාජශාලා වල අධ්‍යක්ෂවරුන්/ කළමනාකාරවරු
- ✦ රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්
- ✦ සමාජශාලා වල ආරක්ෂක නිලධාරී/ පහළ ශ්‍රේණියේ සේවකයෙක්
- ✦ අදාළ ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්
- ✦ අදාළ ප්‍රදේශයේ ඖෂධ හලක හිමිකරුවෙක්/ ඖෂධවේදියෙක්
- ✦ සමාජ මාධ්‍ය භාවිත කරමින් සමාජ ශාලා සාද ප්‍රවර්ධනය කරන පුද්ගලයෙක්

අධ්‍යයන අරමුණු වලට අනුව සකසාගත් තේමාවන් පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් දත්ත ලබාගැනීමට අවශ්‍ය වූ හෙයින් ඉහත පාර්ශ්ව මූලික තොරතුරු සපයන්නන් ලෙස යොදා ගනිමින් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි.

1.9.3 සහභාගීත්ව නිරීක්ෂණ (Participatory observation)

රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ චර්යාවන්, මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන අයුරින් අභ්‍යන්තර හා බාහිර පරිසරය සකස් වී ඇති ආකාරය, මත්ද්‍රව්‍ය සංසරණය වන ස්වභාවය, සාද සංවිධානය වන ආකාරය හා ඒවාට පුද්ගලයින් සම්බන්ධ වන ආකාරය, ඔවුන් නිරූපණය කරන විවිධ සංකේතාත්මක අංග සහ උපසංස්කෘතික චර්යා රටාවන් පිළිබඳ වඩාත් ගැඹුරින් දත්ත රැස් කිරීම සඳහා සහ අනෙක් ශිල්පක්‍රම හරහා ලබාගත් දත්ත වල වලංගුතාවය පරීක්ෂා කිරීම සඳහා මෙම ශිල්ප ක්‍රමය යොදා ගන්නා ලදි. අධ්‍යයනය තුළ සහභාගීත්ව නිරීක්ෂණ අවස්ථා දෙකක් සිදුකරන ලද අතර එය තරමක් ප්‍රායෝගිකව දුෂ්කර වූ කාර්යයක් ද විය. ඊට හේතුව වූයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පරිසරයක් තුළ සිට ඔවුන්ගේ චර්යා නිරීක්ෂණය කිරීමට සිදුවීම සහ අදාළ පුද්ගල කණ්ඩායම් සමඟ මිශ්‍රවීමේ දී ප්‍රායෝගික දුෂ්කරතා මතුවීමයි. කෙසේනමුත් අපේක්ෂිත තේමාවන්ට අදාළ වඩාත් ගුණාත්මක දත්ත රැස් කිරීමට මේ හරහා අවකාශය සැළසිණි.

1.9.4 ප්‍රත්‍යයන අධ්‍යයන (Case studies)

රාත්‍රී සමාජශාලා සාදවලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 03 දෙනෙක් සමඟ ප්‍රත්‍යයක අධ්‍යයන සිදුකරන ලද අතර එහිදී අදාළ පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම සඳහා බලපාන ලද හේතූන් මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වාභාවය සහ ඔවුන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ වඩාත් ගැඹුරින් දත්ත රැස්කර ගන්නා ලදි.

1.10 දත්ත විශ්ලේෂණය

ව්‍යූහගත ප්‍රශ්නාවලි මඟින් රැස්කරන ලද ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත. එහිදී විවිධ විචල්‍ය අතර සහසම්බන්ධතාවන් ද ප්‍රමාණාත්මක වශයෙන් මිණුම් කිරීමට ලක්කර ඇත. ගැඹුරු සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ සහ ප්‍රත්‍යක අධ්‍යයන මඟින් ලබාගත් පුළුල් පරාසයන් තුළ විහිදී ගිය ගුණාත්මක දත්ත තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය (Thematic Content Analysis) භාවිත කරමින් ගුණාත්මක ලෙස විශ්ලේෂණය කර ඉදිරිපත් කර ඇත. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ශිල්ප ක්‍රම කිහියක් යොදාගත් නිසා එක් එක් ශිල්ප ක්‍රම මඟින් රැස්කරන ලද දත්තවල වලංගුභාවය තහවුරු කරගැනීම සඳහා ත්‍රිකෝණ බද්ධකරණ ක්‍රමය (Triangulation method) යොදා ගන්නා ලදි.

2. රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා කාලීන ප්‍රවණතා (දේශීය හා ගෝලීය සන්දර්භය ඇසුරින්)

රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනය තුළ මූලික වශයෙන් හඳුනාගත් විචල්‍යය ආශ්‍රයෙන් ගොඩනගා ගත් සංකල්පීය රාමුවක් (Conceptual Framework) ඔස්සේ අධ්‍යයන මාතෘකාවට අදාළව ද්විතියික මූලාශ්‍ර මඟින් රැස් කරගත් දත්ත මෙම පරිච්ඡේදය තුළ ගොනු කර ඇත. මේ හරහා දේශීය හා ගෝලීය සන්දර්භය තුළ කරන ලද අධ්‍යයන අනාවරණ වලට අනුව සහ නිර්මාණය වී ඇති කතිකාවන්ට අනුව සමාජශාලා සාද වල මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ නව ප්‍රවණතා සම්බන්ධ පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකිවනු ඇත.

රූපසටහන් අංක 01 : රාත්‍රී සමාජශාලා සහ වෙරළසාද ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය සහ කාලීන ප්‍රවණතා පිළිබඳ ද්විතියික මූලාශ්‍ර ඔස්සේ සිදුකරන ලද ගවේෂණයට අදාළ සංකල්පීය රාමුව



2.1 සමාජශාලා මත්ද්‍රව්‍ය (club drugs/ party drugs/ dance drugs) පිළිබඳ පාරිභාෂිතය

සමාජශාලා මත්ද්‍රව්‍ය ගණයට ගැනෙන ද්‍රව්‍යය නිර්ණය කිරීම තරමක් දුෂ්කර සහ ගැටලු සහගත තත්ත්වයක් බව උක්ත කරුණ පිළිබඳ පළවී ඇති ද්විතියික මූලාශ්‍ර ඔස්සේ තහවුරු වෙයි. ද්විතීයික මූලාශ්‍ර වලට අනුව අංශ දෙකකට අයත් වර්ගීකරණ හඳුනාගත හැකිය.

- ❖ ඖෂධවේදය හෝ රසායනික පදනම මත සිට කරනු ලබන වර්ගීකරණය
- ❖ අදාළ මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කරනු ලබන සන්දර්භය මත සිට කරනු ලබන වර්ගීකරණය

මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කරනු ලබන සන්දර්භය මත සිට කරනු ලබන වර්ගීකරණය තරමක් දුරට ගැටලු සහගත වර්ගීකරණයක් වේ. මන්දයත් සාම්ප්‍රදායිකත්වය මත පදනම් වූ සංස්කෘතීන් අනුව සැකසුණු සාද අවස්ථා වල සහ නූතන සංස්කෘතිය මත පදනම්ව ක්‍රියාත්මක වන සාද අවස්ථාවල පැහැදිලි වෙනසක් හඳුනාගත හැකි බැවිනි. නර්තනය හා බැඳුණු සහ සාද අවස්ථාවන් හා බැඳුණු සංස්කෘතීන් වලට අනුව (dance and party cultures) පහත සඳහන් මත්ද්‍රව්‍ය වර්ග මෙම කාණ්ඩයට ඇතුළත් කළ හැකිය.

- ඇම්පිටමින් (Amphetamine)
- මෙතම්පිටමින් (Methamphetamine)
- එක්ස්ටසි (Ecstasy)

- කොකේන් (Cocaine)
- කෙටමින් (Ketamine – Special K)
- GHB
- වාෂ්පශීලී ද්‍රව්‍ය (Volatile nitrites) (Drugs and crime prevention committee, Parliement of Voctoria, 2004: 21)

ඊට අමතරව ගංජා සහ මද්‍යසාර වර්ගයන් ද වැඩි වශයෙන් සමාජශාලා සාද අවස්ථාවන් තුළ භාවිත කරනු ලබයි. "Party drugs" හෝ "Dance drugs" වලට ගැනෙන ද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ දී ඒවා වීදි මට්ටමේ භාවිත වන මත්ද්‍රව්‍ය (street drugs) කාණ්ඩයෙන් වෙන්කර හඳුනා ගැනීමට තරම් පැහැදිලි හෝ අනන්‍ය වූ සීමාවක් නොමැත. උදාහරණයක් ලෙස ඉහළ ගණයේ සමාජශාලා සාද වල භාවිත වන Ecstacy වර්තමානය වනවිට වීදි මට්ටමේදී ද අවස්ථානුකූලව භාවිත වන අතර අලෙවි කිරීම ද සිදුවෙයි.

එමෙන්ම "Club drug" යන්න සාමූහික යෙදුමක් (collective term) වන අතර ඇම්පිටමින්, මෙතම්පිටමින්, එක්ස්ටසි (MDMA) සහ කොකේන් වැනි ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් මෙම කාණ්ඩයට අයත් වන අතර අවස්ථානුකූලව ගංජා හා මද්‍යසාර වැනි ද්‍රව්‍යය මෙන්ම නව මනෝකාරක ද්‍රව්‍ය (New psychoactive drugs) ද මෙම කාණ්ඩය යටතේ සලකනු ලබන අවස්ථා ඇත.

2.2 ගෝලීය සන්දර්භය තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය

ලෝකය පුරා අවස්ථානුකූලව මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (occasional users) සහ දිනපතා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (regular users) යන කණ්ඩායම් දෙකම බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (poly drug users) බව ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව 2017 පෙන්වා දෙයි. එම වාර්තාවට අනුව වයස අවුරුදු 15-64 අතර වැඩිහිටි ජනගහනයෙන් 5% ක් 2015 වර්ෂයේ දී යම් මත්ද්‍රව්‍යයක් එක් වරකදී හෝ භාවිත කර ඇත. ලෝක ජනගහනයෙන් මිලියන 29.5 ක ප්‍රමාණයකට අයත් පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතාවයන්ගෙන් පෙළෙන (SUD) පුද්ගලයින් ය. වැඩිහිටි ජනගහනයෙන් 3.8%ක ප්‍රතිශතයක් පසුගිය වර්ෂය තුළ ගංජා භාවිත කර ඇති බව ද 2017 ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව මඟින් අනාවරණය කර ඇත.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) විසින් ඇස්තමේන්තුගත කරන ලද දත්ත වාර්තා වලට අනුව 2015 වර්ෂයේ ගෝලීය ඇස්තමේන්තු ගත නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිත කරන ලෝක ජනගහනය මිලියන 255 කි. එමෙන්ම ගැටලුකාරී මත්ද්‍රව්‍ය භාවිත (problem drug use) තත්ත්වයට පත්වූ සංඛ්‍යාව මිලියන 29.5 කි. එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කරන පුද්ගලයින්ගේ ඇස්තමේන්තුගත සංඛ්‍යාත්මක අගයන් පිළිබඳ සැළකීමේ දී ගංජා භාවිත කරන පුද්ගලයින් මිලියන 35 ක්, කොකේන් මත්ද්‍රව්‍ය සඳහා මිලියන 17 ක්, ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය සඳහා මිලියන 37 ක් සහ Ecstasy භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව මිලියන 21 ක් වශයෙන් ඇස්තමේන්තුගත කර ඇත. මෙහිදී වඩාත් අවධානයට ලක්වන කරුණක් නම් ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය සහ Ecstasy භාවිත කරන ලෝක ජනගහනයේ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කිරීමයි. එමෙන්ම ලෝක ජනගහනයෙන් පුද්ගලයින් මිලියන 12 ක් යම්කිසි මත්ද්‍රව්‍යයක් එන්නත් කරගනු ලබන අතර එන්නත් කරගන්නා ජනගහනයෙන් මිලියන 1.6 ක් HIV වෛරසය ආසාදිතවූවන් වේ. ඊට අමතරව මිලියන 6.1 ක් හෙපටයිටිස් සී වෛරසය ද, මිලියන 1.3 ක් HIV සහ හෙපටයිටිස් සී යන වෛරස දෙකම ආසාදනයවූවන් බව UNODC ආයතනය විසින් ඇස්තමේන්තු ගත කර දක්වා ඇත.

EMCDDA (European Monitoring Centre for Drugs and Drug Addiction) 2017 වාර්ෂික වාර්තාවට අනුව යුරෝපා සංගමයට අයත් රටවල් අතර වයස අවුරුදු 15-34 වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින්ගෙන් මිලියන 2.3 ක් MDMA භාවිත කර ඇති අතර මිලියන 1.3 ක් ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට අනාවරණය කර ඇත.

ගෝලීය මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ප්‍රවණතාවය විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන කරුණක් නම්, පොදුවේ සියලු වර්ග වලට අයත් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකි අතර ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය, කොකේන් සහ එක්ස්ටසි වැනි ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් ද පවතින බව අනාවරණය වී ඇත. එම මත්ද්‍රව්‍ය වර්ග රාත්‍රී සමාජශාලා හෝ සාද අවස්ථා වල පමණක් භාවිත කරන බවට තහවුරු කළ නොහැකි නමුත් පුද්ගලයින් අවස්ථානුකූලව වීදි මට්ටම තුළ ද අදාළ ද්‍රව්‍ය අවභාවිත කිරීමට යොමුවන අවස්ථා, අත්අඩංගුවට ගැනීම් ආශ්‍රිත දත්ත සහ විවිධ සමීක්ෂණ මඟින් තවදුරටත් තහවුරු කරගෙන ඇත.

2.3 ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතාවය

යුරෝපා සංගමයට අයත් රටවල් සහ දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල් හා සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ ඉහළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තියක් පෙන්නුම් නොකළ ද කාලානුරූපීව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය වැඩිවෙමින් පවතින බව මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ හා මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගැනීම් පිළිබඳ දත්ත වලට අනුව පැහැදිලි වෙයි. හෙරොයින් සහ ගංජා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් පිළිබඳව අවධානය යොමුකිරීමේදී කාලානුරූපිව අත්අඩංගුවට ගැනීම් වැඩිවීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය.

වගු අංක 01 - 2012-2016 දක්වා හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාව

වර්ෂය	හෙරොයින්	ගංජා
2012	16,809	31,093
2013	23,665	42,319
2014	23,331	43,683
2015	26,539	52,076
2016	27,462	47,787

මූලාශ්‍රයඃ (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත, 2017)

හෙරොයින් වලට සාපේක්ෂව ගංජා භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් හඳුනාගත හැකිය. ගංජා, සමාජශාලා මත්ද්‍රව්‍ය කාණ්ඩයට සෘජුවම අයත් නොවූවද එවැනි සන්දර්භ තුළ ශ්‍රී ලංකාවේ ගංජා බහුලව භාවිත කරනු ලබයි.

වගු අංක 02 - කොකේන් සහ මනෝවර්තක ද්‍රව්‍ය සම්බන්ධ වාර්තා වූ සිද්ධීන්

වර්ෂය	කොකේන්	මනෝවර්තක ගණයේ ද්‍රව්‍ය
2012	10	04
2013	-	02
2014	05	01
2015	07	-
2016	22	12

මූලාශ්‍රයඃ (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත, 2017)

පසුගිය වර්ෂ වලට සාපේක්ෂව 2016 වර්ෂය වනවිට කොකේන් හා මනෝවර්තක ගණයේ ද්‍රව්‍ය අවභාවිත කිරීම සම්බන්ධ සිද්ධීන් වාර්තාවීමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇති බව දත්ත වලින් පැහැදිලි වෙයි. "Club drug" කාණ්ඩයට අයත් වන මෙවැනි ද්‍රව්‍ය බහුල ලෙස සමාජශාලා සාද ආශ්‍රිතව සංසරණය වන බවට ද්විතියික මූලාශ්‍ර ඔස්සේ තොරතුරු වාර්තා වී ඇත. **(පුවත්පත් හා අන්තර්ජාල වාර්තා)**

2.4 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ ලක්ෂණ හා චර්යාත්මක ස්වභාවය

සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සමජාතීය කණ්ඩායමක් ලෙස සැළකිය නොහැකි අතර සංස්කෘතික පසුබිම හා සමාජ ආර්ථික පසුබිම මෙන්ම ඔවුන් සහභාගී වන සාද පැවැත්වෙන සන්දර්භය

අනුව පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම චර්යාවන් ද වෙනස් බව හඳුනාගත හැකිය. විවිධ ද්විතියික මූලාශ්‍ර මඟින් හඳුනාගෙන ඇති ආකාරයට වීදි මට්ටමේ මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට (Street opioid users) සාපේක්ෂව සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ යම් වෙනස්කම් හඳුනාගත හැකිය.

- මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට වඩා සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුළුල් පරාසයන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි.
- වීදි මට්ටම තුළ මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට සාපේක්ෂව සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් වයසින් අඩු හෝ තරුණ පිරිසක් වීම ද විශේෂ ලක්ෂණයකි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ඔවුන්ගේ ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත චර්යාවන් සමඟ යම් ආකාරයක පුළුල් මනෝව්‍යාධිමය තත්ත්වයන් පෙන්නුම් කරනු ලබයි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ඉහළ වශයෙන් සමාජශීලිත්වය ඇතිකර ගැනීමේ අරමුණින් එම මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි. (highly socially oriented)
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්, අනෙකුත් මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගෙන් වෙනස්ව තමන්ව හඳුනාගැනීමට කැමැත්තක් දක්වන අතර වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධයෙන් පවත්නා සමාජ අවමානය (Social stigma) හේතුවෙන් ඔවුන් පවතින ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් වීමට මැලිකමක් දක්වයි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ප්‍රතිකාර ලබාගැනීමට අඩු කැමැත්තක් දක්වන අතර ප්‍රතිකාර වලට ඇතුළත් වුවද ප්‍රතිකාර මධ්‍යස්ථාන හෝ ප්‍රතිකාර ක්‍රියාවලිය සමඟ දුර්වල හෝ අවම මට්ටමේ සම්බන්ධතාවයක් පවත්වා ගනියි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බොහෝ අවස්ථාවල සිය මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ උද්ගත වන ගැටලු වලට සහාය ලබාගැනීමේ දී පළමුවෙන් සාමාන්‍ය ජීවිතයේ උපදෙස් දෙන පුද්ගලයෙක් හෝ පවුලේ වෛද්‍යවරයෙක් වෙත යොමුවීමේ ප්‍රවණතාවක් ඇත (වික්ටෝරියා පාර්ලිමේන්තුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කමිටු වාර්තාව, 2004).

එමෙන්ම රාත්‍රී සමාජශාලා සාද ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ආවරණය වූ අවකාශයක් හෝ ඒ සඳහා සකසන ලද පාරිසරිකමය වටපිටාවක් සහිත අවකාශයක සිට මත්ද්‍රව්‍යය වර්ග භාවිත කරන නිසා සාමාන්‍ය මහජනතාවට විවෘත නොවුණු සැඟවුණු කණ්ඩායමක් ලෙස ද ඔවුන්ව හඳුනාගත හැකිය.

එමෙන්ම එක්ස්ටසි හා ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා සහ පැතිකඩ කාලීනව වෙනස්කම් වලට ලක්වන අතර එය විවිධ භූගෝලීය කලාපයන් සහ ඒවායේ ඇති මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය වැනි සාධක මත ද වෙනස්කම් වලට ලක්වෙයි. එමෙන්ම වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිතයට කාන්තාවන්ගේ යොමුවීමට සාපේක්ෂව සමාජශාලා තුළ මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කාන්තාවන්ගේ වැඩි නැඹුරුතාවක් ඇති බව විවිධ අධ්‍යයන මඟින් පෙන්වා දී ඇත. මෙවැනි මත්ද්‍රව්‍ය භාවිතය සෘජුවම නර්තන අවස්ථා (dancing events) සහ රාත්‍රී සමාජශාලා සාද වැනි අවස්ථාවන් සමඟ බැඳී පවතියි. එවැනි සාද අවස්ථාවන් වල භාවිත වන සංගීතය, නර්තනය, විදුලි ආලෝකකරණය වැනි පාරිසරිකමය වෙනස්කම් තුළින් මත්ද්‍රව්‍ය මඟින් ලැබෙනු ඇතැයි සළකන ආස්වාදය වැඩි කිරීමට උත්සාහ කරයි.

2.5 සමාජශාලා මත්ද්‍රව්‍ය (Club drugs) භාවිතයට යොමුවීමේ බලපෑම් සහගත සාධක

බොහෝවිට තරුණ වයස් මට්ටම්වල පුද්ගලයින් විවිධ හේතූන් මත සහ විශේෂයෙන් මිතුරු බලපෑම මත විවිධ අවිධිමත් කණ්ඩායම් වශයෙන් රාශිගත වෙමින් නොයෙකුත් අපගාමී ක්‍රියාවන් වල නිරත වෙයි. ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හෝ අනෙකුත් සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවන පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී ඔවුන් අදාළ සන්දර්භයන් තුළ එවැනි ද්‍රව්‍ය අවභාවිතයට යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක බොහෝවිට පුළුල් පරාසයක් තුළ විහිදි පවතියි. ඇමරිකාවේ ලොස් ඇන්ජලීස් නගරය ආශ්‍රිතව පොදු ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් වූ ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 260 දෙනෙක් ආශ්‍රයෙන් Mayrhauser, Brecht සහ Aglin

යන පර්යේෂකයින් විසින් 2002 වර්ෂයේ දී සිදුකරන ලද අධ්‍යයන අනාවරණ වලට අනුව ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයින් යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක මෙසේය. නියැදියෙන් 28% ක ප්‍රතිශතයක් අනෙකුත් උත්තේජකයන්ට වඩා ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකිවීම, වඩාත් ආරක්ෂාකාරී වීම සහ උපරිම ආස්වාදයක් ලැබීම වැනි හේතූන් නිසා භාවිතයට යොමු වී ඇත. ඊට අමතරව නියැදියෙන් 23% ක ප්‍රතිශතයක් අවදියෙන් සිටීම සඳහාත්, 11% ක ප්‍රතිශතයක් ලිංගික ශක්තිය වර්ධනය කර ගැනීම සඳහාත්, 10% ක ප්‍රතිශතයක් ශරීරයේ බර අඩු කර ගැනීම සඳහාත්, ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇති බව අදාළ අධ්‍යයනය තුළින් අනාවරණය විය.

වෙනත් අධ්‍යයන වලින් තහවුරු වී ඇති ආකාරයට බොහෝ අවස්ථාවල තරුණ පුද්ගලයින් කුතුහලය නිසා මෙවැනි ද්‍රව්‍ය භාවිතය අත්හදා බලන අතර තරුණ පුද්ගලයින් සිය ශරීරයේ වේදනාව නැතිකර ගැනීම (Self-medicate) සඳහා ඇම්පිටමින් වර්ගයේ උත්තේජක වර්ග භාවිත කරනු ලබයි.

වික්ටෝරියා පාර්ලිමේන්තුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කමිටු වාර්තාව, 2004 උපුටා දක්වන පරිදි රාත්‍රී සමාජශාලා වලට ආකර්ෂණයක් ඇති කරනු ලබන සාධක කිහිපයක් අනාවරණය කරගෙන ඇත.

01. සංගීතය (Electronic Music)
02. ආලෝකකරණය
03. නර්තනයට අවස්ථා (Electronic dance and Music - EDM)
04. මිතුරු සබඳතා භාවිත කරමින් මත්ද්‍රව්‍ය මිලදී ගත හැකිවීම.

2.6 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම

ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් සමාජශාලා වල භාවිත වන මත්ද්‍රව්‍ය භාවිතයේ කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් රාශියක් හඳුනාගත හැකි අතර ද්විතියික මූලාශ්‍ර වලට අනුව පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

ශාරීරික වශයෙන් ඇතිවිය හැකි දිගුකාලීන බලපෑම්

නින්ද ආශ්‍රිත ගැටලු
මානසික අවපාතයන්
ක්‍රියාවන් නැවත නැවත කිරීම
විශාදය
කාංසාව
සමාජ හා මූල්‍යමය ගැටලු
හෘදය ආශ්‍රිත අක්‍රමතා
හිසරදය
සංදි වේදනා
බර අඩුවීම හා අඩු පෝෂණය
අධි රුධිර පීඩනය
ප්‍රතිශක්තිකරණය දුර්වල වීම
මනෝ භ්‍රාන්තීන් ඇති වීම
චර්යාත්මක ගැටලු
සංජානන ගැටලු

සමාජමය බලපෑම්

ප්‍රචණ්ඩත්වය හා අපරාධ
අනතුර

3. අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයන අනාවරණ සහ ද්විතියික දත්ත පදනම් කරගනිමින් සිදුකරන ලද විශ්ලේෂණය තුළින් සාකච්ඡාවට බඳුන් කළ යුතු ප්‍රධාන තේමාවන් කිහිපයක් මෙම පරිච්ඡේදය තුළ සංගෘහිත කර ඇත.

1. අධ්‍යයනයට ලක්කළ දත්තදායකයින්ගේ (ප්‍රතිචාරකයින්ගේ) ප්‍රජා සහ සමාජ පැතිකඩ
2. රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය
3. රාත්‍රි සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පුද්ගල චර්යාවේ ස්වභාවය

3.1 ප්‍රතිචාරකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ

3.1.1 ස්ත්‍රී පුරුෂ සංයුතිය

හිමබෝල නියැදි ක්‍රමය භාවිත කරමින් අධ්‍යයනය සඳහා ඇතුළත් කරගන්නා ලද දත්තදායකයින් අතුරින් 42 (84%) දෙනෙක් පුරුෂයින් වූ අතර 8 (16%) දෙනෙක් ස්ත්‍රීන් වූහ.

3.1.2 වයස් මට්ටම

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 25ට වඩා අඩු පුද්ගලයින් වූ අතර, වයස අවුරුදු 18 - 20 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් 10 (20%) දෙනෙක්, වයස අවුරුදු 21 -25 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් 23 (46%) දෙනෙක් සහ වයස අවුරුදු 26 -30 වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් 11 (22%) දෙනෙක් අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ නියෝජනය විය. දත්තදායකයින්ගේ වයස් මට්ටම් පිළිබඳ අධ්‍යයනය කිරිමේදී පැහැදිලි වන කරුණක් නම්, වයස අවුරුදු 21 - 25ත් අතර පුද්ගලයින් රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගී වීම සම්බන්ධයෙන් ඉහළ ආකර්ෂණයක් සහ ප්‍රවණතාවයක් පවතින බවයි.

ප්‍රස්තාර අංක 01 - වයස් මට්ටම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

3.1.3 පදිංචි ප්‍රදේශ අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

රාත්‍රි සමාජශාලා සාද/ වෙරළ සාද වලට සහභාගී වන පුද්ගලයින් 50 දෙනෙක් අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද අතර එහිදි අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික හා උප නාගරික ප්‍රදේශ තෝරා ගන්නා ලදි. රාත්‍රි සමාජශාලා සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් සහිත

කලාපයක් වීම කොළඹ දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනීමේ පදනම විය. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ථානගත වී ඇති සමාජශාලා වලට සහභාගී වන පුද්ගලයින් අධ්‍යයනට භාජනය කරන ලද අතර ඔවුන්ගේ පදිංචිය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

අධ්‍යයනයේ දත්තදායකයින්ගෙන් 21 (42%) දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් වූ අතර 29 (58%) දෙනෙක් එනම්, බහුතරයක් වෙනත් දිස්ත්‍රික්ක වල පදිංචි පුද්ගලයන් වුහ. ඔවුන් කොළඹ දිස්ත්‍රික්කය තුළ තාවකාලිකව පදිංචි වී සිටින පුද්ගලයන් වූ අතර විවිධ රැකියා හා වෘත්තීන් වල නියැළීමේ අරමුණින් එසේ ඔවුන් තාවකාලිකව පදිංචිව සිටියි.

අධ්‍යයන දත්ත වලට අනුව නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් අතුරින් 18 (36%) දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කයේද, පුද්ගලයින් 04 (8%) දෙනෙක් පුත්තලම දිස්ත්‍රික්කයේ ද, පුද්ගලයින් 03 (06%) දෙනෙක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද පදිංචි අය වූහ. ඊට අමතරව අනෙකුත් පුද්ගලයින් මාතර, කළුතර හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ස්ථිර පදිංචියක් සහිත පුද්ගලයින් විය.

ප්‍රස්තාර අංක 02 - පදිංචි ප්‍රදේශ අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

3.1.4 ජනවර්ගය සහ ආගම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

ජනවර්ගය අනුව අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ දත්තදායකයින්ගේ ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී බහුතරයක් එනම්, 49 (98%) දෙනෙක් සිංහල ජාතිකයන් වූ අතර එක් ද්‍රවිඩ ජාතිකයෙක් විය. ආගම් අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය පිළිබඳ සළකන විට 35 (70%) දෙනෙක් බෞද්ධගාමිකයන් ද, 5 (10%) දෙනෙක් ක්‍රිස්තියානි ආගමිකයන් සහ 9 (18%) දෙනෙක් රෝමානු කතෝලික ආගමිකයින් වුහ.

3.1.5 අධ්‍යාපන මට්ටම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදිය සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී 16 (32%) දෙනෙක් අ. පො. ස සාමාන්‍ය පෙළ සමත් පුද්ගලයින් වූ අතර 16 (32%) දෙනෙක් අ. පො. ස උසස් පෙළ සමත්වූවන්ය. ඊට අමතරව පුද්ගලයින් 13 (26%) දෙනෙක් යම්කිසි විෂය ක්ෂේත්‍රයකට අදාළව ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඇති අතර පුද්ගලියන් 7 (4%) දෙනෙක් උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය ලද පුද්ගලයින් වුහ. 10 ශ්‍රේණිය දක්වා (ද්විතියික අධ්‍යාපනය) දක්වා අධ්‍යාපනය ලද

පුද්ගලයින් 3 (6%) දෙනෙක් පමණක් නියැදිය තුළ නියෝජනය වූ අතර අධ්‍යාපනයක් නොලද හෝ ප්‍රාථමික මට්ටම දක්වා පමණක් අධ්‍යාපනය සාධනය කරගත් පුද්ගලයින් කිසිවෙක් නියැදිය තුළ නියෝජනය නොවීම සුවිශේෂී ලක්ෂණයකි. එමෙන්ම අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ බහුතර පුද්ගලයින් සංඛ්‍යාවක් ඉහළ අධ්‍යාපන මට්ටමක් ළඟා කරගෙන ඇති පුද්ගලයින්ය. එනම් පුද්ගලයින් 31 (62%) දෙනෙක් අ.පොෙ.ස උසස් පෙළ හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව ද්විතියික මූලාශ්‍ර වලට වාර්තා වී ඇති දත්ත විශ්ලේෂණය කිරීමේදී ඉහත තත්ත්වයට වඩා වෙනස් ප්‍රවණතාවයක් හඳුනා ගත හැකිය. පසුගිය වසර කිහිපයක මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා ප්‍රතිකාර වලට ඇතුළත් වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ දත්ත පහත වගුව තුළ දක්වා ඇත.

වගු අංක 03 - අධ්‍යාපන මට්ටම අනුව ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින්ගේ ව්‍යාප්තිය

	2012	2013	2014	2015	2016
පාසල් නොගිය	65	31	86	55	120
05 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද	147	124	195	149	267
05 ශ්‍රේණිය හා 8 ශ්‍රේණිය අතර	219	206	313	266	398
9 ශ්‍රේණිය හා 10 ශ්‍රේණිය අතර	296	479	596	485	873
O/ L සමත්	210	299	288	272	501
A/L සමත්	110	172	145	147	173
උපාධි/ ඩිප්ලෝමා	17	23	05	20	20

මූලාශ්‍රය: (ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත, 2017)

ඉහත දත්ත විමර්ශනය කිරීමේදී පැහැදිලි වන වැදගත් ප්‍රවණතාවයක් වන්නේ, මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා ප්‍රතිකාර වලට ඇතුළත් වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් 9 ශ්‍රේණිය හෝ 10 ශ්‍රේණිය දක්වා පමණක් අධ්‍යාපනය ලද පුද්ගලයින් වීමයි. 2012 - 2016 වර්ෂය දක්වා එම ප්‍රවණතාවය වෙනසකට ලක් නොවීම ද සුවිශේෂී ලක්ෂණයකි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ පැතිකඩ (Profile of Drug Users) පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඔවුන්ගේ අඩු අධ්‍යාපන මට්ටම මත්ද්‍රව්‍ය භාවිතය සමග සාකච්ඡාවට බඳුන්වන ප්‍රධාන ලක්ෂණයකි.

නමුත් රාත්‍රී සමාජශාලා හෝ වෙරළ සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳ අවධානය යොමු කිරීමේදී අධ්‍යයන දත්ත වලට අනුව ඔවුන් ඉහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කරගෙන ඇති බව අනාවරණය වී ඇත.

3.1.6 විවාහක අවිවාහක බව

විවාහක අවිවාහක බව අනුව දත්තදායකයින් වර්ගීකරණය කිරීමේදී නියැදිය තුළ විවාහක පුද්ගලයින් 6 (12%) දෙනෙක්, අවිවාහක පුද්ගලයින් 37 (74%) දෙනෙක්, විවාහ නොවී එකට ජීවත්වන පුද්ගලයින් දෙදෙනෙක් සහ විවාහක නමුත් වෙන්ව ජීවත්වන පුද්ගලයින් තිදෙනෙක් (6%) නියෝජනය වුහ.

3.1.7 ආදායම් මාර්ග සහ මාසික ආදායම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

ආදායම් මට්ටම සහ ආදායම් මාර්ග සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ලද දත්තදායකයින් අතුරින් 16 (32%) දෙනෙක් පුහුණු ශ්‍රමිකයන් (Skill labours) ලෙස රැකියාවේ යෙදෙන අතර 11 (32%) දෙනෙක් ව්‍යාපාරික කටයුතු වල නිරත වී සිටිති. ඊට අමතරව 5 (10%) දෙනෙක් නුපුහුණු ශ්‍රමිකයින් ලෙස විවිධ මට්ටමේ රැකියා වල නිරත වෙති. එම නුපුහුණු ශ්‍රමිකයින් අතර කම්කරුවන් ලෙස හෝ කුලී පදනම මත සේවය සපයන පුද්ගලයින් වුහ.

නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් අතුරින් 4 (8%) දෙනෙක් දැනට රැකියාවක නිරත නොවන අතර අධ්‍යාපන කටයුතු වල නිරත වී සිටියි. එක් පුද්ගලයෙක් ප්‍රවාහන සේවකයෙක් ලෙස කටයුතු කරනු ලබන අතර පුද්ගලයින් 13 දෙනෙක් රැකියාව සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නොමැත.

ප්‍රස්තාර අංක 03 - නිරත වන රැකියාව/ වෘත්තිය අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවේ නියතු පුද්ගලයින් නිරත වන ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් සිව් දෙනෙක් සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන අතර එක් පුද්ගලයෙක් සංගීත කණ්ඩායමක ශිල්පියෙක් ලෙස සේවය කරනු ලබයි. ඊට අමතරව තවත් පුද්ගලයින් 10 දෙනෙක් පෞද්ගලික අංශයේ විවිධ රැකියා වල නිරත වෙති.

මාසික ආදායම් තත්ත්වය පිළිබඳව ප්‍රතිචාර දක්වන ලද පුද්ගලයින් අතුරින් මාසික ආදායම රුපියල් 10,001ත් රුපියල් 30,000ත් අතර පුද්ගලයින් 8 (16%) දෙනෙක් සහ රුපියල් 30,001 - 50,000 ත් අතර මාසික ආදායමක් ඇති පුද්ගලයින් 10 (20%) දෙනෙක් නියැදිය තුළ නියෝජනය විය. රු. 50,001 - රු 70,000 ත් අතර ආදායමක් ලබන පුද්ගලයින් 9 (18%) දෙනෙක් ද සිය මාසික ආදායම් මට්ටම පිළිබඳ ප්‍රතිචාර දක්වන ලද පුද්ගලයින් අතර විය. අධ්‍යයන නියැදියෙන් බහුතරයක් පුද්ගල සංඛ්‍යාවක් රු. 30,001 - 50,000 අතර මාසික ආදායමක් ලබන පුද්ගලයන් වේ.

3.2 රාත්‍රී සමාජශාලා සාදවලට සහභාගී වන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ රටාවන්

අධ්‍යයන නියැදිය සඳහා හිමබෝල නියැදි ක්‍රමය භාවිත කරමින් රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගි වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙක් ඇතුළත් කරගන්නා ලද අතර ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත චර්යාවේ ස්වභාවය සහ මත්ද්‍රව්‍ය භාවිත පැතිකඩ සම්බන්ධයෙන් අධ්‍යයනය තුළ අවධානය යොමු කරන ලදි. ඒ අනුව පහත සංරචක හා තේමාවන් යටතේ සිදුකරන ලද ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සහ තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණය මගින් ලද අනාවරණයන් මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡාවට බඳුන් කර ඇත.

3.2.1 මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම

අධ්‍යයනයට සම්බන්ධ වූ දත්තදායකයින්ගෙන් 2 (4%) දෙනෙක් වයස අවුරුදු 11 - 14 අතර වයස් මට්ටමකදී ද, 27 (54%) දෙනෙක් වයස අවුරුදු 15 - 17 වයස් මට්ටමකදී ද ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කිරීම ආරම්භ කර ඇත. ඊට අමතරව පුද්ගලයින් 15 (30%) දෙනෙක් වයස අවුරුදු 18 - 21ත් අතර වයස් මට්ටමකදී යම් මත්ද්‍රව්‍යයක් ප්‍රථම වරට භාවිත කර ඇත. සමස්ත නියැදියෙන් බහුතර පුද්ගල සංඛ්‍යාවක් වයස අවුරුදු 15 - 17 අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කිරීම ආරම්භ කර ඇත.

ප්‍රස්තාර අංක 04 - පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ වයස් මට්ටම්



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානම් වයස් කාණ්ඩය ලෙස වයස අවුරුදු 17 හෝ ඊට අඩු වයස් මට්ටමක් විය හැකි බව Substance Abuse and Mental Health Services Administration Treatment Episode Data Set (2014) වාර්තාව මගින් පැහැදිලි කරයි. මෙම අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් 50 දෙනා අතුරින් පුද්ගලයින් 30 (80%) දෙනෙක් වයස අවුරුදු 17 හෝ ඊට වඩා අඩු වයස් මට්ටමකදී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ කර ඇත. අධ්‍යයන දත්ත වලට අනුව යම් පුද්ගලයෙක් ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ සාමාන්‍ය වයස් මට්ටම අවුරුදු 17 කි.

වගු අංක 04 - පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම

වයස (අවුරුදු)	පුද්ගලයින් සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
< = 17	30	60
18 - 23	16	32
24>	4	8

මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

3.2.2 ප්‍රථම වරට භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග (ප්‍රාථමික මත්ද්‍රව්‍ය)

මත්ද්‍රව්‍ය භාවිත චාර්යාව ආරම්භ කිරීමේදී පුද්ගලයින් විසින් භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් 6 (12%) දෙනෙක් බියර් ප්‍රථම වරට භාවිත කර ඇති අතර පුද්ගලයින් 5 (10%) දෙනෙක් මද්‍යසාර ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස අත්හදාබලා ඇත. සමස්ත නියැදියෙන් බහුතර පුද්ගලයින් සංඛ්‍යාවක් එනම් 39 (78%) දෙනෙක් සිගරැට් ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත.

3.2.3 මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීමට බලපාන ලද සාධක

පුද්ගලයෙක් ඉහත වයස් සීමාවන් තුළ යම් ද්‍රව්‍යයක් භාවිත කිරීම අත්හදා බැලීම සඳහා හේතු වූ කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් 25 දෙනෙක් කුතුහලය හේතුවෙන් ද, පුද්ගලයින් 22 දෙදෙනෙක් මිතුරු බලපෑම හේතුවෙන් ද යම් මත්ද්‍රව්‍ය වර්ගයක් අත්හදා බැලීමට යොමු වී ඇත. ඊට අමතරව පුද්ගලයින් 21 දෙනෙක් සතුට, විනෝදය පිණිස සහ පුද්ගලයින් 07 දෙනෙක් ගැටලුකාරී තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් මත්ද්‍රව්‍ය භාවිත කිරීම ආරම්භ කර ඇත.

සිදුකරන ලද ප්‍රත්‍යක්ෂ අධ්‍යයන අනුව පවුලේ සමීපතමයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම හේතුවෙන් ද පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවන බව අනාවරණය විය. ප්‍රත්‍යක්ෂයක අධ්‍යයන දත්ත වලට අනුව තම පියා සහ පවුලේ අනෙකුත් පුද්ගලයින් නිවසේ සිට මත්ද්‍රව්‍ය භාවිත කිරීම දැකීමෙන් ඇතිවන ආශාව හෝ කුතුහලය නිසා මත්ද්‍රව්‍ය භාවිත කිරීමට යොමු වී ඇති පුද්ගලයින් ද හඳුනාගත හැකිවිය. එමෙන්ම මිතුරු බලපෑම (peer pressure) මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි බලපෑම් ඇති කරවන ප්‍රධාන සාධකයකි.

3.2.4 රාත්‍රී සමාජශාලාවල භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් සියලු දෙනා රාත්‍රී සමාජශාලා සාද හෝ වෙරළ සාද වැනි අවස්ථාවන්ට සහභාගීවන අතර එවැනි අවස්ථා වල විවිධ මත්ද්‍රව්‍ය භාවිත කිරීම පුරුද්දක් වශයෙන් පවත්වා ගෙන යනු ලබයි. ඔවුන් භාවිත කරන එක් එක් මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් 47 දෙනෙක් සිගරැට් භාවිත කරනු ලබන අතර පුද්ගලයින් 48 දෙනෙක් මද්‍යසාර වර්ග භාවිත කරනු ලබයි. එමෙන්ම ගංජා භාවිත කරනු ලබන පුද්ගලයින් 42 දෙනෙක් සහ 21 දෙනෙක් හෙරොයින් භාවිත කර ඇති අතර පුද්ගලයින් 22 දෙනෙක් හෂිස් භාවිත කරනු ලබයි.

අධ්‍යයන නියැදිය තුළ සංගෘහිත වූ පුද්ගලයින් 50 දෙනාගෙන් 45 දෙනෙක් LSD භාවිත කරන අතර 49 දෙනෙක් එක්ස්ටසි භාවිත කරනු ලබයි. ඊට අමතරව පුද්ගලයින් 28 දෙනෙක් කොකේන් භාවිත කරනු ලබන අතර 28 දෙනෙක් මෙතම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි. මේ අනුව පැහැදිලි වන ප්‍රධාන කරුණක් නම්, රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බවයි.

ප්‍රස්තාර අංක 05 - රාත්‍රී සමාජශාලා සාද වල භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග



මූලාශ්‍රයඃ (පර්යේෂණ දත්ත, 2017)

Drugs and crime prevention committee, Parliement of Voctoria, 2004 වාර්තාවෙහි සඳහන් සමාජශාලා මත්ද්‍රව්‍ය (party drugs/ club drugs) වර්ගීකරණය අනුව LSD, එක්ස්ටසි, කොකේන්, මෙතම්පිටමින් හා ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් සමාජශාලා මත්ද්‍රව්‍ය කාණ්ඩයට අයත් වේ. අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය පිළිබඳ දත්ත වලට අනුව ඉහත වර්ගීකරණයට අදාළ විවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් හඳුනාගත හැකිවිය. එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරන පුද්ගලයින්ගේ පැතිකඩ සහ ඒ ආශ්‍රිත චර්යාවන් පහත විස්තර කර ඇත.

3.2.4.1 Ecstasy

අධ්‍යයනය සඳහා සම්බන්ධ වූ පුද්ගලයින් 50 දෙනාගෙන් 49 දෙනෙක් එක්ස්ටසි භාවිත කරනු ලබයි. සාද අවස්ථා වලට සහභාගි වන පුද්ගලයින් එක්ස්ටසි සඳහා "pill" යන අන්වර්ථ නාමය භාවිත කරනු ලබයි. දත්තදායකයින් විසින් අනාවරණය කරන ලද කරුණු වලට අනුව බොහෝ අවස්ථා වල සමාජශාලා වලට පැමිණෙන විට එක්ස්ටසි පෙති රැගෙන එන අතර ඇතැම් අවස්ථා වල සමාජශාලා ඇතුළත ඒවා අලෙවි කරනු ලබන පුද්ගලයින්ගෙන් (ඇතැම් විට සමාජශාලා වල සේවය කරන්නන්) මිලදී ගනු ලබයි.

එක්ස්ටසි පෙති සාද වලට පැමිණෙන විට බාහිර ස්ථානයකින් රැගෙන ඒමට බොහෝ පුද්ගලයින් යොමු වී සිටින අතර එයට ප්‍රධාන හේතුවක් ලෙස ඔවුන් විසින් සඳහන් කර ඇත්තේ සමාජශාලා ඇතුළත ඉහළ මිල ගණන් යටතේ අදාළ මත්ද්‍රව්‍ය අලෙවි කිරීමයි. එමෙන්ම ඔවුන්ගේ අදහස් වලට අනුව ඇතැම් අවස්ථා වල තත්ත්වයෙන් අඩු ව්‍යාජ මත්ද්‍රව්‍ය හා ඒ වෙනුවට වෙනත් ආදේශක වර්ග රාත්‍රී සමාජශාලා තුළ අලෙවි කරනු ලබයි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් විසින් එවැනි ව්‍යාජ මත්ද්‍රව්‍ය (Fake Drugs) හෝ ඔවුන් අපේක්ෂා කරන මට්ටමට තෘප්තියක් ගෙන නොදෙන මත්ද්‍රව්‍ය භාවිත කිරීමට ඇති අකමැත්ත නිසා සමාජශාලාවලට පැමිණෙන විට ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයට එක්ස්ටසි පෙති බාහිරින් රැගෙන එනු ලබයි. එසේ රැගෙන එන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අවස්ථා වල සමාජශාලා ඇතුළත මත්ද්‍රව්‍ය අලෙවි කරනු ලබන පුද්ගලයින්ගෙන් ඒවා මිලදි ගනු ලබයි.

එක්ස්ටසි භාවිත කරන පුද්ගලයින් ඔවුන්ගේ භාවිතය සම්බන්ධයෙන් සිදුකරන ලද ප්‍රකාශ විශ්ලේෂණය කිරීමේදී සතුට හා විනෝදය ලබා ගැනීමට මෙන්ම අනෙක් පුද්ගලයින් සමග මිත්‍රශීලි හා සුහදශීලි ලෙස ගනුදෙනු කිරීම වැනි පරමාර්ථ සහිතව ඔවුන් එක්ස්ටසි භාවිත කරනු ලබයි. ඒ අනුව එක්ස්ටසි භාවිත කරනු ලබන පුද්ගලයින්ගේ ප්‍රකාශ හා අත්දැකීම් විවිධ තේමා අනුව විශ්ලේෂණය කිරීමේදී උපශීර්ෂ 04 ක් යටතට ගොනුකළ හැකිය.

- සතුට දනවන හැඟීම් (Feeling of euphoria)
- සහකම්පනය ප්‍රකාශ කරවන හැඟීම් (Empathy)
- ශක්තිය වැඩි කිරීමට (Increasied energy)
- මෘදු මායාවන්/ භ්‍රාන්තීන් (Mild hallucinations)

වගු අංක 05 - එක්ස්ටසි භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයින් විසින් ඉදිරිපත් කරන ලද අදහස්

සතුට දනවන හැඟීම්	සහකම්පනය ප්‍රකාශ කරවන හැඟීම්	ශක්තිය වැඩි කිරීමට	මෘදු මායාවන්/ භ්‍රාන්තීන්
"දවසෙම සතුටින් ඉන්න පුළුවන්"	"යහළුවෝ එක්ක set වෙන්න පුළුවන්"	"කොච්චර වෙලාවක් නැටුවත් මහන්සියක් නැහැ"	"lighting එක්ක හොඳට feel වෙනවා"
"ප්‍රශ්න අමතක වෙනවා"	"අපි එක set එකක් විදියට ගොඩක් parties වලදී එකතු වෙනවා"	"Music එක්ක නටන්න හොඳ energy එකක් ඕන"	"වෙනම ලෝකයක් වගේ පේනවා"
"හොඳට නටන්න පුළුවන්"			
"වෙනසක් අත්විඳින්න පුළුවන්"			

මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

එක්ස්ටසි භාවිත කරන පුද්ගලයින්ගේ පරිකල්පනයට අනුව (බොහෝවිට මිත්‍යා මතයන් වේ) රාත්‍රී සමාජශාලාවල භාවිත වන සංගීත ප්‍රභේද රසවින්දනය කිරීමට හා ඒ සමඟ නර්තනයේ යෙදීම සඳහා ඔවුන් එක්ස්ටසි භාවිත කරනු ලබයි. විශේෂයෙන් වැඩි වේලාවක් නර්තනයේ යෙදීමට සහ ඉලෙක්ට්‍රෝනික සංගීත ප්‍රභේද සහ ආලෝකකරණය සමඟ මායාකාරී හැඟීම් හා සතුට දනවන හැඟීම් ඇතිකර ගැනීමට මෙලෙස ඔවුන් එක්ස්ටසි භාවිත කරන බව අනාවරණය කරන ලදි. ඉහත මත්ද්‍රව්‍ය

භාවිත කරන පුද්ගලයින්ගේ අත්දැකීම් සහ අදහස් විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ, ඔවුන් සිය මත්ද්‍රව්‍ය භාවිතය පවත්වා ගැනීමට හෝ අදාළ චර්යාවන් දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට විවිධ සාධාරණීකරණ ගොඩනගා ගෙන ඇති බවයි. එම විශ්වාස සහ අත්දැකීම් බොහෝවිට වැරදි පරිකල්පනයන් (Mis perceptions) මත පදනම් වී ඇත.

3.2.4.2 LSD (Lysergic Acid Diethylamide)

අධ්‍යයන නියැදියෙන් පුද්ගලයින් 45 දෙනෙක් LSD භාවිත කරනු ලබන අතර ඔවුන් රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වීමේදී බාහිරින් අදාළ මත්ද්‍රව්‍ය ප්‍රමාණ රැගෙන යයි. එයට හේතුව එක්ස්ටසි මෙන්ම LSD සම්බන්ධයෙන් සමාජශාලා ඇතුළත ඉහළ මිල ගණන් යටතේ ලබාගැනීමට සිදුවීම සහ ව්‍යාජ හා අපේක්ෂා කරන ප්‍රමිතියට වඩා අඩු වර්ගයේ ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදුවීමයි. LSD හැඳින්වීම සඳහා රාත්‍රී සමාජශාලා වලට සහභාගී වන පුද්ගලයින් "Acid" යන අන්වර්ථ නාමය බහුලව භාවිත කරනු ලබයි. LSD භාවිත කරන පුද්ගලයින් විසින් අත්දකින ලද අවස්ථාවන් අනුව වර්ග දෙකකට අයත් භ්‍රාන්තිකාරී අත්දැකීම් (hallucinations) වලට අනුව මුහුණ දී ඇත.

- LSD "good trip" experience
- LSD "bad trip" experience

LSD "good trip" experience

LSD භාවිත කරන බහුතරයක් පුද්ගලයින් විසින් මෙම ගණයට ගැනෙන අත්දැකීමක් බලාපොරොත්තු වෙයි. සාමාන්‍යයෙන් LSD සුළු ප්‍රමාණයක් ශරීරගත වූ පසු පැය 8-12 ත් අතර කාලයක් එහි බලපෑම ශරීරය විසින් අත්දකින බව භාවිත කරන්නන්ගේ අත්දැකීම් හා අදහස් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වේ. good trip ගණයට අයත් අත්දැකීම් ලබාගත් පුද්ගලයින්ට අනුව සතුට දනවන හැඟීම්, අලංකාර දර්ශන, පුදුම සහගත මායාකාරී හැඟීම් අර්ථවත් මානව සම්බන්ධතා වැනි දේ ඇතිවන අවස්ථා "good trip" වශයෙන් සළකන අතර LSD භාවිත කරන්නන් අපේක්ෂා කරනුයේ ද එවැනි අත්දැකීම්ය.

LSD "good trip" experience

භීතිය ඇති කරවන, අප්‍රසන්න දර්ශන පෙන්නුම් කරන, ජීවිතය වේදනාකාරී බව හඟවන සහ නපුරු සහගත දර්ශන පෙන්නුම් කරන ආකාරයේ අත්දැකීම් මෙම ගණයට අයත් වේ. මෙවැනි අත්දැකීම් අත්විඳීමට භාවිත කරන්නන් අකමැති අතර ඒ සමඟ ඇතිවන ශාරීරික සංකූලතා හේතුවෙන් ඒ සම්බන්ධයෙන් ඔවුන් බියක් දක්වයි.

අධ්‍යයනය තුළ සම්මුඛ සාකච්ඡා පවත්වන ලද මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 05 දෙනාගෙන් 04 දෙනෙකු ජීවිතයේ එක් අවස්ථාවක හෝ LSD භාවිතයත් සමඟ භීතිය ඇති කරවන ගණයේ අත්දැකීමට මුහුණ දී ඇත.

ඒ අතුරින් බහුතරයක් මුහුණ දී ඇති තත්ත්වය වන්නේ, දෘශ්‍ය විකෘතීන් දැකීම වැනි තත්ත්වයකට යි. ඔවුන්ගේ අත්දැකීම් අනුව එහිදී බොහෝවිට සමාජශාලා පරිශ්‍රය තුළ දර්ශනය කර ඇති යම් ඡායාරූපයක්/දර්ශනයක් හෝ විදුලි ආලෝකකරණය මඟින් ආලෝක වර්ණ රේඛා වෙනස් කිරීම මඟින් භ්‍රාන්තීන් වලට පත්වීම හෝ ඒවා විකෘති සහගත රූප ලෙස දැකීම සිදුවී ඇත.

ඡායාරූප අංක 01-LSD "good trip" image



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

ඡායාරූප අංක 02-LSD "bad trip" image



මූලාශ්‍රය: (අන්තර්ජාලය ඇසුරින්)

ඇතැම් LSD භාවිත කරන පුද්ගලයින් සිය ජංගම දුරකතනවල LSD මඟින් සෞම්‍ය දර්ශන හා හීතියට පත්නොවන ආකාරයේ භ්‍රාන්තීන් ඇති කරවන ඡායාරූප ගබඩා කරගෙන සිටියි (ඉහත ඡායාරූප අංක 01 එවැනි පුද්ගලයකුගේ ජංගම දුරකථනයකින් ලබාගත් ඡායාරූපයකි). ප්‍රතිචාරකයින් පැහැදිලි කරන පරිදි LSD භාවිත කර ඇති අවස්ථාවල එම ඡායාරූප නරඹා තමන් අපේක්ෂා කරන භ්‍රාන්තිකාරක තත්ත්වයන්ට පත්වීම සිදුවෙයි. එමෙන්ම LSD භාවිත කරන්නන් ඔවුන්ගේ රුචිකත්වය අනුව සුවිශේෂී වූ LSD ප්‍රභේද භාවිත කරයි. එම ප්‍රභේද අතර Ecs, Shell, Burgas, Superman, Super Mario, Red bad man, Rock & Roll, Angel Qpid, Hoffman, Leach, Shiva, Hoffman black යන වර්ග බහුලව භාවිත වන බව අධ්‍යයන දත්ත තුළින් අනාවරණය විය. එමෙන්ම ඇතැම් අවස්ථා වල LSD භාවිත කිරීම මඟින් අපේක්ෂිත තෘප්තිය ලබාගැනීම හා වැඩි කරගැනීම සඳහා මද්‍යසාර වැනි ද්‍රව්‍යය ද ඒ සමඟ භාවිත කරනු ලබන බවට ඔවුන් විසින් ප්‍රතිචාර දක්වා ඇත.

3.2.4.3 ඇම්පිටමින් වර්ගයේ උත්තේජක

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) විසින් 2015 දී පළ කරන ලද Amphetamine type stimulants (ATS) use in India වාර්තාවට අනුව ඇම්පිටමින් වර්ගයේ උත්තේජක ඇම්පිටමින් කාණ්ඩයට අයත් ද්‍රව්‍ය වලින් සමන්විත වේ. ඇම්පිටමින් කාණ්ඩයට අයත් ද්‍රව්‍ය ගණයට ඇම්පිටමින්, මෙතම්පිටමින් සහ ඒවායෙන් ව්‍යුත්පන්න කරගත් ද්‍රව්‍යය එනම්, මෙත්කැතිනොන් (Methcathinone), Fentyline සහ Methylphenidate අයත් වේ. එමෙන්ම මෙතම්පිටමින් ගණයට (පොදුවේ Speed, Ice, Crystal, Glass වශයෙන් හඳුන්වන) කෘතීම රසායනාගාරවල නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වේ.

ලෝක සෞඛ්‍යය සංවිධානය විසින් අර්ථ දක්වන පරිදි ඇම්පිටමින් හා මෙතම්පිටමින් අඩංගු ඖෂධ වලින් සමන්විත කාණ්ඩයක් ලෙස ඇම්පිටමින් වර්ගයේ උත්තේජක හඳුන්වනු ලබයි. කෙසේවෙතත් Methcathinone, Fenetylline, Ephedrine, Pseudophedrine, Methylphenidate සහ MDMA හෙවත් Ecstasy යන ද්‍රව්‍යය ද මෙම කාණ්ඩයට අයත් වේ.

එක්ස්ටසි භාවිතය සම්බන්ධයෙන් ඉහත අනු මාතෘකාව යටතේ විශ්ලේෂණය කරන ලද අතර එක්ස්ටසි වලට අමතරව අධ්‍යයනය නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් විසින් භාවිත කර ඇති ඇම්පිටමින් හා මෙතම්පිටමින් වර්ගයේ ද්‍රව්‍යය පිළිබඳ පහත විග්‍රහ කර ඇත.

අධ්‍යයන දත්ත වලට අනුව නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් විසින් භාවිත කරනු ලබන මෙතම්පිටමින් වර්ගයේ ඖෂධ වර්ග "Ice", "Crystal" සහ "Mendi" වශයෙන් හඳුනාගත හැකිය. එහිදී මෙතම්පිටමින් වර්ගයට ගැනෙන Crystal meth භාවිත කරන පුද්ගලයින් 04 දෙනෙක්, Ice යනුවෙන් හඳුන්වමින් මෙතම්පිටමින් භාවිත කරන පුද්ගලයින් 05 දෙනෙක් සහ Mendi යනුවෙන් හඳුන්වමින්

මෙතම්පිටමින් ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 28 දෙනෙක් හඳුනාගත හැකිවිය. ඇතැම් අවස්ථාවල එකම ද්‍රව්‍ය හැඳින්වීම සඳහා ඉහත නම් එකක් හෝ කිහිපයක් භාවිත කරනු ලබන අවස්ථා ද ඇත. බොහෝවිට ඔවුන් එවැනි ද්‍රව්‍ය ආඝ්‍රාණය කිරීම කරනු ලබයි.

3.2.4.4 කොකේන්

අධ්‍යයන නියැදියෙන් පුද්ගලයින් 28 දෙනෙක් කොකේන් භාවිත කරනු ලබයි. රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වීමේදී බාහිර කොකේන් අලෙවි කරන පුද්ගලයින්ගෙන් අවශ්‍ය ප්‍රමාණය රැගෙන යන අතර සාදවලදී මුණගැසෙන මිතුරන් සමඟ ඇතැම් අවස්ථා වල හුවමාරු කරගැනීම ද සිදුකරනු ලබයි. එමෙන්ම පුද්ගලයින් 14 දෙනෙක් "Charlie" නැමැති මත්ද්‍රව්‍ය විශේෂය ද භාවිත කරනු ලබයි. එයද කොකේන් ආශ්‍රිත නිෂ්පාදනයක් වන අතර කුඩු විශේෂයක් ලෙසින් සංසරණය වෙයි. ඒවා ආඝ්‍රාණය කිරීම බොහෝවිට සිදුකරනු ලබයි. Memidex ශබ්දකෝෂයට අනුව කොකා පත්‍ර (Coca leaves) මඟින් ලබාගන්නා මාදක ගණයේ ද්‍රව්‍යයක් වන අතර එය දැඩිලෙස ඇබ්බැහිකාරී ද්‍රව්‍යයකි. කොකේන් භාවිත කරන්නන් බොහෝවිට මෙම "Charlie" නැමැති මත්ද්‍රව්‍යය ද අවස්ථානුකූලව භාවිත කරනු ලබයි.

3.2.4.5 ඖෂධමය අරමුණු සඳහා භාවිත කරන ද්‍රව්‍ය අවභාවිතය

අධ්‍යයන අනාවරණ වලට අනුව සමස්ත නියැදියෙන් පුද්ගලයින් 26 (52%) දෙනෙක් විවිධ වර්ගයේ ඖෂධමය පෙති වර්ග භාවිත කර ඇත. ඔවුන් භාවිත කර ඇති ඖෂධ වර්ග පිළිබඳ සමස්තයක් ලෙස අවධානය යොමු කිරීමේ දී ඔවුන් සියලු දෙනාම වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරනු ලබන ඖෂධ වර්ග අවභාවිත කිරීම සිදුකර ඇත.

ඖෂධමය පෙති වර්ග භාවිත කරන පුද්ගලයින් 26 දෙනා අතර Pregabalin භාවිත කරන හතර දෙනෙක්, Diazepam භාවිත කරන නව දෙනෙක්, Tramadol භාවිත කරන 8 දෙනෙක්, Rohypnol භාවිත කරන එක් අයෙක්, Burbitone භාවිත කරන එක් අයෙක් සහ Psedoephidrine භාවිත කරන 10 දෙනෙක් හඳුනාගත හැකිවිය. බොහෝ පුද්ගලයින් අවස්ථානුකූලව පෙති වර්ග එකක් හෝ කිහිපයක් භාවිත කරනු ලබයි. මෙහිදී හඳුනාගත හැකි සුවිශේෂී කාරණය වන්නේ රාත්‍රී සමාජශාලා සාද වලදී මෙන්ම වෙනත් බාහිර අවස්ථාවන් වලදී ද ඔවුන් මෙවැනි ඖෂධමය පෙති වර්ග භාවිත කිරීමයි. පෙති වර්ග ලබාගැනීමේ දී ඔවුන් ඖෂධඥල් හෝ වෙනත් පෙති වර්ග නීතිවිරෝධී ලෙස අලෙවි කරන පුද්ගලයින් මාර්ගයෙන් ලබා ගැනීම සිදුකරයි.

ප්‍රස්තාර අංක 06 - ඖෂධමය පෙති වර්ග භාවිත කරනු ලබන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

එන්නත් කරගැනීමේ චර්යාව සම්බන්ධයෙන් දත්තදායකයින් අතර ඇති ප්‍රවණතාව පිළිබඳව අවධානය යොමු කරන ලද අතර පුද්ගලයින් 4 (8%) දෙනෙක් පමණක් හෙරොයින් එන්නත් කරගැනීම සිදුකර ඇත. නමුත් ඔවුන් දීර්ඝකාලීනව එන්නත් කරගන්නන් නොවන අතර අවස්ථානුකූලව හෙරොයින් එන්නත් කරගැනීම සිදුකර ඇත.

3.2.5 රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කිරීමට ප්‍රිය කරන මත්ද්‍රව්‍ය වර්ග

ඉහත විග්‍රහ කරන ලද මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පැතිකඩ සම්බන්ධ තොරතුරු වලට අමතරව දත්තදායකයින් රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කිරීමට වඩාත්ම ප්‍රියකරන මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන ලදි. මෙහිදී Esctasy හා ඇම්පිටමින් වර්ගයේ උත්තේජක (ATS) මෙන්ම LSD වැනි ද්‍රව්‍ය ඔවුන් බොහෝවිට රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කරනු ලබයි. නමුත් කොකේන්, ඖෂධමය පෙති වර්ග, ගංජා, හෙරොයින් වැනි ද්‍රව්‍ය සමාජශාලා සාද වල මෙන්ම ඉන් පරිබාහිර ස්ථාන හා අවකාශයන් වලදී ද අවස්ථානුකූලව භාවිත කරනු ලබයි.

එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය අනුව ඒවා රාත්‍රී සමාජශාලා වලදී භාවිත කිරීමට ඇති කැමැත්ත පිළිබඳ දත්තදායකයින්ගේ මතය මෙහිදී විමසන ලද අතර ඒ සම්බන්ධයෙන් ඔවුන් පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත. ඒ අනුව රාත්‍රී සමාජශාලා සාද අවස්ථා වල Esctasy භාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළ රුචිකත්වයක් දක්වන පුද්ගලයින් 31 (62%) දෙනෙක් සහ LSD භාවිත කිරීමට ඉහළ රුචිකත්වයක් දක්වන පුද්ගලයින් 10 (20%) දෙනෙක් හඳුනාගත හැකිවිය. සමාජශාලා සාද අවස්ථාවල ඉහළ රුචිකත්වයක් සහිතව භාවිත කරන මත්ද්‍රව්‍ය ලෙස මෙහිදී Esctasy හඳුනාගත හැකිය. ඊට සාපේක්ෂව හෙරොයින්, ගංජා, කොකේන් සහ ඖෂධමය පෙති වර්ග වැනි ද්‍රව්‍ය රාත්‍රී සමාජශාලා සාද අවස්ථා වල භාවිත කිරීම සම්බන්ධයෙන් ඔවුන් ඉහළ රුචිකත්වයක් නොදක්වයි.

ප්‍රස්තාර අංක 07 - රාත්‍රී සමාජශාලා සාද අවස්ථා වල එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සඳහා පුද්ගලයින් දක්වන රුචිකත්වය



මූලාශ්‍රයඃ (පර්යේෂණ දත්ත, 2017)

මේ අනුව පැහැදිලි වන කරුණක් නම්, Esctasy වැනි උත්තේජක ගණයේ ද්‍රව්‍ය භාවිතයට සහ ආලෝකකරණය හා සංගීතය සමඟ මායාකාරී අත්දැකීම් කරා ගමන් කිරීමට සමත් බලපෑමක් ලබාදෙන ද්‍රව්‍ය වර්ග භාවිතයට රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින් ඉහළ රුචිකත්වයක් දක්වන බවයි.

එමෙන්ම අධ්‍යයනය තුළ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සම්බන්ධයෙන් තවදුරටත් අවධානය යොමුකරන ලද අතර එහිදී ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සමාජශාලා සාදවලට පමණක් සීමා වන්නේ ද? යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලදි. ඒ අනුව සමස්ත නියැදියෙන් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 27 (54%) දෙනෙක් සමාජශාලා සාද වලට අමතරව වෙනත් අවස්ථා වලදී අදාළ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි. එසේ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන වෙනත් ස්ථාන ලෙස සිය නිවස තුළ, වෙනත් හෝටලයකදී හෝ වෙනත් උත්සව හෝ සාද අවස්ථා දක්වන ලදි. ඒ අනුව පැහැදිලි වන කරුණක් නම්, සමාජශාලා සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ඉන් පරිබාහිර වෙනස් ස්ථාන හෝ අවස්ථාවලදී ද සිය මත්ද්‍රව්‍ය භාවිතය සිදුකරන බවයි.

3.3 රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පුද්ගල චර්යාවේ ස්වාභාවය

රාත්‍රී සමාජශාලා සාද සහ ඒ ආශ්‍රිත අවකාශයන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය සහ ඒ සමඟ සිදුවන පුද්ගල අන්තර්ක්‍රියාවන්ගේ ස්වභාවය පිළිබඳ මෙහිදී අවධානය යොමුකරන ලද අතර එය පහත උප ශීර්ෂ 04 යටතේ සාකච්ඡාවට භාජනය කර ඇත.

- ✦ සමාජශාලා සාදවලට යොමුවීම හා සහභාගීත්වය
- ✦ සමාජශාලා සාද සංවිධානය වන ආකාරය හා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන ආකාරය
- ✦ මත්ද්‍රව්‍ය මිල්දී ගැනීම සිදුකරන ආකාරය
- ✦ මත්ද්‍රව්‍ය භාවිතය : සෞඛ්‍යය හා සමාජ බලපෑම්

3.3.1 සමාජශාලා සාද වලට යොමුවීම හා සහභාගීත්වය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් රාත්‍රී සමාජශාලා සාද වලට ප්‍රථම වරට සහභාගී වී ඇති වයස් මට්ටම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 20 (40%) දෙනෙක් වයස අවුරුදු 18ට වඩා අඩු වයස් මට්ටමකදී ද, පුද්ගලයින් 13 (26%) දෙනෙක් වයස අවුරුදු 19-22 අතර වයස් මට්ටමකදී ද ප්‍රථම වරට සමාජශාලා සාද වලට සහභාගී වී ඇත. ඊට අමතරව පුද්ගලයින් 10 (20%) දෙනෙක් වයස අවුරුදු 23-26 අතර වයස් මට්ටමකදී ද රාත්‍රී සමාජ ශාලා වලට සහභාගී වීම ආරම්භ කර ඇත. සමස්ත නියැදියෙන් පුද්ගලයින් 49 (98%) දෙනෙක් වයස අවුරුදු 30ට වඩා අඩු වයස් මට්ටමක දී ප්‍රථම වරට රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වී ඇත.

ප්‍රථම වරට සමාජශාලා සාද වලට සහභාගී වීම පිළිබඳ තවදුරටත් අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 45 (90%) දෙනෙක් මිතුරන් සමඟ සමාජශාලා සාද වලට සහභාගී වී ඇත. ඊට අමතරව පුද්ගලයින් 2 (4%) දෙනෙක් සිය සහකරුවා හෝ සහකාරිය සමඟ ප්‍රථම වරට සාද අවස්ථා වලට සහභාගී වී ඇත.

රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින්ගෙන් බහුතරයක් (49) දිනපතා එවැනි සාද වලට සහභාගී නොවන අතර පුද්ගලයින් 32 (64%) දෙනෙක් සති අන්ත දිනවල එවැනි සාද වලට සහභාගී වෙයි. ඊට අමතරව පුද්ගලයින් 8 (16%) දෙනෙක් සතියකට වරක් යම්කිසි අවස්ථාවක දී හා පුද්ගලයින් 7 (14%) දෙනෙක් වෙනත් විශේෂිත නිවාඩු දිනයන්හි දී සමාජශාලා සාද වලට සහභාගී වෙයි.

3.3.2 සමාජශාලා සාද සංවිධානය වන ආකාරය හා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කරන ආකාරය

3.3.2.1 සමාජශාලා සාද සංවිධානය වන ආකාරය

සමාජශාලා, වෙනත් හෝටල්, සංචාරක නිකේතන සහ උත්සව ශාලා ආශ්‍රිතව මෙන්ම වෙරළාශ්‍රිත ප්‍රදේශ වල මෙවැනි සාද සංවිධානය කිරීම සිදුවෙයි. අධ්‍යයනයට සහභාගී වූ පුද්ගලයින් සහභාගී වන එවැනි සාද අවස්ථා සිදුවන ස්ථාන පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී දෙහිවල, ගල්කිස්ස, මොරටුව, කොල්ලුපිටිය, තිඹිරිගස්යාය, වාද්දුව, හික්කඩුව, මීගමුව වැනි ප්‍රදේශවල පැවැත්වෙන සාද වලට බහුතරයක් පුද්ගලයින් සහභාගී වී ඇත.

මෙවැනි සමාජ ශාලා සාද සහ වෙරළ සාද සංවිධානය කරනු ලබන වෙනම සංවිධායකයින් සිටින අතර එවැනි සාද ප්‍රවර්ධනය (Promote) කරන වෙනම කණ්ඩායමක් ද සිටියි. එහිදී රාත්‍රී සමාජශාලා හෝ වෙරළ සාද වලට සහභාගී වන පුද්ගල කණ්ඩායම් සමාජ මාධ්‍යය (Social media) හරහා සන්නිවේදනය කරගනු ලබයි. එම ඉලක්ක කණ්ඩායම අතර සාද පිළිබඳ විස්තර හා එක් එක් සාද හා අවස්ථා පිළිබඳ ආරධනා යොමු කරනු ලබන්නේද සමාජ මාධ්‍යය විශේෂයෙන් Facebook ගිණුම් භාවිත කරමිනි. සාද ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනම කණ්ඩායමක් ක්‍රියා කරන අතර Facebook සමාජ ජාලය තුළ නිර්මාණය කරගනු ලබන ව්‍යාජ Facebook ගිණුම් (Fake Account) සහ අදාළ අවස්ථාවන් සඳහාම නිර්මාණය කරන ලද Facebook ගිණුම් භාවිත කරමින් ආරධනා සහ අදාළ විස්තර යොමු කරනු ලබයි. මෙහිදි සාද අවස්ථා ප්‍රවර්ධනය කරන පුද්ගලයින් අදාළ සාද සංවිධානය කරන පුද්ගලයින්ගේ තැරැව්කරුවන් වශයෙන් ක්‍රියා කරනු ලබයි.

ප්‍රවර්ධනය කරන පුද්ගලයින් විසින් කරනු ලබන ප්‍රවර්ධනය අනුව අදාළ සාදයට සහභාගී වන පුද්ගල සංඛ්‍යාව තීරණය වන අතර ඒ අනුව අදාළ පුද්ගලයින්ට ප්‍රවර්ධනය වෙනුවෙන් ගෙවීම් කිරීම හෝ ඇතැම් අවස්ථාවල නොමිලේ ප්‍රවේශපත්‍ර ලබාදීම සිදුකරයි.

අධ්‍යයනය තුළ සිදු කරන ලද ප්‍රත්‍යෙයක අධ්‍යයනවලට අනුව රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින් ඇතැම් අවස්ථාවල සාද ප්‍රවර්ධනය කරන්නන් ලෙස කටයුතු කරනු ලබයි. මන්ද ඔවුන් නොමිලේ ලැබෙන ප්‍රවේශපත්‍ර ලබාගැනීමේ අරමුණින් අදාළ සාද ප්‍රවර්ධන කටයුතු වල යෙදී සිටියි (ප්‍රත්‍යෙක අධ්‍යයන දත්ත). ප්‍රත්‍යෙක අධ්‍යයන දත්ත වලට අනුව සාද අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමේදි සළකා බලනු ලබන නැතිනම් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන ප්‍රධාන කරුණු කිහිපයක් ඇත.

- පැවැත්වෙන ස්ථානය
- සංගීතය සපයන කණ්ඩායම හෝ සහභාගී වන කලාකරුවන් (DJ Artist)
- අදාළ පැකේජයට (Package) ඇතුළත් විශේෂාංග හා මිල ගණන්
- මත්ද්‍රව්‍ය භාවිත කිරීමට ඇති අවකාශය හා එවැනි පසුබිමක් හඟවන සුවිශේෂී වචන හෝ පින්තූර

මෙවැනි අංග හරහා පුද්ගලයින් අදාළ අවස්ථාවන්ට ආකර්ෂණය කරගැනීම සඳහා ඔවුන් උත්සාහ කරනු ලබයි. බොහෝ සාද අවස්ථාවන් වල එකම පිරිසක් සහභාගි වන අතර අදාළ පුද්ගලයින් අතරද සමාජ මාධ්‍යය හරහා ගොඩනගාගත් සම්බන්ධතාවයන් පවත්වා ගෙන යනු ලබයි. විශේෂයෙන් Facebook ගිණුම් හරහා නිර්මාණය කරගත් සමීප කණ්ඩායම් (Close Group) මගින් පැවැත්වෙන සාද අවස්ථා පිළිබඳ විස්තර හුවමාරු කර ගනියි. බොහෝ රාත්‍රී සමාජශාලා සාද වල අවස්ථා නැතිනම් අදියර දෙකක් ඇත. එනම්,

- ❖ Night Party
- ❖ After Party

වශයෙනි. "Night Party" රාත්‍රියේ ආරම්භ වී පසුදින උදෑසන දක්වාම පැවැත්වෙයි. එම අවස්ථා තුළ ඉහළ ඉල්ලුමක් ඇති සංගීත ප්‍රභේද වාදනය කරන අතර ප්‍රවීණ ගණයේ ශිල්පීන් සහභාගී වෙයි. "After Party" යනු රාත්‍රිය පුරා පැවැති සාදය අවසන්ව පසුදින උදෑසන සිට ආරම්භ වී දිවා කාලය දක්වා පැවැත්වෙන අවස්ථාවන්ය. ඒවායේද රාත්‍රියේ පැවැත්වෙන සාද වලට සමාන තත්ත්වයක් දැක ගත හැකි අතර සංගීතය බොහෝ විට වෙනස්කම් වලට ලක් කරයි. එම අවස්ථා තුළ ද මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සිදු කරනු ලබන බව අධ්‍යයන තුළින් අනාවරණය විය. රාත්‍රී සාද වලට සහභාගී වන තරුණ කණ්ඩායම් ඇතැම් අවස්ථාවල එම සාදය අවසන් වූ පසු අදාළ හෝටලය තුළ හෝ වෙනත් ස්ථානයක කාමරයක් කුලී පදනම මත ලබාගෙන නවාතැන් ගනියි. මෙය අදාළ උපසංස්කෘතික පසුබිම තුළ "Room දානවා" යනුවෙන් ඔවුන් විසින් හඳුන්වනු ලබයි. එසේ නවාතැන් ගන්නා අවස්ථා වලද මෙම කණ්ඩායම් විසින් මත්ද්‍රව්‍ය භාවිත කිරීම සිදුකරනු ලබයි. එහිදි බොහෝ විට මද්‍යසාර, සිගරැට්, ගංජා, LSD වැනි ද්‍රව්‍ය භාවිත කරනු ලබයි. මෙහිදි පැහැදිලි වන කරුණක් නම්, මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් ලබාදෙමින් රාත්‍රී සමාජශාලා සාද සංවිධානය වන බවයි.

සාද වලට සහභාගි වන පුද්ගලයින් එවැනි සමාජශාලා පරිශ්‍රයන් වල සිදුවන විවිධ ක්‍රියාකාරකම් වලට ද සම්බන්ධ වෙයි. අධ්‍යයන නියැදියෙන් බහුතරයක් සංගීතමය හා නර්තන අවස්ථා වලට සම්බන්ධ වී ඇත.

ප්‍රස්තාර අංක 08 - රාත්‍රී සමාජ ශාලා වලට යොමුවන පුද්ගලයින් සහභාගි වන විවිධ අවස්ථා



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

ඉහත දත්ත අනුව බහුතර පුද්ගල සංඛ්‍යාවක් නර්තන හා සංගීත අවස්ථාවන්ට සහභාගි වන අතර පුද්ගලයින් 17 (34 %) දෙනෙක් ලිංගික සහකරුවන් හා සහකාරියන් ආශ්‍රය කිරීමේ අවස්ථාවක් ලෙස භාවිත කර ඇත.

ඒ අතුරින් අදාළ පුද්ගලයින් විසින් වැඩි රුචිකත්වයක් දක්වන අවස්ථා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී පුද්ගලයින් 23 (46%) දෙනෙක් සංගීතමය අවස්ථාවන්ට වඩාත් ප්‍රිය කරන අතර පුද්ගලයින් 07 (14%) දෙනෙක් නර්තනයේ යෙදීම සම්බන්ධයෙන් වැඩි රුචිකත්වයක් දක්වන බවට ප්‍රතිචාර දක්වා ඇත. එමෙන්ම පුද්ගලයින් 06 (12%) දෙනෙක් ලිංගික සහකරුවන් හෝ සහකාරියන් සමඟ සම්බන්ධ වීමට වැඩි රුචිකත්වයක් දක්වයි. පොදුවේ ඔවුන් සියලු දෙනාම එවැනි සාද අවස්ථාවල මත්ද්‍රව්‍ය භාවිතය සිදුකරනු ලබයි.

3.3.2.2 මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන ආකාරය හා මිත්‍යා මත

ඉහත පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද කරුණු වලට අනුව රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගි වන පුද්ගලයින් විවිධ වර්ගයේ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි. මෙහිදී සාද අවස්ථාවන්ට සුවිශේෂී වන්නේ යැයි අදාළ පුද්ගලයින් විසින්ම තීරණය කරන ලද මත්ද්‍රව්‍ය වර්ග ද ඔවුන් මෙහිදී භාවිත කරනු ලබයි. එමෙන්ම ඔවුන්ට එවැනි මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීමට සහ එම මත්ද්‍රව්‍ය ශරීර ගත කරගැනීම තුළ ඔවුන් අපේක්ෂා කරන තෘප්තිය වඩාත් තීව්‍ර කර ගැනීම සඳහා විවිධ සංගීතමය ප්‍රභේදයන් ද ඔවුන් විසින් නිර්ණය කරගෙන ඇත.

එමෙන්ම නර්තනයේ යෙදීමට සහ එකනෙකා අතර සුහදතාවය වර්ධනය කරගැනීම සඳහා ඔවුන් මෙසේ මත්ද්‍රව්‍ය භාවිත කර නර්තනයේ යෙදෙන බව ඔවුන් විශ්වාස කරනු ලබන මතයයි. නමුත් මේ තුළ ගැබ්ව ඇති මිත්‍යාව ඔවුන්ට අවබෝධ නොවන අතර සමවයස් සමූහ තුළ එය තවදුරටත් සාධාරණීකරණය කර ගනිමින් මෙවැනි චර්යාවන් දිගටම පවත්වා ගෙන යනු ලබයි.

මෙවැනි සාද අවස්ථාවල මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සංගීතය, නර්තනය (Electronic Dance and Music - EDM) සහ ආලෝකකරණය භාවිත කරනු ලබයි. බොහෝ විට බටහිර ශෛලියට අයත් ගීත පරිගණක අනුසාරයෙන් හෝ Synthesizers මගින් සෝෂාකාරී සහ අඛණ්ඩව වාදනය වන සංගීත බණ්ඩ ලෙස වාදනය කරන අතර ඒ අනුව නර්තනයේ යෙදෙන අතරතුර අදාළ මත්ද්‍රව්‍ය භාවිතයත් සමග මුඛය තුළ ඇතිවන වියළිබව මගහරවා ගැනීමට හෝ තෘප්තිය වැඩි කර ගැනීමේ අරමුණින් පැණි රස ටොෆි වර්ග කෑම සිදුකරයි (සහභාගී නිරීක්ෂණ දත්ත).

මෙවැනි සාද වලට සහභාගි වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිය මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් දක්වන ලද අදහස් හා හේතූන් සංක්ෂිප්ත ලෙස පහත දක්වා ඇත.

- වැඩි වේලාවක් නර්තනයේ යෙදීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරයි.
- යහළුවන් හඳුනා ගැනීම සහ සබඳතා ගොඩනගා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරයි.
- සතුට, විනෝදය වැනි හැඟීම් හා චිත්තවේග ඇති කරගැනීම සඳහා භාවිත කරයි.
- සමාජශාලා තුළ මත්ද්‍රව්‍ය භාවිත කිරීම කිසිවෙකුගේ අවධානයට ලක් නොවීම.
- සතියකට වරක් එවැනි සාදයකට ගොස් මත්ද්‍රව්‍ය භාවිත කිරීම කිසිදු ගැටලුවක් නොවන බව විශ්වාස කිරීම.

ඉහත අදහස් විශ්ලේෂණය කිරීමේදි ඒ සියල්ලම එක් පොදු තේමාවක් යටතට ගොනු කළ හැකිය. එනම්, මත්ද්‍රව්‍ය භාවිතය හා එහි බලපෑම සම්බන්ධයෙන් පුද්ගලයින් තුළ පවත්නා අනවබෝධය හා මිත්‍යා විශ්වාසයන්ය. නිරාවරණ ක්‍රියාකාරකම් තුළ මෙවැනි මිත්‍යා මත නිශේධනය කිරීම සඳහා අවධානය යොමු කිරීම වැදගත්ය.

එමෙන්ම මෙම මිත්‍යා මත වල සිට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ඔවුන් උපසංස්කෘතික කණ්ඩායමක් ලෙස සළකනු ලබයි. සාද වලට සහභාගි වීම, ඒවායෙහි මත්ද්‍රව්‍ය භාවිත කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා සමාජ මාධ්‍ය හරහා ඔවුන් සංවිධානය වන අතර එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සඳහා මෙන්ම අවස්ථා සඳහා උපසංස්කෘතික වචන හා යෙදුම් භාවිත කරනු ලබයි.

වගු අංක 06 - එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය හැඳින්වීම සඳහා රාත්‍රී සමාජශාලා සාද වල භාවිත වන යෙදුම්

මත්ද්‍රව්‍ය වර්ගය	රාත්‍රී සමාජශාලා වල භාවිත වන නාම හෝ යෙදුම්
Ecstasy	Phill
LSD	Acid/ කොළ/Stamp
හෙරොයින්	පැන්/ බව්වා
ගංජා	Joint
කොකේන්	White Bair
මෙතම්පිටමින්	Ice/ Mendi

මූලාශ්‍රයඃ (පර්යේෂණ දත්ත, 2017)

එවැනි උප සංස්කෘතික වචන භාවිත කිරීම හරහා ඔවුන් යම් අනන්‍යතාවයන් ගොඩනගා ගැනීමට උත්සාහ දරන අතර අදාළ කණ්ඩායම අතර අන්තර්ක්‍රියා කිරීම ද සිදුකරයි.

3.4 මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකරන ආකාරය

සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අදාළ මත්ද්‍රව්‍ය වර්ග මිලදී ගනු ලබන ක්‍රමවේද පිළිබඳ මෙහිදී අධ්‍යයනය කරන ලද අතර එහිදී විවිධ මාර්ග ඔස්සේ ඔවුන් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකරනු ලබයි. අධ්‍යයන දත්ත වලට අනුව පුද්ගලයින් 31 (62%) දෙනෙක් රාත්‍රී සමාජශාලාවෙන් හෝ වෙරළසාද පැවැත්වෙන පරිශ්‍ර වලින් මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබන අතර ඉන් පැහැදිලි වන කරුණක් නම්, එවැනි ස්ථාන වලට සහභාගී වන පුද්ගලයින් සඳහා මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවයි.

ප්‍රස්තාර අංක 09 - මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබන මූලාශ්‍රයන්



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

ඉහත ප්‍රස්තාරයට අනුව පුද්ගලයින් 29 (58%) දෙනෙක් බාහිර මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින් මඟින් ද, පුද්ගලයින් 28 (56%) දෙනෙක් සමාජශාලාවට පැමිණෙන මිතුරන් මඟින් ද මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. සම්මුඛ සාකච්ඡා දත්ත මඟින් ද තහවුරු වන ආකාරයට ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර 03 මඟින් ඔවුන් මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. එනම්,

- සමාජශාලා හෝ වෙරළ සාද පැවැත්වෙන පරිශ්‍ර තුළ මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන්
- බාහිර මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන්
- සාද වලට සහභාගී වන මිතුරන් මඟින් වශයෙනි.

බොහෝවිට මෙවැනි සාද සංචාරක හෝටල් හෝ එවැනි වෙනත් අවන්හල් ආශ්‍රිතව පැවැත්වෙන අවස්ථාවලදී මද්‍යසාර හා සිගරැට් ආදිය අදාළ පරිශ්‍රවල සිටම අලෙවි කරනු ලබයි. එය ප්‍රසිද්ධියේ සිදුවූවද හෙරොයින් හෝ ගංජා වැනි මත්ද්‍රව්‍ය වර්ග ද මෙවැනි පරිශ්‍රවල අලෙවි වන අතර එය ප්‍රසිද්ධියේ සිදුනොවන අතර ගොඩනගා ගත් සබඳතා මත සිදුවේ. එනම් එවැනි මත්ද්‍රව්‍ය වර්ග මිලදී ගැනීමට නම් යම් සබඳතාවයක් ගොඩනගා ගෙන සිටිය යුතුය.

අදාළ පුද්ගලයින් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැය කරන මුදල් ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 29 (59%) දෙනෙක් රු. 20,000ට අඩු මුදලක් මසකට මත්ද්‍රව්‍ය සඳහා වියදම් කරනු ලබයි. ඊට අමතරව පුද්ගලයින් 9 (12%) දෙනෙක් රු. 30,000- රු. 40,000 අතර මුදලක් මාසිකව වැය කරනු ලබයි.

ප්‍රස්තාර අංක 10 - රාත්‍රී සමාජශාලා සාද/ වෙරළ සාද වලට සහභාගී වන පුද්ගලයින් මත්ද්‍රව්‍ය සඳහා මාසිකව වැය කරන මුදල් ප්‍රමාණය



මූලාශ්‍රය: (පර්යේෂණ දත්ත, 2017)

ඉහත ප්‍රස්තාරය අනුව රු. 40,000 - 50,000 අතර මුදලක් වියදම් කරන පුද්ගලයින් තිදෙනෙක් සහ රු. 50,000ට වැඩි මුදලක් මාසිකව වියදම් කරන පුද්ගලයින් දෙදෙනෙක් ද අධ්‍යයනය තුළ හඳුනාගත හැකිය. සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින් මත්ද්‍රව්‍ය සඳහා මාසිකව වියදම් කරන මුදල් ප්‍රමාණය මෙන්ම එම මුදල් මත්ද්‍රව්‍ය ලබාගැනීමේ දී වැය කරන ආකාරය ද අධ්‍යයනයට ලක්කරන ලදි.

ඒ අනුව පුද්ගලයින් 38 (76%) දෙනෙක් පෞද්ගලිකව මුදල් ගෙවීමෙන් සහ පුද්ගලයින් 37 (74%) දෙනෙක් යහළුවන් සමඟ මුදල් හුවමාරු කර ගනිමින් ද මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. ඊට අමතරව පුද්ගලයින් 4 (8%) දෙනෙක් ණයට හෝ පසුව ගෙවීමේ එකඟතාවය මත ද, එක් පුද්ගලයෙක් තම ලිංගික සහකරුවා හෝ සහකාරිය වෙත ලිංගික වශයෙන් අල්ලස් ලබාදීමෙන් ද මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. අධ්‍යයනය තුළ මත්ද්‍රව්‍ය සඳහා ලිංගිකත්වය (Sex for drug) සැපයීම පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර එහිදී රාත්‍රී සමාජශාලා සාද අතරතුර ලිංගික සහකරුවන්, සහකාරියන් සමඟ එක්වීම සිදුකළ ද මත්ද්‍රව්‍ය ලබාගැනීමේ අරමුණින් නැතිනම් මත්ද්‍රව්‍ය සඳහා අල්ලසක් වශයෙන් ලිංගික ක්‍රියාකාරකම් වල නිරතවීමේ ප්‍රවණතාවක් හඳුනාගත නොහැකි විය.

ඉහත සඳහන් කරන ලද පෞද්ගලික මුදල් යෙදවීමෙන් මත්ද්‍රව්‍ය මිලදීගනු ලබන පුද්ගලයින් තමන්ට අවශ්‍ය මුදල් උපයන මාර්ග පිළිබඳ අවධානය යොමුකිරීමේ දී පුද්ගලයින් 33 (66%) දෙනෙක් රැකියාවේ නිරත වීමෙන් ලැබෙන ආදායමෙන් ද, පුද්ගලයින් 12 (24%) දෙනෙක් දෙමාපියන්ගෙන් ලැබෙන මුදල් වලින් ද, පුද්ගලයින් 16 (32%) දෙනෙක් වෙනත් පුද්ගලයින්ට මත්ද්‍රව්‍ය සැපයීමෙන් ලැබෙන මුදලින් ද මත්ද්‍රව්‍ය සඳහා අවශ්‍ය මුදල් සපයාගෙන ඇත. මෙහිදී අවධානයට ලක්වන තවත් වැදගත් කරුණක් නම්, ඇතැම් පුද්ගලයින් (අධ්‍යයන අනාවරණයන්ට අනුව පුද්ගලයින් 16 දෙනෙක්) මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන් වෙනත් පුද්ගලයින්ට මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ දී මැදිහත්කරුවන් වශයෙන් ක්‍රියා කිරීමෙන් යම් ආදායමක් උපයනු ලබයි. එහිදී බොහෝවිට මත්ද්‍රව්‍ය සැපයීම හරහා ලැබෙන කොමිස් මුදලක් මඟින් ඔවුන් තමන්ට දෛනිකව අවශ්‍ය මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි.

සමාජශාලා සාද වලට සහභාගී වීම සඳහා ප්‍රවේශ පත්‍රයක් මිලදී ගතයුතු අතර පුද්ගලයින් බහුතරයක් (80%) සාමාන්‍ය ප්‍රවේශ පත්‍ර මිලදී ගනු ලබන අතර ඇතැම් අවස්ථා වල නොමිලේ ඇතුළු විය හැකි ප්‍රවේශ පත්‍ර ද අවිධිමත් මාර්ග හරහා ලබාගනියි. බොහෝ අවස්ථා වල ප්‍රවේශ පත්‍රය මඟින් අදාළ සාද අවස්ථාවට ඇතුළු වීමට පමණක් හැකි අතර ප්‍රවේශ පත්‍රයේ ස්වභාවය අනුව එය වෙනස් වන අවස්ථා

ද ඇත. එනම් මද්‍යසාර ලබාගත හැකි හෝ කාමර පහසුකම් ලබාගත හැකි අවස්ථා ද ඇතැම් වර්ගයේ ප්‍රවේශ පත්‍ර වලට ඇතුළත් කර ඇත. ඒ අනුව රාත්‍රී සමාජශාලා සාදයකට හෝ වෙරළ සාදයකට සහභාගී වන පුද්ගලයෙක් ඇතුළුවීමේ ප්‍රවේශ පත්‍රය සඳහා සහ මත්ද්‍රව්‍ය ලබාගැනීම සඳහා මුදල් වැය කළ යුතුය.

3.5 මත්ද්‍රව්‍ය භාවිතය : සෞඛ්‍යය හා සමාජ බලපෑම්

දීර්ඝකාලීන මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයින් සෞඛ්‍ය හා සමාජමය අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දීම සුලභ සංසිද්ධියක් බව ප්‍රතිකාර ලබාගැනීම පිළිබඳ දත්ත වාර්තා සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තා මඟින් තහවුරු වී ඇත. මෙම අධ්‍යයනය තුළ ප්‍රධාන වශයෙන් රාත්‍රී සමාජශාලා වැනි අවකාශවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුහුණපා ඇති සෞඛ්‍ය හා සමාජමය අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳ අවධානය යොමුකරන ලදි.

අධ්‍යයනය කරන ලද නියැදියෙන් පුද්ගලයින් 31 (62%) දෙනෙක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් යම් ශාරීරික අපහසුතාවන්ට (Physical discomfort) ලක් වී ඇති බව අනාවරණය විය. එහිදී ඇතැම් පුද්ගලයින් LSD භාවිත කිරීම හේතුවෙන් ඇති වූ bad trip ගණයේ අත්දැකීම් සමඟ ඇතිවන හිසරදය, කැරකිල්ල හා ක්ලාන්ත වීම වැනි තත්ත්වයන්ට මුහුණ දී ඇත. ඊට අමතරව හුස්ම ගැනීමේ අපහසුතා, සිහිමුර්ජා වීම වැනි තත්ත්වයන්ට පත් වූ පුද්ගලයින් ද අධ්‍යයනය තුළ ප්‍රතිචාර දක්වා ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඔවුන් මුහුණ දී ඇති එවැනි ශාරීරික අසංකූලතා අධිමාත්‍රා වීමට අදාළ රෝග ලක්ෂණයන්ට බොහෝ සෙයින් සමානකමක් දක්වයි. ලෝක සෞඛ්‍ය සංවිධාන නිර්වචන වලට අනුව අධිමාත්‍රික වීමට අදාළ ලක්ෂණයන් විශ්ලේෂණය කිරීමේ දී අධිමාත්‍රාව තුළ සිහිමුර්ජාව හෝ සිහි විකල් බව ඇති කරන ප්‍රමාණය ඉක්මවා මත්ද්‍රව්‍ය ගැනීම හෝ විවිධ මත්ද්‍රව්‍ය එකට මිශ්‍ර කර ගැනීම සිදුවෙයි. පොදුවේ මෙවැනි අවස්ථා වල හුස්ම ගැනීමේ අපහසුතාවය, දෙතොල් නිල්පැහැ වීම, ඇසේ කළු ඉංගිරියාව/දෑස සංකෝචනය වීම වැනි ලක්ෂණ මතුවේ. මෙම අධ්‍යයනය තුළ පුද්ගලයින් විසින් දක්වන ලද සංකූලතා පිළිබඳ ඉහත නිර්වචනයට අනුව නිර්ණය කිරීමේදී ඇතැම් අවස්ථා වල ඔවුන් අධිමාත්‍රික තත්ත්වයට ද පත්ව ඇති බව නිර්ණය කළ හැකිය.

අදාළ පුද්ගලයින් එවැනි අපහසුතාවන්ට හෝ සංකූලතාවන්ට පත්වීම සඳහා බලපාන ලද මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳ අවධානය යොමුකිරීමේ දී මද්‍යසාර සහ පෙති වර්ග වැනි ද්‍රව්‍ය හේතුවෙන් ප්‍රධාන වශයෙන් ඔවුන් ශාරීරික සංකූලතාවන්ට ලක්ව ඇත.

3.5.1 මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගැනීම

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ක්‍රියාත්මක වන අතර අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 15 (30%) දෙනෙක් මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වයෙන් සුවවීම සඳහා කෙදිනක හෝ ප්‍රතිකාර ලබාගෙන ඇත. එසේ ප්‍රතිකාර සේවාවන් ලබාගැනීමේ දී අදාළ පුද්ගලයින් විවිධ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් සපයන ආයතන වලට යොමු වී ඇත. පුද්ගලයින් දෙදෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින්, පුද්ගලයින් 08 දෙනෙක් රාජ්‍ය නොවන ආයතන මඟින් ක්‍රියාත්මක වන ප්‍රතිකාර වැඩසටහන් වලින් සහ පුද්ගලයින් 04 දෙනෙක් පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන හෝ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගෙන ඇත.

3.5.2 සමාජ අපගාමී ක්‍රියාවලට දක්වන දායකත්වය

රාත්‍රී සමාජශාලා සාද ආශ්‍රිත අවකාශ වල මත්ද්‍රව්‍ය භාවිත කිරීම හා සම්බන්ධව පුද්ගලයින් මැදිහත්වන වෙනත් අපගාමී ක්‍රියාවන් සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වීම් සම්බන්ධයෙන් ද අවධානය යොමුකරන ලද අතර අධ්‍යයන නියැදියෙන් පුද්ගලයින් 22 (44%) දෙනෙක් තුළ කෙදිනක හෝ සමාජශාලා සාද අවස්ථා වල සිදුවූ කැරලි කෝලාහල, ගැටලුකාරී තත්ත්ව, අපරාධ ක්‍රියා වැනි සංසිද්ධීන් සම්බන්ධයෙන් අත්දැකීම් ඇති බව අනාවරණය කර ඇත. එවැනි සංසිද්ධීන් සඳහා මත්ද්‍රව්‍ය

භාවිතය හේතුවක් වී ඇත්ද? යන කරුණ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 20 (40%) දෙනෙක් එවැනි ගැටලුකාරී තත්ත්ව සඳහා ඍජුවම හෝ වක්‍රව මත්ද්‍රව්‍ය භාවිතය හේතු වී ඇති බවට විශ්වාස කරනු ලබයි. මේ අනුව පැහැදිලි වන කරුණක් නම්, සමාජශාලා අවකාශවල මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් විවිධ සමාජ විරෝධී හා අපගාමී ක්‍රියාවන් සිදුවන බවයි.

එමෙන්ම අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 19 (38%) දෙනෙක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවකු බවට පත්වී ඇති අතර ඔවුන් විවිධ වැරදි යටතේ වරදකරුවන් බවට පත්වී ඇත. පුද්ගලයින් 14 දෙනෙක් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම යටතේ සහ පුද්ගලයින් සිව් දෙනෙක් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම යටතේ නීතියෙන් වැරදිකරුවන් බවට පත්වී ඇත. ඊට අමතරව තවත් පුද්ගලයින් 04 දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ වරදට වැරදිකරුවන් බවට පත්ව ඇත. මේ අනුව පැහැදිලි වන කරුණක් නම්, රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පුද්ගලයින් සෞඛ්‍යමය හා සමාජමය ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන බවයි.

4 සාකච්ඡාව

රාත්‍රී සමාජශාලා හා වෙරළ සාදවල මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනය තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සුවිශේෂී කරුණු කිහිපයක් සාකච්ඡාවට භාජනය කර ඇත. ගෝලීය සන්දර්භය තුළ වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව රාත්‍රී සමාජශාලාවල ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය බහුලව භාවිත කරන පුද්ගලයින්ගේ වෙනස්කම් හා අනන්‍ය වූ ලක්ෂණ විවිධ අධ්‍යයන මඟින් තහවුරු කරගෙන ඇත. උක්ත පරිච්ඡේද වල සාකච්ඡා කළ අන්දමට කොළඹ නගරය හා අනෙකුත් උපනාගරික කලාප ආශ්‍රයෙන් සිදුකරන ලද මෙම අධ්‍යයනය තුළින් ද ගෝලීය මට්ටමේ අධ්‍යයන වලින් අනාවරණය කරගෙන ඇති තත්ත්වයන් සහ සාධක නැවත සනාථ වී ඇත.

විශේෂයෙන්ම අධ්‍යයන අනාවරණයන්ට අනුව රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි. අනෙකුත් අධ්‍යයන වලින් තහවුරු වන ආකාරයට වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වීදි මට්ටම තුළ පහසුවෙන් ලබාගත හැකි මත්ද්‍රව්‍ය හා මද්‍යසාර වර්ග වලට සීමා වීම බොහෝවිට සිදුවන නමුත් සමාජශාලා වැනි ආවරණය වූ පරිශ්‍ර වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වීදි මට්ටම තුළ පහසුවෙන් ලබාගත හැකි ද්‍රව්‍ය මෙන්ම සමාජශාලා සාදවල සංසරණය වන ද්‍රව්‍ය වර්ග ලබාගැනීමට ද යොමු වී ඇත. අධ්‍යයනයේ දත්ත දායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වාභාවය පිළිබඳ පූර්ව පරිච්ඡේද වල ඉදිරිපත් කරන ලද කරුණු අනුව එය වැඩිදුරටත් සනාථ කරගත හැකිය.

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 25ට අඩු පුද්ගලයින් වූ අතර ඔවුන් ඉතා අඩු වයස් මට්ටම් වලදී මත්ද්‍රව්‍ය භාවිතයට සහ රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වීමට යොමු වී ඇත. තරුණ වයසේ පුද්ගලයින් සමාජශාලා සාද වලට මත්ද්‍රව්‍ය භාවිත කිරීමට නැතිනම් ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය හෝ පොදුවේ "Party drugs" ගණයට අයත් ද්‍රව්‍ය භාවිත කිරීම ගෝලීය මට්ටමේ වෙනත් අධ්‍යයන මඟින් ද තහවුරු කරන ලද ප්‍රවණතාවයකි.

මෙම අධ්‍යයනය තුළින් ද තහවුරු වූ ආකාරයට තරුණ වයසේ පුද්ගලයින් වෙනත් විවිධ ආකර්ෂණීය සාධක හා සමාජ මාධ්‍ය හරහා සංවිධානය වීම තුළ මෙවැනි සාද වලට සහභාගී වීම විලාසිතාවක් බවට පත් කරගෙන ඇත. අධ්‍යයනය තුළින් අනාවරණය වූ ආකාරයට පුද්ගලයින් ඉහළ වශයෙන් සමාජශීලීත්වය ඇතිකර ගැනීමේ අරමුණින් සාද වලට සහභාගී වීම සිදුකරන අතර එවැනි සාදවල සිය මිතුරු සමූහ සමඟ අන්තර්ක්‍රියා කිරීමේදී මත්ද්‍රව්‍ය භාවිතය එක් ක්‍රමයක් බවට පත්කරගෙන ඇත. වික්ටෝරියා පාර්ලිමේන්තුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කමිටු වාර්තාව, 2004 මඟින් පෙන්වාදෙන ආකාරයට සමාජශාලා වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ඉහළ වශයෙන් සමාජශීලීත්වය ළඟාකර ගැනීම සඳහා එම මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි.

වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගල කණ්ඩායම් වලට සාපේක්ෂව සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සාමාන්‍ය සමාජයට නිරාවරණය හෝ දෘශ්‍ය නොවන නිසා ඔවුන් වෙනස් කණ්ඩායමක් ලෙස සැළකීම ආරම්භ කරයි. විශේෂයෙන්ම වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගල කණ්ඩායම් සම්බන්ධයෙන් සමාජය විසින් ගොඩනගනු ලබන ලේබල්කරණයන් සහ ඍණාත්මක ප්‍රතිරූප හේතුවෙන් ඒ සම්බන්ධයෙන් සමාජය තුළ අවමානයට ලක්කරන හෝ බහිෂ්කරණයට ලක්කරන ස්වරූපයක් ඇත. නමුත් සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අදාළ අවකාශය තුළ සුරක්ෂිත පුද්ගල කොට්ඨාසයක්ය යන මිත්‍යා විශ්වාසය තුළ ජීවත් වන අතර තමන් සම්බන්ධයෙන් එවැනි ඍණාත්මක ප්‍රතිචාරයක් හෝ අවමානයක් ගොඩනැගී නැති බවට ඔවුන් විශ්වාස කරයි. මෙය මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අදාළ ඉලක්කගත කණ්ඩායම විසින් ගොඩනගා ගෙන ඇති සාවද්‍ය මතවාදයකි. නිවාරණ ක්‍රියාකාරකම් තුළ මේ සම්බන්ධයෙන් ඍජු අවධානයක් යොමුවීමේ අවශ්‍යතාව මේ තුළ ඉස්මතු වී පෙනෙන කරුණකි.

එමෙන්ම අදාළ කණ්ඩායම තුළ එනම් රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් තුළ පවතින තවත් මිත්‍යා විශ්වාසයක් නම් ඔවුන් ප්‍රතිකාර හෝ පුනරුත්ථාපනය සඳහා යොමුවීමේ අවශ්‍යතාවයක් නැති පුද්ගලයින් ලෙස සැළකීමයි. එනම් වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින්ට සාපේක්ෂව ඔවුන් දැඩි ඇබ්බැහිකාරීත්වයෙන් පෙළෙන පුද්ගලයින් නොවන බවට සහ ඒ හේතුව නිසා අදාළ මත්ද්‍රව්‍ය භාවිත චර්යාව නැවැත්වීමට හෝ සුවවීම ඇති කර ගැනීමට අවශ්‍යතාවක් නොමැති බවයි. මෙම විශ්වාසය තුළ දීර්ඝකාලීන කටයුතු කිරීම හේතුවෙන් ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ප්‍රතිකාර හෝ පුනරුත්ථාපන ක්‍රියාවලියට ඇතුළත් වීමට උත්සාහ නොකරන අතර එවැනි අවස්ථාවන් ප්‍රතික්ෂේප කරනු ලබයි.

එමෙන්ම ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිය මත්ද්‍රව්‍ය භාවිත චර්යාව පොදු අවකාශය තුළ සාකච්ඡා කරන හෝ අවධානයට ලක්වන සුවිශේෂී කරුණක් නැතිනම් ගැටලුවක් ලෙස දැකීමට අකමැත්තක් දක්වන අතර එය තරුණ පුද්ගලයින් විසින් හුදෙක් විනෝදකාමී අංගයක් හෝ මිතුරු සමූහ තුළ සිදුවන එක් අවස්ථාවක් ලෙස සළකා සාමාන්‍යකරණය කරනු ලබයි. මේ සම්බන්ධයෙන් ද නිවාරණය තුළ අවධානය යොමු කළ යුතුය.

නිවාරණ ක්‍රියාකාරකම් වලට සමගාමීව විවිධ අධ්‍යාපනික වැඩසටහන් ඔස්සේ තරුණ පරම්පරාව උදෙසා මාර්ගෝපදේශයන් සැපයීම මෙවැනි සංසිද්ධීන් වල ඉස්මතු වීමත් සමඟ ජාතික අවශ්‍යතාවක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කිරීම වටා ගොඩනැගී ඇති උපසංස්කෘතික ලාක්ෂණිකයන් සහ අංගයන් වලට පුද්ගලයින් ආකර්ෂණය වීම සිදුවෙයි. නූතන තාක්ෂණය හා සමාජ මාධ්‍යවල ව්‍යාප්තියත් සමඟ ඒවා අවභාවිත කිරීම සිදුවන අතර සමාජ මාධ්‍යය හරහා තරුණ තරුණයින් විවිධ අපගාමී ක්‍රියාවන් උදෙසා සංවිධානගත කිරීම සිදුකරයි. රාත්‍රී සමාජශාලා සාද සහ ඒවායේ ඇති විශේෂාංග ප්‍රවර්ධනය කිරීමට සමාජ මාධ්‍ය භාවිත කරන අතර ඒ හරහා තරුණ පිරිස් ආකර්ෂණය කරගනු ලබයි. මෙම කරුණු සැළකිල්ලට ගනිමින් නූතන තාක්ෂණය අවභාවිත කිරීමෙන් වැළකීමේ සහ එවැනි අවදානම් සහගත තත්ත්ව හඳුනාගැනීම අරභයා තරුණ පිරිස් සඳහා අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වා දීම අවශ්‍යතාවක් ලෙස ඉස්මතු වෙයි.

නිවාරණ ක්‍රියාකාරකම් හා ප්‍රතිකාර සේවාවන් මඟින් මෙම ක්ෂේත්‍රය නැතිනම් උපසංස්කෘතික කණ්ඩායම පිළිබඳව අවධානය යොමු කළයුතු අතරම නීතිය ක්‍රියාත්මක කිරීම මඟින් ද සැළකියයුතු පාලනයක් අපේක්ෂා කළ හැකිය. පුද්ගලයින් විවේකය ගත කිරීම සඳහා හෝ විනෝදාස්වාදය සඳහා නිරතුරුවම සමාජ අනුමත විධික්‍රම තෝරා ගැනීමට සහ ඉන් පරිබාහිර නීත්‍යානුකූල නොවන මාර්ග වලට ඇති ඉඩප්‍රස්ථා අහිමි කිරීම වැදගත් වේ.

විශේෂයෙන්ම අන්තර්ජාලය භාවිත කරමින් සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම හා සාමාන්‍ය පොදු අවකාශයට නිරාවරණය නොවූ සමාජශාලා වැනි ස්ථාන ආශ්‍රිතව සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් තවදුරටත් නෛතික මැදිහත්වීමක් අවශ්‍ය වන බව අධ්‍යයන අනාවරණයන් සාකච්ඡාවට භාජනය කිරීමේ දී තහවුරු වෙයි.

5 නිගමන

- වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (club drug users) පුළුල් පරාසයකට ගැනෙන මත්ද්‍රව්‍ය හා මද්‍යසාර වර්ග භාවිත කරන අතර ඔවුන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (poly drug users) වේ.
- LSD, Ecstasy ඇතුළු ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය, මෙතම්පිටමින් කාණ්ඩයට අයත් ද්‍රව්‍ය වලට අමතරව හෙරොයින්, ගංජා සහ මද්‍යසාර වැනි මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ගයන් ද රාත්‍රී සමාජශාලා සාද ආශ්‍රිතව බහුලව භාවිත කරනු ලබයි.
- සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් එවැනි අවකාශයන් වල මෙන්ම ඉන් පරිබාහිර වෙනත් ස්ථාන වලදී ද එවැනි ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සිදුකරයි.
- තරුණ පිරිස් සමාජශාලා සාදවලට යොමුවීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර තරුණ වයසේ පුද්ගලයින් අතර රාත්‍රී සමාජශාලා හෝ වෙරළ සාද ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය.
- රාත්‍රී සමාජශාලා සාද සහ ඒ ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා facebook වැනි සමාජ මාධ්‍ය භාවිත කරනු ලබයි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වෙනම උපසංස්කෘතික කණ්ඩායමක්, සාමාන්‍ය සමාජයට නිරාවරණය නොවන අවකාශයක් තුළ සිටින පිරිසක් වීම හේතුවෙන් ඔවුන් වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගෙන් වෙනස්ව දැකීමට ප්‍රිය කරන අතරම ඒ හේතුව නිසා ඔවුන් ප්‍රතිකාර ලබා ගතයුතු හෝ ඇබ්බැහිකාරීත්වයෙන් පෙළෙන පිරිසක් ලෙස ඔවුන් නොදකියි. ඒ සමඟ ඔවුන්ගේ චර්යාවන් සාමාන්‍යකරණය කරගැනීමත් සිදුකරනු ලබයි.
- වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධයෙන් සමාජය තුළ ගොඩනැගී ඇති සමාජ අවමානය, සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධයෙන් ආරෝපණය වී නොමැත. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ, ඔවුන්ගේ චර්යාවන් පොදු අවකාශයට නිරාවරණය නොවීමයි.
- සමාජශාලා සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් දැඩි ලෙස වැරදි සහගත විශ්වාස හෝ තීරණයන් මත ක්‍රියාත්මක වෙයි. එමෙන්ම ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සාධාරණීකරණය කරගැනීම උදෙසා සමාජශාලා ආශ්‍රිතව සිදුවන විවිධ විශේෂාංග භාවිත කරයි.
    - උදා :- නර්තනයේ යෙදීම සඳහා මත්ද්‍රව්‍ය ගැනීම.
- සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයින් යොමුවීම කෙරෙහි විවිධ ආකර්ෂණීය සාධක බලපාන අතර, එවැනි අවකාශ වල පවතින විනෝදාස්වාදය අරමුණු කරගත් විශේෂාංග සහ සමාජ මාධ්‍ය මඟින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රවර්ධනය එම ආකර්ෂණීය සාධක අතර ප්‍රබල වේ.
- නාගරික හා උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව සහ වෙරළාසන්න ප්‍රදේශවල හා ඒවායේ පැවැත්වෙන සාද වලට වෙනත් නාගරික, උපනාගරික හා ග්‍රාමීය ප්‍රදේශ වලින් ද පුද්ගලයින් සහභාගී වන අතර ඔවුන් විවිධ ස්ථානවල පැවැත්වෙන සාද වලට සහභාගී වීමේදී ඔවුන් අතර සබඳතා ජාලයක් නිර්මාණය කරගනු ලබයි. මේ තුළ මෙම ප්‍රවණතාව සෑම ප්‍රදේශයකටම ව්‍යාප්ත වීමේ අවධානමක් ඇත.
- සමාජශාලා වැනි පරිශ්‍ර වලට මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධයෙන් වෙනම පුද්ගලයින් පිරිසක් නියැළී සිටින අතර මිතුරු කණ්ඩායම් තුළ විවිධ මත්ද්‍රව්‍ය සංසරණය කරගැනීම සිදුකරයි.

6 යෝජනා

- නිවාරණ ක්‍රියාකාරකම් මඟින් ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය අවභාවිත කරන පුද්ගලයින් ඉලක්ක කළයුතු අතර එහිදී ඔවුන් විසින් ගොඩනගාගෙන ඇති සාමාන්‍යකරණයන් හා මිත්‍යා විශ්වාසයන් පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර නිවැරදි අවබෝධය ලබාදිය යුතුය.

- තවදුරටත් නිවාරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී තරුණ ජනහනයට වඩාත් ප්‍රවේශ වියහැකි සමාජ මාධ්‍ය වැනි මාර්ග භාවිත කිරීම වැදගත් වේ. ඊට අමතරව සමාජශාලා සාද වල වැඩි ව්‍යාප්තියක් සහිත ප්‍රදේශ වල තරුණ පිරිස් උදෙසා අවිධිමත් නිවාරණ ක්‍රියාකාරකම් මඟින් ඒවාට සහභාගී නොවීම සම්බන්ධයෙන් පෙළඹවීමක් ඇති කිරීම වැදගත් වේ.

- අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා නූතන සන්නිවේදන තාක්ෂණය නිවැරදිව භාවිත කිරීමට සහ නූතන තාක්ෂණය හා සම්බන්ධ අවදානම් සහගත ප්‍රවණතා හඳුනාගැනීමට තරුණ පිරිස් තුළ කුසලතා වර්ධනය කිරීම වැදගත් වේ.

- ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය දීර්ඝකාලීනව භාවිත කිරීමට යොමුවී සිටින පුද්ගලයින් උදෙසා ඇබ්බැහිකාරීත්වයෙන් මිදීම සඳහා ප්‍රතිකාර වලට යොමුකිරීම කෙරෙහි අවධානය යොමු කළයුතු අතර රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සමාජශාලා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර වැඩසටහන් සැළසුම් කළ යුතුය. එමෙන්ම අදාළ පුද්ගලයින් සඳහා පූර්ව පියවරක් වශයෙන් ප්‍රජාව තුළ පුද්ගලික උපදේශනය වැනි ප්‍රවේශ ඵලදායී විය හැකිය.

- ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන අංශ වල සුවිශේෂී අවධානය යොමුවිය යුතු අතර අන්තර්ජාලය භාවිත කරමින් සිදුවන ජාවාරම් හා මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සැළකිලිමත් වීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

- වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ වර්ග අවභාවිත කිරීමේ ප්‍රවණතාව සම්බන්ධයෙන් නෛතික හා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ අවධානය යොමු කළ යුතුය.

- "Party drug use" සම්බන්ධයෙන් සහයෝගීත්ව ප්‍රවේශයකින් කටයුතු කළ යුතු අතර එහිදී පොලිසිය, ගුරු වෘත්තිකයින්, වෛද්‍ය වෘත්තිකයින්, උපදේශකයින් සහ පර්යේෂකයින් මෙන්ම ප්‍රජා සංවිධාන වැනි අංශ මඟින් වැදගත් භූමිකාවක් ඉටුකළ යුතුය. එනම් නීතිය ක්‍රියාත්මක කිරීම, දැනුවත් කිරීම (නිවාරණය) සහ ප්‍රතිකාර වලට යොමු කිරීම යන ප්‍රවේශ වලින් සමබරව මෙම ගැටලුව ආමන්ත්‍රණය කිරීම වැදගත් වේ.

7. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Calafat Far, A. *et al.* (1999) 'Night life in Europe and recreative drug use . SONAR 98', *Europe*, p. 242.

Gureje, O. (2007) 'Alcohol, Gender and Drinking Problems: Perspectives from Low and Middle Income Countries. Edited by Isidore S. Obot & Robin Room. World Health Organization.

Van Havere, T. *et al.* (2009) 'The influence of age and gender on party drug use among young adults attending dance events, clubs, and rock festivals in Belgium', *Substance Use and Misuse*, 44(13), pp. 1899–1915. doi: 10.3109/10826080902961393.

Lam, C., Sub-committee, H. K. A. C. A. N. R. and Administration, U. of H. K. D. of S. W. & S. (2004) 'A study of substance abuse in underground rave culture and other related settings', (September), pp. 84–104.

National Dangerous Drugs Control board (2017) *Handbook of Drug Abuse information in Sri Lanka 2017*. Rajagiriya: National Dangerous Drugs Control Board.

NHS (2012) 'Club Drugs: Emerging Trends and Risks', pp. 1–8. Available at: www.nta.nhs.uk/uploads/clubdrugsreport2012[0].pdf.

Report, F. (no date) *Inquiry into Amphetamine and 'Party Drug' Use in Victoria DRUGS AND CRIME PREVENTION COMMITTEE*.

UNODC (2015) 'Amphetamine - Type Stimulants (ATS)', p. 111.

ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධ කාලීන ප්‍රවණතා හඳුනා ගැනීමේ අධ්‍යයනය

ප්‍රධාන පර්යේෂක කණ්ඩායම

භද්‍රානි සේනානායක
තමර දර්ශන
නිලානි රේණුකා

සහාය පර්යේෂක කණ්ඩායම

වසන්ත ප්‍රදීප් කුමාර
නිලුක්ෂි තිසේරා
මහේෂි පෙරේරා
දිල්හාරා වරාගොඩ

දත්ත විශ්ලේෂණය

සජීව අතාවුද

1 හැඳින්වීම

අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන ද්‍රව්‍ය අවභාවිත කිරීම සම්බන්ධ ප්‍රවණතාව සමාජයේ සෑම ස්ථරයකටම බලපෑම් සහගත කරුණක් බවට පත් වූයේ, විවෘත ආර්ථික ප්‍රතිපත්තිවල ආගමනයත් සමඟය. එහෙත් පුද්ගලයින් ඇත අතීතයේ සිටම විෂ සහිත මත්ද්‍රව්‍ය වර්ග ශරීරගත කරගැනීම සිදුකර ඇති බවට ඓතිහාසික මූලාශ්‍ර වලින් තොරතුරු අනාවරණය කරගත හැකිය. එනම්, 12 වන ශතවර්ෂයේදී ලියවී තිබෙන යෝගරත්නාකරය නැමති ආයුර්වේද ග්‍රන්ථයේ සඳහන් කර තිබෙන අන්දමට ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ අබිං ප්‍රබල ඖෂධයක් ලෙස මුල් කාලයේ සිටම භාවිත කර ඇති බවට පැහැදිලි කර තිබෙන අතර එම කාලවකවානුව තුළ දී ලාංකිකයන් අබිං පිළිබඳව දැනසිටි බවට ද සාක්ෂි දරයි. කය වෙහෙසා වැඩ කරන පුද්ගලයින් ඔවුන්ගේ වෙහෙස දුරුකර ගැනීම සඳහා අබිං කෑමට පුරුදු වී සිටි බව ද සාක්ෂි වලින් අනාවරණය වී තිබේ.

එසේම අන්තරායකර ඖෂධ වර්ග අධිරාජ්‍යවාදී පාලන කාල සීමා තුළ ද අවභාවිත කිරීම සම්බන්ධ ප්‍රවණතා පැවැති බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. විශේෂයෙන් ලංදේසි පාලන සමය තුළ (1656-1796) අබිං භාවිතය ලංකාවේ ප්‍රචලිත වීම එයට කදිම නිදසුනකි. 1664 දී ලංකාවේ අබිං නිෂ්පාදනය කිරීමට උත්සාහ දරා ඇති අතර, ලන්දේසි පාලනය යටතේ හමුදාවේ සොල්දාදුවන් අතර අබිං භාවිතය ප්‍රචලිත වී ඇත. 1745 ද අබිං වෙළඳ සමාජ ද පිහිටුවා ඇති අතර අබිං සම්බන්ධයෙන් ඉහළ ප්‍රචලිතභවක් පැවති බවට එය සාක්ෂි දරයි.

එසේම ලන්දේසි පාලන සමයෙන් පසුව පැමිණෙන ඉංග්‍රිසි පාලන සමය තුළ ද අබිං ව්‍යාප්තිය සහ අබිං බෙදාහැරීම වර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් පියවර රැසක් ගෙන තිබේ. 1829 දී එවකට සිටි ආණ්ඩුකාරවරයා විසින් වතුකරයේ ජනතාවට අබිං ගෙන්වා දීම සිදුකළ අතර ලංකාවේ අබිං වගා කිරීමට ද ඔවුන් උනන්දු කරවන ලදී. අබිං වෙළඳාම ක්‍රමවත්ව පවත්වා ගෙනයාම සඳහා 1867 වර්ෂයේදී අබිං සඳහා බලපත්‍ර නිකුත් කිරීම "ලයිසන් ක්‍රමය" ආරම්භ කර ඇති අතර එමඟින් විශාල ආදායමක් උපයා ගැනීමටද ඔවුන්ට හැකියාව ලැබී ඇත. ක්‍රමයෙන් ලාංකික සමාජ ක්‍රමය තුළ "අබිං කෑම" සමාජ ප්‍රශ්නයක් ලෙස මතුවීමට පටන්ගත් නිසා 1867 දී, 1867 අංක 19 දරන අබිං සහ කංසා ආඥා පනත පනවන ලද අතර එමඟින් අබිං විකිණීම සහ කංසා පාවිච්චිය හා විකිණීම තහනම් කර ඇත. එසේම 1869 දී අබිං ආනයනය සහ අපනයනය සීමා කිරීමට ද පියවර ගෙන ඇත.

පසුකාලීනව මධ්‍යම පන්තියේ හා වැඩිහිටි හා තරුණ කොටස් වැඩි වශයෙන් අබිං සඳහා ඇබ්බැහි වූ නිසා එය සමාජ ප්‍රශ්නයක් ලෙස මතුවීම හේතුවෙන් සිංහල ප්‍රභූන් හා අනෙකුත් ලාංකිකයින් එකතු වී අබිං සම්බන්ධ ව්‍යාප්තිය අවම කිරීම සඳහා විවිධ ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 1893 දී අබිං තහනම් කරන ලෙස ඉල්ලා ශ්‍රී ලාංකිකයින් විසින් අත්සන් කරන ලද පෙත්සමක් ඉංග්‍රිසි පාලන තන්ත්‍රය වෙත ඉදිරිපත් කර ඇත.

1924 වනවිට අබිංවලට ඇබ්බැහි වී සිටි ලයිසන් නොමැති සංඛ්‍යාව ද ක්‍රමයෙන් අඩු වී ඇති අතර නීතිවිරෝධී ලෙස අබිං භාවිත කිරීම අඩු කිරීම සඳහා සිංහල ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ද ලයිසන් ක්‍රමයක් හඳුන්වා දී තිබුණි.

මෙම කාලවකවානුව තුළ අබිං ඇබ්බැහියට ඇති ප්‍රවණතාව ක්‍රමයෙන් අඩු වුවද ප්‍රභූ පිරිස සිදුකළ විවිධ උද්ඝෝෂණ ව්‍යාපාරවල ප්‍රතිඵලයක් ලෙස 1929 දී ව්‍යවස්ථාදායක සභාව තුළ පනතක් සම්මත කර ගන්නා ලදී. එය 1929 විෂ වර්ග අබිං හා අන්තරායකර ඖෂධ පනත ලෙස හඳුන්වනු ලැබේ.

අබිං අලෙවිය පිළිබඳව සැළකිමේදී, අධිරාජ්‍යවාදී පාලන කාලය තුළ කාලානුරූපීව අබිං වෙළඳ සැල් වල ව්‍යාප්තවීමක් හඳුනාගත හැකිය. 1890 වර්ෂයේ 31 ක්ව පැවති අබිං වෙළඳ සැල් සංඛ්‍යාව 1897 වනවිට 56 දක්වා ද, 1907 වර්ෂය වන විට 65 දක්වා ද වර්ධනය වී ඇත.

පසුකාලීනව අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්තවලට අනුව කාලානුරූපීව අත්අඩංගුවට ගැනීම් වල ව්‍යාප්තිය අඩු වී ඇත.

ප්‍රස්තාර අංක 01 - අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 1981 - 2014



මූලාශ්‍රය: (මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත පද්ධතිය)

1983 සිට 2015 වර්ෂය දක්වා අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳව සළකා බැලීමේ දී විශාල අඩුවීමක් පෙන්නුම් කරන අතර එය 2015 වර්ෂය වනවිට පුද්ගලයින් 04 දෙනෙක් දක්වා අඩු වී ඇත.

එමෙන්ම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා ලංකාවේ වාර්ෂිකව සැළකිය යුතු ප්‍රමාණයක අබිං යොදා ගනු ලබන අතර ඒ සඳහා අබිං ආනයනය කිරීම ද සිදු කරනු ලැබේ.

ප්‍රස්තාර අංක 02 - වාර්ෂිකව අබිං ආනයනය කරන ප්‍රමාණය 2006 - 2015 (Kg)



මූලාශ්‍රය: (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත)

ඉහත ප්‍රස්තාරයට අනුව 2006 වර්ෂයේ දී අබිං කිලෝග්‍රෑම් 175 ක් ආනයනය කර ඇති අතර 2011 වර්ෂය වනවිට එය කිලෝග්‍රෑම් 268 ක් දක්වා වර්ධනය වී ඇති අතර 2015 වර්ෂයේ දී කිලෝ ග්‍රෑම් 110 ක් මෙරටට ආනයනය කරනු ලැබ ඇත. එයින් ආයුර්වේද රෝහල්වල වෛද්‍යමය අරමුණු සඳහා විවිධ ප්‍රමාණයන්ගෙන් අබිං භාවිත කිරීම කරනු ලබයි.

අබිං වලට අමරතව ගංජා හෙවත් කංසා භාවිත කරමින් ද ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කරනු ලබයි. මෙහිදී වෛද්‍ය සැපයීම් අංශය, ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ආයුර්වේද ඖෂධ සංස්ථාව ඒ සඳහා අවශ්‍ය අබිං හා කංසා බෙදාහැරීම සම්බන්ධ කටයුතු කරයි. එහිදී දිවයිනේ ලියාපදිංචි පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සහ රජයේ ආයුර්වේද රෝහල් සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත ප්‍රමාණයන්ගෙන් අබිං සහ කංසා නිකුත් කරනු ලැබේ. මෙසේ ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අබිං නිකුත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණ ඇස්තමේන්තු ගත කිරීමේදී දිස්ත්‍රික් අබිං මණ්ඩලය (Distric opium board) රැස්වී අවශ්‍ය ප්‍රමාණ පිළිබඳව තීරණය කරනු ලබයි.

මෙම ක්‍රියාවලිය විවිධ රාජ්‍ය ආයතනික යාන්ත්‍රණය හරහා අධීක්ෂණය කරනු ලබයි. අබිං සම්බන්ධ නීත්‍යානුකූල පරිභෝජනය තුළ කාලීනව උද්ගත වූ ගැටලු කිහිපයක් ඇත. එනම්,

- අබිං බලපත්‍ර ලබාගෙන ඇති ආයුර්වේද වෛද්‍යවරුන් අබිං ආයුර්වේද නිෂ්පාදන සඳහා පමණක් යොදා ගනී ද? යන්න,
- අබිං සහ කංසා ලබා ගන්නා ආයුර්වේද වෛද්‍යවරුන් අබිං ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇත් ද? යන්න,
- දැනට ලංකාවේ අබිං අවභාවිතයක් සිදුවන්නේ ද?, එසේ සිදුවන්නේ නම් ඒ නීත්‍යානුකූලව ලබාගත් අබිං සම්බන්ධයෙන් ද නැත්නම් අයථා මාර්ග වලින් ගෙන්වන ලද අබිං සම්බන්ධයෙන් ද යන්න පිළිබඳවය.

ඉහත ගැටලු පිළිබඳ අවධානය යොමුකරමින් ලංකාවේ අබිං සහ කංසා භාවිතය සහ බෙදා හැරීම සම්බන්ධව විධිමත් වැඩපිළිවෙළක් සැකසීම සම්බන්ධයෙන් යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් ඇත. එහි මූලික පියවරක් වශයෙන් අබිං හා කංසා භාවිතය හා බෙදා හැරීම සම්බන්ධයෙන් වර්තමාන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

1.1 පර්යේෂණ ගැටලුව

ආයුර්වේදමය අරමුණු සඳහා ලංකාවට ගෙන්වා බෙදා හරිනු ලබන අබිං අවභාවිත වීමක් සිදුවන්නේ ද? ඒ ආශ්‍රිත කාලීන ප්‍රවණතා මොනවාද?

1.2 පර්යේෂණ අරමුණු

- නීත්‍යානුකූල නොවන සහ අයථා ක්‍රම වලට අබිං පරිභෝජනයක් සිදුවන්නේ ද? යන්න සොයා බැලීම.
- ලංකාවේ දැනට අබිං භාවිත කරනු ලබන්නේ නම්, එම පුද්ගලයන්ගේ භාවිත රටාවන් හා කාලීන ප්‍රවණතා හඳුනා ගැනීම.
- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අබිං යොදාගැනීම ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධව විධිමත් වැඩපිළිවෙළක් සැකසීම සඳහා අවශ්‍ය පූර්ව නිර්දේශයන් ඉදිරිපත් කිරීම.

1.3 පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රමය

මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් (Mix research methodology) මෙහිදී භාවිත කළ අතර සමීක්ෂණ ක්‍රමය මෙහිදී යොදා ගන්නා ලදි. උක්ත පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අධ්‍යයන සිදු

කළ අතර, එහිදී ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතීයික මූලාශ්‍ර ඔස්සේ ලබාගත් දත්ත භාවිත කරන ලද අතර එම ක්‍රම දෙක ඔස්සේ ලබා ගත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදි.

1.4 පර්යේෂණ ක්ෂේත්‍රය

දැනට අබිං භාවිත කරන පුද්ගලයින් සිටී නම් ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පැතිකඩ අධ්‍යයනය කිරීම සඳහා දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 110 දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් නියැදියට ඇතුළත් කරගන්නා ලදි.

අධ්‍යයනයේ පර්යේෂණ අරමුණු වලට අනුව වෛද්‍ය සැපයීම් අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව/ආයුර්වේද ඖෂධ සංස්ථාව යන ආයතන වලින් අදාළ ඖෂධ ළඟ තබා ගැනීමට සහ බෙදා හැරීම සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීමේ ලැයිස්තු අනුව දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක සිටින පාරම්පරික වෛද්‍යවරුන් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි.

ඊට අමතරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතියට වාර්තා වූ දත්ත ද මෙහිදී උපයෝගී කරගන්නා ලදි. දත්ත පද්ධතියට වාර්තා වී ඇති අබිං භාවිත කරන පුද්ගලයින්ගේ සමාජ හා ප්‍රජා විද්‍යාත්මක පැතිකඩ අධ්‍යයනය කරන ලදි. ඊට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශ ආශ්‍රයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් යොදා ගනිමින් කාලීනව කරන ලද අධ්‍යයනයන්ට අදාළ දත්ත ගොනු ද භාවිත කරමින් උක්ත කරුණට අදාළව එනම් අබිං භාවිත කරන්නන්ගේ ස්වභාවය සම්බන්ධයෙන් දත්ත ලබා ගන්නා ලදි.

1.5 නියැදිය තෝරා ගැනීම

පළමු අදියර -

මෙහිදී දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ භාවිත රටාවන් සහ පැතිකඩ හඳුනා ගැනීම සඳහා හිමබෝල නියැදිය භාවිත කරමින් කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 110 දෙනෙක් නියැදියට ඇතුළත් කර ගන්නා ලදි.

දෙවන අදියර -

වෛද්‍ය සැපයීම් අංශය/ආයුර්වේද ඖෂධ සංස්ථාව සහ අයුර්වේද දෙපාර්තමේන්තුව යන ආයතනවල ඉහත ඖෂධ ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති වෛද්‍යවරුන්ගේ ලැයිස්තු අනුව අහඹු ලෙස වෛද්‍යවරුන් 15 දෙනෙකු නියැදියට ඇතුළත් කර ගෙන ඇත. එහිදී සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ සසම්භාවී වගුවක් භාවිත කරමින් අහඹු ලෙස අදාළ වෛද්‍යවරුන් තෝරා ගන්නා ලදි. එහිදී දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන සේ වෛද්‍යවරුන් ප්‍රදේශ අනුව වෙන් කර තෝරා ගන්නා ලදි.

තුන්වන අදියර -

මෙහිදි අධ්‍යයනයේ අරමුණු වලට අනුව වෛද්‍ය සැපයීම් අංශය, ආයුර්වේද ඖෂධ සංස්ථාව සහ ආයුර්වේද දෙපාර්තමේන්තුව යන ආයතන වලින් තෝරාගත් නිලධාරීන් 05 දෙනෙක් (මූලික තොරතුරු සපයන්නන්) සමඟ සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත ලබාගත් අතර අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිත කරමින් අදාළ නිලධාරීන් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි.

ඒ අනුව අධ්‍යයනයේ නියැදියේ සංයුතිය මෙසේය.

- පාරම්පරික ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් 15 දෙනෙක්
- මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 110 දෙනෙක්
- ඉහත ආයතන නියෝජනය වන පරිදි තෝරාගත් නිලධාරීන් 10 (මූලික තොරතුරු සපයන්නන්) දෙනෙක්

1.6 දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම

දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා යන ශිල්ප ක්‍රම භාවිත කරන ලදි. **පාරම්පරික ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් 15** ක් සමඟ සහ දැනට **මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් 110 දෙනෙක්** සමඟ ප්‍රශ්නාවලි මඟින් සහ සම්මුඛ සාකච්ඡා යන ශිල්ප ක්‍රමය භාවිත කරමින් ද දත්ත රැස් කරන ලදි.

1.7 දත්ත විශ්ලේෂණය

ප්‍රශ්නාවලි මගින් ලැබෙන දත්ත SPSS පරිගණක මෘදුකාංගය භාවිත කරමින් ප්‍රමාණාත්මක ලෙස විශ්ලේෂණය කරන ලද අතර ගැඹුරු සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් දත්ත පර්යේෂණ අරමුණු වලට අනුව ගුණාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් ද විශ්ලේෂණය සිදු කරන ලදි.

2 ප්‍රතිඵල

2.1 අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ

2.1.1 ස්ත්‍රී පුරුෂ සංයුතිය

මෙම අධ්‍යයනය සඳහා භාජනය කළ සමස්ත නියැදියෙන් බහුතරයක් (97%) පුරුෂයින් වූ අතර ස්ත්‍රීන් 3 (3%) දෙනෙක් ද අහඹු ලෙස තෝරාගත් නියැදිය තුළ නියෝජනය විය.

2.1.2 වයස් සංයුතිය

අධ්‍යයනයට ලක්කරන ලද නියැදියේ වයස් සංයුතිය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතරින් පුද්ගලයින් 35 (32%) දෙනෙක් වයස අවුරුදු 51 - 60 අතර වයස් මට්ටමට අයත් වූ බව අනාවරණය විය. පුද්ගලයින් 20 (10%) දෙනෙක් වයස අවුරුදු 41 - 50 වයස් කාණ්ඩයට ද, පුද්ගලයින් 21 (19%) දෙනෙක් අවුරුදු 31 - 40 වයස් කාණ්ඩයට ද, පුද්ගලයින් 19 (17%) දෙනෙක් අවුරුදු 21 - 30 වයස් කාණ්ඩයට ද, පුද්ගලයින් 9 (8%) දෙනෙක් අවුරුදු 60 ට වැඩි වයස් කාණ්ඩයට ද, පුද්ගලයින් 6 (6%) දෙනෙක් අවුරුදු 15 - 20 අතර වයස් කාණ්ඩයට ද අයත් වූහ.

ප්‍රස්තාර අංක 03 - නියැදිය තුළ නියෝජනය වූ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ වයස් සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර දත්ත, 2017)

2.1.3 ජාතීන් අනුව නියැදියේ සංයුතිය

අධ්‍යයනයට ලක් කරන ලද නියැදියෙන් පුද්ගලයින් 80 (73%) දෙනෙක් සිංහල ජනවර්ගය ද, පුද්ගලයින් 10 (9%) දෙනෙක් ද්‍රවිඩ ජනවර්ගය ද, පුද්ගලයින් 15 (14%) දෙනෙක් මුස්ලිම් ජනවර්ගය සහ පුද්ගලයින්

4 (4%) දෙනෙක් මැලේ ජනවර්ගය ද නියෝජනය කරනු ලැබේ. ඒ අනුව අධ්‍යයනයට ලක්කළ පුද්ගලයින්ගෙන් බහුතර ප්‍රතිශතයක් සිංහල ජනවර්ගය නියෝජනය කරනු ලබයි.

2.1.4 ආගම අනුව නියැදියේ සංයුතිය

අධ්‍යයනය කරන ලද නියැදියේ පුද්ගලයින් 67 (61%) දෙනෙක් බෞද්ධ ආගම නියෝජනය කරනු ලබයි. පුද්ගලයින් 7 (6%) දෙනෙක් හින්දු ආගම ද, පුද්ගලයින් 19 (17%) දෙනෙක් ඉස්ලාම් ආගම ද, පුද්ගලයින් 11 (10%) දෙනෙක් ක්‍රිස්තියානි ආගම ද, පුද්ගලයින් 6 (6%) දෙනෙක් රෝමානු කතෝලික ආගම ද නියෝජනය කරනු ලබයි. මේ අනුව අධ්‍යයනයට ලක් කරන ලද නියැදියෙන් බහුතරයක් පුද්ගලයින් එනම්, 61% ප්‍රතිශතයක් සිංහල ජනවර්ගය සහ බෞද්ධ ආගම නියෝජනය කරන පුද්ගලයින් බව පැහැදිලි විය.

2.1.5 අධ්‍යාපන මට්ටම අනුව සංයුතිය

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සහ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී අධ්‍යයන නියැදිය තුළ ද්විතියික මට්ටම දක්වා අධ්‍යාපනය ලැබූ පුද්ගලයින් 40 (36%) දෙනෙක් සහ ප්‍රාථමික අධ්‍යාපනය පමණක් ලබා ඇති පුද්ගලයින් 35 (32%) දෙනෙක් නියැදිය තුළ නියෝජනය වූහ. පුද්ගලයින් 18 (16%) දෙනෙක් සාමාන්‍ය පෙළ සමත් අය බවත්, පුද්ගලයින් 2 (2%) දෙනෙක් උසස් පෙළ විභාගය සමත් අය බව ද අනාවරණය විය. තවද පුද්ගලයින් 15 (14%) දෙනෙක් අධ්‍යාපනයක් නොලද එනම්, කියවීමට හෝ ලිවීමට නොහැකි අය බව ද අනාවරණය විය.

ප්‍රස්තාර අංක 4 - නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර දත්ත, 2017)

2.1.6 විවාහක අවිවාහක බව පිළිබඳ සංයුතිය

අධ්‍යයනයට ලක් කරන ලද නියැදියෙන් පුද්ගලයින් 63 (57%) දෙනෙක් විවාහක අය වෙති. පුද්ගලයින් 39 (35%) දෙනෙක් අවිවාහක අය ද පුද්ගලයින් 4 (4%) දෙනෙක් දික්කසාද වූ අය ද, පුද්ගලයින් 2 (2%) දෙනෙක් විවාහ නොවී එකට ජීවත් වෙන අය ලෙස ද, තවත් පුද්ගලයින් 2 (2%) ප්‍රතිශතයක් විවාහ වුවද වෙන්ව ජීවත් වන පිරිස් අතරට අයත් වූහ.

ප්‍රස්තාර අංක 5 - විවාහක අවිවාහක බව පිළිබඳ තත්ත්වය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර දත්ත, 2017)

2.1.7 දත්තදායකයින්ගේ රැකියාවල ස්වභාවය

අධ්‍යයනයට ලක් කරන ලද නියැදියේ එනම්, මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ රැකියාවේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පුද්ගලයින්ගෙන් 43% ක බහුතර ප්‍රතිශතයක් කම්කරුවන් ලෙස සිය රැකියාවේ නිරත බවත්, පුද්ගලයින්ගෙන් 18% ක ප්‍රතිශතයක් සුළු වෙළඳාම්වල නිරත වන බවත්, පුද්ගලයින්ගෙන් 12% ක ප්‍රතිශතයක් ධීවර කටයුතුවල නිරත වන බවත්, පුද්ගලයින්ගෙන් 1% ක ප්‍රතිශතයක් කාර්මික කටයුතු, ලිංගික වෘත්තියෙහි නිරත වීම, ස්වයංරැකියා, රියැදුරු යන වෘත්තීන් වල නිරත වන බව අනාවරණය විය.

2.1.8 මාසික ආදායම

අධ්‍යයනයට ලක් කරන ලද පුද්ගලයින්ගෙන් 51% (56) ක ප්‍රතිශතයක් මාසික ආදායම රු. 20001 - 40000 අතර ප්‍රමාණයක් බව අනාවරණය විය. පුද්ගලික මාසික ආදායම් ප්‍රමාණයේ බහුතර ප්‍රතිශතය මෙම ප්‍රමාණය විය. වැඩිදුර විමර්ශනය කිරීමේ දී පුද්ගලයින් 21% (23) ක ප්‍රතිශතයක් රුපියල් 20000 අඩු මාසික ආදායමක් ලබන බවත්, පුද්ගලයින් 20% (22) ක ප්‍රතිශතයක් රුපියල් 40001 - 60000 අතර ආදායමක් ලබන බවත් අනාවරණය විය.

ප්‍රස්තාර අංක 6 - නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ මාසික ආදායම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර දත්ත, 2017)

ඒ අනුව නියැදියට අයත් පුද්ගලයින්ගේ සාමාන්‍ය මාසික ආදායම රුපියල් 36,435 ක් බව මෙහිදී අනාවරණය විය.

2.1.9 අධ්‍යයනයට ලක්කරන ලද පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය

2.1.9.1 කෙදිනක හෝ භාවිත කර ඇති මත්ද්‍රව්‍ය/ මත්ද්‍රව්‍ය වර්ග

අධ්‍යයනයේ අරමුණු වලට අදාළව නියැදියට අයත් සමස්ත පුද්ගලයින්ගේ අබිං භාවිතයේ අතීත හා වර්තමාන ස්වභාවය පිළිබඳව තොරතුරු ලබාගැනීම සඳහා ඔවුන් කෙදිනක හෝ භාවිත කර ඇති මත්ද්‍රව්‍ය හෝ මත්ද්‍රව්‍ය වර්ග මොනවා ද? යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලදි. කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍ය වර්ගයක් භාවිත කළ පුද්ගලයින්ගෙන් 109 (99%) දෙනෙක් සිගරැට් භාවිත කර ඇති අතර 89 (81%) දෙනෙක් ගංජා සහ 86 (78%) දෙනෙක් නීත්‍යනුකූල මද්‍යසාර භාවිත කර ඇති බව අනාවරණය වී ඇත. එසේම පුද්ගලයින්ගෙන් 84 (74%) දෙනෙක් හෙරොයින් ද, පුද්ගලයින්ගෙන් 42 (38%) දෙනෙක් අබිං සහ 38 (35%) දෙනෙක් පෙති වර්ග භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත.

2.1.9.2 දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය හෝ මත්ද්‍රව්‍ය වර්ග

අධ්‍යයනයට ලක්කල සමස්ත නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය හෝ මත්ද්‍රව්‍ය වර්ග මොනවා ද? යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර බහුතරයක් පුද්ගලයින් එනම් 88 (80%) දෙනෙක් සිගරැට් භාවිත කරන අතර ඊට අමතරව පුද්ගලයින්ගෙන් 58 (53%) දෙනෙක් හෙරොයින් ද, පුද්ගලයින්ගෙන් 42 (38%) දෙනෙක් ගංජා ද භාවිත කරන බව ද හෙළි වී ඇත. තවද 12 (11%) දෙනෙක් පෙති වර්ග ද, 4 (4%) දෙනෙක් "වෙනත්" වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ද අනාවරණය වී ඇත. මෙහි විශේෂත්වය වන්නේ, නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් කෙදිනක හෝ අබිං මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණ ද ඔවුන්ගේ කිසිවෙක් දැනට අබිං භාවිත නොකිරීමයි.

ප්‍රස්තාර අංක 7 - පුද්ගලයින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය/මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

2.1.9.3 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත වයස් සංයුතිය

මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කළ වයස් මට්ටම් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී වයස අවුරුදු 16 - 20 අතර වයසකදී පුද්ගලයින් 57 (52%) දෙනෙක් ද, අවුරුදු 11 - 15 අතර වයස් මට්ටමකදී පුද්ගලයින් 32 (29%) දෙනෙක් ද, අවුරුදු 21 - 25 අතර වයස් මට්ටමේදී පුද්ගලයින් 13 (12%) දෙනෙක් ද, අවුරුදු 26 ට වැඩි වයසකදී පුද්ගලයින් 5 (4%) දෙනෙක් ද මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ කර ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාර අංක 8 - පුද්ගලයින්ගේ ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත වයස් සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

2.1.9.4 ප්‍රථම වරට භාවිත කරන ලද මත්ද්‍රව්‍ය/ මත්ද්‍රව්‍ය වර්ග

ප්‍රථම වරට භාවිත කරන ලද මත්ද්‍රව්‍ය/ මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී නියැදියේ සමස්ත පුද්ගලයින්ගෙන් බහුතරයක් සිගරැට් භාවිත කර ඇති බව අනාවරණය විය. ඒ අනුව පුද්ගලයින් 90 (82%) දෙනෙක් සිගරැට් සිය ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස භාවිත කර තිබේ. පුද්ගලයින් 10 (9%) දෙනෙක් ගංජා මත්ද්‍රව්‍යය ද, පුද්ගලයින් 6 (6%) දෙනෙක් හෙරොයින් මත්ද්‍රව්‍ය ද, පුද්ගලයින් 4 (4%) දෙනෙක් බීඩි, දුම්වැටි ද, පුද්ගලයින් 3 (3%) දෙනෙක් නීත්‍යානුකූල නොවන මද්‍යසාර ද සිය ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස ලබා ගෙන ඇති බවට අනාවරණය වී ඇත.

ප්‍රස්තාර අංක 09 - පුද්ගලයින් ප්‍රථම වරට භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

2.1.9.5 මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට බලපා ඇති හේතු

පුද්ගලයින් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීමට බලපා ඇති හේතු සාධක පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරන ලද අතර බහුතරයක් පුද්ගලයින් මිතුරු බලපෑම හේතුවෙන් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වී ඇති බව තොරතුරු හෙළි වී ඇත. එනම්, පුද්ගලයින්ගෙන් 65% (71) ප්‍රතිශතයක් මිතුරු බලපෑම නිසා මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වී ඇත. පුද්ගලයින්ගෙන් 29% (32) ප්‍රතිශතයක් සතුට විනෝදය හේතුවෙන් ද, 18% (20) ප්‍රතිශතයක් කුතුහලය නිසා ද, 4% (4) ප්‍රතිශතයක් ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් ද මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වී ඇති බවට තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 10 - මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීමට බලපාන ලද හේතු



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

2.2 අධ්‍යයනයට භාජනය කළ පුද්ගලයින්ගේ අබිං භාවිතය පිළිබඳ තත්ත්වය

2.2.1 ප්‍රථම වරට අබිං භාවිතය සඳහා යොමු වී ඇති කාල පරාසය

අධ්‍යයනය කළ නියැදිය තුළ කෙදිනක හෝ අබිං භාවිත කළ පුද්ගලයින් 42 දෙනෙක් හඳුනාගත හැකිවූ අතර ඔවුන් අබිං භාවිතය කෙරෙහි යොමු වී ඇති කාල වකවානුව පිළිබඳ සොයා බැලීමේ දී පුද්ගලයින් 55% (23) බහුතර ප්‍රතිශතයක් වර්ෂ 1980 - 1989 කාල වකවානුව තුළදී අබිං භාවිතය කෙරෙහි යොමු වී තිබේ. පුද්ගලයින් 14% (6) ප්‍රතිශතයක් 1990 - 1999 කාල වකවානුව තුළදී ද 14% (6) ප්‍රතිශතයක් 2000 - 2009 කාල වකනානුව තුළදී ද යොමු වී තිබේ. 1980 ට පෙර පුද්ගලයින් 10% (4) ප්‍රතිශතයක් අබිං භාවිතය කෙරෙහි යොමු වී ඇති අතර 2009 ට පසුව පුද්ගලයින් 7% (3) ප්‍රතිශතයක් ද අබිං භාවිත කර ඇති බවට තොරතුරු හෙළී වී ඇත.

ප්‍රස්තාර අංක 11 - ප්‍රථම වරට අබිං භාවිතය සඳහා යොමු වී ඇති කාල පරාසය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

2.2.2 අබිං පිළිබඳ දැනුවත්භාවය

පුද්ගලයින් අබිං මත්ද්‍රව්‍ය පිළිබඳව දැනුවත් වී තිබෙන්නේ කෙසේද? යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමේදී බහුතරයක් පුද්ගලයින් එනම්, 29 (69%) දෙනෙකු මිතුරකු මඟින් දැනුවත් වී තිබෙන බව සමීක්ෂණය තුළින් හෙළි විය. ඊට අමතරව 4 (10%) දෙනෙක් අසල්වැසියන් මගින් හා විදේශිකයකු මගින් ද අබිං පිළිබඳ දැනුවත් වී තිබෙන අතර පුද්ගලයින් 3 (7%) දෙනෙක් අබිං වෙළෙන්දෙකු මඟින් අබිං පිළිබඳ දැනුවත් වී තිබෙන බවට තොරතුරු අනාවරණය විය.

ඒ අනුව මෙම අධ්‍යයනයට ලක්කළ සමස්ත පුද්ගලයින් 110 දෙනාගෙන්, කෙදිනක හෝ අබිං භාවිත කර ඇති පුද්ගලයින් 42 ක් හඳුනාගත හැකි වූ අතර එම පුද්ගලයින්ගෙන් 29 දෙනෙක් මිතුරු බලපෑම නැතහොත් මිතුරු ඇසුර හේතුවෙන් අබිං පිළිබඳ දැනුවත් වී ඇත.

පුද්ගලයෙක් සමාජානුයෝජනය වීමේ දී නැතහොත් සමාජයට අනුගත වීමේ දී ඒ සඳහා එම පුද්ගලයාගේ පවුල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එය පුද්ගලයාගේ ප්‍රාථමික සමාජානුයෝජනය ලෙස හැඳින්වෙන අතර පුද්ගලයෙකුගේ ද්විතීයික සමාජානුයෝජනය සිදුවන ප්‍රධාන සමාජානුයෝජන කාරක කිහිපයක් ද ඇත. එම සමාජානුයෝජන කාරක අතර මිතුරු ඇසුර හෙවත් සමවයස් කණ්ඩායම් වල බලපෑම නැමති සාධකය ද ඒ අතර ප්‍රධාන කාරකයක් වේ. ඒ අනුව අධ්‍යයනයට ලක් කරන ලද නියැදියේ බහුතර පුද්ගලයින් ප්‍රමාණයක් අබිං පිළිබඳ දැනුවත්භාවය ලබා තිබෙන්නේ මිතුරු බලපෑම හේතුවෙනි.

2.2.3 ප්‍රථම වරට අබිං සපයා ගත් ආකාරය

අබිං පාවිච්චි කරන ලද පුද්ගලයින් ප්‍රථම වරට අබිං සපයා ගත් ආකාරය පිළිබඳව තොරතුරු සොයා බැලීමේ දී, පුද්ගලයින් 21 (50%) දෙනෙක් අබිං සපයා ගෙන තිබෙන්නේ අබිං අලෙවි කරන පුද්ගලයන්ගෙනි. පුද්ගලයන් 17 (41%) දෙනෙක් මිතුරන් මඟින් ද, 2 (5%) දෙනෙක් අසල්වැසියෙකුගෙන් හා විදේශිකයකු මඟින් ද, එක් පුද්ගලයෙක් ආයුර්වේද ඖෂධාලකින් ද අබිං ප්‍රථම වරට සපයා ගෙන ඇති බව අනාවරණය විය.

2.2.4 ප්‍රථම වරට අබිං භාවිත කිරීමට යොදා ගනු ලැබූ ක්‍රම

අධ්‍යයනය කළ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් ප්‍රථම වරට අබිං භාවිත කිරීමට විවිධ ක්‍රම යොදා ගෙන ඇති බව ලබා ගත් තොරතුරු වලින් අනාවරණය කර ගත හැකි විය. එහිදී පුද්ගලයින් 21 (50%) දෙනෙක් සකස් කරගත් පානයක් ලෙස ද, පුද්ගලයින් 14 (33%) දෙනෙක් කෑමක් ලෙස ද, පුද්ගලයින් 4 (10%) දෙනෙක් දුමක් ලෙස ආඝ්‍රාණය කිරීමෙන් ද, පුද්ගලයින් 2 (5%) දෙනෙක් වෙනත් මත්ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් ද අබිං ප්‍රථම වරට භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. මීට අමතරව පුද්ගලයින් 8 (19%) දෙනෙක් අබිං සිගරට් එකක ගැල්වීමෙන් හෝ තවරා පාවිච්චි කිරීම, ගුලියක් ලෙස සකස් කර ජලය සමඟ ගිලීම හා උඩ තල්ලේ රඳවා තේ සමඟ බීම වැනි ක්‍රම හරහා අබිං භාවිත කර ඇත.

ප්‍රස්තාර අංක 12 - ප්‍රථම වරට අබිං භාවිත කිරීමට යොදා ගනු ලැබූ ක්‍රම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

මෙහිදී බහුතරයක් පුද්ගලයින් ප්‍රථම වරට අබිං භාවිත කිරීමේදී පානයක් ලෙස සකස් කර භාවිත කර ඇති බව පැහැදිලි වේ.

2.2.5 පුද්ගලයින් ප්‍රථම වරට අබිං භාවිත කළ ස්ථානය

නියැදියේ සමස්ත පුද්ගලයින් ප්‍රථම වරට අබිං භාවිත කළ ස්ථානය පිළිබඳ සොයා බැලීමේ දී පුද්ගලයින් 10 (24%) දෙනෙක් යහළුවෙකුගේ නිවසේ දී ද, පුද්ගලයින් 7 (17%) දෙනෙක් නිවසේ දී ද, පුද්ගලයින් 4 (10%) දෙනෙක් පාළු ස්ථානයකදී ද, පුද්ගලයින් 3 (7%) දෙනෙක් දුම්රිය මාර්ගයක් හෝ වෙනත් මාර්ගයක් අසළ දී ද ප්‍රථම වරට අබිං භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය වී තිබේ. මීට අමතරව පුද්ගලයින් 17 (41%) දෙනෙක් ප්‍රථම වරට අබිං භාවිත කිරීම සඳහා මිලදී ගත් ස්ථානය, පොදු ස්ථාන, අවන්හල් වැනි ස්ථාන ද භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත.

2.2.6 පුද්ගලයින් ප්‍රථම වරට අබිං භාවිත කිරීමට හේතු

පුද්ගලයින් ප්‍රථම වරට අබිං භාවිත කිරීමට බලපා ඇති හේතු සාධක කිහිපයක් අධ්‍යයනයට ලක්කළ නියැදියේ පුද්ගලයින්ගෙන් හඳුනා ගැනීමට හැකිවිය. පුද්ගලයින් 24 (57%) දෙනෙක් මිතුරන්ගේ බලපෑම නිසා ද, පුද්ගලයින් 11 (26%) දෙනෙක් විනෝදය සඳහා ද, පුද්ගලයින් 10 (24%) දෙනෙක් ආශාව හෝ කුතුහලය නිසා ද අබිං භාවිත කිරීමට පෙළඹී ඇති බව අනාවරණය වී තිබේ. තවද පුද්ගලයින් 7 (17%) දෙනෙක් තනිකම නිසා ද, හෙරොයින් වලින් ඇතිවන විරමණ ලක්ෂණ මඟහරවා

ගැනීම සඳහා ද, ගංජා සමඟ පානය කිරීම සඳහා ද, හෙරොයින් වලට ආදේශකයක් ලෙස ද, ලිංගික අරමුණු සඳහා ද අබිං භාවිත කර ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීම සඳහා මිතුරු ඇසුර හෙවත් මිතුරන්ගේ බලපෑම හේතුවක් වන බව අධ්‍යයනය තුළින් තවදුරටත් තහවුරු වේ. එසේම පුද්ගලයෙකුගේ අබිං භාවිතයට යොමු වීම සඳහා ද මිතුරු බලපෑම ප්‍රධාන සාධකයක් වී ඇති බව තහවුරු වේ.

2.2.7 පුද්ගලයින් දැනට අබිං භාවිත නොකිරීමට හේතු

මෙම අධ්‍යයනය කරන ලද නියැදියේ පුද්ගලයින් මීට පෙර කවදා හෝ අබිං භාවිත කළ තිබුණ ද මේ වනවිට අබිං භාවිත කරන කිසිඳු පුද්ගලයෙක් අධ්‍යයනය තුළින් සොයා ගැනීමට නොහැකි විය. නමුත් කෙදිනක හෝ අබිං භාවිත කර ඇති පුද්ගලයින් දැනට අබිං භාවිත නොකිරීමට බලපා ඇති හේතු සාධක මොනවාද? යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර එහිදී පුද්ගලයින් 24 (57%) දෙනෙක් අබිං ලබා ගැනීමට ඇති අපහසුව හෝ අබිං භාවිතය දුලබ වීම නිසා අබිං භාවිත නොකරන බව අනාවරණය විය. මීට අමතරව පුද්ගලයින් 9 (21%) දෙනෙක් අබිං ලබා ගැනීම තුළින් අපේක්ෂිත තෘප්තිය නොලැබීම නිසා ද, එක් පුද්ගලයෙක් (2%) අබිං මිල අධික වීම නිසා ද, අබිං භාවිත නොකරන බව අනාවරණය විය. මීට අමතරව පුද්ගලයින් 12 (29%) දෙනෙක් හෙරොයින් වලට ඇබ්බැහි වීම නිසා ද, වෙනත් මත්ද්‍රව්‍ය ලංකාවේ තිබීම, අබිං වලට ඇති ආශාව නොමැති වී යාම, අනෙකුත් මත්ද්‍රව්‍ය මෙන් අබිං වලින් තෘප්තියක් නැතැයි විශ්වාස කිරීම නිසා ද පුද්ගලයින් දැනට අබිං භාවිත නොකරන බව අනාවරණය විය.

2.2.8 අබිං ආයුර්වේද ඖෂධයක් ද? යන්න පිළිබඳ තිබෙන දැනුවත්භාවය

අධ්‍යයන නියැදියේ සමස්ත පුද්ගලයින්ගෙන් ලබාගත් ප්‍රතිචාර වලට අනුව අබිං ආයුර්වේද ඖෂධයක් ද? යන්න පිළිබඳ ප්‍රතිචාරකයින්ගේ දැනුවත්භාවය සොයා බැලීමට ද මෙහිදී හැකිවිය. පුද්ගලයින් 64 (58%) දෙනෙක් අබිං ආයුර්වේද ඖෂධයක් වනබව දැනුවත් නැති අතර ප්‍රතිචාරකයින් 46 (42%) දෙනෙක් අබිං ආයුර්වේද ඖෂධයක් ලෙස භාවිත කරන බවට දැනුවත්භාවයකින් පසුවන බව අනාවරණය විය.

අබිං ආයුර්වේද ඖෂධයක් වන බවට ප්‍රතිචාර දක්වා තිබෙන ප්‍රතිචාරකයින් 46 දෙනාගෙන් පුද්ගලයින් 28 (61%) දෙනෙක් එවැනි ඖෂධ වර්ග කිසිවක් නොදන්නා බව දන්වා ඇත. පුද්ගලයින් 14 (30%) දෙනෙක් මදනමෝදක සඳහා ද, පුද්ගලයින් 2 (4%) දෙනෙක් අරිෂ්ට සඳහා ද, එක් පුද්ගලයෙක් කසාය සඳහා සහ ස්වභාවික ඖෂධ වර්ග සඳහා ද අබිං භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා ඇත. එමෙන්ම කෙදිනක හෝ අබිං භාවිත කර ඇති පුද්ගලයින් අතුරින් 5 (4%) දෙනෙක් මීට පෙර අවස්ථාවල ආයුර්වේද ඖෂධ සැලකින් අවස්ථානුකූලව තමන්ට අවශ්‍ය අබිං ලබාගෙන ඇත.

2.2.9 කෙදිනක හෝ මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකු වී තිබීම

මත්ද්‍රව්‍යයට යොමු වූ පුද්ගලයින් කෙදිනක දී හෝ මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකු වී තිබේද? යන්න පිළිබඳව අධ්‍යයන නියැදියේ සමස්ත පුද්ගලයින්ගෙන් තොරතුරු අනාවරණය කර ගැනීමේ දී පුද්ගලයින් 81 (74%) දෙනෙක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකු වී ඇති බවට ද, පුද්ගලයින් 29 (26%) දෙනෙක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකු වී නොමැති බවට ද තොරතුරු අනාවරණය වී තිබේ.

ප්‍රස්තාර අංක 13 - කෙදිනක හෝ මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකු වී තිබීම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

කෙදිනක හෝ මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකු වී ඇති පුද්ගලයින් 81 අතුරින් 65 (80%) දෙනෙක් හෙරොයින් සම්බන්ධ වරදකරුවන් වී ඇති අතර පුද්ගලයින්ගෙන් 24 (30%) දෙනෙක් ගංජා සම්බන්ධව ද, පුද්ගලයින්ගෙන් එක් අයෙක් (1%) මද්‍යසාර සම්බන්ධව ද වරදකරුවෙකු වී ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. මෙහි ඇති විශේෂත්වය වන්නේ, මෙම අධ්‍යයන නියැදිය තුළ අබිං සම්බන්ධව කෙදිනකදී හෝ වරදකරුවකු වූ පුද්ගලයින් නියෝජනය නොවීමයි.

2.2.10 මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමුවීම

මත්ද්‍රව්‍යවලට යොමු වූ පුද්ගලයින්ට එයින් මිදීම සඳහා අවශ්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමුවීම පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරන ලදි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වීම සඳහා ප්‍රතිකාර ලබා ගෙන තිබේ ද? යන්න පිළිබඳව විමසා බැලීමේ දී, නියැදියෙන් ලද ප්‍රතිචාර වලට අනුව පුද්ගලයින් 62 (56%) දෙනෙක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙන බව ද, පුද්ගලයින් 48 (44%) දෙනෙක් ප්‍රතිකාර ලබාගෙන නොමැති බව ද තොරතුරු අනාවරණය විය.

එලෙස ප්‍රතිකාර වලට යොමු වූ පුද්ගලයින් 62 අතුරින් බහුතරයක් පුද්ගලයින් එනම්, 37 (60%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලින් ද, පුද්ගලයින් 17 (27%) දෙනෙක් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් ද, පුද්ගලයින් 2 (3%) දෙනෙක් රාජ්‍ය නොවන ආයතන මඟින් ද ප්‍රතිකාර ලබාගෙන ඇති අතර තවත් පුද්ගලයින් 9 (16%) දෙනෙක් රජයේ රෝහල් මඟින් ද ප්‍රතිකාර ලබාගෙන ඇති බවට තොරතුරු අනාවරණය විය.

2.3 අබිං භාවිත කරමින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධ කාලීන ප්‍රවණතා හඳුනා ගැනීම පිළිබඳ අධ්‍යයනයේදී පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු 15 දෙනෙක් සමඟ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා සිදු කරන ලද අතර ඔවුන්ගෙන් ලබාගත් තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ අබිං භාවිත කරමින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම සම්බන්ධ කාලීන තත්ත්වය සහ ඒ ආශ්‍රිත ගැටලු හඳුනාගත හැකි වූ අතර පහත උප ශීර්ෂ යටතේ අදාළ කරුණු පෙළගස්වා ඇත.

2.3.1 වෛද්‍යවරුන්ගේ ලියාපදිංචියේ ස්වභාවය හා පසුබිම

අධ්‍යයනය සඳහා තෝරාගත් ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචියේ ස්වාභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී එම වෛද්‍යවරුන්ගෙන් 12 (80%) දෙනෙක් ආයුර්වේද වෛද්‍යවරයෙක් ලෙස ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. වෛද්‍යවරුන්ගෙන් 11 (73%) දෙනෙක් ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයෙක් ලෙස ද, වෛද්‍යවරුන්ගෙන් 2 (13%) දෙනෙක් ආයුර්වේද මධ්‍යස්ථානයක් සඳහා ද ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. බොහෝ වෛද්‍යවරු ආයුර්වේද වෛද්‍යවරයෙක්

ලෙස සහ ඖෂධ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි වී ඇත. එමෙන්ම ඔවුන් තමන්ගේ නමට ලබාගත් ලියාපදිංචි සහතිකයක් මත අදාළ වෘත්තිය සිදුකරනු ලබයි.

ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙනගැනීම සහ එම ශාස්ත්‍රය ප්‍රගුණ කිරීම පිළිබඳව නියැදියට අදාළ වෛද්‍යවරුන්ගෙන් ලබාගත් තොරතුරු වලට අනුව, වෛද්‍යවරුන්ගෙන් 13 (87%) දෙනෙක් පාරම්පරිකව ලබාගත් දැනුම උපයෝගී කරගෙන ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ප්‍රගුණ කර ඇති අතර වෛද්‍යවරුන්ගෙන් 4 (27%) දෙනෙක් ආයුර්වේද ඩිප්ලෝමාවක් හැදෑරීමෙන් ද, එක් වෛද්‍යවරයෙක් ආයුර්වේද වෛද්‍ය උපාධියක් ලැබීමෙන් ද, ආයුර්වේද වෛද්‍යවරයෙක් යටතේ පුහුණුව ලැබීමෙන් ද ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ප්‍රගුණ කර ඇති බවට තොරතුරු අනාවරණය විය.

2.3.2 ඖෂධ නිෂ්පාදනය හා අබිං භාවිතය

නියැදියට අදාළ වෛද්‍යවරුන්ගෙන් ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අබිං භාවිත කිරීම පිළිබඳ ලබාගත් දත්ත තොරතුරු වලට අනුව වෛද්‍යවරු 15 (100%) දෙනාම කියා සිටියේ, ඖෂධ නිෂ්පාදන සඳහා අබිං භාවිත කිරීම සිදුකරන බවයි.

අබිං භාවිත කර නිෂ්පාදනය කරන ඖෂධ පිළිබඳ අවධානය යොමු කිරීමේදී වාත තෙල් සහ සර්ප විෂ නැසීමට සකස් කරන ඖෂධ වර්ග, තුවාල තෙල්, ස්නායු රෝග වලට අදාළ ඖෂධ, ප්‍රමේය ගජකේෂ්වරී, බුද්ධරාජ කල්කය, ජීවානන්ද ගුලි, රස ඖෂධ, පාරම්පරිකව සකසන කසාය වර්ග, අබිං ගුලිය, රණහංසි, අකාදකරවදිවටිය, කාමදේව රසායනය සහ කාමේෂ්වරී මෝදකය වැනි ඖෂධ වර්ග සකස් කිරීම සඳහා අබිං භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

ඖෂධ නිෂ්පාදනය සඳහා අබිං භාවිත කරන ආයුර්වේද වෛද්‍යවරු වාර්ෂිකව හෝ මාස 6කට වරක් අබිං මිලදී ගැනීම සිදුකළ යුතුය. නියැදියට අදාළ ආයුර්වේද වෛද්‍යවරු අබිං මිලදී ගැනීම සිදුකර තිබෙන්නේ කුමන වර්ෂයේ සිට ද? යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර වෛද්‍යවරු 5 (33%) දෙනෙක් අබිං මිලදී ගැනීම ආරම්භ කර තිබෙන්නේ 2004 වර්ෂයේදීය. අනෙක් වෛද්‍යවරු පිළිවෙළින් 1981, 1987, 1999, 2000, 2001 සහ 2005 යන වර්ෂවලදී අබිං මිලදී ගැනීම ආරම්භ කර ඇත.

2.3.3 වාර්ෂික අබිං මිලදී ගැනීමේ ක්‍රියාවලිය

අදාළ දිස්ත්‍රික්කයේ අබිං කමිටුව (Opium board) මඟින් වෛද්‍යවරුන්ගේ අවශ්‍යතාවය අනුව ලබාගත හැකි වාර්ෂික අබිං ප්‍රමාණය සම්බන්ධයෙන් ඇස්තමේන්තු කරන අතර ඒ සඳහා ඔවුන්ට කාඩ්පතක් (Opium card) ලබාදෙනු ලබයි. අදාළ කාඩ්පත භාවිත කරමින් දිස්ත්‍රික් මහ රෝහල් මඟින් අදාළ ඇස්තමේන්තුගත අබිං ප්‍රමාණයන් ලබාගත හැකිය. එය අබිං ලබාගැනීම සම්බන්ධයෙන් පවත්නා ක්‍රමවේදයයි.

නියැදියට අදාළ වෛද්‍යවරුන්ගෙන් වර්ෂයකට මිලදී ගන්නා අබිං ප්‍රමාණය ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් ද? යන්න පිළිබඳව විමසීමේදී වෛද්‍යවරු 14 (93%) දෙනෙක් කියා සිටියේ වාර්ෂිකව ලබා ගන්නා අබිං ප්‍රමාණය ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් නොවන බවයි. එක් වෛද්‍යවරයෙක් පමණක් වාර්ෂිකව ලැබෙන අබිං ප්‍රමාණය ප්‍රමාණවත් වන බව සඳහන් කරන ලදි.

ප්‍රස්තාර අංක 14 - වර්ෂයකට මිලදී ගන්නා අබිං ප්‍රමාණය ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් වේද? යන්න පිළිබඳ මතය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

ඇස්තමේන්තු ගත ප්‍රමාණය අනුව නියැදිය තුළ නියෝජනය වූ වෛද්‍යවරුන් ලබාගන්නා අබිං ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කිරීමේදී වෛද්‍යවරු 6 (40%) දෙනෙක් වර්ෂයකට ග්‍රෑම් 12 බැගින් ද, වෛද්‍යවරු 2 (13%) දෙනෙක් ග්‍රෑම් 15 බැගින් ද මිලදී ගනු ලබයි. මීට අමතරව ග්‍රෑම් 6, ග්‍රෑම් 9, ග්‍රෑම් 30, ග්‍රෑම් 36, ග්‍රෑම් 48 සහ ග්‍රෑම් 60 බැගින් මිලදී ගනු ලබන වෛද්‍යවරුන් ද නියැදිය තුළ වූහ. ඔවුන්ගේ අදහස අනුව අදාළ ප්‍රමාණයන් වාර්ෂික ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් නොමැති බව අනාවරණය විය.

ආයුර්වේද වෛද්‍යවරුන් අබිං මිලදී ගැනීම සඳහා වර්ෂයකට යම් මුදලක් වියදම් කරන අතර වෛද්‍යවරු 6 (40%) දෙනෙක් වර්ෂයකට රුපියල් 400 ක මුදලක් ද වෛද්‍යවරු 2 (13%) දෙනෙක් රුපියල් 500 ක් ද වියදම් කර ඇත. ඊට අමතරව වෛද්‍යවරු 6 දෙනෙක් රුපියල් 200 ක් ද, රුපියල් 300 ක් ද, රුපියල් 1000 ක් ද, රුපියල් 1200 ක් ද, රුපියල් 2000 ක් ද වාර්ෂිකව වියදම් කර ඇත. එසේ වැය කරනු ලබන මුදල් ප්‍රමාණය ලබාගන්නා අබිං ප්‍රමාණය මත තීරණය වේ.

2.3.4 අබිං සම්බන්ධයෙන් ඇති අවශ්‍යතාවය හා ඉල්ලුම

අබිං භාවිත කරමින් නිෂ්පාදනය කරනු ලබන ඖෂධ රෝගීන්ට නිර්දේශ කිරීමෙන් පසුව එවැනි ඖෂධ සම්බන්ධයෙන් රෝගීන්ගෙන් තවදුරටත් ඉල්ලුමක් පවතින්නේදැයි මෙහිදී අවධානය යොමු කළ අතර, බහුතරයක් වෛද්‍යවරුන් විසින් සඳහන් කළ කරුණක් නම් අබිං මිශ්‍රිත ඖෂධ වලට රෝගීන්ගෙන් එවැනි ඉල්ලුමක් නොමැති බවයි. එමෙන්ම ඔවුන් රෝගයට අදාළ නියමිත මාත්‍රාවක් සහිතව අදාළ ඖෂධ ලබාදෙන අතර ඉන් ඔබ්බට එවැනි ඖෂධ නිකුත් කිරීමක් සිදුනොවන බවයි.

අබිං යොදා සකස් කරන ඖෂධ සඳහා ප්‍රදේශය තුළ වෙනත් බාහිර පුද්ගලයින්ගෙන් හෝ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගෙන් ඉල්ලුමක් පවතින්නේ ද? යන්න පිළිබඳ අවධානය යොමු කිරීමේදී වෛද්‍යවරු 13 (87%) දෙනෙක් කියා සිටියේ ප්‍රදේශය තුළ අබිං සඳහා කිසිදු ඉල්ලුමක් නොමැති බවයි. වෛද්‍යවරු 3 (13%) දෙනෙක් කියා සිටියේ, එම ප්‍රදේශවල අබිං සඳහා ඇතැම් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගෙන් ඉල්ලුමක් පවතින බවයි.

ප්‍රස්තාර අංක 15 - අබිං සඳහා ප්‍රදේශය තුළ ඇති ඉල්ලුම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂිත දත්ත, 2017)

රෝගීන් සඳහා දීර්ඝකාලීනව නිර්දේශ කරන අබිං අඩංගු ඖෂධ වර්ග නිර්දේශ කරනු ලබන්නේ, වාතරෝග, උන්මාද රෝග, සර්ප විෂ නැසීම සඳහා ගනු ලබන ඖෂධ වර්ගය.

3 සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ අබිං භාවිතයේ ව්‍යාප්තිය හා කාලීන ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනය තුළින් ලද ප්‍රාථමික දත්ත හා ද්විතීයික මූලාශ්‍ර මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම තුළ ප්‍රධාන කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළ හැකිය.

- ශ්‍රී ලංකාව තුළ සැළකිය යුතු අන්දමේ අබිං අවභාවිත කිරීමක් සිදු නොවන බව
- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අබිං යොදා ගැනීමේ ක්‍රියාවලිය තුළ වෛද්‍යවරුන් යම් ගැටලු වලට මුහුණ දී සිටීම.

ශ්‍රී ලංකාව තුළ අබිං අවභාවිතවීමක් සිදුවන්නේද?

මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත විමර්ශනය කිරීමේදී කාලානුරූපීව අබිං ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්වල සංඛ්‍යාව අඩු වී ඇති අතර ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් වූ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත පැතිකඩ අධ්‍යයනය කිරීමේදී ද අබිං භාවිත කර ඇති පුද්ගලයින් ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් නොවීම ද පැහැදිලිව හඳුනාගත හැකිය.

වගු අංක 01 - අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්

වර්ෂය	2012	2013	2014	2015	2016
අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්	03	06	00	04	04

මූලාශ්‍රය: (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත, 2017)

ඉහත දත්ත විශ්ලේෂණය කිරීමේදි අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල සංඛ්‍යාව ඉතා සුළු අගයක පවතින බව හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ආශ්‍රයෙන් ලබාගත් නියැදිය අධ්‍යයනයට ලක්කිරීමේදී ලද අනාවරණයන්ට අනුව දැනට අබිං භාවිත කරන කිසිඳු පුද්ගලයෙක් නියැදිය තුළ නියෝජනය නොවූ අතර කෙදිනක හෝ අබිං භාවිත කර ඇති පුද්ගලයින් පමණක් හඳුනා ගත හැකි විය.

දත්තදායකයින් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා වලින් ලද තොරතුරු අනුව 1980 - 1990 දශකයන් තුළ අබිං භාවිතයට යොමු වී සිටි පිරිස් පසුකාලීනව අබිං ව්‍යාප්තිය ක්‍රමයෙන් අඩුවීමත් සමඟ හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇත. එමෙන්ම අබිං ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේ ප්‍රබල මූලයක් ලෙස භාවිත වන බව බොහෝ පුද්ගලයින් සතුව දැනුවත්භාවයක් තිබී ඇති අතර ඒ සමඟ ඔවුන් තුළ "අබිං ශරීරයට හානිදායක නොවන ඖෂධයක්" ය යන මතය ද ගොඩනැගී ඇත. එම මතයත් සමඟ අදාළ කාලවකවානුව තුළ අබිං භාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවයක් ඇති වී ඇත. නමුත් පසුකාලීනව නීති අණ පනත් ක්‍රියාත්මක වීමත් සමඟ අබිං ව්‍යාප්තිය අවම වීම හා සීමා කිරීම් පැනවීම තුළ අබිං භාවිත කරන පුද්ගලයින් වෙනත් මත්ද්‍රව්‍ය වෙත යොමු වී ඇත. මෙම අධ්‍යයනය තුළ කෙදිනක හෝ අබිං භාවිත කර ඇති පුද්ගලයින් සියලු දෙනාම දැනට හෙරොයින් භාවිත කරනු ලබයි.

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අබිං යොදා ගැනීමේ ක්‍රියාවලිය තුළ වෛද්‍යවරයන් මුහුණ දී ඇති ගැටලු

විෂ වර්ග අබිං හා අන්තරාදායක ඖෂධ පිළිබඳ ආඥ පනතේ IV වැනි පරිච්ඡේදයේ (32) වගන්තියේ (2) උප වගන්තියට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකගේ අනුමැතිය යටතේ ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා අබිං නිකුත් කිරීම සිදු කළ යුතුය. එවැනි කිසිඳු බලපත්‍රයක් හෝ අවසරයක් නොමැතිව සකස් කළ හෝ නොකළ අබිං (Raw or prepared opium) ගෙන්වීම, බෙදා හැරීම තහනම් ක්‍රියාවකි. දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන අබිං කමිටු (Opium Board) මගින් අදාළ වෛද්‍යවරුන් සඳහා ඇස්තමේන්තුගත ප්‍රමාණයන් නිර්දේශ කරනු ලබන අතර දිස්ත්‍රික් මහා රෝහල් වලින් අදාළ බලපත්‍රය ලබා ගත හැකිය. අදාළ බලපත්‍රයේ ලබාදෙන අබිං ප්‍රමාණය සහ දිනය සටහන් කර අධීක්ෂණයකින් යුතුව නිකුත් කරනු ලබයි.

ඡායාරූප අංක 01 - අබිං නිකුත් කිරීම සඳහා වලංගු කාඩ්පත



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර කටයුතු වල්දී ලබා ගන්නා ලද ඡායාරූපයකි.)

මෙම ක්‍රියාවලිය තුළ අබිං නිකුත් කිරීමේදී බොහෝ විට වර්ෂයකට දෙවරක් වශයෙන් අදාළ ප්‍රමාණයන් නිකුත් කරනු ලබයි. එක් එක් වෛද්‍යවරුන්ගේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය සහ ඒ සඳහා භාවිත කරනු ලබන පාරම්පරික ක්‍රමවේදය වෙනස් වීම නිසා අවශ්‍ය වන අබිං ප්‍රමාණය ද විවිධ වේ.

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ ආයුර්වේද වෛද්‍යවරුන් ඉදිරිපත් කළ අදහස් අනුව ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා ඔවුන්ට වාර්ෂිකව ලැබෙන අබිං ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව දක්වන ලදි. අදාළ ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් අබිං නොමැති අවස්ථාවල ඒ වෙනුවට විකල්ප ඖෂධ වර්ග භාවිත කරන අවස්ථා ද ඇති අතර ඔවුන් විශ්වාස කරන පරිදි අබිං භාවිත කිරීම මගින් නිෂ්පාදනය කරන ඖෂධවල මට්ටමට විකල්ප භාවිත කරමින් නිෂ්පාදනය කරන ඖෂධවල ගුණාත්මකභාවය ලබාගත නොහැකි බවයි. මෙම තත්ත්වය තුළ ඔවුන් ගැටලු වලට මුහුණ දී සිටියි.

4 නිගමන

අධ්‍යයන අනාවරණ වලට අනුව ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදා හැරීම සම්බන්ධ කාලීන ප්‍රවණතාවයන්ට අදාළව පහත සඳහන් නිගමන වලට එළඹිය හැකිය.

- අධ්‍යයන අනාවරණ වලට අනුව දැනට අබිං භාවිත කරන කිසිඳු පුද්ගලයෙක් නියැදිය තුළ නියෝජනය නොවූ අතර අබිං සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල ප්‍රතිශතය ද ඉතා අවම මට්ටමක පවතී. ඒ අනුව ශ්‍රී ලංකාවේ අබිං අවභාවිත කිරීම සම්බන්ධ සැළකිය යුතු මට්ටමේ ප්‍රවණතාවයක් නොමැති බව නිගමනය කළ හැකිය.

- ශ්‍රී ලංකා සමාජය තුළ අබිං සම්බන්ධ ඉහළ ව්‍යාප්තියක් පැවති කාලසීමාව තුළ අබිං භාවිත කළ පුද්ගලයින් අබිං ව්‍යාප්තිය අවම වීමත් සමග හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇති අතර ඔවුන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (poly drug users) වේ. එසේම ඔවුන් තුළ අබිං භාවිතය සම්බන්ධ පුර්ව අත්දැකීම් හා දැනුවත්භාවයක් ඇත.

- විෂ වර්ග අබිං හා අන්තරාදායක ඖෂධ ආඥා පනත ප්‍රකාරව බලපත්‍ර සහිතව ඇස්තමේන්තුගත ප්‍රමාණය අනුව ආයුර්වේද වෛද්‍යවරුන්ට අබිං ලබාදීම සිදුවන අතර අදාළ ප්‍රමාණයන් ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් නොවීම පිළිබඳ ගැටලුවට ආයුර්වේද වෛද්‍යවරුන් මුහුණ දී සිටියි. එමෙන්ම ඖෂධ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැනි සාධක මත ඔවුන් අබිං වෙනුවට විකල්ප අමුද්‍රව්‍ය භාවිත කිරීමට අකමැත්තක් දක්වයි.

- අබිං ව්‍යාප්තිය අවම වීම, අත්අඩංගුවට පත්වීම් අවම වීම, දැනට භාවිත කරන්නන් නොමැති වීම, ආයුර්වේද වෛද්‍යවරුන් තමන් සතු අබිං ප්‍රමාණයන් පුර්ණ වශයෙන් ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සහ අබිං නීතිවිරෝධීව ලබා ගැනීම සඳහා භාවිත කරන්නන්ගෙන් ආයුර්වේද වෛද්‍යවරුන්ට ඉල්ලීම් ඉදිරිපත් නොවීම වැනි කරුණු මත ශ්‍රී ලංකාවේ සැළකියයුතු මට්ටමේ අබිං අවභාවිතයක් සිදු නොවන බවට සහ අබිං සඳහා ඉල්ලුමක් නොමැති බවට නිගමනය කළ හැකිය.

5 යෝජනා

- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අබිං ප්‍රමාණ ඇස්තමේන්තුගත කිරීමේදී අදාළ වෛද්‍යවරුන්ගේ වාර්ෂික පරිභෝජනය සහ අවශ්‍යතාවය සැළකිල්ට ගෙන ලබාදිය යුතු අබිං ප්‍රමාණය නිර්දේශ කළ යුතුය.
- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කේන්ද්‍රීය ලක්ෂ්‍ය වශයෙන් ක්‍රියා කරමින් අදාළ සියලු සංවිධානයන්හි මත්ද්‍රව්‍ය පාලන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි. අබිං බෙදා හැරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතනික ව්‍යුහය සමග ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ අබිං බෙදා හැරීම සම්බන්ධ යාන්ත්‍රණය නව්‍යකරණයට ලක්කිරීම යෝග්‍ය වේ.

6. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 2016, *මත්ද්‍රව්‍ය දුර්භාවිත නොරතුරු අත්පොත*, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රාජගිරිය.

නන්දදේව, ඩබ්ලිව්., 1986, *ලංකා ජනතාව*, ගුණසේන සහ සමාගම, කොළඹ.

රත්නපාල, එන්., 1986. *විෂ මත්ද්‍රව්‍ය සමාජය සහ ඔබේ දරුවා*, සිටි ප්‍රින්ටර්ස්, මොරටුව.

Rathnapala, N., 1986, Drug *and Narcotic Dependence in Sri Lanka*, City printers, Moratuwa.

Urugoda, C.G.,1983, *Story of Opium in Sri lanka*, Gunasena Publishers, Colombo.

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතය ආශ්‍රිත ප්‍රවණතා

ප්‍රධාන පර්යේෂක
භද්‍රානි සේනානායක
නිලානි රේණුකා

සහාය පර්යේෂණ කණ්ඩායම

සුපුන් සේනානායක
වසන්ත ප්‍රදීප් කුමාර
නිලුක්ෂි තිසේරා
මහේෂි පෙරේරා

දත්ත විශ්ලේෂණය
සජීව අතාවුද

සෝදුපත් බැලීම
හිරුණි වත්සලා

සාරාංශය

ගෝලීය වශයෙන් මාදක ගණයේ ඖෂධ අවභාවිතයෙහි ප්‍රවණතාව සමඟම ඒවා පාලනය කිරීම සඳහා රටවල් එකතු වී ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව 1961 මාදක ගණයේ මත්ද්‍රව්‍ය පිළිබඳ ඒකීය සම්මුතිය (Single Convention on Narcotic Drugs), 1971 මාදක සහ මනෝවර්තක ගණයේ ඖෂධ පාලනය පිළිබඳ සම්මුතිය (Convention on Pshychotropic Substances) හා 1988 මාදක සහ මනෝවර්තක ඖෂධ නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය (Convention against Illicit Traffick in Narcotic Drugs and Psychotropic Substances) සහ දකුණු ආසියානු කලාපීය සහයෝගීතාව පිළිබඳ සමුළුවේ මාදක හා මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතිය (SAARC Convention Narcotic Drugs and Psychotropic Subsances) වැදගත් වන අතර ශ්‍රී ලංකා රජය ද මෙම සම්මුතීන්වලට අත්සන් කර තිබෙන නිසා මෙම සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි. ශ්‍රී ලාංකේය සමාජය ගත්කල වර්තමානයේදී තරුණයින් අතර කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කිරීමෙහි ප්‍රවණතාවක් වර්ධනය වෙමින් පවතින බව නිල සංඛ්‍යාලේඛන හා පර්යේෂණ වාර්තා තුළින් අනාවරණය වී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ප්‍රධාන සමාජ ගැටලුවක් වී ඇති මත්ද්‍රව්‍ය අතර හෙරොයින්, ගංජා, සිගරැට්, මද්‍යසාර වැනි ද්‍රව්‍ය ප්‍රධාන වන අතර ඊට අමතරව මෑතකාලීනව මනෝවර්තක ගණයේ (Psychotropic Drugs) සහ මනෝකාරක (Psychoactive) මෙන්ම මාදක ගණයේ ඖෂධ (Narcotic Drugs) දුර්භාවිතයෙහි ප්‍රවණතාවක් ද දැකිය හැකිය.

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ප්‍රවණතා සහ රටා පිළිබඳ සිදු කරන ලද මෙම අධ්‍යයනය තුළ දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස දිස්ත්‍රික්ක 10 ක් තෝරා ගත් අතර එම දිස්ත්‍රික්කවල ජීවත්වන පුද්ගලයින්ගෙන් මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින් 1000 ක නියැදියක් අධ්‍යයනයට ලක් කරන ලදි. කොළඹ දිස්ත්‍රික්කය තුළ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගේ ඉහළ ව්‍යාප්තියක් පවතින බැවින් කොළඹ දිස්ත්‍රික්කයෙන් නියැදිය සඳහා පුද්ගලයින් සංඛ්‍යාවක් 535ක් අධ්‍යයනය කළ අතර අනෙකුත් දිස්ත්‍රික්කවලින් පුද්ගලයින් 465 දෙනෙක් ඒ ඒ දිස්ත්‍රික්කවලින් භාවිතයෙහි ව්‍යාප්තිය සහ ප්‍රවණතාව අනුව තෝරා ගන්නා ලදි. (වගු අංක 03 බලන්න).

අධ්‍යයන අනාවරණයන්ට අනුව නියැදියේ පුද්ගලයින්ගේ සමාජ හා ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබඳව අවධානය යොමු කිරීමේ දී නියැදියට අයත් පුද්ගලයින් බහුතරයක් පුරුෂයින් වූ අතර ඔවුන් සිංහල ජනවර්ගයට අයත් බෞද්ධාගමික පුද්ගලයින් විය. වයස් මට්ටම පිළිබඳව සළකා බැලීමේ දී බහුතරයක් වයස අවුරුදු 21 - 25 ත් අතර වයස් මට්ටමට අයත් පුද්ගලයින් විය. ඔවුන්ගෙන් බහුතරයක් 6 - 10 වසර දක්වා අධ්‍යාපන මට්ටමක් ලබා ඇති අතර ඔවුන් බහුතරයක් අවිවාහකයින් විය. එසේම නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් බහුතරයක් රැකියා කටයුතුවල නිරත වී ඇත.

නියැදිය සඳහා තෝරා ගත් පුද්ගලයින් 1000 දෙනාම කෙදිනකදී හෝ මාදක, මනෝවර්තක ඖෂධ භාවිත කර ඇති අතර පුද්ගලයින්ගෙන් 983 (98%) දෙනෙක් කෙදිනකදී හෝ ඖෂධ වර්ග භාවිත කර ඇති අතර 322 (32%) දෙනෙක් සිරජ වර්ග භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. එහිදී කෙදිනකදී හෝ භාවිත කර තිබෙන මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳව විමසීමේ දී නියැදියේ බහුතරයක් පුද්ගලයින් වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ වර්ග භාවිත කර ඇති බවට එමඟින් අනාවරණය විය. එසේම සියලුම පුද්ගලයින් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (Poly Drug Users) බව ද අධ්‍යයනය තුළින් අනාවරණය විය.

ප්‍රථම වරට මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගේ වයස් මට්ටම හඳුනා ගැනීමේ දී පුද්ගලයින් 584 (58%) දෙනෙක් වයස අවුරුදු 16 - 20 අතර වයස් මට්ටමක දී ප්‍රථම වතාවට භාවිත කර ඇති බවට අධ්‍යයනය තුළින් අනාවරණය විය.

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කිරීමට බලපා ඇති බහුවිධ හේතු සාධක පවතින බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. පුද්ගලයින්ගෙන් බහුතරයක් සතුට, විනෝදය සඳහා, මිතුරු බලපෑම නිසා ද, කුතුහලය නිසා ද, වෙනත් මත්ද්‍රව්‍යයකට ආදේශකයක් ලෙස භාවිත කිරීමට යොමු වීම ද, ගැටලු

මගහරවා ගැනීම සඳහා ද, පාඩම් කිරීමට පහසු ක්‍රමයක් වශයෙන් ද, ලිංගික තෘප්තිය සඳහා ද ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කිරීමට බලපා ඇති හේතු සාධක ලෙස හඳුනාගෙන ඇත.

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ ඖෂධ භාවිත කළ පුද්ගලයින් එම ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව පිළිබඳව සළකා බැලීමේ දී බහුතරයක් සමීප මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක ප්‍රථම වතාවට භාවිත කර ඇති බව අනාවරණය විය. උත්සව අවස්ථා, වෙරළ සාද, රාත්‍රී සමාජ ශාලාවලදී ද ලිංගික ක්‍රියාකාරකම් වලදී ද හෙරොයින් නොමැති විට එහි විරමණ ලක්ෂණ මගහරවා ගැනීමට ද, වේදනා නාශකයක් වශයෙන් ද, අවමංගල්‍ය උත්සව අවස්ථාවලදී ද, ප්‍රථම වතාවට මාදක සහ මනෝවර්තක වර්ග භාවිත කර ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

පුද්ගලයින් ප්‍රථම වතාවට භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ රාශියක් වූ අතර එයින් Tramadol, Corex D, Pregabalin, MDMA, Diazepam, Benzhexol, Morphine සහ Rohypnol ප්‍රධාන වශයෙන් භාවිත කර ඇතිබව හෙළිවිය. කෙදිනක හෝ වෛද්‍යමය නිර්දේශයකින් තොරව මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ බහුතරයක් පුද්ගලයින් එනම්, 731 (73%) දෙනෙක් Tramadol භාවිත කර ඇති බවට අනාවරණය විය. පුද්ගලයින් 499 (50%) දෙනෙක් Pregabalin ඖෂධ වර්ගය ද, 313 (31%) දෙනෙක් Corex D ද අවභාවිත කර ඇති බව අනාවරණය විය. පුද්ගලයින් 84 (8%) දෙනෙක් Benzhexol ද, 78 (8%) දෙනෙක් Morphine ද, 57 (6%) Rohypnol ඖෂධය ද භාවිත කරන බව අනාවරණය විය. ඊට අමතරව මනෝකාරක ගණයට අයත් ද්‍රව්‍යයක් වන MDMA (Ecstasy) 192 (19%) දෙනෙක් විසින් භාවිත කර ඇති බවට ද අධ්‍යයනය තුළින් අනාවරණය විය.

අධ්‍යයන කළ කාලවකවානුව තුළදී පසුගිය මාස තුන තුළ සහ මාස තුනට වඩා වැඩි කාලය තුළ පුද්ගලයින් භාවිත කළ මාදක සහ මනෝවර්තක වර්ග පිළිබඳව විමසා බැලිමේදී මාස තුන තුළදී බහුතරයක් පුද්ගලයින් භාවිත කර තිබෙන්නේ Tramadol සහ Pregabalin ඖෂධය. සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත වන "ඇපල්", "ගැබා" යන අන්වර්ථ නාමවලින් මෙම ඖෂධ හඳුන්වනු ලැබේ. නමුත් මාස තුනට වඩා වැඩි කාලසීමාවේදී භාවිත කර තිබෙන මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග පිළිබඳ සොයා බැලීමේ දී Corex D සිරප් වර්ගය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය. මේ අනුව පසුගිය වසරක කාලසීමාව තුළ දී මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමේ ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය.

අධ්‍යයනය කළ නියැදියේ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින් බහුතරයක් මිතුරන් මාර්ගයෙන් එම ඖෂධ ලබාගෙන ඇති බව අනාවරණය විය. ඊට අමතරව ෆාමසි වලින් ද, පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවන් මාර්ගයෙන් ද, මත්පෙති විකුණන නීත්‍යානුකූල නොවන වෙළෙන්දන් මඟින් ද, රජයේ ඖෂධහල් හෝ රෝහල් වලින් ද, නීත්‍යානුකූල නොවන අයුරින් ද, අන්තර්ජාලය හරහා ඇනවුම් කිරීම මඟින් ද ලබාගෙන ඇත.

පුද්ගලයින් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග දීර්ඝකාලීනව භාවිත කළ ද ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විමසීමේ දී දීර්ඝකාලීනව සෞඛ්‍ය ගැටලුවලට මුහුණපා නොමැති බව ද අනාවරණය විය.

එහෙත් පුද්ගලයින් 151 දෙනෙක් කෙදිනකදී හෝ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීම නිසා අධිමාත්‍රා වීම (Overdose) සිදු වී ඇත. එහිදී කරකැවිල්ල, හුස්ම ගැනීමේ අපහසුතා, සිහිමුර්ඡාවීම වැනි තත්ත්වයන්ට මුහුණ දී ඇත. මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය හේතුවෙන් ඔවුන් මුහුණ දී ඇති ශාරීරික අසංකූලතා (Physical discomfort) අධිමාත්‍රා වීමට අදාළ රෝග ලක්ෂණයන්ට බොහෝ සෙයින් සමානකමක් දක්වයි.

වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන මාදක ගණයේ සහ මනෝවර්තක ගණයේ ඖෂධ වර්ග අවභාවිතය සම්බන්ධයෙන් පාසල් සිසුන් හා තරුණයින් යොමු වීමේ ප්‍රවණතාවයක් ඇති බව මෙම අධ්‍යයනය තුළින් අනාවරණය විය. එහිදී විශේෂයෙන් Tramadol වැනි මාදක ගණයේ ඖෂධ භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් ද අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය.

මනෝවර්තක (Psychotropic) හා මනෝකාරක ඖෂධ (Psychoactive) භාවිතයෙහි ප්‍රවණතාවක් මෙන්ම වෙළඳපළ තුළ මෙම ඖෂධ අලෙවියෙ හි සුලභතාවක් දැකිය හැකි බව අධ්‍යයනය තුළින් අනාවරණය කරගත හැකි විය. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා රජය විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ මත්ද්‍රව්‍ය පාලන, නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාර්යයන්හි නිරත වී සිටින රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධව කඩිනම් පියවර ගත යුතුව ඇත. නැතහොත් අනාගතයේ දී ශ්‍රී ලංකාවේ ළමා හා තරුණ පරපුර ශීඝ්‍රයෙන් ඖෂධ අවභාවිතයට පෙළඹිය හැකිය.

1 හැඳින්වීම

1.1 අධ්‍යයන පසුබිම

ශ්‍රී ලංකාව තුළ කලින් කලට විවිධ සමාජ පරාසයන් තුළ භාවිතය වර්ධනය වන්නා වූ මත්ද්‍රව්‍ය වර්ග රැසක් පවතින අතර එවැනි මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීම සහ ඊට විසඳුම් ලබාදීම අප මණ්ඩලයේ මුඛ්‍ය අරමුණකි. හෙරොයින් භාවිතයෙහි ව්‍යාප්තියත් සමඟ ලංකාව තුළ වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කිරීමේ වර්ධනයක් ද ක්‍රමිකව පෙන්නුම් කරයි. වෛද්‍යමය හේතූන් මත භාවිත කරන ඖෂධ වර්ග වර්තමානය වනවිට නීත්‍යනුකූල නොවන ආකාරයෙන් වෙළඳපොළ තුළ සංසරණය වන අවස්ථා ඇත. හෙරොයින් නොමැති විට ඇතිවන විරමණ ලක්ෂණ මඟහරවා ගැනීම සඳහාත්, හෙරොයින්, ගංජා භාවිත කරන අතරතුර භාවිත කිරීම සඳහාත් මෙම මාදක සහ මනෝවර්තක නීත්‍යනුකූල නොවන අයුරින් ලබාගැනීම සිදුකරන බව නිල සංඛ්‍යාලේඛන හා පර්යේෂණ වාර්තා තුළින් අනාවරණය වී ඇත. එබැවින් මාදක සහ මනෝවර්තක දුර්භාවිතයෙහි ව්‍යාප්තියක් තිබේ ද? සහ ඒ ආශ්‍රිත නූතන ප්‍රවණතා මොනවා ද? යන්න පිළිබඳව දිස්ත්‍රික්ක මට්ටමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදි.

ගෝලීය වශයෙන් මාදක ගණයේ ඖෂධ අවභාවිතයෙහි ප්‍රවණතාව සමඟම ඒවා පාලනය කිරීම සඳහා රටවල් එකතු වී ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව 1961 මාදක ගණයේ මත්ද්‍රව්‍ය පිළිබඳ ඒකීය සම්මුතිය, 1971 මනෝවර්තක ගණයේ ඖෂධ පාලනය පිළිබඳ සම්මුතිය හා 1988 මාදක සහ මනෝවර්තක ඖෂධ නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය සහ දකුණු ආසියානු කලාපීය සහයෝගීතාව පිළිබඳ සමුළුවේ මාදක හා මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතිය වැදගත් වන අතර ශ්‍රී ලංකා රජය ද මෙම සම්මුතීන්වලට අත්සන් කර තිබෙන නිසා මෙම සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි.

ශ්‍රී ලාංකේය සමාජය ගත්කල වර්තමානයේදී තරුණයින් අතර කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කිරීමෙහි ප්‍රවණතාවක් වර්ධනය වෙමින් පවතින බව නිල සංඛ්‍යාලේඛන හා පර්යේෂණ වාර්තා තුළින් අනාවරණය වී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ප්‍රධාන සමාජ ගැටලුවක් වී ඇති මත්ද්‍රව්‍ය අතර හෙරොයින්, ගංජා, සිගරැට්, මද්‍යසාර වැනි ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් හැඳින්විය හැකිය. මීට අමතරව මෑතකාලීනව මනෝවර්තක ගණයේ ඖෂධ (Psychotropic Substances) සහ මාදක ගණයේ ඖෂධ (Narcotic Drugs) දුර්භාවිතයෙහි ප්‍රවණතාවක් ද දැකිය හැකිය. මේවා අතර ශ්‍රී ලංකාව තුළ බහුලවම අවභාවිත වන මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය ලෙස, Diazepam, Methamphetamine, Lorazepam (Artivan), Artane, (Trihexyphenidyl) Clonazepam මාදක ගණයේ ඖෂධ ලෙස Morphine, Tramadol, Methodone යනාදිය හැඳින්විය හැකි අතර LSD, Ecstasy, Gabapentin සහ Pregabalin වැනි මනෝකාරක ද්‍රව්‍ය ද අවභාවිත කිරීම සිදුවන බවට වාර්තා වී ඇත (සේනානායක, 2018).

මනෝවර්තක ද්‍රව්‍ය (Psychotropic Substances) යනු, 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතියේ i, ii, iii, iv වන උපලේඛනයන්හි අන්තර්ගත ස්වාභාවික, අර්ධ කෘත්‍රිම හා කෘත්‍රිම ද්‍රව්‍ය ලෙස මේවා කාණ්ඩ කර ඇත. මේවා විශේෂයෙන්ම මනෝචිකිත්සාවේ නීත්‍යනුකූලව භාවිත වන ඖෂධ සමූහයකි. එනම්, භ්‍රාන්තීකාරක (Hallucinogens), උත්තේජක (Stimulants), අවපීඩක (Depressant) සහ

පද්ධතියට බලපෑම් කරන විලාසය, සංජානනය හෝ විඥානය වැනි මානසික තත්ත්ව වෙනස් කරනු ලබන මත්ද්‍රව්‍ය හෝ විෂ මත්ද්‍රව්‍ය වේ (මත්ද්‍රව්‍ය දූර්භාවිත පද විවිරණය:1991).

බයිපෝල අක්‍රමිකතා සඳහා හෝ යම් පෞරුෂ අක්‍රමිකතා සඳහා වෛද්‍ය අනුමැතිය ඇතිව මනෝවර්තක ඖෂධ පුද්ගලයින් හට ලබාදීම සිදුකරයි. මෙම ඖෂධ නීත්‍යානුකූල ආකාරයට ආනයනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය ඖෂධ ආනයනකරුවන්ට බලපත්‍ර ලබාදෙන අතර වෛද්‍යමය හේතූන් සඳහා අමාත්‍යාංශයේ ඖෂධ සැපයීම් අංශය මඟින් දිවයින පුරා රෝහල්වලට බෙදාහැරීම සිදු කරයි. නමුත් නීත්‍යානුකූල නොවන ආකාරයේ ඖෂධ ජාවාරමක් රට තුළ ක්‍රියාත්මක වන බවට පැමිණිලි හා වාර්තා වන අතර ජාවාරම්කරුවන් විසින් සූක්ෂ්මව තරුණයින් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පොළඹවා ගැනීමට කටයුතු කරමින් සිටියි.

1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතිය ප්‍රකාරව සහ 1988 මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව 2008 අංක 1 දරන මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ශ්‍රී ලංකාවේ සම්මත කරගත් අතර ඒ අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ පුරෝගාමී රසායන පාලන අධිකාරිය 2010 දී පිහිටවනු ලැබීය. 2008 අංක 1 දරන පනත මඟින් ලංකාව තුළ මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය, ජාවාරම හා බෙදාහැරීම පාලනය කිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු ආරම්භ කරන ලදි.

2017 අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ වාර්ෂික වාර්තාවට අනුව ආසියානු කලාපය තුළ මෙතම්පිටමින් ඇතුළු ඇම්පිටමින් වර්ගයේ උත්තේජක ජාවාරම් කිරීමේ වර්ධනයක් දැකගත හැකි බව තහවුරු වී තිබේ. එසේම මත්ද්‍රව්‍ය ආශ්‍රිතව පවතින ප්‍රධාන අභියෝග අතර ඖෂධීය නිෂ්පාදන සහ ජාවාරම් එනම්, මාදක ගණයේ සහ මනෝවර්තක ගණයේ ඖෂධ නිෂ්පාදනය සහ දූර්භාවිත කිරීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකි බව ද පෙන්වා දී ඇත (අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව : 2017).

ආසියානු කලාපීය තත්ත්වයට සාපේක්ෂව ශ්‍රී ලංකාව තුළ මනෝවර්තක ගණයේ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ ජාවාරම් කිරීමේ ප්‍රවණතාව ඉතා අඩු මට්ටමක පවතී. 2008 වර්ෂයේ අවිස්සාවේල්ල කොස්ගම ප්‍රදේශයේ නීතිවිරෝධීව පවත්වාගෙන ගිය මෙවැනි රසායනාගාරයක් වටලනු ලැබිණි. ඉන්පසු 2008 අංක 1 දරන පනත ක්‍රියාත්මක වීම සහ ඒ හා සමගාමීව නීතිය බල ගැන්වීම සහ එවැනි නීතිවිරෝධී ක්‍රියාවන්ට පැවතුණු ඉඩ ප්‍රස්ථාවන් සීමා වීම ද සිදුවිය.

2011 දී ඇම්පිටමින් කිලෝ 1.769 ක් ද, 2012 දී මාදක සහ මනෝවර්තක ඖෂධ කිලෝ 3.780 ක් ද, 2013 දී මෙතම්පිටමින් ඖෂධ කිලෝ 1.972.450 ක් ද, 2014 දී මනෝවර්තක කිලෝ 0.190 ක් ද, 2016 දී මෙතම්පිටමින් කිලෝ 0.50 ක් ද, මනෝවර්තක ඖෂධ කිලෝ 1.232.30 ක් ද අත්අඩංගුවට ගෙන ඇත (මත්ද්‍රව්‍ය දූර්භාවිත තොරතුරු අත්පොත, 2016).

එපමණක් ද නොව ඇතැම් පුද්ගලයින් විසින් හෙරොයින්, ගංජා වැනි මත්ද්‍රව්‍ය භාවිත කරන අතරතුරම මෙම මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරනු ලබයි. කුමන කාරණය පදනම් කරගෙන වුවද මේ වනවිට මාදක සහ මනෝවර්තක භාවිතය ක්‍රමිකව වර්ධනය වී ඇත. ඒ අනුව දිස්ත්‍රික්ක මට්ටමින් නියැදියක් තෝරාගෙන මාදක සහ මනෝවර්තක භාවිතය හා එහි ප්‍රවණතා පිළිබඳව විමර්ශනය කිරීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරන ලදි.

1.2 පර්යේෂණ ගැටලුව

වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන මාදක සහ මනෝවර්තක ගණයේ ඖෂධ වර්ග අවභාවිත කිරීමක් සිදුවන්නේ ද? මනෝවර්තක ද්‍රව්‍ය අවභාවිත කිරීමේ ස්වභාවය හා ඒ ආශ්‍රිත නූතන ප්‍රවණතා මොනවාද? යන ගැටලු අධ්‍යයනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

1.3 පර්යේෂණ අරමුණු

- වර්තමානයේ ලංකාව තුළ අවභාවිතයක් සිදුවන ඖෂධ වර්ග (මාදක සහ මනෝවර්තක හෝ වෛද්‍යමය අරමුණ සඳහා භාවිත කරන ඖෂධ) හඳුනා ගැනීම.

- අවභාවිත කරන ඖෂධ සංසරණය වන රටාවන් හා ඒ හා සම්බන්ධව භාවිත කරන විධික්‍රම හඳුනා ගැනීම.

- මාදක සහ මනෝවර්තක අවභාවිතය ප්‍රචලිත දිස්ත්‍රික්ක හඳුනාගැනීම සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා හඳුනා ගැනීම.

- මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනයට යොමු කිරීමට අදාළ ක්‍රමවේද නව්‍යකරණයට ලක් කිරීම.

1.4 පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රමය

පර්යේෂණ ක්ෂෙත්‍රය ඇසුරින් තෝරාගනු ලබන නියැදිය අධ්‍යයනයට ලක්කර ලබාගන්නා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්ෂෙත්‍රය දත්ත පර්යේෂණ අරමුණු අනුව විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මෙහිදී පර්යේෂණ ක්‍රමය බවට පත්වූයේ, සමීක්ෂණ ක්‍රමයයි. ඊට අමතරව මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් ආශ්‍රිතව මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතිවලින් සහ මීට පෙර කරන ලද අධ්‍යයනවලට අදාළව ද ද්විතියික දත්ත අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදි.

1.5 පර්යේෂණ ක්ෂෙත්‍රය සහ නියැදිය තෝරාගැනීම

1.5.1 පර්යේෂණ ක්ෂෙත්‍රය

මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය අවභාවිත කිරීම සම්බන්ධ ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් සිදුකරනු ලැබූ මෙම අධ්‍යයනය කඩිනම් සමීක්ෂණයක් ලෙස සිදු කරන ලදි. ඒ අනුව අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්ද්‍රව්‍යවල පවත්නා ඉහළ ව්‍යාප්තිය සහ මාදක සහ මනෝවර්තක ගණයට ගැනෙන ද්‍රව්‍ය අවභාවිත කිරීම පිළිබඳ සිද්ධි වාර්තා වීමේ තත්ත්වය යන කාරණා සැලකිල්ලට ගෙන අධ්‍යයනයේ පර්යේෂණ ක්ෂෙත්‍රය ලෙස කොළඹ, කළුතර, ගම්පහ, මහනුවර, ගාල්ල, මාතර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, රත්නපුර යන දිස්ත්‍රික්ක තෝරා ගන්නා ලදි. රාත්‍රී සමාජශාලා හා වෙරළ සාද ආශ්‍රිතව නව පරපුර පෙති වර්ග භාවිත කිරීමේ ප්‍රවණතාවක් වර්ධනය වෙමින් පවතින බව පර්යේෂණ අංශය සිදු කරන ලද පර්යේෂණ තුළින් ද අනාවරණය වී ඇත. මෙම දිස්ත්‍රික්ක ආශ්‍රිතව රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද වැඩි ප්‍රමාණයක් කේන්ද්‍රගත වී ඇති නිසා පර්යේෂණ ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී එම කාරණය කෙරෙහි ද සැලකිල්ලක් දක්වන ලදි.

1.5.2 නියැදිය

මෙම අධ්‍යයනය සඳහා මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන ජනගහනය තුළින් නියැදිය තෝරා ගන්නා ලදි. මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන ජනගහනය අතරින් පුද්ගලයින් 1000 කින් සමන්විත නියැදියක් තෝරා ගන්නා ලදි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතියට (Drug Abuse Monitoring System) ලැබෙන මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත්වීම්වලට අදාළ දත්ත අනුව ඒ ඒ දිස්ත්‍රික්කවල අත්අඩංගුවට පත් පුද්ගලයින්ගේ අනුපාතයට අනුව වයස අවුරුදු 14 - 44 අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් තෝරා ගැනීම සඳහා හිමබෝල නියැදිය (Snowball technique) භාවිත කරන ලදි.

1.6 දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම

නියැදියට අදාළව මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට ව්‍යූහගත ප්‍රශ්නාවලියක් ලබාදීමෙන් තොරතුරු ලබාගන්නා ලදි.

ඊට අමතරව සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රමය මඟින් අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරු, ප්‍රදේශයේ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත රටා සහ ප්‍රවණතා පිළිබඳව ගැඹුරින් තොරතුරු ලබාගන්නා ලදි.

1.7 දත්ත විශ්ලේෂණය කිරීම

ව්‍යූහගත ප්‍රශ්නාවලී මඟින් රැස් කරන ලද ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත. එහිදී විචල්‍යය අතර සහසම්බන්ධතාවන් ප්‍රමාණාත්මක ලෙස මිණුම් කර ඇත. සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ වැනි විධික්‍රම හරහා ලබාගත් ගුණාත්මක දත්ත ඒ ඒ ලක්ෂණ අනුව වර්ග කර ගුණාත්මක ලෙස විශ්ලේෂණය කර ඇත.

2 මාදක සහ මනෝවර්තක භාවිතයෙහි ප්‍රවණතා සහ රටා (සංකල්ප නිර්වචනය, දේශීය සහ ගෝලීය අධ්‍යයන ඇසුරෙනි)

2.1 සංකල්ප නිර්වචනය

2.1.1 මාදක ඖෂධ (Narcotic drugs)

- නිදිබර ගතිය හෝ නින්ද ඇති කිරීමට හැකි බලයක් තිබේ.
- පුද්ගලයෙකුගේ සංජානනයන් අඳුරු කරන කුඩා ප්‍රමාණයකින් ඔහු තුළ සුඛස්ථිතික හැඟීම් ඇති කරවන, ඔහු කරන කියන දේ ගැන අවිඥානිකවීම් සහ අමතකවීම් ඇති කරන සහ විශාල ප්‍රමාණයක් ගත්කල මරණය වුවද ඇති කළ හැකි ඕනෑම ඖෂධයකට වෛද්‍ය විද්‍යාවේ නාකොටික් යන වචනය භාවිත කෙරේ (මත්ද්‍රව්‍ය දුර්භාවිත පද විවරණය, 1991).

2.1.2 මනෝවර්තක ද්‍රව්‍ය (Psychotropic Substances)

- මනෝචිකිත්සාවේ නීත්‍යනුකූලව භාවිතවන ඖෂධ සමූහයකි.
- ප්‍රති අවපීඩක, ප්‍රධාන භ්‍රාන්තීකාරක, උත්තේජක (ඇම්පිටමින් ආදී) ශමක සහ නිද්‍රාජනක (බාර්බිටියුරේට් ආදී) සහ සුළු භ්‍රාන්තීකාරක (බෙන්සොඩයසපින්) මේ සමූහයන්ට අඩංගුය. මේ සෑම වර්ගයකටම අනිසි භාවිතයට හා යැපීම් උපදවීමට විභවයක් ඇත (මත්ද්‍රව්‍ය දුර්භාවිත පද විවරණය, 1991).

2.1.3 මනෝකාරක ද්‍රව්‍ය (Psychoactive Drugs)

- විලාසය, සංජානනය සහ විඥානය වැනි මානසික තත්ත්වයන් වෙනස් කළ හැකි ද්‍රව්‍ය වේ (මත්ද්‍රව්‍ය දුර්භාවිත පද විවරණය, 1991).

2.1.4 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත

ගෝලීය වශයෙන් මාදක ගණයේ ඖෂධ අවභාවිතයෙහි ප්‍රවණතාව සමඟම ඒවා පාලනය කිරීම සඳහා රටවල් එකතු වී ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව 1961 මාදක ගණයේ මත්ද්‍රව්‍ය පිළිබඳ ඒකීය සම්මුතිය, 1971 මනෝවර්තක ගණයේ ඖෂධ පාලනය පිළිබඳ සම්මුතිය හා 1988 මාදක සහ මනෝවර්තක ඖෂධ නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුතීන් වැදගත් වන අතර ශ්‍රී ලංකා රජය ද මෙම සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි.

1988 ඔස්ට්‍රියාවේ වියානා නුවර දී පැවති එක්සත් ජාතීන්ගේ සමුළුවේ දී මත්ද්‍රව්‍ය සහ මනෝකාරක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහිව සම්මුතියක් සම්මත කරගත් අතර එම සම්මුතියට ශ්‍රී ලංකාව ද අත්සන් තබන ලදි.

1990 නොවැම්බර් මාසයේ දී මාලේ නගරයෙ දී පවත්වන ලද කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියානු සංගමයේ 05 වන සමුළුවේ දී මාදක හා මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මත කරගනු ලැබූ අතර ඉහත සඳහන් සම්මුතිවල පාර්ශ්වකරුවෙකු වන්නා වූ ශ්‍රී ලංකාව ද එම සම්මුතිවල විධිවිධාන ඇති කිරීමට බැඳී සිටින හෙයින් ද, 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 1 වන වගුවේ සහ 2 වන වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය නියාමනය කිරීමේ විධිමත් යාන්ත්‍රණයක් ඇති කිරීමට ශ්‍රී ලංකාවට හැකිවනු පිණිස මෙවැනි විධිවිධාන අවශ්‍යතාව සපුරා ගැනීම පිණිස 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත පනවා ඇත.

2.2 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයෙහි ගෝලීය ප්‍රවණතා සහ සිදු කළ අධ්‍යයන

2018 ලෝක මත්ද්‍රව්‍ය වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ලෝකයේ පුද්ගලයින් අතුරින් වයස අවුරුදු 15 - 64 වයස් කාණ්ඩයේ පසුවන පුද්ගලයින් මිලියන 275 ක් එක්වරක් හෝ මත්ද්‍රව්‍ය ශරීරගත කරගෙන ඇති බවට වාර්තා වන බවත්, මිලියන 31 ක් මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා හේතුවෙන් පීඩාවට පත් වී ඇති බවත් වාර්තා කර ඇත. 2015 වනවිට දළ වශයෙන් පුද්ගලයින් 450,000 ක් මත්ද්‍රව්‍ය භාවිතය නිසා මරණයට පත්ව ඇත. ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තාවලට අනුව එම සංඛ්‍යාවෙන් පුද්ගලයින් 167,750 දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා හේතුවෙන් මරණයට පත්ව ඇත (ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව, 2018). එමඟින් පෙනී යන්නේ, මත්ද්‍රව්‍ය භාවිතය යනු පුද්ගලයාගේ සෞඛ්‍ය කෙරෙහි සෘජුව බලපෑම් කරන එනම්, හානිකර තත්ත්වයන්ට පත්වන නිසා මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර කිරීම අත්‍යවශ්‍ය වන බවයි.

2016 ඇස්තමේන්තුගත වාර්තාවලට අනුව වයස අවුරුදු 15 - 64 වයස් මට්ටමට අයත් පුද්ගලයින් මිලියන 34.2 (0.7%) ක් ඇම්පිටමින් සහ වෛද්‍යවරු නිර්දේශ කරනු ලබන ඖෂධ වර්ග භාවිත කර ඇති බවට හෙළි කර ඇත. තවද ලෝකයේ බොහෝ රටවල් වලින් Tramadol ඖෂධය භාවිත කරන බවට වාර්තා කර ඇති අතර Tramadol ඖෂධය භාවිතය හේතුවෙන් ඒ සඳහා ප්‍රතිකාර ලබාගැනීමත් අධිමාත්‍රා වීම නිසා මරණයට පත් වීම් පිළිබඳව ද වාර්තා කර ඇත (ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව, 2018).

ඊට අමතරව ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව 2018 හි සඳහන් කර ඇති පරිදි 2017 වර්ෂයේ මෙතම්පිටමින් ටොන් 158 ක් ද, ඇම්පිටමින් ටොන් 70 ක් ද, එක්ස්ටසි ටොන් 70 ක් ද අත්අඩංගුවට ගෙන ඇති අතර එය 2016 වර්ෂය හා සසඳන කල මෙතම්පිටමින් 12% කින් ද, ඇම්පිටමින් 35% කින් ද, එක්ස්ටසි 37% කින් ද වර්ධනය වීමක් පෙන්නුම් කර ඇත. තවද 2017 වර්ෂය වනවිට ලෝකයේ එක්ස්ටසි භාවිත කරන සංඛ්‍යාව මිලියන 20.6 ක් බව වාර්තා කර ඇත (ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව, 2018).

2018 අන්තර්ජාතික මාදක මණ්ඩල වාර්තාවට අනුව දකුණු ආසියානු කලාපයේ ඇති ප්‍රධාන අභියෝගය වශයෙන් ඇම්පිටමින් සහ මෙතම්පිටමින් වර්ගයේ උත්තේජක නිෂ්පාදනය, ජාවාරම, දුර්භාවිතය හඳුනා ගෙන ඇත. ඊට අමතරව නව මනෝකාරක ද්‍රව්‍ය (New Psychoactive) දුර්භාවිත කිරීමේ ප්‍රවණතාවක් ද පවතින බව අනාවරණය කර ඇත (INCB වාර්තාව, 2018).

මනෝවර්තක ඖෂධ දුර්භාවිතය පිළිබඳව විවිධ පර්යේෂකයින් විසින් සිදුකර තිබෙන අධ්‍යයන මඟින් ද එහි ප්‍රවණතාව කෙතරම් ද යන්න හඳුනා ගැනීමට හැකිය. 2012 - 2013 කාල පරිච්ඡේදයේ දී ටෙහෙරානයේ වෛද්‍ය ශිෂ්‍යයින් 2212 ක් නියැදියට අන්තර්ගත කරගනිමින් සිදුකළ අධ්‍යයනයට අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගෙන් 5% ක් පසුගිය මාසය තුළ සතියකට තුන්වරක්වත් මනෝවර්තක ඖෂධ හෝ වෙනත් මත්ද්‍රව්‍ය දුර්භාවිත කර ඇති බවට අධ්‍යයන අනාවරණවලින් තහවුරු කර ඇත. දුර්භාවිත කර තිබෙන ද්‍රව්‍ය අතර ඕපියොයිඩ් මත්ද්‍රව්‍ය, නිද්‍රාජනක ඖෂධ (Sedatives), Methylphenidate වැනි ද්‍රව්‍ය භාවිත කර ඇත. කවදා හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය වර්ග අතර ගංජා,

එක්ස්ටසි, ඇම්පිටමින්, මෙතම්පිටමින්, අබිං, හෙරොයින් හා කොකේන් වැනි ද්‍රව්‍ය භාවිත කර ඇති බවට ද එම අධ්‍යයනය තුළින් තහවුරු කර ඇත (Ghahramanloo etc,2013).

ඊට අමතරව විශ්වවිද්‍යාල සිසුන් මනෝවර්තක ඖෂධ දුර්භාවිත කිරීම කෙරෙහි බලපා ඇති සාධක ලෙස අධ්‍යයන කටයුතු නිසා ඇතිවන පීඩනය මඟහරවා ගැනීමටත්, මිතුරු බලපෑම නිසා ද මද්‍යසාර භාවිතය වැනි දේ සමාජයේ සාමාන්‍ය දෙයක්වීම නිසා ද, මෙම ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් යොමු වී ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය කර ඇත.

2001 - 2002 කාල පරිච්ඡේදයේ දී වයස අවුරුදු 18 - 60 අතර වයස් කාණ්ඩයට අයත් පුරුෂයින් 3793 දෙනෙක් ද, කාන්තාවන් 3244 දෙනෙක් ද හොකොං නගරය මූලික කරගනිමින් නියැදියක් තෝරා ගෙන මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ප්‍රවණතා සහ ඒ ආශ්‍රිත සෞඛ්‍ය ප්‍රතිඵල පිළිබඳව අධ්‍යයනයක් සිදුකරන ලදි. එම අධ්‍යයනයට අනුව අධ්‍යයනය කළ වර්ෂයට පෙර වර්ෂයේ එනම්, පසුගිය වසර තුළ දී පුරුෂයින් 5% ක් ද කාන්තාවන් 1.8% ක් ද මනෝවර්තක දුර්භාවිත කර ඇති අතර ඊට අමතරව ගංජා, මෙතම්පිටමින්, කේටමින්, කොකේන්, ඕපියේඩ්ස්, බෙන්සොඩයසිපින්ස් වැනි ද්‍රව්‍ය ද භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය කරගෙන ඇත. තවද භාවිතය කෙරෙහි බලපා ඇති හේතු ලෙස වයස් සීමාව, විරැකියාව, පාසල් හැරයාම, අවිවාහක බව, මද්‍යසාරවලට ඇබ්බැහි වී සිටීම වැනි හේතු සාධක බලපා ඇති බව ද සොයා ගෙන ඇත (Joseph and et.al, 2009).

2.3 මාදක සහ මනෝවර්තක දුර්භාවිතයෙහි දේශීය ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ප්‍රවණතා සහ රටා පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ඒ සම්බන්ධයෙන් සිදුකර තිබෙන අධ්‍යයන සොයාගැනීම් කෙරෙහි අවදානයක් යොමු කිරීම ඉතා වැදගත් වේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය මඟින් සිදුකර තිබෙන මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයනවලට අනුව එම එක් එක් පර්යේෂණවලින් පුද්ගලයින්ගේ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතයෙහි ප්‍රවණතා පිළිබඳව ද අධ්‍යයනයට ලක් කර ඇත.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් පවත්වා ගෙනයනු ලබන "මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතිය" (DAMS) මඟින් ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගලයින් සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත්වන පුද්ගලයින්ගේ තොරතුරු පරිගණක ගතකර තොරතුරු විශ්ලේෂණ පද්ධතියක් සකස් කර ඇත. මෙම තොරතුරු මාසිකව සියලුම නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙතින් (පොලිස් ස්ථාන) රජයේ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා බන්ධනාගාරවලින් ලබා ගනියි.

පසුගිය වසර 5 ක කාලය තුළ අත්අඩංගුවට පත්වන සහ ප්‍රතිකාර සඳහා පැමිණෙන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ රටා විමර්ශනය කරනවිට ඖෂධ භාවිතය පිළිබඳ යම්තාක් දුරකට ප්‍රවණතාවක් ඇතිබව නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව DAMS දත්ත පද්ධතියට අනුව මත්ද්‍රව්‍ය සඳහා අත්අඩංගුවට පත් පුද්ගලයින් පිළිබඳ වාර්තා විශ්ලේෂණයේදී 2016 වර්ෂයේදී පෙති වර්ග භාවිතය නිසා අත්අඩංගුවට පත් පුද්ගලයින් 23 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්විට 0.1%කි. 2017 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා කාලසීමාව තුළ අත්අඩංගුවට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව 124 ක් වූ අතර 0.2% කි. 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා ඖෂධ සඳහා අත්අඩංගුවට පත් පුද්ගලයින් අතරින් ඖෂධ දුර්භාවිතයේ වර්ධනයක් හඳුනාගත හැකි ආකාරය පහත ප්‍රස්තාරය තුළින් පෙන්නුම් කළ හැකිය.

ප්‍රස්තාර අංක 1 - මාදක සහ මනෝවර්තක භාවිතය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් - 2017



මූලාශ්‍රය: (DAMS දත්ත පද්ධතිය, 2017)

ඖෂධ නියාමන අධිකාරිය විසින් 2016 වර්ෂයේ දී සිදු කරන ලද වැටලීම් පිළිබඳව විමර්ශනය කර බැලීමේ දී බස්නාහිර පළාත තුළ පමණක් ඖෂධ ළඟ තබා ගැනීම, ගබඩා කර තැබීම, බෙදා හැරීම, විකිණීම හා ආනයනය යන කරුණු මූලික කරගනිමින් සිදුකළ වැටලීම් පහත සඳහන් කර ඇත. ඒ අනුව මීගමුව, පමුණුගම, කඳාන, දෙමටගොඩ, කොළඹ 12, එඬේරමුල්ල, කිඹුලපිටිය, කොච්චිකඩේ, වයික්කාල, කටුවාපිටිය, ඒකල, කටාන, රද්දොළුගම, පැලියගොඩ, කැළණිය, වත්තල, ආඩිඅම්බලම, නාරාහේන්පිට, මාළිගාවත්ත, මොරටුව යන ප්‍රදේශ ආශ්‍රිතව සිදු කරන ලද වැටලීම් පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

වගු අංක 1 - ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදුකළ නීත්‍යානුකූල නොවන ඖෂධ වැටලීම් - 2016

අනු අංකය	වරදේ ස්වභාවය	ඖෂධ වර්ගය	ප්‍රමාණය
01	ළඟ තබා ගැනීම	ට්‍රැමඩෝල් ප්‍රීගැබලින්	පෙති 106,377 පෙති 1100
02	බෙදාහැරීම	ප්‍රීගැබලින්	පෙති 996
03	ගබඩා කර තැබීම	ට්‍රැමඩෝල්	පෙති 200
04	විකිණීම	ට්‍රැමඩෝල්	පෙති 06
එකතුව			පෙති 108,679

මූලාශ්‍රය: (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත, 2016)

2016 වර්ෂයේදී ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදුකළ ඖෂධ වැටලීම්වලදී වැඩි ප්‍රමාණයක් වැටලීම් සිදුකර තිබෙන්නේ ට්‍රැමඩෝල් පෙති වර්ගය වන අතර එහිදී විදේශීය ජාතිකයින් වන, පකිස්ථාන හා ඉන්දියානු ජාතිකයින් දෙදෙනෙකු ද ඖෂධ ළඟ තබා ගැනීමේ වරදට අත්අඩංගුවට ගෙන ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මෙරට ඖෂධ ජාවාරම සිදුවන බවත් ඖෂධ දුර්භාවිතයෙහි ප්‍රවණතාවක් තිබෙන බවට ද මෙමඟින් අනාවරණය කරගත හැකිය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය මඟින් 2016 - 2017 වර්ෂවලදී සිදුකළ විවිධ පර්යේෂණ මඟින් ද හෙරොයින් භාවිතයේ ව්‍යාප්තිය සමඟම මාදක සහ මනෝවර්තක භාවිතයෙහි ද සුළු වර්ධනයක් පෙන්නුම් කරන බව අනාවරණය කරගෙන තිබේ. කාලයත් සමඟ හෙරොයින් මිල අධික වීමත්, හෙරොයින් වෙළඳපළේ නොමැති වීමේ තත්ත්ව මත පුද්ගලයින් මාදක සහ මනෝවර්තක භාවිතයට යොමු වී ඇති බව සිදු කළ පර්යේෂණවලින් අනාවරණය වී ඇත.

එමෙන්ම අවුරුදු 15 - 25 අතර තරුණ ප්‍රජාව අතර ඖෂධ අනිසි භාවිතයට යොමු වීමේ නව ප්‍රවණතාවක් සහ අධි අවදානමක් ඇති බව එම පර්යේෂණ මඟින් අනාවරණය කර ඇත.

මණ්ඩලයේ පර්යේෂණ අංශය විසින් (2016 - 2017) සිදු කළ සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනයේ අනාවරණවලට පුද්ගලයින් 50 දෙනෙකුගෙන් යුතු නියැදියෙන් පුද්ගලයින් 26 (52%) දෙනෙක් විවිධ වර්ගයේ ඖෂධමය පෙති වර්ග භාවිත කර ඇත. ඔවුන් සියලු දෙනාම වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරනු ලබන ඖෂධ වර්ග අවභාවිත කිරීම සිදුකර ඇත. ඖෂධමය පෙති වර්ග භාවිත කරන පුද්ගලයින් 26 දෙනා අතර Diazepam, Tramadol, Pregabalin, Rohypnol, Burbitone, Psedoephidrine වැනි ඖෂධ වර්ග භාවිත කර ඇත. බොහෝ පුද්ගලයින් අවස්ථානුකූලව පෙති වර්ග එකක් හෝ කිහිපයක් භාවිත කර ඇති අතර රාත්‍රී සමාජශාලා සාද වලදී මෙන්ම වෙනත් බාහිර අවස්ථාවන්වලදී ද ඔවුන් මෙවැනි ඖෂධමය පෙති වර්ග භාවිත කිරීම සිදු කරන බව ද අධ්‍යයනය තුළින් අනාවරණය කර ඇත. තවද ඖෂධ වර්ග ලබාගැනීමේ දී ඔවුන් ඖෂධහල් හෝ වෙනත් පෙති වර්ග නීතිවිරෝධී ලෙස අලෙවි කරන පුද්ගලයින් මාර්ගයෙන් ලබාගැනීම සිදුකරන බව ද එම අධ්‍යයනය තුළින් අනාවරණය කර ඇත (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 2017).

පර්යේෂණ අංශය විසින් (2016 - 2017) සිදු කළ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් දිවයිනේ තෝරාගත් පොලිස් බලප්‍රදේශ 28 ක් ඇසුරින් "මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය හා නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක්" සිදුකර ඇත. හිමබෝල නියැදි ක්‍රමය (Snow Balling Technique) භාවිත කරමින් දත්තදායකයින් 1079 ක් මෙම අධ්‍යයනයට ලක්කර ඇති අතර ඒ අතරින් පුද්ගලයින් 72 (7%) ක් පෙති වර්ග භාවිත කරන බවට තොරතුරු අනාවරණය වී ඇත. එයින් 16 දෙනෙක් දිනපතා පෙති වර්ග දුර්භාවිත කරන පුද්ගලයින් වූ අතර එම පුද්ගලයින් භාවිත කරන ඖෂධ වර්ග පිළිබඳ විමසීමේදී බොහෝ පුද්ගලයින් ඖෂධ වර්ග එකක් හෝ කිහිපයක් භාවිත කරන බවට තොරතුරු අනාවරණය වී ඇත. නියැදිය තුළ නියෝජනය වූ ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින්ගෙන් 50 දෙනෙක් Pseudoephedrine පෙති වර්ගය භාවිත කර තිබුණි. ඊට අමතරව Tramadol භාවිත කරන පුද්ගලයින් 39 දෙනෙක්, Morphine පෙති භාවිත කරන පුද්ගලයින් 36 දෙනෙක් සහ Diazepam භාවිත කරන පුද්ගලයින් 31 දෙනෙක් ද නියැදිය තුළ නියෝජනය වී තිබුණි. මේ අනුව පැහැදිලි වන්නේ, මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතර ඖෂධ දුර්භාවිතයෙහි ප්‍රවණතාවක් ද හඳුනාගත හැකි බවයි.

මේ අනුව දේශීය සහ ගෝලීය වශයෙන් මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාවක් පවතින බව සිදු කරන ලද පර්යේෂණ වාර්තා සහ අන්තර්ජාතික වාර්ෂික වාර්තා ඇසුරෙන් තහවුරු කරගත හැකිය.

3 ප්‍රතිඵල හා සාකච්ඡාව

3.1 මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සහ සමාජ විද්‍යාත්මක පැතිකඩ

3.1.1 දත්තදායකයින්ගේ වාසස්ථාන/ පදිංචි ප්‍රදේශ

මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයෙහි ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය තුළ දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස දිස්ත්‍රික්ක 10 ක් තෝරා ගත් අතර එම දිස්ත්‍රික්කවල ජීවත්වන පුද්ගලයින්ගෙන් මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 1000 ක් අධ්‍යයනයට ලක් කරන ලදි. මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වැඩි සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්තව ඇති බැවින් එම දිස්ත්‍රික්කයෙන් පුද්ගලයින් 535 ක සංඛ්‍යාවක් අධ්‍යයනය කළ අතර අනෙකුත් දිස්ත්‍රික්කවල පදිංචි පුද්ගලයින්ගේ ව්‍යාප්තිය පහත පරිදි හඳුනාගත හැකිය.

වගු අංක 02 - මාදක සහ මනෝවර්තක භාවිත කරන දත්තදායකයින් ජීවත්වන ප්‍රදේශ

දිස්ත්‍රික්කය	මාදක සහ මනෝවර්තක භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව	%
කොළඹ	535	53.5
ගම්පහ	159	15.9
කලුතර	46	4.6
මහනුවර	50	5
ගාල්ල	45	4.5
මාතර	29	2.9
කුරුණෑගල	45	4.5
පුත්තලම	28	2.8
අනුරාධපුර	28	2.8
රත්නපුර	35	3.5
එකතුව	**1000**	**100**

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

මේ අනුව පැහැදිලි වන්නේ, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ඖෂධ දුර්භාවිතයෙ හි සැළකිය යුතු වර්ධනයක් පවතින බවයි. මීට අමතරව කුරුණෑගල, කළුතර, ගාල්ල යන දිස්ත්‍රික්ක වඩාත් අවදානම් සහගත තත්ත්වයක පවතී.

3.1.2 ස්ත්‍රී පුරුෂ සංයුතිය

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අධ්‍යයනයට ලක්කළ නියැදියේ දත්තදායකයින්ගෙන් පුද්ගලයින් 984 (98%) දෙනෙක් පුරුෂයින් වූ අතර 16 (2%) දෙනෙක් ස්ත්‍රීන් විය. මේ අනුව පුද්ගලයින් බහුතරයක් පුරුෂ පක්ෂය වූහ.

ප්‍රස්තාර අංක 02 - ස්ත්‍රී පුරුෂ සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.1.3 වයස් මට්ටම

මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින්ගේ වයස් මට්ටම පිළිබඳව සළකා බැලීමේ දී භාවිත කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, පුද්ගලයින් 333 (33%) දෙනෙක් වයස අවුරුදු 21 - 25 අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් විය. පුද්ගලයින් 263 (26%) දෙනෙක් වයස අවුරුදු 26 - 30 අතර වයස් කාණ්ඩයට ද, 199 (20%) දෙනෙක් අවුරුදු 14 - 20 වයස් කාණ්ඩයට ද, 120 (12%) දෙනෙක් අවුරුදු 31 - 35 වයස් කාණ්ඩයට ද, 85 (9%) දෙනෙක් අවුරුදු 36 - 44 අතර වයස් කාණ්ඩයට ද අයත් විය.

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 21 - 25 අතර වයසේ නිසා තරුණ ප්‍රජාව මනෝවර්තක ඖෂධ දුර්භාවිතයට යොමු වී ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාර අංක 03 - දත්තදායකයින්ගේ වයස් මට්ටම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.1.4 ජනවාර්ගික සංයුතිය

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගේ ජනවාර්ගික තත්ත්වය පිළිබඳ විමසීමේ දී පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 901 (90%) දෙනෙක් සිංහල වූ අතර පුද්ගලයින් 57 (5.7%) දෙනෙක් මුස්ලිම් ද, 40 (4%) දෙනෙක් දමිළ ජාතිකයින් ලෙස අධ්‍යයන නියැදියට ඇතුළත් විය. පුද්ගලයින් 2 (0.2%) දෙනෙක් බර්ගර් ජාතිකයින් ද, එක් පුද්ගලයෙක් මැලේ ජාතිකයෙක් (0.1%) වශයෙන් නියැදිය තුළ නියෝජනය විය.

ප්‍රස්තාර අංක 04 - ජනවාර්ගික සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.1.5 ආගමික සංයුතිය

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින් බහුතරයක් සිංහල ජාතිකයින් වූ අතර ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 720 (72%) දෙනෙක් බෞද්ධ ආගමිකයින් වූ අතර 160 (16%) දෙනෙක් ක්‍රිස්තියානි ආගමිකයින් ද, 57 (6%) දෙනෙක් ඉස්ලාම් ආගමිකයින් ද, පුද්ගලයින් 36 (3%) දෙනෙක් රෝමානු කතෝලික ආගමිකයින් ද, 27 (3%) දෙනෙක් හින්දු භක්තිකයින් ද නියැදිය තුළ නියෝජනය විය.

ප්‍රස්තාර අංක 05 - ආගමික සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.1.6 විවාහක අවිවාහක සංයුතිය

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින් පිළිබඳ තොරතුරු සහ ඔවුන්ගේ විවාහක අවිවාහක බව අතර සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 621 (62%) දෙනෙක් අවිවාහකයින් විය. පුද්ගලයින් 314 (31%) දෙනෙක් විවාහකයින් ද, 19 (2%) දෙනෙක් විවාහ නොවී එකට ජීවත්වන පුද්ගලයින් ද, 19 (2%) ක් දික්කසාද අය සහ විවාහ වී වෙන්ව ජීවත්වන පුද්ගලයින් 27 (3%) දෙනෙක් ද සිටි බව අනාවරණය විය.

ප්‍රස්තාර අංක 06 - විවාහක අවිවාහක සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

මේ අනුව බහුතරයක් පුද්ගලයින් අවිවාහක පුද්ගලයින් බව අනාවරණය කරගෙන ඇත.

3.1.7 අධ්‍යාපන මට්ටම

නියැදියට ඇතුළත් වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී බහුතරයක් පුද්ගලයින් එනම්, 517 (52%) දෙනෙක් 6 - 10 වසර දක්වා අධ්‍යාපනය ලැබූ පුද්ගලයින් වූහ. පුද්ගලයින් 315 (32%) දෙනෙක් සා. පෙළ සමත් පුද්ගලයින් ද, 82 (8%) දෙනෙක් උ.පෙළ සමත් පුද්ගලයින් ද, 50 (5%) දෙනෙක් 1 - 5 වසර දක්වා අධ්‍යාපනය ලබා ඇති බව ද අනාවරණය විය. මාදක සහ මනෝවර්තක භාවිත කරන පුද්ගලයින්ගෙන් 18 (2%) දෙනෙක් ඩිප්ලෝමාධාරීන් ද, 9 (1%) දෙනෙක් උපාධි හෝ පශ්චාද් උපාධි මට්ටම දක්වා අධ්‍යාපනයක් ලබා ඇති බව ද අධ්‍යයනය තුළින් අනාවරණය විය.

ප්‍රස්තාර අංක 07 - අධ්‍යාපන මට්ටම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.1.8 රැකියා සංයුතිය

අධ්‍යයනයට ලක්කළ නියැදියේ මාදක සහ මනෝවර්තක ද්‍රව්‍ය භාවිත කරන දත්තදායකයින්ගේ රැකියාව සම්බන්ධව විශ්ලේෂණය කිරීමේ දී නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 205 (21%) දෙනෙක් නුපුහුණු ශ්‍රමිකයින් ලෙස අනාරවරණය වූ අතර 174 (17%) දෙනෙක් රියදුරු වෘත්තියේ ද, 141 (14%) දෙනෙක් වෙළඳාම් කටයුතුවල නිරත වී ඇති බව හෙළිවිය. පුද්ගලයින් 94 (9%) දෙනෙක් කිසිඳු රැකියාවක් නොකරන අතර 48 (5%) දෙනෙක් ධීවර කටයුතුවල නිරත වී ඇති අතර 40 (4%) දෙනෙක් ව්‍යාපාරික කටයුතුවල නිරත වී ඇති අතර 52 (5%) දෙනෙක් රැකියාව සඳහන් කර නොතිබුණි.

පුද්ගලයින් 56 (6%) දෙනෙක් ශිෂ්‍යයින් වූහ. තවද පුද්ගලයින් 28 (3%) දෙනෙක් පෞද්ගලික අංශයේ රැකියාවල ද, පුද්ගලයින් 12 (1%) දෙනෙක් ස්වයං රැකියාවල ද, 10 (1%) දෙනෙක් පුහුණුකරුවන් වශයෙන් ද, 14 (1%) දෙනෙක් උපදේශක වෘත්තියෙහි ද නිරත වී ඇති බව අනාවරණය විය.

කාන්තාවන් 03 (0.3%) දෙනෙක් ගණිකා වෘත්තියෙහි නිරත වන බව ද, 05 (0.5%) දෙනෙක් කොන්දොස්තරවරුන් වශයෙන් ද, 7 (1%) දෙනෙක් රජයේ සේවකයින් ද, 03 (0.3%) දෙනෙක් ගොවිතැන් කටයුතු සිදුකිරීම ද, ලිපිකරුවන් ද, කළමනාකරුවන් ද, විදේශ රැකියාවල නිරත වූවන් වශයෙන් ද නිරත වී ඇති බව අනාවරණය විය.

මීට අමතරව ආරක්ෂක අංශයේ නිලධාරීන් 07 (1%) දෙනෙක් ද, රැකියාව වශයෙන් මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයෙක් ද වාර්තා වී ඇත. එසේම විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු ද සිටි අතර පරිගණක ක්‍රියාකරුවන් දෙදෙනෙකු ද මෙම නියැදිය තුළ නියෝජනය වී ඇත.

මේ අනුව නියැදියේ බහුතරයක් කම්කරු වෘත්තියේ නිරත වූ අය වූ අතර ඊට අමතරව රියදුරු වෘත්තියේ නිරතවන්නන් වූ බව තහවුරු විය.

ප්‍රස්තාර අංක 08 - දත්තදායකයින්ගේ රැකියා සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

වගු අංක 03 - දත්තදායකයින්ගේ සමාජ ප්‍රජා විද්‍යාත්මක සාධක

සමාජ ප්‍රජා විද්‍යාත්මක සාධක	මාදක සහ මනෝවර්තක භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව	ප්‍රතිශතය %
ස්ත්‍රී පුරුෂ භාවය		
පුරුෂ	984	98.4%
ස්ත්‍රී	16	1.6%
වයස		
අවුරුදු 14 - 20	199	19.9%
21 - 25	333	33.3%
26 - 30	263	26.3%
31 - 35	120	12%
36 - 44	85	8.5%
ජනවර්ගය		
සිංහල	901	90.1%
දෙමළ	40	04%
මුස්ලිම්	57	5.7%
බර්ගර්	02	0.2%
මැලේ	00	00
ආගම		
බෞද්ධ	720	72%
හින්දු	27	2.7%
ඉස්ලාම්	57	5.7%
ක්‍රිස්තියානි	160	16%
රෝමානු කතෝලික	36	3.6%

අධ්‍යාපන මට්ටම		
අධ්‍යාපනයක් නොලද	9	0.9%
1 - 5 වසර දක්වා	50	5%
6 - 10 වසර දක්වා	517	51.7%
සා. පෙළ සමත්	315	31.5%
උ.පෙළ සමත්	82	8.2%
ඩිප්ලෝමාධාරී	18	1.8%
උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපනයක් ලැබූ	09	0.9%
විවාහක/අවිවාහක බව		
විවාහක	314	31.4%
අවිවාහක	621	62.1%
විවාහ නොවී එකට ජීවත්වන	19	1.9%
දික්කසාද	19	1.9%
විවාහක වෙන්ව ජීවත් වන	27	2.7%
වැන්දඹු		

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.2 දත්තදායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත ඉතිහාසය

අධ්‍යයනයට ලක්කළ නියැදියේ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත ඉතිහාසය පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන නිර්ණායක කිහිපයක් යටතේ විග්‍රහ කිරීම සිදුකළ හැකිය. එනම්,

01. කවදා හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය

02. පසුගිය මාස 12 තුළ මත්ද්‍රව්‍ය භාවිතය

03. පසුගිය මාස 03 තුළ මත්ද්‍රව්‍ය භාවිතය

3.2.1 දත්තදායකයින් භාවිත කළ මත්ද්‍රව්‍ය

මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී එම පුද්ගලයින් කෙදිනකදී හෝ භාවිත කර තිබෙන මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින් 1000 දෙනා අතරින් 962 (96%) දෙනෙක් කෙදිනකදී හෝ සිගරැට් දුම්වැටි භාවිත කර ඇති බව අනාවරණය විය. පුද්ගලයින් 915 (92%) දෙනෙක් මද්‍යසාර භාවිත කර ඇති අතර 818 (82%) දෙනෙක් ගංජා භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය විය. 462 (46%) දෙනෙක් හෙරොයින් භාවිත කර තිබූ අතර 219 (22%) දෙනෙක් නීතිවිරෝධී මද්‍යසාර ද, 134 (13%) දෙනෙක් කොකේන් ද, 117 (12%) දෙනෙක් LSD ද භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය විය.

නියැදියට අයත් වූ පුද්ගලයින් සියලු දෙනාම කෙදිනක හෝ ඖෂධ භාවිත කර ඇති අතර එම පුද්ගලයින්ගෙන්, 983 (98%) දෙනෙක් කෙදිනක හෝ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කර ඇති අතර එම පුද්ගලයින්ගෙන් 322 (32%) දෙනෙක් කෙදිනක හෝ සිරප් වර්ග භාවිත කර ඇති බවට ද තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 09 - දත්තදායකයින් කවදා හෝ භාවිත කළ මත්ද්‍රව්‍යය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

ඉහත ප්‍රස්තාරයට අනුව මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින් කෙදිනක හෝ වෙනත් මත්ද්‍රව්‍ය වර්ග ද භාවිත කර තිබෙන අතර එමනිසා සියලුම පුද්ගලයින් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (Poly Drug Users) බව ද අධ්‍යයනය තුළින් අනාවරණය විය.

3.2.2 පසුගිය වසර ඇතුළත ඖෂධ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ මාදක හා මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින් පසුගිය වසර ඇතුළත භාවිත කර ඇති මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේදී පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 944 (94%) දෙනෙක් සිගරට්/දුම්වැටි භාවිත කර ඇත. පුද්ගලයින්ගෙන් 833 (83%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද, 677 (68%) දෙනෙක් ගංජා ද, 374 (37%) දෙනෙක් හෙරොයින් ද, 71 (7%) දෙනෙක් නීතිවිරෝධී මද්‍යසාර ද, 33 (3%) දෙනෙක් කොකේන් ද භාවිත කර ඇති බව අනාවරණය විය.

පුද්ගලයින්ගෙන් 944 (94%) දෙනෙක් පසුගිය වසර ඇතුළත දී මාදක හා මනෝවර්තක ඖෂධ භාවිත කිරීම සිදු කර ඇති බවට අනාවරණය විය. එයින් 83 (8%) දෙනෙක් සිරප් වර්ග භාවිත කර ඇත. පුද්ගලයින්ගෙන් 33 (4%) දෙනෙක් LSD භාවිත කර ඇති බව අධ්‍යයන නියැදිය තුළින් තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 10 - පසුගිය වසර තුළ භාවිත කළ මත්ද්‍රව්‍ය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.2.3 පසුගිය මාස තුන තුළ භාවිත කළ ඖෂධ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වර්ගයන්හි සංයුතිය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් පසුගිය මාස තුන තුළ දී භාවිත කර ඇති ඖෂධ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය ලෙස පුද්ගලයින්ගෙන් 932 (93%) දෙනෙක් සිගරට්/දුම්වැටි භාවිත කර ඇත. පුද්ගලයින් 768 (77%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද, 602 (60%) දෙනෙක් ගංජා ද, 334 (33%) දෙනෙක් හෙරොයින් ද භාවිත කර ඇත. මීට අමතරව 56 (6%) දෙනෙක් නීතිවිරෝධී මද්‍යසාර ද, 29 (3%) දෙනෙක් කොකේන් ද, 26 (3%) දෙනෙක් LSD ද භාවිත කර ඇති බවට අනාවරණය විය.

පසුගිය මාස තුන තුළ දී අධ්‍යයන නියැදියේ එනම්, 917 (92%) දෙනෙක් මාදක හා මනෝවර්තක ඖෂධ භාවිත කිරීම සිදු කර ඇත. ඒ අතුරින් 70 (7%) දෙනෙක් සිරප් භාවිත කර ඇත.

ප්‍රස්තාර අංක 11 - පසුගිය මාස තුන තුළ භාවිත කර ඇති මත්ද්‍රව්‍ය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.2.4 ප්‍රථම වරට මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ වයස් මට්ටම්වල සංයුතිය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ මාදක හා මනෝවර්තක ඖෂධ ප්‍රථම වරට භාවිත කළ පුද්ගලයින්ගේ වයස් මට්ටම හඳුනා ගැනීමේ දී පුද්ගලයින් 584 (58%) දෙනෙක් වයස අවුරුදු 16 - 20 අතර වයස් සීමාවේ දී ද, පුද්ගලයින් 215 (22%) දෙනෙක් අවුරුදු 21 - 25 අතර වයස් සීමාවේදී ද, 120 (12%) දෙනෙක් අවුරුදු 25 ට වැඩි වයස් සීමාවේදී ද, 81 (8%) දෙනෙක් අවුරුදු 11 - 15 අතර වයස් සීමාවේ දී එනම්, පාසල් වයසේදී ප්‍රථම වතාවට භාවිත කර ඇති බවට අධ්‍යයනය තුළින් අනාවරණය විය. මේ අනුව පැහැදිලි වන්නේ, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා අවදානම් වයස අවුරුදු 11 වන බවයි.

ප්‍රස්තාර අංක 12 - ප්‍රථම වරට මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ වයස් මට්ටම්වල සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.3 එක් එක් මාදක මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය ආරම්භ කළ වයස

ප්‍රථම වතාවට මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ වයස පිළිබඳව සළකා බැලීමේ දී පුද්ගලයින් 584 දෙනෙක් වයස අවුරුදු 16 - 20 අතර වයස්වල දී ඖෂධ භාවිතය කෙරෙහි යොමු වී ඇත. එම පුද්ගලයින්ගෙන් 227 (39%) දෙනෙක් Tramadol ඖෂධය භාවිත කර ඇත. පුද්ගලයින් 125 (21%) දෙනෙක් Corex D සිරප් වර්ගය ද, 79 (14%) දෙනෙක් Pregabalin ද, 77 දෙනෙක් MDMA (Ecstasy) ද භාවිත කර ඇති බව තහවුරු විය. මේ අනුව ඖෂධ භාවිත කරන වැඩි පුද්ගල සංඛ්‍යාවක් වයස අවුරුදු 16 - 20 අතර වයස් මට්ටමට අයත් පුද්ගලයින් වූ බව තහවුරු විය.

ඊට අමතරව අවුරුදු 11 - 15 අතර වයස් මට්ටමට අයත් පුද්ගලයින් ද, මාදක සහ මනෝවර්තක ඖෂධ සඳහා යොමුවීමේ ප්‍රවණතාවක් ද හඳුනාගත හැකිවිය. මෙම වයස් මට්ටමට අයත් පුද්ගලයින් 81 දෙනෙක් ප්‍රථම වරට ඖෂධ භාවිතය සිදු කර ඇති අතර එම පුද්ගලයින් අතුරින් 23 (28%) දෙනෙක් Corex D භාවිත කර ඇති බව අධ්‍යයනය මඟින් තහවුරු විය. ඊට අමතරව 22 (27%) දෙනෙක් Tramadol ද, 12 (15%) දෙනෙක් MDMA (Ecstasy) ද, 7 (9%) දෙනෙක් Diazepam ද 6 (7%) දෙනෙක් Pregabalin ද භාවිත කර ඇති බවට තහවුරු විය. ඒ අනුව පුද්ගලයකු මත්ද්‍රව්‍යයට යොමු වීමේ අවදානම් වයස වශයෙන් වයස අවුරුදු 11 දක්වා අඩු වී ඇති බව මෙම අධ්‍යයනය මඟින් තහවුරු විය.

ප්‍රස්තාර අංක 13 - මාදක, මනෝවර්තක ඖෂධ වර්ගය සහ වයස අතර සම්බන්ධය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.4 ප්‍රථම වතාවට භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග

පුද්ගලයින් ප්‍රථම වතාවට භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග මොනවාද? යන්න හඳුනා ගැනීමේ දී ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගෙන් 412 (41%) දෙනෙක් Tramadol ඖෂධය භාවිත කර ඇති බව අනාවරණය විය. පුද්ගලයින් 182 (18%) දෙනෙක් Corex D ද, 150 (15%) දෙනෙක් Pregabalin ද, 101 (10%) දෙනෙක් MDMA ද ප්‍රථම වරට මාදක සහ මනෝවර්තක ඖෂධ ලෙස භාවිත කර ඇත. එසේම පුද්ගලයින් 83 (8%) දෙනෙක් Diazepam ද, 26 (3%) දෙනෙක් Benzhexol ද, 22 (2%) Morphine ද, 14 (1%) දෙනෙක් Rohypnol ද ප්‍රථම වතාවට භාවිත කර ඇති බව හෙළිවිය.

ප්‍රස්තාර අංක 14 - ප්‍රථම වරට භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.5 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ප්‍රථම භාවිතය

ප්‍රථම වතාවට මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගේ වයස් සංයුතිය, භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග මෙන්ම මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ අවස්ථාව ද ඉතා වැදගත් වේ. අධ්‍යයන නියැදිය තුළ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගෙන් 698 (70%) දෙනෙක් මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක ප්‍රථම වතාවට ඖෂධ භාවිත කර ඇති බව අනාවරණය විය. පුද්ගලයින් 109 (11%) දෙනෙක් උත්සව අවස්ථාවකදී ද, 45 (5%) දෙනෙක් වෙරළ සාදවල දී ද, මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර ඇති අතර 30 (3%) දෙනෙක් රාත්‍රී සමාජ ශාලාවලදී ද, 27 (3%) දෙනෙක් ලිංගික සංසර්ගයේ යෙදෙන අවස්ථාවලදී ද, 17 (2%) දෙනෙක් හෙරොයින් නොමැතිවිට එහි විරමණ ලක්ෂණ මඟහරවා ගැනීමට ද ප්‍රථම වතාවට ඖෂධ භාවිත කර ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. එසේම 4 (0.4%) දෙනෙක් වේදනා නාශකයක් වශයෙන් ද, අවමංගල්‍ය උත්සව අවස්ථාවේදී ද ප්‍රථම වතාවට භාවිත කර ඇති බව හෙළිවිය.

ප්‍රස්තාර අංක 15 - මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ප්‍රථම භාවිතය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

මාදක, මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ අවස්ථාව පිළිබඳව සළකා බැලීමේ දී එනම්, බහුතරයක් මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක දී මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කිරීමට යොමු වී තිබීම

අධ්‍යයනය මඟින් තහවුරු ගන්නා ලදී. ප්‍රථම වරට Tramadol භාවිත කළ පුද්ගලයින් 412 දෙනාගෙන් 318 (77%) දෙනෙක් මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක භාවිත කර ඇති බව තහවුරු කර ගන්නා ලදී. Pregabalin භාවිත කළ 150 දෙනාගෙන් 114 (76%) දෙනෙක් ද, Corex D භාවිත කළ පුද්ගලයින් 182 දෙනාගෙන් 131 (72%) දෙනෙක් ද, Diazepam භාවිත කළ 83 දෙනාගෙන් 61 (73%) දෙනෙක් ද, Rohypnol භාවිත කළ 14 දෙනාගෙන් 13 (93%) දෙනෙක් ද මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක ප්‍රථම වරට මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කර ඇත.

ඒ අනුව බහුතරයක් පුද්ගලයින් මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක දී භාවිත කර තිබුණ ද MDMA (Ecstasy) භාවිත කළ බහුතරයක් පුද්ගලයින් උත්සව අවස්ථාවකදී භාවිත කර ඇති බවට අනාවරණය විය. MDMA (Ecstasy) විනෝදකාමී අවස්ථා වලදී (Recreational) භාවිත කරන මනෝකාරක ද්‍රව්‍යයක් බව මීට පෙර සිදු කරන ලද පර්යේෂණවලින් ද තහවුරු කරගෙන ඇත. ඒ අනුව MDMA (Ecstasy) භාවිත කළ පුද්ගලයින් 101 දෙනාගෙන් 59 (58%) දෙනෙක් උත්සව අවස්ථාකදී භාවිත කර ඇති අතර පුද්ගලයින් 20 (20%) දෙනෙක් යහළුවන් සමඟ එකතු වූ අවස්ථාවකදී ද, තවත් පුද්ගලයින් 20 (20%) දෙනෙක් රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදවලදී ද භාවිත කර ඇති බවට තහවුරු විය. මේ අනුව ප්‍රථම වරට භාවිත කළ මාදක, මනෝවර්තක ඖෂධ භාවිතය මිතුරු ඇසුර සහ උත්සව අවස්ථාව අතර සම්බන්ධයක් පවතින බව සඳහන් කළ හැකිය.

ප්‍රස්තාර අංක 16 - මාදක, මනෝවර්තක ඖෂධ භාවිතය හා මිතුරු ඇසුර, උත්සව අවස්ථාව අතර සම්බන්ධය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

එක් එක් ඖෂධ වර්ග වශයෙන් ගත්විට බොහෝ ඖෂධ වර්ග භාවිත කිරීම සඳහා එකම අවස්ථාවක් යොදා ගෙන ඇත. නමුත් තවත් සමහර මනෝකාරක ද්‍රව්‍ය භාවිත කිරීම සඳහා වෙනත් අවස්ථා යොදා ගෙන තිබීම ද හඳුනාගත හැකිය. විශේෂයෙන්ම උත්සව අවස්ථාවලදී මෙන්ම රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද වලදී MDMA (Ecstasy) භාවිත කර ඇති බව මෙමඟින් තහවුරු වී ඇත. ඒ අනුව මනෝවර්තක ඖෂධ භාවිත කිරීමේදී සමීප මිතුරන් ප්‍රධාන බලපෑම් සාධකයක් (Influencing factor) වී ඇති අතර මනෝකාරක ද්‍රව්‍ය භාවිත කිරීම සඳහා උත්සව අවස්ථා සහ රාත්‍රී සමාජශාලා මෙන්ම වෙරළ සාද වැනි අවස්ථා බහුලව යොදා ගෙන ඇති බව ඉහත ප්‍රස්තාර සටහනට අනුව වඩාත් තහවුරු වේ.

3.6 ඖෂධ වර්ග භාවිත කිරීමේ ප්‍රථම අත්දැකීම

මධ්‍ය ස්නායු පද්ධතියට බලපෑම් කරන විලාසය, සංජානනය හෝ විඥානය වැනි මානසික තත්ත්ව වෙනස් කරනු ලබන බයිපෝල අක්‍රමිකතා සඳහා හෝ යම් පෞරුෂ අක්‍රමිකතා සඳහා වෛද්‍ය අනුමැතිය ඇතිව මාදක සහ මනෝවර්තක ඖෂධ රෝගීන් සඳහා ලබාදෙන අතර වෛද්‍ය නිර්දේශයකින් තොරව ඒවා භාවිත කිරීම නිසා පුද්ගලයින්ගේ සංජානනය මෙන්ම එක් එක් පුද්ගලයාට ලැබෙන අත්දැකීම එකිනෙකාට වෙනස් වේ.

එක් එක් පුද්ගලයාට දැනුණ අත්දැකීම් විශ්ලේෂණය කිරීමේදී අධ්‍යයනයට ලක්කළ නියැදියේ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ පුද්ගලයින් එම ඖෂධ භාවිත කිරීමෙන් පසුව ලැබුණු ප්‍රථම අත්දැකීම පිළිබඳව ඔවුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කර ඇති අතර එක් එක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ගය සඳහා එක් එක් පුද්ගලයින්ට ලැබුණු අත්දැකීම්වල විවිධත්වය මෙමඟින් අනාවරණය විය. ඒ අනුව පුද්ගලයින් 412 දෙනෙක් ප්‍රථම වරට Tramadol ඖෂධය භාවිත කර ඇති අතර එම පුද්ගලයින්ට ලැබුණු අත්දැකීම මේ ආකාරයට හඳුනාගත හැකිය. පුද්ගලයින් 95 (23%) දෙනෙක් Tramadol ඖෂධය භාවිත කිරීම නිසා නිද්‍රාජනක තත්ත්වයක් පළමු අත්දැකීම වූ බව ප්‍රකාශ කර තිබුණි. "නිදිමත ගතියක් ආවා", "Slow වුණා වගේ දැණුනා", "අමතක වුණා" වැනි ප්‍රකාශ තුළින් ඒ බව තවදුරටත් තහවුරු වේ. පුද්ගලයින් 83 (20%) දෙනෙක් Tramadol ඖෂධය භාවිත කිරීමෙන් පසුව කායික අපහසුතා ඇති වී ඇති බව අධ්‍යයනය තුළින් ප්‍රකාශ කර තිබුණි. "ඇඟ තලලා දාලා වගේ", "වමනේ ගියා", "බඩේ දැවිල්ල ආවා", "මස් පිඬු රිදෙනවා", "හුස්ම ගන්න වේගේ වැඩි වුණා" වැනි ප්‍රකාශ උදාහරණ වේ. පුද්ගලයින් 37 (9%) දෙනෙක් Tramadol ඖෂධය භාවිත කිරීමෙන් පසුව ශක්තිය වැඩි වීමක් සිදුවන බව දක්වා ඇත. "ඕනි දෙයක් කරන්න පුළුවන්", "ඇඟට Fit එකක් ආවා", "අමුතු ප්‍රාණවත් බවක් ඇති වුණා" වැනි ප්‍රකාශ ඊට උදාහරණ වේ. පුද්ගලයින් 35 (9%) දෙනෙක් Tramadol ඖෂධය භාවිත කිරීමෙන් නොයෙක් මායාවන් භ්‍රාන්තීන් ඇති වී තිබෙන බව ප්‍රකාශ කර තිබුණි. "අහසෙ පාවෙනවා වගේ", "වෙන ලෝකෙකට ගියා වගේ", "අත් උඩ ගියා", "හිත මගේ ළඟ නෑ වගේ" වැනි අත්දැකීම් ලබා ඇති බව ප්‍රකාශ කරන ලදි.

පුද්ගලයින් 150 දෙනෙක් Pregabalin ඖෂධය ප්‍රථම වරට භාවිත කිරීම නිසා ඔවුන් ලැබූ පළමු අත්දැකීම ලෙස එම පුද්ගලයින්ගෙන් 39 (26%) දෙනෙක් සතුට දනවන හැඟීම් සිය පළමු අත්දැකීම වී ඇති බව ප්‍රකාශ කරන ලදි. පුද්ගලයින් 34 (23%) දෙනෙක් මත්ගතියට වැඩි කැමැත්තක් දැක්වීම ද, පුද්ගලයින් 31 (21%) දෙනෙක් Pregabalin ඖෂධය භාවිත කිරීමෙන් පසු මානසික ව්‍යාකූලතාවන්ට පැමිණ ඇත. පුද්ගලයින් 25 (17%) දෙනෙක්ට මායාවන් භ්‍රාන්තීන් ඇති වී තිබෙන බව ප්‍රකාශ කරන ලදි. පුද්ගලයින් 20 (13%) දෙනෙක්ට මානසික ශක්තීන් වර්ධනය වන අත්දැකීමක් ලැබී ඇති බව අනාවරණය විය. "ධාරණ ශක්තිය වැඩියි", "ඉක්මනින් තීරණ ගන්න පුළුවන්", "Stress අඩු වෙනවා" වැනි ප්‍රකාශ එයට උදාහරණ වේ.

පුද්ගලයින් 33 (40%) දෙනෙක් Diazepam ඖෂධය භාවිත කිරීමෙන් පසු නිද්‍රාජනක තත්ත්වයක් පළමු අත්දැකීම වූ බව අනාවරණය විය. එසේම 14 (17%) දෙනෙක්ට නොයෙක් මායාවන් භ්‍රාන්තීන් ඇති වී තිබෙන බව අනාවරණය වී ඇත. පුද්ගලයින් 13 (16%) දෙනෙකුට සතුට දනවන හැඟීම් සිය පළමු අත්දැකීම වී ඇති බව අනාවරණය විය. තවත් 13 (16%) දෙනෙකුට කායික අපහසුතා ඇති වී ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය වේ.

පුද්ගලයින් 101 දෙනෙක් ප්‍රථම වරට MDMA භාවිත කර ඇති අතර එමනිසා ඔවුන් ලැබූ ප්‍රථම අත්දැකීම ලෙස, පුද්ගලයින් 55 (54%) දෙනෙක් සතුට දනවන හැඟීම් සිය පළමු අත්දැකීම වී ඇති බව ප්‍රකාශ කරන ලදි. 37 (37%) දෙනෙක් ශක්තිය වැඩි වීමක් සිදුවන බව ප්‍රකාශ කරන ලදි. පුද්ගලයින් 15 (15%) දෙනෙක් ට නොයෙක් මායාවන් භ්‍රාන්තීන් ඇති වී තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

ඖෂධ මෙන්ම පුද්ගලයින් සිරප් වර්ග භාවිත කිරීම ද සිදු කරන බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. පුද්ගලයින් 182 දෙනෙක් Corex D සිරප් වර්ගය භාවිත කර ඇති අතර පුද්ගලයින් 37 (20%)

දෙනෙක් Corex D සිරප් වර්ගය භාවිත කිරීම නිසා සතුට දනවන හැඟීම් සිය පළමු අත්දැකීම වී ඇති බව ප්‍රකාශ කරන ලදි. පුද්ගලයින් 33 (18%) දෙනෙක්ට නිද්‍රාජනක තත්ත්වයක් පළමු අත්දැකීම වූ බව ප්‍රකාශ කරන ලදි. විසිපස් (14%) දෙනෙක් ට නොයෙක් මායාවන් භ්‍රාන්තීන් ඇති වී තිබෙන බව ප්‍රකාශ කරන ලදි. විසිතුන් (18%) දෙනෙක් Corex D සිරප් වර්ගය භාවිත කිරීමෙන් පසුව කායික අපහසුතා ඇති වී ඇති බව ප්‍රකාශ කරන ලදි. තවද 17 (9%) දෙනෙක් ට මානසික ශක්තිය වැඩි වී ඇති වී ඇති බව ප්‍රකාශ කරන ලදි.

3.7 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමට බලපා ඇති හේතු සාධක

පුද්ගලයෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කිරීමට බලපා ඇති බහුවිධ හේතු සාධක පවතින බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. පුද්ගලයින්ගෙන් බහුතරයක් සඳහා එනම්, 642 (64%) දෙනෙක් සතුට, විනෝදය සඳහා මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කිරීමට යොමු වී ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. පුද්ගලයින්ගෙන් 514 (51%) දෙනෙක් මිතුරු බලපෑම නිසාද, 313 (31%) දෙනෙක් කුතුහලය නිසාද, 245 (25%) දෙනෙක් වෙනත් මත්ද්‍රව්‍යයකට ආදේශකයක් ලෙස භාවිත කිරීමට යොමු වී ඇති බවත්, 225 (23%) දෙනෙක් ගැටලු මඟහරවා ගැනීම සඳහා ද, 21 (2%) දෙනෙක් පාඩම් කිරීමට පහසු ක්‍රමයක් වශයෙන් ද, 8 (1%) දෙනෙක් ලිංගික තෘප්තිය සඳහා ද මනෝවර්තක ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කිරීමට යොමු වී ඇති බව අනාවරණය විය.

මේ අනුව බහුතරයක් සතුට විනෝදය නිසා සහ මිතුරු බලපෑම යන සාධක මත ඖෂධ අනිසි භාවිතයට යොමු වී ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාර අංක 17 - මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කිරීමට හේතු



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017

3.8 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයේ වර්තමාන තත්ත්වය

3.8.1 මාදක සහ මනෝවර්තක ඖෂධ සමඟ භාවිත කරන අනෙකුත් මත්ද්‍රව්‍ය වර්ග

සමස්ත නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර ඇති අතර එම සියලු දෙනාම බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (Multiple Drug Users) බව ද අධ්‍යයනය තුළින් අනාවරණය විය. එනම්, එක් මත්ද්‍රව්‍යයකට වඩා වැඩි මත්ද්‍රව්‍ය වර්ග ප්‍රමාණයක් භාවිත කර ඇති අතර දැනට මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන්නන් ඖෂධ දුර්භාවිතයට අමතරව අනෙකුත් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සිදුකරන බව ද අධ්‍යයනය තුළ අනාවරණය විය.

අධ්‍යයන නියැදියට අයත් පුද්ගලයින්ගෙන් 862 (86%) දෙනෙක් දැනට මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීම සිදු කරන බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. ඒ අතුරින් 52 (5%) දෙනෙක් සිරප් වර්ග භාවිත කිරීම සිදු කරන බව ද අනාවරණය විය.

කෙදිනක හෝ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ පුද්ගලයින්ගෙන් 925 (93%) දෙනෙක් දැනට සිගරැට්/දුම්වැටි භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය. පුද්ගලයින්ගෙන් 680 (68%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර, 538 (54%) දෙනෙක් ගංජා ද, 308 (31%) දෙනෙක් හෙරොයින් ද, 42 (4%) නීතිරෝධී මද්‍යසාර ද, 25 (3%) දෙනෙක් කොකේන් ද, 19 (2%) LSD ද භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 18 - දත්තදායකයින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය සමඟ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත තත්ත්වය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

අධ්‍යයනයට ලක්කළ නියැදිය තුළ නියෝජනය වූ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් දැනට භාවිත කරනු ලබන්නේ සිගරැට්/ දුම්වැටි ය. ඊට අමතරව නීත්‍යානුකූල මද්‍යසාර, නීතිවිරෝධී මද්‍යසාර, ගංජා සහ හෙරොයින් වැනි මත්ද්‍රව්‍යවලට ද යොමු වී ඇති බව අනාවරණය විය.

3.8.2 කෙදිනක හෝ භාවිත කර තිබෙන මාදක සහ මනෝවර්තක ඖෂධ

නියැදිය තුළ නියෝජනය වූ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කළ දත්තදායකයින්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව කෙදිනක හෝ වෛද්‍යමය නිර්දේශයකින් තොරව මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කරන බවට අධ්‍යයන තුළින් අනාවරණය විය. බහුතරයක් පුද්ගලයින් එනම්, 731 (73%) දෙනෙක් Tramadol භාවිත කර ඇති බවට අනාවරණය විය. පුද්ගලයින් 499 (50%) දෙනෙක් Pregabalin ඖෂධ වර්ගය ද, 313 (31%) දෙනෙක් Corex D ද අවභාවිත කර ඇති බව අනාවරණය විය. පුද්ගලයින් 84 (8%) දෙනෙක් Benzhexol ද, 78 (8%) දෙනෙක් Morphine ද, 57 (6%) Rohypnol ඖෂධය ද භාවිත කරන බව අනාවරණය විය. ඊට අමතරව මනෝකාරක ගණයට අයත් ද්‍රව්‍යයක් වන MDMA (Ecstasy) 192 (19%) දෙනෙක් විසින් භාවිත කර ඇති බවට ද අධ්‍යයනය තුළින් අනාවරණය විය.

වගු අංක 04 - කෙදිනක හෝ වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ භාවිත තත්ත්වය

භාවිත කළ පෙති/ සිරප් වර්ගය හෝ ද්‍රව්‍ය	පුද්ගලයින් සංඛ්‍යාව	%
Pregabalin	499	49.9
Corex D	313	31.3
Diazepam	219	21.9
Tramadol	731	73.1
Dextromethorphan	3	0.3
Rohypnol	57	5.7
Thiophene	1	0.1
MDMA	192	19.2
Morphine	78	7.8
GabaPentin	9	0.9
Corex	5	0.5
Benzhexol	84	8.4
Methamphetamine	4	0.4
Methadone	2	0.2
Broncodex	3	0.3
piriton	2	0.2
Amphetamine	1	0.1
Largactil	7	0.7
Clonazepam	24	2.4
Haloperidol	2	0.2
Olanzapine	1	0.1
Clozapine	1	0.1

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.8.3 බහුලවම භාවිත කරන මාදක සහ මනෝවර්තක ඖෂධ

Tramadol ඖෂධය

මාදක ගණයේ ඖෂධ කාණ්ඩයට අයත් මෙම ඖෂධය මධ්‍ය මට්ටමේ වේදනා නාශක ඖෂධයක් ලෙස ප්‍රතිකාර සඳහා යොදා ගනී. විශේෂයෙන්ම මෙම ඖෂධය භාවිත කරන්නේ, ගර්භනී කාන්තාවන්ගේ

ප්‍රසව වේදනා සඳහා, අක්මාව හා වකුගඩු ආශ්‍රිත ආබාධ පිළිකා සඳහා වේදනා නාශකයක් ලෙස භාවිත කරයි. තවද Tramadol භාවිත කිරීමෙන් ඇතිවන අතුරු ආබාධ ලෙස වමනය, ඔක්කාරය, තොල කට වියලීම, බඩේ කැක්කුම, හිසරදය, මලබද්ධය වැනි ආබාධ හඳුන්වා දිය හැකිය. එසේම වෛද්‍ය නිර්දේශයකින් තොරව භාවිත කිරීමෙන් ඇබ්බැහිකාරී තත්ත්වයට පත් විය හැකිය. වර්තමානය වනවිට සමාජයේ ඉතා ජනප්‍රිය අන්වර්ථ නාමයක් වන "ඇපල් " යන නාමයෙන් හඳුන්වන්නේ මෙම ඖෂධ වර්ගයයි.

Pregabalin ඖෂධය

අපස්මාරය, ස්නායු ආබාධ සඳහා මෙන්ම කාංසාමය අක්‍රමතා සඳහා ප්‍රතිකාර කිරීමට මෙම ඖෂධය භාවිත කරයි. පාදවල ආබාධ, ඉරුවාරදය (Migraine), මද්‍යසාර විරමණ ලක්ෂණ මඟහරවා ගැනීමට විශේෂයෙන් මෙම ඖෂධය භාවිත කරයි. වෛද්‍ය නිර්දේශයකින් තොරව භාවිත කළ විට ඇබ්බැහිකාරී තත්ත්ව ඇති විය හැකිය. අතුරු ආබාධ ලෙස නිදිමත ගතිය, තොල කට වියලීම, ව්‍යාකූල බව, මතකය සම්බන්ධ ගැටලු වැනි ආබාධ ඇතිවිය හැකිය. වර්තමානයේ සාමාන්‍ය ව්‍යවහාරයේ "ගැබා", "ප්‍රී ගැබ්" ලෙස අන්වර්ථ නාමයෙන් හඳුන්වයි.

Corex D සිරප් වර්ගය

Corex D සිරප් වර්ගය කැස්ස සඳහා භාවිත කරන ඖෂධයක් වන අතර වෛද්‍ය නිර්දේශයක් සහිතව නියමිත මාත්‍රාව ලබාගත යුතුය. වෛද්‍ය නිර්දේශයකින් තොරව නියමිත මාත්‍රාව ඉක්මවා භාවිත කළවිට මත්වීම සිදුවන අතර ඇබ්බැහිකාරී තත්ත්වයට ද පත් වනු ඇත.

Diazepam ඖෂධය

Valium නැමති වෙළඳ නාමයෙන් හඳුන්වන Diazepam ඖෂධය Benzodiazepine කාණ්ඩයට අයත් ඖෂධයකි. පොදුවේ මෙම ඖෂධය කාංසා අක්‍රමතා සඳහා, මද්‍යසාරවල විරමණ ලක්ෂණ මඟහරවා ගැනීම සඳහා, ශල්‍යකර්ම, පාදවල ආබාධ, මතක ශක්තිය වැඩිකර ගැනීම සඳහා වෛද්‍ය නිර්දේශය සහිතව මෙම ඖෂධ නිර්දේශ කරයි. වෛද්‍ය නිර්දේශයකින් තොරව භාවිත කළහොත් ඇබ්බැහිකාරී තත්ත්ව ඇති වේ. අතුරු ආබාධ ලෙස නිදිමත ගතිය ප්‍රධාන වශයෙන් ඇතිවිය හැකිය. භයානක තත්ත්වය වන්නේ සියදිවි නසා ගැනීම සඳහා ඉඩකඩ ඇති බවයි.

MDMA (Ecstasy)

Methylenedioxymethampitamine යන රසායනික නාමයෙන් හඳුන්වන MDMA නැතහොත් Ecstasy විනෝදය පිණිස භාවිත කරන (Recreational) මනෝකාරක ද්‍රව්‍යයක් ලෙස හැඳින්විය හැකිය. උත්තේජක (Stimulant) හා භ්‍රාන්තිකාරක (Halluzinogens) හැඟීම් ඇති කරවන මෙම ද්‍රව්‍ය වෛද්‍යවරුන් නිර්දේශ කරන ඖෂධයක් නොවේ. Ecstasy වල තිබෙන සුවිශේෂීතාවය වන්නේ, මෙම ඖෂධය සාදවල නර්තනය සඳහා යොදා ගැනීමයි. මෙහි තිබෙන අතුරු ආබාධ වශයෙන් මතකය පිළිබඳ ගැටලුවලට මුහුණ දීම, නිදා ගැනීමට තිබෙන අපහසුව, දහඩිය දැමීම, හෘද ස්පන්දනය වැඩිවීම දැක්විය හැකිය.

MDMA නැතහොත් Ecstasy භාවිත කර ඇති පුද්ගලයින්ගෙන් 192 (19%) දෙනා අතරින් පුද්ගලයින් 31 (3%) දෙනෙක් පසුගිය පැය 24 තුළ දී භාවිත කර ඇති අතර 54 (5%) දෙනෙක් පසුගිය සතිය තුළදී ද, 90 (9%) දෙනෙක් පසුගිය මාසය තුළ දී ද, 4 (0.4%) දෙනෙක් පසුගිය මාස 03 තුළදී ද, 13 (1%) දෙනෙක් පසුගිය මාස 03 ට වැඩි කාල පරාසයකදී ද MDMA භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය විය.

3.8.4 පැය 24 ක් තුළ භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක ඖෂධ

පසුගිය පැය 24 ක් තුළ දී පුද්ගලයින් 456 දෙනෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර ඇති බවට තොරතුරු හෙළි විය. එම පුද්ගලයින් 456 දෙනා විසින් පසුගිය පැය 24 ක් තුළ දී මනෝවර්තක ඖෂධ වර්ග 17 ක් භාවිත කර ඇත. එනම්, පසුගිය පැය 24 ක් තුළ දී Tramadol පෙති 225 ක් ද, Pregabalin පෙති 218 ක් ද, Diazepam පෙති 49 ක් ද, MDMA (Ecstasy) 31 ක් ද, Morphine පෙති 22 ක් ද, Benzehxol පෙති 22 ක් ද, Corex D 18 ක් ද, Rohypnol 17 ක් ද භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය විය. මීට අමතරව Mathamphetemin, Clonazepam, Largactill, Gabapentin, Broncodex, Dextromethophan වැනි ඖෂධ වර්ග ද භාවිත කර ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාර අංක 19 - පැය 24 ක් තුළ භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.8.5 සතිය තුළ දී භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග

පසුගිය සතිය තුළ දී මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර පුද්ගලයින් 291 දෙනෙක් පිළිබඳව තොරතුරු අනාවරණය වී ඇති අතර එම පුද්ගලයින් පසුගිය සතියක් තුළ දී මනෝවර්තක ඖෂධ වර්ග 16 ක් දුර්භාවිත කර ඇති බව අනාවරණය විය. එම ඖෂධ වර්ග 16 සඳහා Tramadol පෙති 230 ක් ද, Pregabalin 147 ක් ද, Diazepam 56 ක් ද, MDMA (Ecstasy) 54 ක් ද, Morphine 17 ක් ද, Rohypnol පෙති 15 ක් ද, Corex D 11 ක් ද, Benzhexol 13 ක් ද අවභාවිත කර ඇති බවට අධ්‍යයනය තුළින් අනාවරණය විය. මීට අමතරව Gabapentin, Methamphetemin, Broncodex, Largactill, Clonazepam ද අවභාවිත කර ඇති බවට හෙළි විය.

ප්‍රස්තාර අංක 20 - සතියක් තුළ දී භාවිත කර ඇති ඖෂධ වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.8.6 මාසයක් තුළ දී භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග

පසුගිය මාසයක් තුළ දී පුද්ගලයින් 106 දෙනෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර ඇති අතර එම පුද්ගලයින් 106 දෙනා පසුගිය මාසය තුළ දී භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග 12 කි.

එම මාසය තුළ දී Tramadol පෙති 113 ක් ද, Pregabalin 67 ක් ද, MDMA 90 ක් ද, Diazepam 29 ක් ද, Benzhexol 20 ක් ද, Morphine පෙති 17 ක් ද, Corex D 9 ක් ද, Rohypnol 5 ක් ද භාවිත කර ඇති බවට තොරතුරු හෙළි විය.

ප්‍රස්තාර අංක 21 - මාස 03 ක් තුළ දී භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.8.7 මාස 03 තුළ දී භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක වර්ග

පසුගිය මාස 03 තුළ දී මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර ඇති පුද්ගලයින් 53 අධ්‍යයනය මගින් සොයා ගෙන ඇති අතර පසුගිය මාස 03 තුළ දී එම පුද්ගලයින් 53 දෙනා භාවිත කළ මනෝවර්තක ඖෂධ වර්ග 11 ක් බව ද අනාවරණය විය.

ඒ අතර Tramadol පෙති 57 ක් ද, Diazepam පෙති 24 ක් ද, Pregabalin පෙති 22 ක් ද, Corex D 20 ක් ද, Morphine 12 ක් ද, MDMA 04 ක් ද, Rohypnol 03 ක් ද, Benzhexol 09 ක් ද, Gabapentin 01 ක් ද අවභාවිත කර ඇත.

ප්‍රස්තාර අංක 22 - පසුගිය මාස 03 ක් තුළ දී භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.8.8 මාස 03 ට වැඩි කාල සීමාවක් තුළ භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක වර්ග

පසුගිය මාස 03 ට වැඩි කාල සිමාවේදී මාදක මනෝවර්තක ඖෂධ වර්ග අවභාවිත කළ පුද්ගලයින් 94 දෙනෙක් අධ්‍යයනය තුළින් අනාවරණය වී ඇති අතර එම කාල සීමාවේදී ඔවුන් භාවිත කර තිබෙන මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග 17 ක් බව අනාවරණය වී ඇත. එම ඖෂධ වර්ග 17 න් පසුගිය මාස 03 ට වැඩි කාල සීමාවේදි Corex D සිරප් 254 ක් ද, Tramadol පෙති 105 ක් ද, Diazepam 59 ක් ද, Pregabalin 39 ක් ද, Benzhexol 17 ක් ද , MDMA 13 ක් ද, Rohypnol 12 ක් ද, Morphine 10 ක් ද, Gabapentin 05 ක් ද අවභාවිත කර ඇත. ඊට අමතරව Methadone, Broncodex, Amphetamine, Corex වැනි ඖෂධ/සිරප් වර්ග ද භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 23 - පසුගිය මාස 03 ට වැඩි කාල සීමාව තුළ භාවිත කර ඇති මාදක සහ මනෝවර්තක වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

ප්‍රස්තාර අංක 24 - දත්තදායකයින් භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග සංයුතිය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

ඉහත ප්‍රස්තාරයට අනුව පසුගිය මාස තුන තුළ සහ මාස තුනට වඩා වැඩි කාලය තුළ පුද්ගලයින් භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග පිළිබඳව විමසා බැලීමේදී මාස තුන තුළ දී වැඩිපුර භාවිත කර තිබෙන්නේ Tramadol සහ Pregabalin ඖෂධ වේ. සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත වන " ඇපල්", "ගැබා" යන අන්වර්ථ නාම වලින් මෙම ඖෂධ හඳුන්වනු ලැබේ. නමුත් මාස තුනට වඩා වැඩි කාලසීමාවේදී භාවිත කර තිබෙන මනෝවර්තක ඖෂධ වර්ග පිළිබඳ සොයා බැලීමේ දී Corex D සිරප් වර්ගය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය. මේ අනුව මෑතකාලීනව මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමේ ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය.

ඉහත සඳහන් කළ අධ්‍යයන අනාවරණවලට අනුව වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන මනෝවර්තක ඖෂධ වර්ග අවභාවිත කිරීම ක්‍රමික වර්ධනයක් ඇති බව පෙනී යයි. එම ඖෂධ වර්ග මනෝවර්තක සහ මනෝකාරක ඖෂධ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය.

3.9 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගන්නා ආකාරය

මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කරන පුද්ගලයින් එම මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගන්නා ආකාරය සොයා බැලීම ද ඉතා වැදගත් වේ. අධ්‍යයනය කළ නියැදියේ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතා කරන පුද්ගලයින්ගෙන් 807 (81%) දෙනෙක් මිතුරෙකු මාර්ගයෙන් එම ද්‍රව්‍ය ලබාගෙන ඇති බව අනාවරණය විය. පුද්ගලයින්ගෙන් 230 (23%) දෙනෙක් ෆාමසි වලින් ද, පුද්ගලයින්ගෙන් 202 (20%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකු මාර්ගයෙන් ද, 240 (24%) දෙනෙක් මත්පෙති විකුණන වෙළෙන්දන් මඟින් ද, 45 (5%) දෙනෙක් රජයේ ඖෂධ හලකින් හෝ රෝහලකින් ද, මාද සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබාගෙන ඇත. මීට අමතරව 30 (3%) දෙනෙක් නීත්‍යානුකූල නොවන අයුරින් ද, 15 (2%) දෙනෙක් අන්තර්ජාලය හරහා ඇනවුම් කිරීම මඟින් ද මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබාගෙන ඇති අතර මීට අමතරව පුද්ගලයින් 12 (1%) දෙනෙක් වෙනත් ක්‍රම මඟින් ලබා ගන්නා බවත් අනාවරණය විය.

ප්‍රස්තාර අංක 25 - මාදක සහ මනෝවර්තක ඖෂධ ලබා ගන්නා ආකාරය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

පුද්ගලයෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීම සඳහා එම ද්‍රව්‍ය සොයා ගැනීමේදී මිතුරන් මඟින් ඖෂධ වර්ග ලබා ගැනීම සිදුකර ඇත. එමඟින් පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමේදී ද මිතුරන්ගේ බලපෑම මෙන්ම මිතුරන් මාර්ගයෙන් ද්‍රව්‍ය ලබා ගැනීම කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාවක් පවතින බව සඳහන් කළ හැකිය. තවද මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග දුර්භාවිතයේ ප්‍රවණතාවක් වශයෙන්, එම ද්‍රව්‍ය ෆාමසිවලින් ලබා ගැනීමත් මත්පෙති විකුණන වෙළෙන්දන් ලබාදීමත් සිදු කරන බව ද මෙමඟින් අනාවරණය වේ.

3.10 මාදක සහ මනෝවර්තක ඖෂධ මිල දී ගැනීමේ ස්වභාවය

පුද්ගලයින්ට වැළඳෙන විවිධ කායික මානසික රෝගී තත්ත්ව සඳහා වෛද්‍යවරු විසින් නිර්දේශ කරන ඖෂධ හා සිරප් වර්ග වෛද්‍ය නිර්දේශයකින් තොරව භාවිත කිරීමේ ප්‍රවණතාවක් පවතින බව මෙම අධ්‍යයනය තුළින් තහවුරු කරගන්නා ලදි. අධ්‍යයනයට ලක් කළ නියැදියේ මත්ද්‍රව්‍ය භාවිත කළ පුද්ගලයින්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 237 (98%) දෙනෙක් වෛද්‍ය වට්ටෝරුවක් හෝ වෛද්‍ය නිර්දේශයක් නොමැතිව ඖෂධ, සිරප් වර්ග භාවිත කරන බවටත්, පුද්ගලයින් 06 (2%) දෙනෙක් පමණක් වෛද්‍ය නිර්දේශයක් සහිතව ඖෂධ සිරප් වර්ග භාවිත කරන බවටත් අධ්‍යයනය තුළින් අනාවරණය විය. මේ අනුව පැහැදිලි වන්නේ, බහුතරයක් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ඖෂධ ලබා ගන්නා බවයි.

ප්‍රස්තාර අංක 26 - මාදක සහ මනෝවර්තක ඖෂධ මිල දී ගැනීමේ ස්වභාවය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

3.11 නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මිල්දී ගැනීමේ සංයුතිය

වෛද්‍ය නිර්දේශයක් නොමැතිව පෞද්ගලික ෆාමසියකින් හෝ වෙනත් ඖෂධ හලකින් පුද්ගලයින් විසින් ලබා ගන්නා මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගන්නා ආකාරය පිළිබඳව විමසා බැලීමේ දී පුද්ගලයින් 119 (50%) දෙනෙක් ම ඔවුන් හඳුනන අතරමැදි පුද්ගලයින් මාර්ගයෙන් ද, 99 (41%) දෙනෙක් යහළුවෙක් මඟින් ද, 12 (5%) දෙනෙක් ෆාමසි සේවකයකු මඟින් ද, 11 (4%) දෙනෙක් ෆාමසියෙන් වැඩි මුදලක් දී මිලදී ගැනීමෙන් ද මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබාගෙන ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. තවද අතරමැදියන් සේවය කරන රෝහලෙන් එක් පුද්ගලයෙකු ද වෛද්‍ය නිර්දේශයක් සහිත වෛද්‍ය වට්ටෝරුවක් ෆාමසියට ලබා දීමෙන් ද මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග මිලදී ගෙන ඇති බව අනාවරණය විය.

3.12 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමේ සුලභතාව

3.12.1 භාවිත කරන පුද්ගලයින්ගේ වයස් සංයුතිය පිළිබඳ දැනුවත්භාවය

අධ්‍යයන නියැදියේ පුද්ගලයින්ගෙන් තම ප්‍රදේශය තුළ මාදක සහ මනෝවර්තක ඖෂධ සමඟ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳ දැනුවත්භාවය පිළිබඳව විමසා බලන ලදි. මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින් 1000 දෙනා අතරින් බහුතරයක් එනම්, 880 (88%) දෙනෙක් ප්‍රකාශ කර සිටියේ, තම ප්‍රදේශයේ වයස අවුරුදු 18 - 35 අතර තරුණ වයසේ පුද්ගලයින් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන බව පිළිබඳ ඔවුන් දැනුවත් බවයි. පුද්ගලයින්ගෙන් 561 (56%) දෙනෙක් පාසල් හැරගිය සිසුන් භාවිතයේ නියැළෙන බව දැනුවත් බවටත්, 404 (40%) දෙනෙක් වැඩිහිටි පිරිස් එනම්, වයස අවුරුදු 36 - 60 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයින් භාවිත කරන බවටත් දැනුවත් වී ඇත. එසේම පුද්ගලයින් 121 (12%) දෙනෙක් වයස් අවුරුදු 60 ට වැඩි පුද්ගලයින් භාවිතයේ නියැළෙන බව පිළිබඳ දැනුවත් බවත් අනාවරණය වී ඇත. එසේම 362 (36%) දෙනෙක් කියා සිටියේ පාසල් වයසේ දරුවන් භාවිත කරන බව පිළිබඳ දැනුවත් බවයි. ඒ අනුව අධ්‍යයනය මඟින් තහවුරු වූ ආකාරයට පාසල් වයසේ සිසුන් අතර මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකි බව අනාවරණය වේ.

3.12.2 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීමට ඇති හැකියාව

මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින්ගෙන් එම ප්‍රදේශයේ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීමට තිබෙන හැකියාව පිළිබඳව විමසීමේ දී පුද්ගලයින් 325 (35%) දෙනෙක් කියා සිටියේ, මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග තම ප්‍රදේශය තුළ ඉතා පහසුවෙන් ලබා ගතහැකි බවයි. පුද්ගලයින් 245 (24%) දෙනෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග පහසුවෙන් ලබාගත හැකි බවත්, 148 (15%) දෙනෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීමට ඇති හැකියාව සාමාන්‍ය බවත් ය. එසේම පුද්ගලයින් 158 (17%) දෙනෙක් කියා සිටියේ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීමට අපහසු බවත්, 86 (8%) දෙනෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීමට ඉතා අපහසු බවත් දත්තදායකයින් ප්‍රකාශ කර සිටින ලදි.

ප්‍රස්තාර අංක 27 - මාදක සහ මනෝවර්තක ඖෂධ ලබා ගැනීමට ඇති හැකියාව



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

මේ අනුව බහුතරයක් එනම්, 60% ක් පමණ ඖෂධ වර්ග ප්‍රචලිත බවත්, පහසුවෙන් ලබා ගැනීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

3.12.3 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයෙහි ප්‍රචලිතබව (දිස්ත්‍රික්ක මට්ටමින්)

අධ්‍යයනයට ලක්කළ නියැදියට අනුව දිස්ත්‍රික්ක මට්ටමින් මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතයත් සමඟ අනෙකුත් මත්ද්‍රව්‍ය වන ගංජා සහ හෙරොයින් සමඟ දුර්භාවිතයෙහි ප්‍රචලිත බව පිළිබඳව ද සොයා බලන ලදි. ඒ අනුව අධ්‍යයනයට ලක්කළ දිස්ත්‍රික්ක 10 හි ගංජා සහ හෙරොයින් මත්ද්‍රව්‍යවලට සාපේක්ෂව වඩා වැඩි පුද්ගල සංඛ්‍යාවක් මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ බවට තොරතුරු අනාවරණය විය. එනම්, නියැදිය සඳහා මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින් පමණක් තෝරා ගැනීම එයට හේතුවයි.

කොළඹ දිස්ත්‍රික්කය තුළින් අධ්‍යයනයට ලක්කළ පුද්ගලයින් 535 දෙනාගෙන් 427 (80%) ක් ගංජා භාවිත කර ඇති අතර 270 (50%) ක් හෙරොයින් භාවිත කර ඇත. එසේම එම පුද්ගලයින් 535 දෙනාගෙන් 532 (99%) දෙනෙක් මාදක හා මනෝවර්තක ඖෂධ භාවිත කර ඇති අතර ඒ අතුරින් 119 (22%) දෙනෙක් සිරප් වර්ග භාවිත කර ඇත.

ගම්පහ දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට ලක්කළ පුද්ගලයින් 159 දෙනාගෙන් 130 (82%) ක් ගංජා භාවිත කර ඇති අතර 71 (45%) ක් හෙරොයින් භාවිත කර ඇත. එසේම එම පුද්ගලයින් 159 දෙනාගෙන් 151 (95%)

දෙනෙක් මාදක හා මනෝවර්තක ඖෂධ භාවිත කර ඇති අතර එයින් 39 (25%) දෙනෙක් සිරප් වර්ග භාවිත කර ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට ලක්කළ පුද්ගලයින් 50 දෙනාගෙන් 46 (92%) ක් ගංජා භාවිත කර ඇති අතර 22 (44%) ක් හෙරොයින් භාවිත කර ඇත.

අධ්‍යයනයට ලක්කළ දිස්ත්‍රික්ක 10 හි නියැදියට ඇතුළත් වූ පුද්ගලයින් භාවිත කළ මාදක සහ මනෝවර්තක ඖෂධවල ප්‍රචලිත බව පිළිබඳව සොයා බැලීමේ දී පුද්ගලයින් බහුතරයක් එනම්, 731 දෙනෙක් Tramadol ඖෂධය භාවිත කර ඇති අතර එම 731 දෙනාගෙන් පුද්ගලයින් 326 (53%) දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ද, 137 (19%) දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද, 46 (6%) දෙනෙක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද, 39 (5%) දෙනෙක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් ද, 35 (5%) දෙනෙක් කළුතරින් ද, 27 (4%) දෙනෙක් රත්නපුරෙන් ද Tramadol ඖෂධය භාවිත කර ඇති බවට අධ්‍යයනය තුළින් අනාවරණය විය. තවද අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික්ක වලින් පුද්ගලයින් 26 (4%) දෙනෙක් ද වාර්තා විය.

අධ්‍යයන නියැදියේ Pregabalin ඖෂධය පුද්ගලයින් 499 දෙනෙක් භාවිත කර ඇති අතර ඔවුන්ගෙන් 332 (67%) දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ද, 32 (6%) දෙනෙක් කළුතරින් ද, 30 (6%) දෙනෙක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් ද, 28 (6%) දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද, Pregabalin භාවිත කර ඇති බවට අනාවරණය වූ අතර Pregabalin අඩුම ප්‍රතිශතයක් භාවිත කර තිබෙන්නේ මාතර දිස්ත්‍රික්කයේ ය. එය වාර්තා වූයේ පුද්ගලයින් 1 (0.2%) වශයෙනි.

නියැදියට අයත් පුද්ගලයින් 313 Corex D සිරප් වර්ගය භාවිත කර ඇති බවට තොරතුරු අනාවරණය වූ අතර එම පුද්ගලයින් අතරින් වැඩිම සංඛ්‍යාවක් එනම්, 116 (37%) දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කය තුළින් ද, 39 (12%) දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද, 34 (17%) දෙනෙක් කළුතරින් ද අනාවරණය විය. තවද Corex D සිරප් වර්ගය අඩුම සංඛ්‍යාවක් භාවිත කර ඇති බවට හෙළි වූයේ, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වූ අතර එය පුද්ගලයින් 03 දෙනෙකි.

නියැදියේ පුද්ගලයින් 219 දෙනෙක් Diazepam ඖෂධය භාවිත කර ඇති අතර ඒ අතරින් පුද්ගලයින් 72 (33%) දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කය තුළින් වාර්තා වූ අතර අඩුම පුද්ගලයින් සංඛ්‍යාවක් (0.4%) පුත්තලම දිස්ත්‍රික්කය තුළින් අනාවරණය විය.

සිතියම් අංක 01 - මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ප්‍රචලිත බව - (දිස්ත්‍රික්ක මට්ටමින්)



3.13 මාදක සහ මනෝවර්තක ඖෂධ දුර්භාවිතය සහ සෞඛ්‍ය ගැටලු

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග දීර්ඝකාලීනව භාවිත කිරීම නිසා ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව සොයා බැලීම ද අධ්‍යයනය තුළින් සිදු කරන ලදි. මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින් 1000 දෙනා අතරින් පුද්ගලයින් 898 (90%) දෙනෙක් කියා සිටියේ, මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය හේතුවෙන් දීර්ඝකාලීන රෝගී තත්ත්වවලින් නොපෙළෙන බවයි. එහෙත් පුද්ගලයින් 102 (10%) දෙනෙක් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය හේතුවෙන් පුද්ගලයින් දීර්ඝකාලීන ලෙස රෝගී තත්ත්වවලින් පෙළෙන බවට ප්‍රකාශ කර ඇත.

අධිමාත්‍රා වීම

අධ්‍යයනය කරන ලද නියැදියෙන් පුද්ගලයින් 151 දෙනෙක් කෙදිනක හෝ ඖෂධ/ සිරප් වර්ග ලබා ගැනීම නිසා අධිමාත්‍රා වීම ද සිදු වී ඇත. එහිදී කරකැවිල්ල, හුස්ම ගැනීමේ අපහසුතා, සිහිමුර්ඡාවීම

වැනි තත්ත්වයන්ට මුහුණ දී ඇත. මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය හේතුවෙන් ඔවුන් මුහුණ දී ඇති ශාරීරික අසංකූලතා අධිමාත්‍රා වීමට අදාළ රෝග ලක්ෂණයන්ට බොහෝ සෙයින් සමානකමක් දක්වයි. ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්වචනය කළ මත්ද්‍රව්‍ය අධිමාත්‍රා වීමේ දී අධිමාත්‍රාව තුළ සිහිමුර්ජාව හෝ සිහිවිකල් බව ඇති කරන ප්‍රමාණය ඉක්මවා මත්ද්‍රව්‍ය ගැනීම හෝ විවිධ මත්ද්‍රව්‍ය එකට මිශ්‍රකර ගැනීම සිදු වෙයි. පොදුවේ මෙවැනි අවස්ථාවල හුස්ම ගැනීමේ අපහසුතාව, දෙතොල් නිල්පැහැවීම, ඇසේ කළු ඉංගිරියාව/ දෑස සංකෝචනය වීම වැනි ලක්ෂණ මතු වේ. මෙම අධ්‍යයනය තුළ දී ද පුද්ගලයින් විසින් දක්වන ලද සංකූලතා පිළිබඳ ඉහත නිර්වචනයට අනුව නිර්ණය කිරීමේ දී ඇතැම් අවස්ථාවල ඔවුන් අධිමාත්‍රා තත්ත්වයට පත්ව ඇති බව නිර්ණය කළ හැකිය.

3.14 මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය නතර කිරීම ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමුවීම

කෙදිනකදී හෝ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර දැනට භාවිත නොකිරීමට බලපා ඇති විවිධ හේතු පැවති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. අධ්‍යයනයේ පහසුව පිණිස මෙලෙස සාරාංශ කර දැක්විය හැකිය.

වගු අංක 05 - මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිතය නතර කිරීමට හේතු

ශාරීරික ගැටලු	මානසික ගැටලු	පවුලේ යහපැවැත්ම උදෙසා	ආර්ථික ගැටලු	රැකියාව සම්බන්ධ කරුණු
ශරීරයට ඔරොත්තු දෙන්නේ නැහැ	අමතක වීම්	විවාහය නිසා	අධික මුදලක් වැයවීම	කාර්ය බහුලත්වය
ඔළුව කරකැවෙනවා වගේ	මනස විකෘති වන නිසා	දරුවන්ට ලැජ්ජා කරන්න බෑ		විදේශගත වීම
	සිහිවිකල් වීම	අම්මලාට සැක පහළ වීම		
		දෙමව්පියන් අහිමි වීම		
		දෙමව්පියන් දඬුවම් කිරීම		

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

අධ්‍යයනයට ලක්කළ නියැදියේ සාමාජිකයින්ගෙන් ලබාගත් තොරතුරු අනුව පෙනී යන්නේ, පුද්ගලයින් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිතය නතර කිරීම සඳහා පෞද්ගලික කරුණු මෙන්ම සිය පවුල ඇතුළු සමාජයීය වශයෙන් බලපාන කරුණු කිහිපයක් ද බලපා ඇති බවයි.

මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කිරීම නතර කිරීමට කෙදිනකදී හෝ උත්සාහ කළ පුද්ගලයින් ද අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ අතර පුද්ගලයින් 200 (20%) දෙනෙක් කෙදිනකදී හෝ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග නතර කිරීමට උත්සාහ ගෙන ඇති බව අධ්‍යයන නියැදිය තුළින් අනාවරණය විය. එම පුද්ගලයින් 200 දෙනාගෙන් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග නතර කිරීම සඳහා 94 (47%) දෙනෙක් ස්වයං උත්සාහයෙන් ද, 29 (14%) දෙනෙක් පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මඟින් ද, 15 (7%) දෙනෙක් රජයේ වෛද්‍ය ප්‍රතිකාර මඟින් ද, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් ද ප්‍රතිකාර ලබා ගෙන ඇති බව අනාවරණය විය. එසේම පෞද්ගලික ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් ද ඒ සඳහා ප්‍රතිකාර ලබාගෙන තිබෙන බව අනාවරණය විය.

ප්‍රස්තාර අංක 28 - ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබා ගැනීමේ ස්වභාවය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2017)

4 නිගමන හා යෝජනා

ශ්‍රී ලංකාවේ අන්තරායකර ඖෂධ භාවිතය පිළිබඳ සළකන විට හෙරොයින්, ගංජා භාවිතයට අමතරව මාදක (Narcotic), මනෝවර්තක (Psychotropic) හා මනෝකාරක ඖෂධ (Psychoactive) දුර්භාවිතයෙහි යම් ප්‍රවණතාවක් හා වෙළඳපළ තුළ මෙම ඖෂධවල සුලභතාවක් දැකිය හැකි බව නිගමනය කළ හැකිය. තවද ඉදිරි වර්ෂවලදී වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන විවිධ වර්ගයේ ඖෂධ භාවිත කිරීමේ සහ මනෝකාරක ගණයේ ද්‍රව්‍ය (Recreational) භාවිත කිරීමේ වැඩි ප්‍රවණතාවක් ඇතිවිය හැකි බව නිගමනය කළ හැකිය. මෙම ප්‍රවණතාව පාලනය නොකළහොත් ඉදිරි වසර 5 තුළ ඖෂධ දුර්භාවිතය දිවයින පුරා ව්‍යාප්ත වීමේ අවදානමක් සහ ළමා සහ තරුණ පරපුර බහුතරයක් මෙයට ගොදුරු වීමේ අවදානමක් පවතියි.

4.1 නිගමන

- වර්තමානය වනවිට තරුණයින් අතර වෛද්‍ය නිර්දේශයකින් තොරව මාදක, මනෝවර්තක ඖෂධ සහ මනෝකාරක ඖෂධ භාවිත කිරීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය.

- වෛද්‍ය විද්‍යාවේ මධ්‍ය වේදනා නාශක (Modarate Pain Killer) ලෙස භාවිත කරන ඖෂධ භාවිත කිරීමේ ප්‍රවණතාවක් පවතී.

- මාදක, මනෝවර්තක හා මනෝකාරක ඖෂධ භාවිත කරන්නන් ඖෂධ සිරප්වලට අමතරව මත්ද්‍රව්‍ය, මද්‍යසාර භාවිත කරන අතර ඔවුන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (Poly Drug User) වේ.

- අධ්‍යයනයට ලක්කළ දිස්ත්‍රික්ක 10 අතරින් බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල ද, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ද මාදක, මනෝවර්තක හා මනෝකාරක ඖෂධ සඳහා ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකි විය.

- බහුල වශයෙන් භාවිත කරන මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලෙස Tramadol, Diazepam, Pregabalin, Corex D, Morphine, MDMA, Rohypnol, Benzhexol, Gabapentin හඳුනාගත හැකිය. මේවා නීත්‍යානුකූල නොවන අයුරින් රට තුළට පැමිණෙන අතර විශේෂයෙන් ඉන්දියාවේ සිට මුහුදු මාර්ග ඔස්සේ පැමිණෙන බවට තොරතුරු හෙළි විය.

- අධ්‍යයන නියැදිය තුළ මාදක සහ මනෝවර්තක ඖෂධ භාවිත කළ පුද්ගලයින්ගෙන් බහුතරයක් සමීප මිතුරන් එකතු වූ අවස්ථාවක ප්‍රථම වතාවට මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කර ඇත.

- අධ්‍යයනය කළ නියැදියේ මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග භාවිත කරන පුද්ගලයින් බහුතරයක් මිතුරන් මාර්ගයෙන් මාදක සහ මනෝවර්තක ඖෂධ වර්ග ලබා ගැනීම සිදු කරයි.

4.2 යෝජනා

- මාදක, මනෝවර්තක හා මනෝකාරක ඖෂධ දුර්භාවිතය වැළැක්වීම සඳහා රජය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.

- නීති ක්‍රියාත්මක කිරීම සහ ඖෂධ සැල් වැටලීම් වැඩිකිරීම එමෙන්ම දැනට තිබෙන වැටලීම් බල අධිකාරිය ව්‍යාප්ත කිරීම හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා ද වැටලීම් බලය ලබාදීම. මෙහිදී ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට සහ පොලිස් නිලධාරීන්ට නීති මඟින් වැටලීම් සඳහා බලය ලබාදීම.

- වෛද්‍ය නිර්දේශ නොමැතිව ඖෂධ අලෙවි කරන්නන්ගේ ඖෂධසැල් බලපත්‍ර අවලංගු කිරීම වැනි දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ අනිසි භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරන Morphine, Tramadol, Pregabalin වැනි පෙති වර්ග පාලනය දැඩි කිරීම හා ඖෂධ බෙදා හැරීම විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම.

- නීත්‍යානුකූල නොවන මාර්ගයෙන් ඉන්දියාව වැනි රට වලින් මෙරටට ජාවාරම් කරන ඖෂධ වැටලීම් සිදුකර නීත්‍යානුකූල නොවන ඖෂධ බෙදාහරින්නන් අත්අඩංගුවට ගැනීම හා ඖෂධ ජාවාරම්කරුවන් සඳහා දැඩි නීතිමය තත්ත්වයක් ක්‍රියාවට නැංවීම.

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා අනෙකුත් ආයතන ඒකාබද්ධව මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ඖෂධ අවභාවිතය පිළිබඳව ඉලක්කගත පාසැල් සිසුන්, දෙමව්පියන් හා ගුරුවරුන්, තරුණයින් සහ මහජනතාව දැනුවත් කිරීම සහ අවභාවිතය වැළැක්වීම සඳහා කුසලතා හා නායකත්ව පුහුණු වැඩසටහන් දිවයින පුරා ව්‍යාප්ත කිරීම.

- ඖෂධහල් හිමියන්, ඖෂධ ආනයනකරුවන් දැනුවත් කිරීම.

- දුර්භාවිතයට යොමු වී ඇති පුද්ගලයින්ට උපදේශන සේවාවන් ලබාදීම සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියක් ආරම්භ කිරීම.

5 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Abbas A, Ghahramanloo, Akbar F. H. Z, and Afarin R M., Prescription Drugs, Alcohol, and Illicit Substance Use and Their Correlations Among Medical Sciences Students in Iran,pubilised by Pubmed, March 2015.

Drug Abuse Monitoring System, 2017, NDDCB

Drug Abuse, 1991, Terms Explained, National Dangerous Drugs Control Board

European Drug Report 2017: Trends and Developments, *June 2017,EMCDDA, Lisbon,*

International Narcotics Control Board, 2018, International Narcotics Control Board Report 2018, United Nation Information Service, Vienna.

Joseph T. F. Lau,Jean. Kim & Hi Yi Tsui, Prevalence, Health Outcomes, and Patterns of Psychotropic Substance Use in a Chinese Population in Hong Kong: A Population-Based Study, Pages 187-209 | Published online: 03 Jul 2009,https://doi.org/10.1081/JA-200048454.

National Dangerous Drugs Control Board, 2017, Handbook of Drug Abuse Information, Youth Service press, Maharagama.

World Drug Report, 2018, United Nation Office on Drug and Crime, Vienna

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය හා නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය 2016 - 2017.

සේනානායක, භද්‍රානි, "මනෝවර්තක ඖෂධ භාවිතයෙහි ප්‍රවණතා සහ රටා", News Letter (Volume 19), රාජගිරිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,

කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය

ප්‍රධාන පර්යේෂක

හද්‍රානි සේනානායක
වසන්ත ප්‍රදීප් කුමාර

සහාය පර්යේෂක කණ්ඩායම

සුපුන් සේනානායක
නිලූක්ෂි තිසේරා
නිලානි රේණුකා
මහේෂි පෙරේරා

දත්ත විශ්ලේෂණය

සජීව අතාවුද

සංක්ෂිප්තය

ලොව බොහෝ රටවල මෙන්ම ලාංකික සමාජය තුළ ද මත්ද්‍රව්‍ය භාවිතය සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය හේතුකොට ගනිමින් ඒ වටා අතුරු ප්‍රශ්න නිර්මාණය වීමත් සමඟ එයින් ඍජු හා වක්‍ර ආකාරයට සමාජයට වන බලපෑම සුළු කොට සැලකිය නොහැක.

කලින් කලට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ විවිධ සමාජ ස්ථර අනුව ද මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා හා රටා විවිධ වේ. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජයේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සළකා බැලීමේ දී කම්කරු ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නියුතු පුද්ගලයින් අතර ද මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකි වේ. කම්කරුවන් සමාජයේ විවිධ ක්ෂෙත්‍ර තුළ සේවය කරනු ලබන අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රය එයින් එක් ක්ෂෙත්‍රයක් වේ. මෑතකාලීනව වාර්තා වන තොරතුරු අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් නීත්‍යානුකූල මද්‍යසාර, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සහ වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ (පෙති වර්ග සහ සිරප් වර්ග) භාවිත කරනු ලබයි. මෙවැනි පසුබිමක් තුළ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා හඳුනාගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතය හා මත්ද්‍රව්‍ය අලෙවිය හේතුවෙන් අත්අඩංගුවට ගැනීම් වැඩි සංඛ්‍යාවක් වාර්තා වන කොළඹ දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු බහුලව සිදු කෙරෙමින් පැවති කොළඹ 01, කොළඹ 02, කොළඹ 03, කොළඹ 05, කොළඹ 08, රාජගිරිය යන ප්‍රදේශවල සමාගම් පහක් යටතේ වූ වැඩබිම් අටක් කේන්ද්‍ර කර ගනිමින් මෙම පර්යේෂණය සිදුකරනු ලැබීය.

එක් වැඩබිමකින් කම්කරුවන් පනස් දෙනෙකු බැගින් වැඩබිම් අට තුළින් කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යයන නියැදියට තෝරාගනු ලැබිණ. අරමුණුගත නියැදි ක්‍රමය භාවිත කරමින් එක් වැඩබිමකින් මූලික තොරතුරු සපයන්නන් හත්දෙනෙකු බැගින් වැඩබිම් තුළ විවිධ සේවා සපයනු ලබන 56 දෙනෙකු මූලික තොරතුරු සපයන්නන් ලෙස අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණ. සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයෙහි දී ව්‍යුහගත ප්‍රශ්නාවලි, ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණය ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස භාවිත කරන ලද අතර පොත් පත්, සංඛ්‍යාලේඛන වාර්තා සහ අන්තර්ජාලය භාවිත කරමින් ද්විතියික දත්ත රැස්කර ගන්නා ලදි. රැස්කර ගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත.

අධ්‍යයන අනාවරණයන්ට අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවයේ නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් වැඩිනියා දිස්ත්‍රික්කයෙන් හැර සෙසු සියලු දිස්ත්‍රික්කවලින් නියෝජනය විය. බහුතරයක් එනම්, කම්කරුවන් 179 (45%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල නවාතැන්ගෙන සිටි අතර බහුතරයක් කම්කරුවන් වයස අවුරුදු 36 - 40 ත් අතර වයස් කාණ්ඩයෙහි පසුවන්නන් විය. දෙසිය පනස් හයක් (64%) වැනි බහුතරයක් විවාහකයන් විය. දහ දෙනෙක් (3%) වැනි අඩු කම්කරුවන් පිරිසක් පමණක් අධ්‍යාපනය ලබා නොතිබූ අතර සෙසු සියලු කම්කරුවන් කිසියම් හෝ අධ්‍යාපන මට්ටමක් ලබා තිබිණ. බහුතරයක් එනම්, 206 (51%) ක් පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවෙහි නිරත වන්නන් විය.

කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන්නන් බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. එමෙන්ම ඔවුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බවක් හඳුනාගත හැකි විය. කම්කරුවන් විසින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන කේරළ ගංජා, දේශීය ගංජා, සහ හෙරොයින් බහුලව භාවිත කරනු ලබන බවත්, කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළම ප්‍රවණතාවක් පවතින බවත් හඳුනාගත හැකි විය. එමෙන්ම නීත්‍යානුකූල මද්‍යසාර, වෛද්‍යමය අරමුණු සඳහා ගැනෙන ඖෂධ (පෙති වර්ග), දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් බහුලව භාවිතයෙහි ප්‍රවණතාවක් පවතින බවත් අධ්‍යයනය තුළින් අනාවරණය විය. නීත්‍යානුකූල මද්‍යසාර, දේශීය ගංජා, කේරළ ගංජා, දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, මත්පෙති සහ හෙරොයින් ද කම්කරුවන් අතර ප්‍රචලිතව පවතින මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකි විය. පෙර සඳහන් කරන ලද මත්ද්‍රව්‍යයන්ට සාපේක්ෂව එල්.එස්.ඩී (LSD) සහ

සිරප් වර්ග භාවිතයෙහි අඩු ප්‍රචලිත බවක් පවතින බව ද, ප්‍රාථමික මත්ද්‍රව්‍යයක් ලෙස ගැනෙන සිගරැට් භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බව ද හඳුනාගත හැකි විය.

දැනට කේරළ ගංජා භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් තම අවශ්‍යතාව සඳහා සේවා ස්ථානය තුළ වූ මිතුරන්ගෙන් කේරළ ගංජා සපයාගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවත්, දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) ලබාගන්නා බවත් හඳුනාගත හැකි විය.

පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබන කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළම ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය. සේවය සඳහා පැමිණි කෙදිනක හෝ කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති පුද්ගලයින් හට මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීම සඳහා සේවායෝජක එමෙන්ම ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් ද බලපෑමක් වී ඇති බව හඳුනාගත හැකි විය.

කම්කරුවන් 201 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත් වී තිබූ බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වීමත් සමඟ නිලධාරීන් විසින් කම්කරුවන් සම්බන්ධයෙන් අවවාද කිරීම, බැනවැදීම, උපදෙස් දීම, දඩ මුදල් නියම කිරීම, සේවය අත්හිටුවීම, සේවයෙන් ඉවත් කිරීම යනා දී පියවර ගෙන තිබූ බවට තොරතුරු අනාවරණය විය.

කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ විවිධ වූ නීතිවිරෝධී ක්‍රියාවන් සේවා ස්ථානයෙන් පිටතදී පමණක් නොව සේවා ස්ථානය තුළ දී ද සිදුකරන බව අනාවරණය කරගත හැකි විය. සේවා ස්ථානයේ සෙසු සේවකයන්ට පහරදීම, සොරකම් කිරීම, මත්ද්‍රව්‍ය අලෙවි කිරීම, දේපලවලට හානි කිරීම සහ මත්ද්‍රව්‍ය අලෙවියට සහාය වීම යන වැරදි සේවා ස්ථානය තුළ සිදුකරනු ලැබ තිබූ වැරදි ක්‍රියා ලෙස හඳුනාගත හැකි විය.

මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බව අනාවරණය විය. සෙසු සේවකයින් සමඟ ගැටුම් ඇති කරගැනීම, අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වීම, සේවා කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකි වීම, සුළු අනතුරුවලට මුහුණ දීම, නිලධාරීන් සමඟ මත ගැටුම් ඇති කරගැනීම සහ සේවා ස්ථානයේ සෙසු සේවකයන් අතර තමා කොන් වීම යන ගැටලුවලට කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී තිබිණ.

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය හා නිවාරණය සම්බන්ධයෙන් කේන්ද්‍රීය ආයතනය ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කරන අතර මත්ද්‍රව්‍ය ආශ්‍රිත කාලීන ප්‍රවණතා හඳුනාගැනීම සඳහා විවිධ ක්ෂෙත්‍ර ආශ්‍රිතව පර්යේෂණ හා සමීක්ෂණ සිදුකිරීම එහි පර්යේෂණ අංශය මඟින් සිදුකරනු ලබන එක් ප්‍රධාන කාර්යයක් වේ.

අතුරු ප්‍රශ්න රැසක් නිර්මාණය වීමට හේතු වී ඇති මත්ද්‍රව්‍ය භාවිතය විවිධ ක්ෂෙත්‍රයන් තුළ සේවයෙහි නියුතු පුද්ගලයින් අතර හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත සහ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ප්‍රතිකාර ලබන තැනැත්තන්ගේ වාර්තාගත දත්ත අනුව ඔවුන්ගේ එක් එක් රැකියා තත්ත්වය විශ්ලේෂණය කිරීමේ දී බහුතරය කම්කරු සේවයෙහි නියුක්තවූවන් බව හඳුනාගත හැකි අතර ඒ අනුව කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් හා ව්‍යාප්තියක් පවතින බව තහවුරු වේ.

කම්කරුවන් ගත් කල ඔවුන් සමාජයේ විවිධ ක්ෂෙත්‍ර තුළ කම්කරු සේවයෙහි නියැළී සිටියි. ඔවුන් සේවය කරනු ලබන ක්ෂෙත්‍ර අතරින් එක් ක්ෂෙත්‍රයක් ලෙස ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රය හඳුනාගත හැකිය. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ගෝලීය සමාජ ප්‍රශ්නයකි. ශ්‍රී ලංකාවේද ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි ප්‍රවණතාවක් පවතින බවට අවිධිමත් ආකාරයට තොරතුරු වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නිරත කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ සිදුකර නොමැති අතර එබැවින් ඒ සම්බන්ධයෙන් පවතින විධිමත් දැනුම ද අල්ප වේ. ඒ අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නිරත කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීම කාලීන වශයෙන් ඉතා වැදගත් වේ. මෙම තත්ත්වය තුළ පර්යේෂණ අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නිරත කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා හා රටා හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි.

1.1 අධ්‍යයන පසුබිම

සමාජ වෙනස්වීමේ කාරක වන නාගරීකරණය, නවීකරණය, කාර්මීකරණය සහ ගෝලීයකරණය යනාදියෙහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින ලොව බොහෝ රටවල ඉදිකිරීම් ක්ෂෙත්‍රය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම්, සිවිල් ඉදිකිරීම් සහ කර්මාන්ත ඉදිකිරීම් හඳුනාගත හැකි වේ. ඒ අතරින් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රය ගත් කළ වර්තමානය වන විට ඒ ආශ්‍රිත විවිධ සමාජ සංකීර්ණතා ඇතිවීමේ පසුබිමක් හඳුනාගත හැකිය. එම සංකීර්ණතා අතර උද්ගතව ඇති එමෙන්ම ආමන්ත්‍රණයට ලක් කළ යුතු සමාජ ප්‍රශ්නයක් ලෙස කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හඳුනාගත හැකිය.

ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවය කරනු ලබන පුද්ගලයින් ප්‍රධාන කාණ්ඩ ත්‍රිත්වයක් යටතේ හඳුනාගත හැකි වේ. එනම්, කළමනාකරණ සහ තාක්ෂණික (Management and technical work force), පුහුණු ශ්‍රමික (Skilled), අර්ධ පුහුණු ශ්‍රමික සහ නුපුහුණු ශ්‍රමික (Semi skilled and unskilled) .(civilatwork.blogspot.com/2015/05/types-of-labour-employed-in.html). මෙම වර්ගීකරණයෙහි දෙවන සහ තෙවන කාණ්ඩයට අයත් ශ්‍රමිකයින් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තොරතුරු වාර්තා වේ.

ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් යනු සැළකිය යුතු සංඛ්‍යාවක් ඉදිකිරීමේ කටයුතුවල නිරත වන ස්ථානයකි. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල අනතුරුදායක යන්ත්‍රෝපකරණ භාවිත කරනු ලබන අතර සුළු මොහොතකට හෝ අවධානය නොමැති වුවහොත් අනතුරු සිදුවීමේ ඉඩකඩ වැඩිය. එමනිසා මත්ද්‍රව්‍ය භාවිතය ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානයන්හි දී බරපතල ප්‍රශ්නයක් විය හැකිය. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සැළකිය යුතු සෞඛ්‍ය ගැටලු ඇති කිරීමට පමණක් නොව එහි බලපෑමට ලක්වන ඕනෑම තැනැත්තෙකු තමන්ට සහ අන්අයට අනතුරක් වීමට හේතු විය හැකිය.

අපරාධ සහ ප්‍රචණ්ඩ ක්‍රියා, සොරකම් වැනි නීතිවිරෝධී ක්‍රියාවන් ද මත්ද්‍රව්‍ය භාවිතයෙහි අතුරු ප්‍රතිඵල ලෙස උද්ගත විය හැකිය. මත්පැන් භාවිතයේ සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ඓතිහාසික පසුබිමක් සහිත කම්කරුවන් අතර අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවේ (Mushi.F.V & Manege S.L,2018:66). ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල මත්ද්‍රව්‍ය භාවිතය පොදු සංසිද්ධියක් වීමෙන් විවිධ රෝගාබාධ ඇතිවීම, තුවාල සිදුවීම, රැකියාවට නොපැමිණීම, ආබාධිතවීම වැනි ගැටලුවලට මුහුණ දීමට සිදුවන අතර ඵලදායීතාව අඩුවීමට ද හේතු වේ (Gavioli.A,Mathias.T.A,Rossi.R.M & Oliveira.M.L,2014:472,accessed 2018/02/18).

ඉදිකිරීමේ කර්මාන්තයේ සේවකයන්ගේ මත්පැන් භාවිතය, මත්ද්‍රව්‍ය භාවිතය, දුම්කොළ හා දුම්පානය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ අගයක පවතින බවට අධ්‍යයන තුළින් අනාවරණය වී ඇත (Alberta Addiction and Mental Health Research Partnership Programme,2010:9). එමෙන්ම කම්කරුවන් අතර ගංජා සහ ඇම්පිටමින් භාවිතයෙහි ඉහළ මට්ටමක් පවතින බවට ද අනාවරණය වී ඇත (Banwell.C,Dance.P,Quinn.C,Davies.R & Hall.D,2009:167-178). ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවය කරන කම්කරුවන් නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය පමණක් නොව නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය ද භාවිත කරන බවට තොරතුරු වාර්තා වේ. සේවා ස්ථානයන්හි දී නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය දුර්භාවිතය පමණක් නොව නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය භාවිතය ද පෙර සඳහන් කරන ලද ගැටලු ඇති වීම කෙරෙහි හේතු විය හැකිය.

ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවය කරන කම්කරුවන් භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග, කම්කරු මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා හා රටා, මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ සමාජ ප්‍රජා පැතිකඩ, සේවා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ගොඩනැගී ඇති පරිසරයෙහි ස්වභාවය සහ ඒ ආශ්‍රිතව නිර්මාණය වී පවතින ගැටලු විද්‍යාත්මක පදනමක සිට අධ්‍යයනය කිරීම මඟින් ඒ සම්බන්ධ විධිමත් දැනුම ගොඩනැගීමට සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි.

1.2 පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට අවිධිමත් ආකාරයට තොරතුරු වාර්තා වුවද ඒ සම්බන්ධ විධිමත් දැනුම සහ සංඛ්‍යාත්මක තොරතුරු අවම මට්ටමක පවතී. එබැවින් උක්ත කාරණය සම්බන්ධ විද්‍යාත්මක පදනමකින් යුතුව දැනුම ගොඩනැගීම සඳහා සිදුකරන ලද මෙම අධ්‍යයනයෙහි කේන්ද්‍රීය ගැටලුව වූයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි වර්තමාන රටා සහ ප්‍රවණතා මොනවාද? යන්නයි. ප්‍රධාන ගැටලුවට අතිරේකව අධ්‍යයනය කරන ලද උප පර්යේෂණ ගැටලු පහත පරිදි විය.

උප පර්යේෂණ ගැටලු 01 - කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවා කටයුතු අතර පවත්නා සම්බන්ධය කෙබඳු ද?

1.3 පර්යේෂණ අරමුණු

ප්‍රධාන පර්යේෂණ අරමුණ

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා හඳුනාගැනීම.

සුවිශේෂී පර්යේෂණ අරමුණු

1. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ හඳුනාගැනීම.

2. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අතර සබඳතාවය හා ඒ ආශ්‍රිතව උද්ගතව ඇති මූලික ගැටලු හඳුනා ගැනීම.

3. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා නිවාරණය උදෙසා අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.4 පර්යේෂණ ප්‍රශ්න

පර්යේෂණ ප්‍රශ්න 01

ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුවල සේවයෙහි නිරත මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා සමාජ පැතිකඩ කෙබඳු ද?

පර්යේෂණ ප්‍රශ්න 02

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්හි ස්වභාවය කෙබඳු ද?

පර්යේෂණ ප්‍රශ්න 03

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි නව ප්‍රවණතා මොනවාද?

පර්යේෂණ ප්‍රශ්න 04

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් කම්කරුවන් දරන මිත්‍යා විශ්වාස මොනවා ද?

පර්යේෂණ ප්‍රශ්න 05

මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති ගැටලු මොනවාද?

1.5 පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව

ලෝකයේ මෙන්ම ලංකාවේ ද මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සේවා අංශ පිළිබඳව සළකා බැලීමේදී බහුතරය කම්කරු සේවයෙහි නියුතු වූවන් බව අනාවරණය වී ඇත. ඔවුන් විවිධ ක්ෂේත්‍ර තුළ සේවය සපයන්නන් වන අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය එයින් එක් ක්ෂේත්‍රයකි. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් යනු, සැළකිය යුතු පිරිසක් සේවය කරනු ලබන අනතුරුදායක යන්ත්‍ර භාවිත කරන ස්ථානයකි. එබැවින් යම් පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය භාවිත කර සේවයේ නිරත වීම තමා පමණක් නොව සෙසු පුද්ගලයන් ද අවධානමකට ලක් කිරීමකි. එය සමස්ත සේවා කණ්ඩායමටම ගැටලුවක් විය හැකිය. මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ සංස්කෘතියක් වැඩබිම් තුළ නිර්මාණය කරගෙන ඇති බවට ද්විතියික මූලාශ්‍ර සාක්ෂි දරයි. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ අතුරු ප්‍රශ්න නිර්මාණය විය හැකි අතර ලොව තුළ සිදු කරන ලද අධ්‍යයන තුළින් එය තහවුරු වී ඇත.

මත්පැන් සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහ නිවාරණ ක්‍රියාකාරකම් බලගැන්වීම සඳහා අධ්‍යයන අනාවරණ ඉදිරිපත් කෙරෙන අතර නිවාරණය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩබිම්වල සේවයෙහි නියුතු කම්කරුවන් කෙරෙහි පවත්නා අවධානය පුළුල් කිරීම ද අත්‍යාවශ්‍ය වේ. තවද සෞඛ්‍ය වැඩසටහන් සැලසුම් කිරීමට සහ නීතිය ක්‍රියාත්මක කරන අංශවලට අවශ්‍ය අනාගත සැලසුම් සකස් කිරීමට ද පදනමක් වශයෙන් යොදා ගත හැකිය.

1.6 පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහි දී ප්‍රපංචවේදීමය පර්යේෂණ ක්‍රමවේදය (Phenomenological research methodology) යොදාගනු ලැබිණ. ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුවල සේවයෙහි නිරත මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා සමාජ පැතිකඩ පිළිබඳවත්, කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි රටා සහ නව ප්‍රවණතා පිළිබඳවත්, මත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවා කටයුතු අතර පවත්නා සම්බන්ධතාවය පිළිබඳවත් එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ගැටලු උද්ගත වී පවතී නම් ඒවායෙහි ස්වභාවය පිළිබඳවත් වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා මෙම ක්‍රමවේදය භාවිත කරනු ලැබිණ. මෙහිදී පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය (Survey method) භාවිත කරනු ලැබිණ.

1.7 අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනයෙහි දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු බහුලව සිදු කෙරෙමින් පැවති කොළඹ 01, කොළඹ 02, කොළඹ 03, කොළඹ 05, කොළඹ 08, රාජගිරිය යන ප්‍රදේශ තෝරාගනු ලැබිණ. කොළඹ දිස්ත්‍රික්කය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු බහුලව සිදුවෙමින් පැවතීමත්, එමෙන්ම වාර්තාගත සංඛ්‍යාලේඛනවලට අනුව අන්තරායකර ඖෂධ දුර්භාවිතයෙහි ඉහළ ව්‍යාප්තියක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පෙන්නුම් කිරීමත් යන හේතූන් මත පදනම්ව ඉහත සඳහන් ප්‍රදේශ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගනු ලැබිණ.

1.8 අධ්‍යයන නියැදිය

කොළඹ දිස්ත්‍රික්කය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සමාගම් ගණනාවක් යටතේ සිදුවෙමින් පැවති අතර එයින් ප්‍රධාන සමාගම් පහක් අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණ. තෝරාගනු ලැබූ සමාගම්වලට අදාළ ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සිදුකෙරෙමින් පැවති වැඩබිම් අතරින් එකම භූගෝලීය ප්‍රදේශයක පිහිටි වැඩබිම් අටක් පොකුරු නියැදියක් ලෙස තෝරාගනු ලැබිණ. එම වැඩබිම් පිහිටි ප්‍රදේශ වූයේ කොළඹ 01, කොළඹ 02, කොළඹ 03, කොළඹ 05, කොළඹ 08, සහ රාජගිරිය වේ. එම ප්‍රදේශ අධ්‍යයනයේ ශක්‍යතාවය සඳහා තෝරාගනු ලැබූ අතර එක් එක් ප්‍රදේශ තුළින් තෝරාගනු ලැබූ වැඩබිම් ප්‍රමාණ පහත පරිදි විය.

වගු අංක 01 - අධ්‍යයනයට අයත් එක් එක් ප්‍රදේශ තුළින් තෝරාගනු ලැබූ වැඩබිම් ප්‍රමාණ

වැඩබිම් පිහිටි ප්‍රදේශ	තෝරාගනු ලැබූ වැඩබිම් ගණන
කොළඹ 01	02
කොළඹ 02	02
කොළඹ 03	01
කොළඹ 05	01
කොළඹ 08	01
රාජගිරිය	01
එකතුව	**08**

ඉහත වගුවෙහි සඳහන් කරන ලද වැඩබිම්වල කම්කරු සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන් අතරින් අහඹු ලෙස එක් වැඩබිමකින් කම්කරුවන් පනස් දෙනෙකු බැගින් වැඩබිම් අට තුළින් කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යයන නියැදියට තෝරාගනු ලැබිණ.

අරමුණුගත නියැදි ක්‍රමය භාවිත කරමින් එක් වැඩබිමකින් මූලික තොරතුරු සපයන්නන් හත්දෙනෙකු බැගින් වැඩබිම් තුළ විවිධ සේවා සපයනු ලබන 56 දෙනෙකු මූලික තොරතුරු සපයන්නන් ලෙස අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණ. එක් වැඩබිමකින් පහත වගුවෙහි සඳහන් සංයුතිය පරිදි මූලික තොරතුරු සපයන්නන් අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබිණ.

වගු අංක 02 - අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ මූලික තොරතුරු සපයන්නන්ගේ සංයුතිය

අනු අංකය	වෘත්තිය	එක් වැඩබිමකින් තෝරාගන්නා ලද මූලික තොරතුරු සපයන්නන් සංඛ්‍යාව
01	ඉංජිනේරුවරු	02
02	ආරක්ෂක නිලධාරි (Security officer)	01
03	වැඩ සුපරීක්ෂකවරු	01
04	තාක්ෂණික සේවා සපයන්නන්	01
05	ආරක්ෂක නිලධාරි (Safety officer)	01

1.9 දත්ත රැස්කිරීම

සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයෙහි දී ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත භාවිත කරන ලදි. ව්‍යුහගත ප්‍රශ්නාවලි, ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණය ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස භාවිත කරන ලද අතර පොත් පත්, සංඛ්‍යාලේඛන වාර්තා සහ අන්තර්ජාලය භාවිත කරමින් ද්විතියික දත්ත රැස්කර ගන්නා ලදි.

1.10 දත්ත විශ්ලේෂණය

ව්‍යුහගත ප්‍රශ්නාවලි මඟින් රැස්කරගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ දී විචල්‍ය අතර සහසම්බන්ධතාවය (Correlation) ප්‍රමාණාත්මකව ඉදිරිපත් කර ඇත.

2 අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව

පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ සහ සුවිශේෂී අරමුණු ඉටුකරගැනීම සඳහා තෝරා ගන්නා ලද නියැදියට ඇතුළත් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යක් භාවිත කරනු ලබන කම්කරුවන් 400 දෙනාගේ ප්‍රජා හා සමාජ පැතිකඩ, ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා සහ සෙසු පර්යේෂණ අනාවරණ පහත සඳහන් තේමා යටතේ මෙම පරිච්ඡේදයෙහි දී ඉදිරිපත් කර ඇත.

1. දත්තදායකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ

2. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්

3. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් තුළ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාවේ ස්වභාවය

2.1 දත්තදායකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ

2.1.1 පදිංචි දිස්ත්‍රික්ක අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තියෙහි සංයුතිය

පොකුරු නියැදි ක්‍රමය භාවිත කරමින් තෝරාගන්නා ලද වැඩබිම් අට තුළ කම්කරු සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යක් භාවිත කරන කම්කරුවන් අතරින් එක් වැඩබිමකින් කම්කරුවන් 50 දෙනෙකු බැගින් අහඹු ලෙස කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යනය සඳහා තෝරාගනු ලැබිණ. ඔවුන්ගේ පදිංචිය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

අධ්‍යයන දත්තවලට අනුව නියැදිය තුළ නියෝජනය වූ දත්තදායකයින්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සළකා බැලීමේදී, දත්තදායකයින් වැඩිනියා දිස්ත්‍රික්කයෙන් හැර සෙසු සියලු දිස්ත්‍රික්කවලින් නියෝජනය වීම විශේෂ කරුණකි. 101 (25%) වැනි බහුතර පුද්ගල සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් වූ අතර පුද්ගලයන් 35 (9%) දෙනෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් විය. නුවර දිස්ත්‍රික්කයේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් වූ පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 24 (6%) සහ 23 (6%) ක් විය. කළුතර දිස්ත්‍රික්කයේ සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 19 (5%) බැගින් එක් එක් දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් විය. නියැදියට ඇතුළත් දත්තදායකයින්ගෙන් පුද්ගලයින් 18 (5%) දෙනා බැගින් අනුරාධපුරය, කුරුණෑගල, සහ නුවරඑළිය යන එක් එක් දිස්ත්‍රික්කවල ස්ථිර පදිංචිකරුවන් වූ අතර අඩුම පුද්ගල සංඛ්‍යාවක් එනම්, එක් පුද්ගලයෙකු (0. 2%) පමණක් මන්නාරම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවකු විය. සෙසු පුද්ගලයින් අනෙකුත් දිස්ත්‍රික්කවලින් පහත වගුවෙහි සඳහන් පරිදි නියෝජනය විය.

වගු අංක 03 - පදිංචි දිස්ත්‍රික්ක අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තියෙහි සංයුතිය

දිස්ත්‍රික්කය	සංඛ්‍යාව	%
කොළඹ	101	25.25
රත්නපුර	35	8.75
මහනුවර	24	6
ගම්පහ	23	5.75
කළුතර	19	4.75
කිලිනොච්චිය	19	4.75
අනුරාධපුර	18	4.5
කුරුණෑගල	18	4.5
නුවරඑළිය	18	4.5
මාතර	15	3.75
ගාල්ල	14	3.5
බදුල්ල	12	3
මඩකලපුව	11	2.75
මාතලේ	11	2.75
හම්බන්තොට	10	2.5
අම්පාර	9	2.25
මොණරාගල	9	2.25
කෑගල්ල	8	2
පොළොන්නරුව	8	2
යාපනය	5	1.25
මුලතිව්	4	1
පුත්තලම	4	1
ත්‍රිකුණාමලය	4	1
මන්නාරම	1	0.25
මුළු එකතුව	400	100

මූලාශ්‍රයඃ (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)

සිතියම් අංක 01 - පදිංචි දිස්ත්‍රික්ක අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.1.2 වාසස්ථාන අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ දත්තදායකයින්ගේ වාසස්ථානවල ව්‍යාප්තිය සළකාබැලීමේ දී බහුතරයක් එනම්, පුද්ගලයින් 179 (45%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල නවාතැන්ගෙන සිටින අතර 103 (26%) දෙනෙක් කුලී පදනම මත ලබාගත් නිවාසවල නවාතැන් ගෙන සිටියහ. සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථාන වැඩබිම් පිහිටි භූමිය තුළ සහ වැඩබිම පිහිටි ප්‍රදේශයට නුදුරින් පිහිටි වෙනත් ස්ථානයක තිබීම හඳුනාගත හැකි විය. තම නිවසේ වාසය කරන පුද්ගලයින් සංඛ්‍යාව 59 (15%) දෙනෙක් වූ අතර මිතුරකුගේ නිවසේ නවාතැන්ගෙන සිටින පුද්ගල සංඛ්‍යාව 38 (10%) දෙනෙක් විය. ඊට අමතරව ඥාති නිවෙසක වාසය කරන පුද්ගල සංඛ්‍යාව 21 (5%) දෙනෙක් විය.

ප්‍රස්තාර අංක 01 - වාසස්ථාන අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

සමස්ත දත්තදායකයින් අතරින් බහුතර පුද්ගල සංඛ්‍යාවක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල නවාතැන්ගෙන ඇති බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වේ. ඔවුන් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවා කටයුතු සඳහා ලංකාවේ විවිධ ප්‍රදේශවලින් කොළඹ නගරය කරා සංක්‍රමණය වූ පුද්ගලයන් වේ.

2.1.3 දත්තදායකයින්ගේ ස්ත්‍රී පුරුෂ සංයුතිය

අහඹු නියැදි ක්‍රමය භාවිත කරමින් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද දත්තදායකයින්ගේ පුම්තිරි බව සළකා බැලීමේදී බහුතරයක් එනම්, 392 (98%) දෙනෙක් පුරුෂයන් වූ අතර 8 (2%) ක් වැනි අඩු සංඛ්‍යාවක් ස්ත්‍රීන් වූහ.

ප්‍රස්තාර අංක 02 - දත්තදායකයින්ගේ ස්ත්‍රී පුරුෂ සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.1.4 දත්තදායකයින්ගේ වයස් සංයුතිය

අධ්‍යයන නියැදිය සඳහා තෝරාගන්නා ලද පුද්ගලයන්ගේ වයස් සංයුතිය පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී බහුතරයක් එනම්, 90 (23%) දෙනෙක් වයස අවුරුදු 36-40 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් වූහ. පුද්ගලයන් 81 (20%) දෙනෙක් වයස අවුරුදු 31-35 ත් අතර වයස් කාණ්ඩයට අයත් වූ අතර 75 (19%) දෙනෙක් වයස අවුරුදු 26-30 ත් අතර වයස් කාණ්ඩයට අයත් වූහ. වයස අවුරුදු 41-45 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් 61 (15%) දෙනෙක්, වයස අවුරුදු 18-25 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් 53 (13%) දෙනෙක් සහ වයස අවුරුදු 46-70 අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් 40 (10%) දෙනෙක් අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ නියෝජනය විය.

ප්‍රස්තාර අංක 03 - දත්තදායකයින්ගේ වයස් සංයුතිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

නියැදියට ඇතුළත් සමස්ත දත්තදායකයින්ගේ වයස් ව්‍යුහය විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වූ විශේෂ කරුණ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ මත්ද්‍රව්‍ය භාවිතය වයස අවුරුදු 36 - 40 ත් වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් අතර බහුලව ප්‍රචලිත වී ඇති බවයි.

2.1.5 ජාතිය අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

නියැදියට ඇතුළත් දත්තදායකයින්ගේ ජනවාර්ගිකත්වය අනුව බහුතරයක් එනම්, 277 (69%) දෙනෙක් සිංහල ජාතිකයින් වූ අතර 96 (24%) ක් දෙමළ ද, 26 (7%) ක් මුස්ලිම් ද වූහ. මැලේ ජාතියට අයත් එක් පුද්ගලයෙකු (0.2%) පමණක් නියැදිය තුළ නියෝජනය විය.

ප්‍රස්තාර අංක 04 - ජාතිය අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.1.6 ආගම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදියට ඇතුළත් දත්තදායකයින්ගේ ආගම අනුව 87 (22%) දෙනෙක් හින්දු ආගමිකයන් ද, 27 (7%) දෙනෙක් ඉස්ලාම් ආගමිකයන් ද, 38 (10%) දෙනෙක් ක්‍රිස්තියානි ආගමිකයන් ද වූ අතර 3 (1%) දෙනෙක් රෝමානු කතෝලිකයින් වූහ. බහුතරයක් එනම්, 245 (61%) දෙනෙක් බෞද්ධ ආගමිකයන් වූහ.

ප්‍රස්තාර අංක 05 - ආගම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.1.7 දත්තදායකයින්ගේ විවාහක අවිවාහක තත්ත්වය

විවාහක අවිවාහක බව අනුව 107 (26%) දෙනෙක් අවිවාහකයන් ද, 21 (5%) දෙනෙක් විවාහක එහෙත් වෙන්ව ජීවත්වන්නන් ද වූ අතර දික්කසාද සහ වැන්දඹු පුද්ගලයන් 6 (2%) දෙනා බැගින් ද නියැදිය තුළ නියෝජනය වූහ. අඩුම පුද්ගල සංඛ්‍යාවක් එනම්, 4 (1%) දෙනෙක් විවාහනොවී එකට ජීවත්වන්නන් වූ අතර බහුතරය එනම්, පුද්ගලයින් 256 (64%) දෙනෙක් විවාහකයින් විය. ඒ අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවයෙහි නියුතු අවිවාහක කම්කරුවන්ට වඩා විවාහක කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රචලිත බවක් ඇති බව ඉහත විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ.

ප්‍රස්තාර අංක 06 - දත්තදායකයින්ගේ විවාහක අවිවාහක තත්ත්වය

මූලාශ්‍රය: (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)



2.1.8 අධ්‍යාපන මට්ටම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී 20 (5%) දෙනෙක් අ. පො . ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබූ අතර 121 (30%) දෙනෙක් අ. පො. ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබිණ. ඊට අතිරේකව පුද්ගලයන් 57 (14%) දෙනෙක් 1 වසර සිට 5 වසර දක්වා අධ්‍යාපනය ලබා තිබිණ. බහුතරයක් එනම්, 192 (48%) දෙනෙක් 10 වසර දක්වා අධ්‍යාපනය ලබා තිබූ අතර 10 (3%) දෙනෙක් වැනි අඩුම පුද්ගල සංඛ්‍යාවක් පමණක් අධ්‍යාපනය ලබා නොතිබුණි.

ප්‍රස්තාර අංක 07 - අධ්‍යාපන මට්ටම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.1.9 කම්කරුවන්ගේ රැකියා නියුක්තියෙහි ව්‍යාප්තිය

අධ්‍යයන නියැදියට ඇතුළත් වූ කම්කරුවන් ගොඩනැගිලි ඉදිකිරීමේ ක්ෂේත්‍රයෙහි සේවය කිරීමේ දී විවිධ රැකියා තත්ත්වයන් යටතේ සේවයෙහි නියුක්තව ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. 206 (51%) දෙනෙක් වැනි බහුතර සංඛ්‍යාවක් පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවෙහි නිරත වන අතර 140 (35%) දෙනෙක් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබයි. ඊට අතිරේකව 54 (14%) දෙනෙක් අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබයි.

ප්‍රස්තාර අංක 08 - කම්කරුවන්ගේ රැකියා නියුක්තියෙහි ව්‍යාප්තිය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබන කම්කරුවන් අතරින් බහුතරයක් එනම්, 118 (30%) දෙනෙක් පෙදරේරුවරුන් ලෙස සේවය කරනු ලබන අතර 24 (6%) දෙනෙක් යකඩ පැස්සුම්කරුවන් ලෙස සේවය කරනු ලබයි. කම්බි බැඳීමේ නිරතවන කම්කරුවන් 17 (4%) දෙනෙක් ද, වඩුවැඩ සිදුකරන කම්කරුවන් 16 (4%) දෙනෙක් ද, පුහුණු ශ්‍රමිකයන් අතර විය. ඊට අතිරේකව 14 (4%) දෙනෙක් විදුලි කාර්මිකයින් ලෙස ද, 10 (3%) දෙනෙක් ගල් අතුරන්නන් ලෙස ද, 6 (2%) දෙනෙක් තීන්ත ආලේප

කරන්නන් ලෙස ද සේවය කරනු ලබන අතර එක් කම්කරුවෙක් ග්‍රයින්ඩර්කරුවකු ලෙස සේවය කරනු ලබයි.

අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවයෙහි නියුතු කම්කරුවන්ගේ රැකියා තත්ත්වය සම්බන්ධයෙන් සළකා බැලීමේ දී ඔවුන් අතරින් බහුතරයක් එනම්, 36 (9%) දෙනෙක් යකඩ පැස්සුම් සහයකයන් ලෙස සේවය කරනු ලබන අතර 11 (3%) දෙනෙක් පලංචි දැමීමෙහි නිරත වේ. ඊට අතිරේකව 7 (2%) දෙනෙක් විදුලි කාර්මික සහයකයින් ලෙස සේවයෙහි නිරත වේ.

නියැදිය තුළ නියෝජනය වූ නුපුහුණු ශ්‍රමිකයන් නිරත වී සිටින සේවා තත්ත්වයන් සළකා බැලීමේදී ඔවුන් අතරින් 43 (11%) දෙනෙක් කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමෙහි නිරත වන අතර 12 (3%) දෙනෙක් ද්‍රව්‍ය සැපයීමෙහි නිරත වේ. නුපුහුණු ශ්‍රමිකයින් අතරින් බහුතරයක් එනම්, 85 (21%) දෙනෙක් පිරිසිදුකරන්නන් ලෙස සේවය කරනු ලබයි.

නියැදියට ඇතුළත් කම්කරුවන්ගෙන් බහුතරයක් පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවෙහි නිරත වන බව ඉහත විශ්ලේෂිත තොරතුරු අනුව පැහැදිලි වේ.

2.1.10 මාසික ආදායම

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගේ මාසික ආදායම සම්බන්ධයෙන් විමසා බැලීමේ දී බහුතරයකගේ මාසික ආදායම රු. 30,000 - 40,000 අතර බව අනාවරණය විය. එය මුළු නියැදියෙන් 171 (43%) කි. අසූ නව (22%) දෙනෙකුගේ ආදායම රු. 20,000 - 30,000 අතර විය . අසූ අට (22%) දෙනෙක් මාසික ආදායම රු. 40,000 - 50,000 අතර බව ප්‍රකාශ කර තිබුණි. විසි අට (7%) දෙනෙක් රු. 60,000 - 70,000 අතර මාසික ආදායමක් ලැබෙන බව ප්‍රකාශ කරන ලදි. පහළොස් (4%) දෙනෙකුගේ මාසික ආදායම රු. 50,000 - 60,000 අතර විය. නව (2%) දෙනෙකුගේ මාසික ආදායම රු. 70,000 ට වැඩි බව ප්‍රකාශ කරන ලදි.

ප්‍රස්තාර අංක 09 - මාසික ආදායම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.2 ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්

අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් අට තුළ කම්කරු සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන් අතරින් අහඹු ලෙස එක් වැඩබිමකින් කම්කරුවන් පනස් දෙනෙකු බැගින් වැඩබිම් අට තුළින් කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යයන නියැදියට තෝරාගනු ලැබූ අතර ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත චර්යාවේ ස්වභාවය හා මත්ද්‍රව්‍ය භාවිත පැතිකඩ සම්බන්ධයෙන් අධ්‍යයනය තුළ අවධානය යොමුකරන ලදි. ඒ අනුව ලද පර්යේෂණ අනාවරණයන් මෙම පරිච්ඡේදය තුළ ඉදිරිපත් කර ඇත.

2.3 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම

අධ්‍යයන නියැදියට ඇතුළත් දත්තදායකයින් ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති වයස් මට්ටම සළකා බැලීමේදී අධ්‍යයන අනාවරණයන්ට අනුව 95 (24%) දෙනෙක් වයස අවුරුදු 10 - 15 ත් අතර වයස් මට්ටමකදී ද, 32 (8%) දෙනෙක් වයස අවුරුදු 21 - 25 ත් අතර වයස් මට්ටමකදී ද, 4 (1%) දෙනෙක් වයස අවුරුදු 30 ට වඩා වැඩි වයස් මට්ටමකදී ද, 3 (1%) දෙනෙක් වයස අවුරුදු 26 - 30 ත් අතර වයස් මට්ටමකදී ද ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇත. නියැදියට ඇතුළත් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 266 (66%) වයස අවුරුදු 16 - 20 ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කර තිබුණි.

ප්‍රස්තාර අංක 10 - ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.4 කම්කරුවන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය

අධ්‍යයන නියැදියට ඇතුළත් දත්තදායකයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අතීත තොරතුරු අධ්‍යයනය කිරීමේ දී ඔවුන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍යයන් මොනවා ද? යන්න අධ්‍යයනය තුළින් අනාවරණය කරගත හැකි විය. ඒ අනුව බහුතරයක් එනම්, පුද්ගලයින් 396 (99%) දෙනෙක් සිගරට්/ දුම්වැටි කෙදිනක හෝ භාවිත කර තිබිණ. තුන්සිය හැට හය (92%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර කෙදිනක හෝ භාවිත කර තිබූ අතර 347 (87%) දෙනෙක් කේරළ ගංජා කෙදිනක හෝ භාවිත කර තිබුණි. කෙදිනක හෝ දේශීය ගංජා භාවිත කළ පුද්ගල සංඛ්‍යාව 167 (42%) දෙනෙක් වූ අතර නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) කෙදිනක හෝ භාවිත කළ පුද්ගල සංඛ්‍යාව 146 (37%) ක් විය. මනෝවර්තක ඖෂධ 146 (37%) දෙනෙක් ද , දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන 144 (36%) දෙනෙක් ද, හෙරොයින් 125 (31%) දෙනෙක් ද, සිරප් වර්ග 50 (13%) දෙනෙක් ද කෙදිනක හෝ භාවිත කර තිබුණි. එල්. එස්. ඩී, කොකේන් වැනි මත්ද්‍රව්‍ය ද නියැදියට ඇතුළත් පුද්ගලයින් කෙදිනක හෝ භාවිත කර තිබූ අතර එම පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 4 (1%) දෙනෙක් සහ 3 (1%) දෙනෙක් විය. ඊට අමතරව 95 (24%) දෙනෙක් මදනමෝදක, හෂිස්, මෙතම්පිටමින් සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කෙදිනක හෝ භාවිත කර තිබුණි. ඒ අතරින් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 90 (94%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබුණි.

ප්‍රස්තාර අංක 11 - කම්කරුවන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.5 ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක

ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කිරීම කෙරෙහි කම්කරුවන් හට බලපාන ලද සාධක පිළිබඳව ද අධ්‍යයනයේදී විමර්ශනය කරන ලදි. එහිදී අනාවරණය වූයේ බහුතර පිරිසක් එනම්, 162 (41%) දෙනෙක් කුතුහලය නිසා ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කර ඇත. මිතුරු ඇසුර ද කම්කරුවන්ගේ ප්‍රථම මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපා ඇති අතර එම පුද්ගල සංඛ්‍යාව 128 (32%) කි. පුද්ගලයින් 64 (16%) දෙනෙක් සතුට/ විනෝදය සඳහා ද, 35 (9%) දෙනෙක් ගැටලු මඟහරවා ගැනීම සඳහා ද, 5 (1%) දෙනෙක් ලිංගික තෘප්තිය සඳහා ද ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කර ඇත. අත්හදා බැලීම, ආශාව, ආතතිය, වැඩකරද්දී මහන්සිය නැතිවීමට සහ තනිකම යනාදී වෙනත් හේතූන් ද කම්කරුවන්ගේ ප්‍රථම මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපා ඇත. එම පුද්ගල සංඛ්‍යාව 6 (1%) කි.

ප්‍රස්තාර අංක 12 - ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.6 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව

නියැදිය තුළ වූ කම්කරුවන් ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව සළකා බැලීමේ දී බහුතර කම්කරුවන් පිරිසක් එනම්, 317 (79%) දෙනෙක් මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. 39 (10%) දෙනෙක් උත්සව අවස්ථාවකදී ද, 11 (3%) දෙනෙක් ලිංගික සංසර්ගයේ යෙදෙන අවස්ථාවකදී ද ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. නව (2%) දෙනා බැගින් සේවා ස්ථානයේදී සහ තනි වූ අවස්ථාවකදී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබූ අතර 6 (2%) දෙනෙක් ගැටලුවක් වූ අවසථාවකදී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. වෙනත් අවස්ථාවන්හි දී එනම්, විනෝද ගමනක් ගිය අවස්ථාවක දී සහ නෑදෑ නිවසක දී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර ඇති පුද්ගල සංඛ්‍යාව 9 (2%) දෙනෙක් විය.

ප්‍රස්තාර අංක 13 - ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.7 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම

ඉහත සඳහන් කරන ලද අවස්ථාවන්හි දී කම්කරුවන් හට යම් මත්ද්‍රව්‍යක් ප්‍රථමයෙන් හඳුන්වා දෙනු ලැබුවේ කා විසින් ද? යන්න මෙම අධ්‍යයනයේ දී විමසා බලන ලදි. අධ්‍යයන අනාවරණයන්ට අනුව කම්කරුවන් බහුතරයකට එනම්, 266 (66%) දෙනෙකුට ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් හඳුන්වා දී ඇත්තේ තම සමීපතම මිතුරෙකු හෝ මිතුරියක විසිනි. තමන් විසින් යම් මත්ද්‍රව්‍යක් ප්‍රථම වරට භාවිත කළ පිරිස 57 (14%) ක් වූ අතර ඥාතියෙකු විසින් ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් හඳුන්වා දී ඇති කම්කරුවන් සංඛ්‍යාව 47 (12%) ක් විය. මත්ද්‍රව්‍ය වෙළෙන්දෙකු විසින් කම්කරුවන් 16 (4%) දෙනෙකුට ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇති අතර තමා සේවයෙහි නියුතු වූ වැඩබිමෙහි දී කම්කරුවන් 11 (3%) දෙනෙකුට එම වැඩබිමෙහි සේවයෙහි නියුතු වූ මිතුරෙකු විසින් ප්‍රථම වරට මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇත. සේවායෝජක සහ රියදුරු සහයක මඟින් ද ප්‍රථම වරට මත්ද්‍රව්‍යක් හඳුනාගත් කම්කරුවන් ද නියැදිය තුළ නියෝජනය වූ අතර එම කම්කරුවන් සංඛ්‍යාව 3 (1%) ක් විය.

ප්‍රස්තාර අංක 14 - ප්‍රථම වරට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

තමා සේවයෙහි නියුතු වූ වැඩ බිමෙහි සේවය කළ මිතුරෙකු විසින් ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී තිබීම ඉහත විශ්ලේෂණය තුළ හඳුනාගත හැකි සුවිශේෂී කාරණයක් වේ. ඒ අනුව වැඩ බිම්වල සේවයට පැමිණීමත් සමඟ ඇතැම් කම්කරුවන් කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිතය ආරම්භ කර ඇති බව තහවුරු වේ.

2.8 කම්කරුවන් විසින් පසුගිය වසර තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය

අධ්‍යයන අනාවරණයන්ට අනුව සමස්ත දත්තදායකයින් අතරින් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 396 (99%) ක් පසුගිය වසර තුළ සිගරැට් හෝ දුම්වැටි භාවිත කර තිබුණි. තුන්සිය හතලිස් හයක් (87%) නීත්‍යානුකූල මද්‍යසාර ද, 331 (83%) ක් කේරළ ගංජා ද, 146 (37%) ක් දේශීය ගංජා ද පසුගිය වසර තුළ භාවිත කර තිබූ අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන 106 (27%) ක් පසුගිය වසර තුළ භාවිත කර තිබිණ. මත් පෙති, හෙරොයින්, නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු), සිරප් වර්ග පසුගිය වසර තුළ භාවිත කළ පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 99 (25%), 69 (17%), 50 (13%) සහ 11 (3%) ක් විය. පසුගිය වසර තුළ කොකේන් සහ එල්.එස්.ඩී (LSD) භාවිත කළ පුද්ගලයින් ද එක් අයෙක් බැගින් විය. පසුගිය වසර තුළ මදනමෝදක සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබූ පුද්ගලයින් 86 (22%) දෙනෙක් ද වූ අතර එයින් බහුතරයක් එනම්, 85 (99%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබූ පුද්ගලයින් විය.

ප්‍රස්තාර අංක 15 - කම්කරුවන් විසින් පසුගිය වසර තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

පසුගිය වසර තුළ කම්කරුවන් විසින් භාවිත කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ ඉහත විශ්ලේෂිත කරුණු අනුව ඉහළම ප්‍රචලිත බවක් තිබූ මත්ද්‍රව්‍ය සිගරට් හෝ දුම්වැටි බව පැහැදිලි වේ. පසුගිය වසර තුළ නීත්‍යනුකූල මද්‍යසාර, කේරළ ගංජා, දේශීය ගංජා සහ දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිතය අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයට වඩා ඉහළ ප්‍රචලිත බවක් පැවත ඇති බව තවදුරටත් පැහැදිලි වේ. කොකේන් සහ එල්.එස්.ඩී (LSD) භාවිතය සම්බන්ධයෙන් කම්කරුවන්ගේ අඩු ප්‍රචලිත බවක් හඳුනාගත හැකිය.

2.9 කම්කරුවන් විසින් පසුගිය තෙමස තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය

නියැදියට ඇතුළත් දත්තදායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පසුගිය තෙමස තුළ ඔවුන් භාවිත කරන ලද මත්ද්‍රව්‍යයන් මොනවා ද? යන්නත් අනාවරණය විය. ඒ අනුව 328 (82%) දෙනෙක් නීත්‍යනුකූල මද්‍යසාර භාවිත කර තිබූ අතර 318 (18%) දෙනෙක් කේරළ ගංජා භාවිත කර තිබිණ. දේශීය ගංජා, දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, පෙති වර්ග, නීතිවිරෝධී මද්‍යසාර, හෙරොයින් සහ සිරප් වර්ග භාවිත කළ පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 133 (33%), 95 (24%), 76 (19%), 30 (8%), 41 (10%) සහ 4 (1%) දෙනෙක් විය. කොකේන් සහ එල්. එස්. ඩී (LSD) භාවිත කළ පුද්ගලයින් එක් අයෙකු බැගින් වූ අතර බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 395 (99%) දෙනෙක් සිගරට් හෝ දුම්වැටි භාවිත කර තිබිණ. ඊට අමතරව 85 (21%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබිණ.

ප්‍රස්තාර අංක 16 - කම්කරුවන් විසින් පසුගිය තෙමස තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.10 කම්කරුවන් විසින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් දැනට භාවිත කරනු ලබන එක් එක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේ දී කම්කරුවන් 314 (79%) දෙනෙක් කේරළ ගංජා දැනට භාවිත කරනු ලබන අතර 305 (76%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරනු ලබයි. එකසිය විසි දෙනෙක් (30%) දේශීය ගංජා ද, 82 (21%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද දැනට භාවිත කරන බවට අධ්‍යයන තුළින් අනාවරණය විය. පෙති වර්ග සහ හෙරොයින් දැනට භාවිත කරන කම්කරුවන් සංඛ්‍යාව පිළිවෙළින් 65 (16%) දෙනෙක් සහ 36 (9%) දෙනෙක් විය. ඊට අතිරේකව එල්.එස්.ඩී (LSD) සහ සිරප් වර්ග දැනට භාවිත කරන කම්කරුවන් එක් අයෙකු බැගින් ද නියැදිය තුළ විය. අසූ එක් දෙනෙක් (20%) හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කරන බවට අධ්‍යයනය තුළින් අනාවරණය විය. නියැදියට ඇතුළත් දත්තදායකයින්ගෙන් බහුතරයක් කම්කරුවන් එනම්, 395 (99%) දෙනෙක් සිගරට්/ දුම්වැටි භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තවදුරටත් අනාවරණය විය.

ප්‍රස්තාර අංක 17 - කම්කරුවන් විසින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

නියැදියට ඇතුළත් සියලු කම්කරුවන්ගේ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය විශ්ලේෂණය කර බැලීමේ දී පැහැදිලි වන ප්‍රධාන කාරණය නම් කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන බවයි. එමෙන්ම සිගරැට්/ දුම්වැටි භාවිතය සම්බන්ධයෙන් ඉහළම ප්‍රචලිත බවක් හඳුනාගත හැකිය. නීත්‍යානුකූල මද්‍යසාර, දේශීය ගංජා, කේරළ ගංජා, දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, මත්පෙති සහ හෙරොයින් ද කම්කරුවන් අතර ප්‍රචලිතව පවතින මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකිය. පෙර සඳහන් කරන ලද මත්ද්‍රව්‍යයන්ට සාපේක්ෂව එල්. එස්. ඩී (LSD) සහ සිරප් වර්ග භාවිතයෙහි අඩු ප්‍රචලිත බවක් පවතින බව ද හඳුනාගත හැකිය.

2.11 කම්කරුවන්ගේ සිගරැට්/ දුම්වැටි සහ මද්‍යසාර ආශ්‍රිත ප්‍රවණතා

2.11.1 සිගරැට්/ දුම්වැටි භාවිතය

කම්කරුවන්ගේ සිගරැට්/ දුම්වැටි භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් 395 (99%) දෙනෙක් දැනට සිගරැට්/ දුම්වැටි භාවිත කරන අතර එයින් 373 (94%) දෙනෙක් දිනපතා සිගරැට්/ දුම්වැටි භාවිත කරයි. විසි එක් දෙනෙක් (5%) ඉඳහිට සිගරැට්/ දුම්වැටි භාවිත කරනු ලබන අතර එක් අයෙකු (0.25%) කලාතුරකින් සිගරැට්/ දුම්වැටි භාවිත කරනු ලබයි.

ඉහත විශ්ලේෂිත කරුණු දෙස සළකා බැලීමේ දී පැහැදිලි වන්නේ, දැනට සිගරැට්/ දුම්වැටි භාවිත කරන කම්කරුවන් අතරින් බහුතරයක් දෙනා දිනපතා සිගරැට්/ දුම්වැටි භාවිත කිරීමට යොමු වී සිටින බවයි. ඒ අනුව කම්කරුවන් අතර සිගරැට්/ දුම්වැටි භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින බව තහවුරු වේ.

2.11.2 මද්‍යසාර භාවිතය

අධ්‍යයනයට භාජනය කරන ලද කම්කරුවන්ගේ මද්‍යසාර භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී නියැදිය තුළ වූ කම්කරුවන් දැනට නීත්‍යානුකූල මද්‍යසාර සහ නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය. අධ්‍යයනයට භාජනය කරන ලද කම්කරුවන්ගෙන් 305 (76%) දෙනෙක් දැනට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් වූ අතර 17 (4%) දෙනෙක් දැනට නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන්නන් විය.

නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කම්කරුවන් 305 (76%) දෙනා අතරින් 40 (13%) දෙනෙක් දිනපතා නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් වූ අතර 56 (18%) දෙනෙක් කලාතුරකින් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් විය. ඊට අතිරේකව 30 (10%) දෙනෙක් විශේෂිත අවස්ථාවන්හිදී පමණක් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් විය. දැනට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කම්කරුවන් අතරින් බහුතරයක් එනම්, 179 (59%) දෙනෙක් ඉඳහිට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් විය.

කම්කරුවන්ගේ නීතිවිරෝධී මද්‍යසාර භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දැනට නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන කම්කරුවන් 17 (4%) දෙනා අතරින් 11 (65%) දෙනෙක් ඉඳහිට නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන කම්කරුවන් වූ අතර 6 (35%) දෙනෙක් කලාතුරකින් නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන්නන් විය. දැනට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කම්කරුවන් අතර දිනපතා නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කිසිවෙකු නොසිටීම, කම්කරුවන්ගේ නීතිවිරෝධී මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් අනාවරණය වූ එක් විශේෂිත කරුණකි.

2.12 කම්කරුවන්ගේ ගංජා භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ රටා

අධ්‍යයන නියැදියට ඇතුළත් වූ කම්කරුවන්ගෙන් 314 (79%) දෙනෙක් කේරළ ගංජා දැනට භාවිත කරන්නන් වූ අතර 120 (30%) දෙනෙක් දැනට දේශීය ගංජා භාවිත කරන්නන් විය. ඔවුන් සියලු දෙනාම දුමක් ලෙස එය භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් 314 (79%) දෙනා අතුරින් 171 (54%) දෙනෙක් වැනි බහුතර කම්කරු පිරිසක් දිනපතා කේරළ ගංජා භාවිත කරනු ලබන අතර 118 (38%) දෙනෙක් ඉඳහිට කේරළ

ගංජා භාවිත කරනු ලබයි. ඊට අමතරව 22 (7%) දෙනෙක් කලාතුරකින් කේරළ ගංජා භාවිත කරනු ලබන අතර 3 (1%) දෙනෙක් විශේෂිත අවස්ථාවන්හි දී පමණක් කේරළ ගංජා භාවිත කරනු ලබයි.

ප්‍රස්තාර අංක 18 - කම්කරුවන්ගේ කේරළ ගංජා භාවිතය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

කම්කරුවන් අතර කේරළ ගංජා දිනපතා භාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු වේ.

අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ නියෝජනය වූ දැනට කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා කේරළ ගංජා සපයා ගන්නා ආකාරය පිළිබඳව විමසීමේදී, බහුතරයක් එනම්, 138 (44%) දෙනෙක් සේවා ස්ථානයේ මිතුරෙකුගෙන් ද, 129 (41%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකුගෙන් ද, 84 (27%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරෙකුගෙන් ද, 26 (8%) දෙනෙක් පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවෙකුගෙන් ද සපයාගන්නා බවට ප්‍රතිචාර දක්වා තිබිණ.

ප්‍රස්තාර අංක 19 - කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා කේරළ ගංජා සපයා ගන්නා ආකාරය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

කම්කරුවන්ගේ කේරළ ගංජා සපයා ගැනීම සම්බන්ධ විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වන්නේ, සේවා ස්ථානය තුළ වූ මිතුරන්ගෙන් කේරළ ගංජා සපයා ගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවයි.

දේශීය ගංජා දැනට භාවිත කරන කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දැනට දේශීය ගංජා භාවිත කරන කම්කරුවන් 120 (30%) දෙනා අතරින් බහුතරයක් එනම්, 57 (48%) දෙනෙක් ඉඳහිට දේශීය ගංජා භාවිත කරන අතර 38 (32%) දෙනෙක් දිනපතා දේශීය ගංජා භාවිත කරයි. ඊට අමතරව 22 (18%) දෙනෙක් කලාතුරකින් දේශීය ගංජා භාවිත කරන අතර 3 (3%) දෙනෙක් විශේෂිත අවස්ථාවන්හි දී පමණක් දේශීය ගංජා භාවිත කරනු ලබයි.

ප්‍රස්තාර අංක 20 - කම්කරුවන්ගේ දේශීය ගංජා භාවිතය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

සිය භාවිතය සඳහා කම්කරුවන් දේශීය ගංජා සපයා ගන්නා ආකාරය සළකා බැලීමේ දී අධ්‍යයන අනාවරණයන්ට අනුව බහුතරයක් එනම්, 94 (78%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකුගෙන් දේශීය ගංජා සපයා ගන්නා අතර 31 (26%) දෙනෙක් සේවා ස්ථානයේ මිතුරෙකුගෙන් ද, 23 (19%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරෙකුගෙන් ද, 7 (6%) දෙනෙක් පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවෙකුගෙන් ද දේශීය ගංජා සපයා ගනී.

ප්‍රස්තාර අංක 21 - කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා දේශීය ගංජා සපයා ගන්නා ආකාරය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.13 කම්කරුවන්ගේ හෙරොයින් භාවිත ප්‍රවණතා සහ රටා

හෙරොයින් භාවිත කරන කම්කරුවන්ගේ හෙරොයින් භාවිත රටා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී

හෙරොයින් භාවිත කරනු ලබන අතර 7 (19%) දෙනෙක් කලාතුරකින් හෙරොයින් භාවිත කරනු ලබයි. ඊට අමතරව දෙදෙනෙක් (6%) විශේෂිත අවස්ථාවන්හි දී හෙරොයින් භාවිත කරනු ලබයි. හෙරොයින් දැනට භාවිත කරනු ලබන කම්කරුවන් අතුරින් බහුතර පිරිසක් එනම්, 17 (47%) දෙනෙක් ඉඳහිට හෙරොයින් භාවිත කරනු ලබන බව අධ්‍යයනය තුළින් තවදුරටත් අනාවරණය විය.

ප්‍රස්තාර අංක 22 - කම්කරුවන්ගේ හෙරොයින් භාවිතය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

කම්කරුවන්ගේ හෙරොයින් භාවිතය හා සම්බන්ධ ප්‍රවණතා අධ්‍යයනයෙහි දී ඔවුන් හෙරොයින් භාවිත කිරීමට අනුගමනය කරන ක්‍රම පිළිබඳව ද අවධානය යොමුකරන ලදි. ඒ අනුව දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් 36 (9%) දෙනාගෙන් 33 (92%) දෙනෙක් චයිනිස් ක්‍රමය (Chases The Dragon) භාවිත කරන බවත්, 3 (8%) දෙනෙක් ඉරීම/ ආඝ්‍රාණය කිරීම මඟින් හෙරොයින් ශරීරගත කර ගන්නා බවත් අනාවරණය විය. දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන්ගෙන් එක් අයෙකු පමණක් හෙරොයින් එන්නත් කරගන්නා බව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් සිය භාවිතය සඳහා හෙරොයින් සපයා ගන්නා ආකාරය පිළිබඳව සළකා බැලීමේ දී කම්කරුවන් 6 (17%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරෙකුගෙන් ද, 4 (11%) දෙනෙකු බැගින් සේවා ස්ථානයේ මිතුරෙකුගෙන් සහ පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවෙකුගෙන් ද හෙරොයින් සපයා ගන්නා බව අනාවරණය විය. දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් අතරින් 26 (72%) දෙනෙක් වැනි බහුතර පිරිසක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකුගෙන් හෙරොයින් සපයා ගන්නා බවට තොරතුරු අනාවරණය වූ අතර නියැදිය තුළ නියෝජනය වූ එක් කාන්තාවක් තම අනියම් සැමියාගෙන් හෙරොයින් සපයා ගන්නා බවට තවදුරටත් අධ්‍යයනය මඟින් තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 23 - කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා හෙරොයින් සපයා ගන්නා ආකාරය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.14 කම්කරුවන් අතර ඖෂධ (පෙති වර්ග/ සිරප් වර්ග) අවභාවිතය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් අතුරින් 65 (16%) දෙනෙක් ඖෂධ (පෙති වර්ග) දැනට භාවිත කරයි. ඒ අතුරින් 27 (42%) දෙනෙක් ඉදහිට පෙති වර්ග භාවිත කරන අතර 19 (29%) දෙනෙක් කලාතුරකින් පෙති වර්ග භාවිත කරයි. දිනපතා ඖෂධ (පෙති වර්ග) අවභාවිත කරන කම්කරුවන් ද ඖෂධ (පෙති වර්ග) අවභාවිත කරන පිරිස තුළ වූ අතර එම කම්කරුවන් සංඛ්‍යාව 17 (26%) දෙනෙකි.

කම්කරුවන් අතර සිරප් වර්ග අවභාවිතය පිළිබඳ සළකා බැලීමේ දී නියැදිය තුළ වූ කම්කරුවන්ගෙන් එක් අයෙකු පමණක් දැනට සිරප් වර්ග භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

දැනට පෙති වර්ග අවභාවිත කරන කම්කරුවන්ගේ ඖෂධ (පෙති වර්ග) අවභාවිත කරන ක්‍රමය සළකා බැලීමේ දී අනාවරණය වූයේ, ඔවුන් අතුරින් එක් අයෙකු පමණක් මෝර්ෆීන් සල්ෆේට් නැමති පෙති වර්ගය එන්නත් කරගන්නා බවත්, සෙසු පුද්ගලයින් පෙති වර්ග පානය කරන බවත්ය.

දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගේ ඖෂධ (පෙති වර්ග) සපයා ගැනීම සම්බන්ධව අනාවරණය වූ තොරතුරු අනුව දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 43 (66%) දෙනෙක් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) ලබාගනී. ඔවුන් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) නීත්‍යනුකූල නොවන ආකාරයට ලබාගන්නා අතර ඖෂධහල් හිමියා සමඟ තිබෙන පෞද්ගලික දැන හැඳුනුම්කම් මත හෝ ව්‍යාජ වෛද්‍ය නිර්දේශ භාවිත කිරීම මත එම ඖෂධ (පෙති වර්ග) ලබාගැනීම සිදුකරනු ලබයි. ඖෂධහල්වලින් නීත්‍යනුකූල නොවන ආකාරයට ඖෂධ (පෙති වර්ග) ලබාගැනීමට අමතරව 11 (17%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවකුගෙන් ද, 8 (12%) දෙනෙක් පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවකුගෙන් ද, 6 (9%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරකුගෙන් ද, එක් කම්කරුවකු පමණක් (2%) සේවා ස්ථානයේ මිතුරකුගෙන් ද ඖෂධ (පෙති වර්ග) ලබා ගන්නා බව අනාවරණය විය.

2.15 කම්කරුවන් අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන සහ එල්.එස්.ඩී භාවිතය හා ඒ අශ්‍රිත ප්‍රවණතා

අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ දැනට දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන කම්කරුවන් ද සිටි අතර එම කම්කරුවන් 82 (21%) දෙනා අතුරින් 47 (57%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ඉඳහිට භාවිත කරන්නන් විය. තිස් තුන් දෙනෙක් (40%) දිනපතා දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන්නන් වූ අතර දෙදෙනෙක් (2%) කලාතුරකින් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන්නන් විය.

එල්.එස්.ඩී දැනට භාවිත කරන එක් කම්කරුවෙක් පමණක් අධ්‍යයන නියැදිය තුළ වූ අතර එම පුද්ගලයා ද කලාතුරකින් පමණක් එල්.එස්.ඩී භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

2.16 කම්කරුවන් මත්ද්‍රව්‍ය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය

කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය පිළිබඳව විමර්ශනය කිරීමේ දී නියැදියට අයත් සියලු කම්කරුවන්ගෙන් බහුතර පිරිසක් එනම්, 122 (30%) දෙනෙක් රු. 501 - 750 ත් අතර මුදලක් වැය කරන බවට තොරතුරු අනාවරණය වූ අතර 111 (28%) දෙනෙක් රු. 251 - 500 ත් අතර මුදලක් ද, 89 (22%) දෙනෙක් රු. 751 - 1000 ත් අතර මුදලක් ද වැය කරන බවට තොරතුරු අනාවරණය විය. ඊට අතිරේකව රු. 100 - 250 ත් අතර මුදලක් හා රු. 1001 - 2000 ත් අතර මුදලක් භාවිත කරන කම්කරුවන් 39 (10%) දෙනා බැගින් විය.

ප්‍රස්තාර අංක 24 - කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.17 මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කම්කරුවන් මුදල් උපයාගන්නා ආකාරය

අධ්‍යයනය තුළ නියෝජනය වූ කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතය සඳහා අවශ්‍ය මුදල් සපයාගන්නේ කෙසේ ද? යන්න පිළිබඳව ද අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ලදි. ඒ අනුව නියැදියට ඇතුළත් වූ සියලුම කම්කරුවන් තම ප්‍රධාන රැකියාව වන කම්කරු සේවයෙහි නිරතවීමෙන් උපයාගන්නා මුදල්වලින් ද මත්ද්‍රව්‍ය මිලදී ගන්නා බවට කරුණු අනාවරණය විය. සමස්ත නියැදිය තුළ වූ කම්කරුවන්ගෙන් 58 (15%) දෙනෙක් තම ප්‍රධාන රැකියාවට අමතරව වෙනත් සුළු රැකියාවක නිරත වීමෙන් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් සපයාගන්නා බවට තොරතුරු අනාවරණය විය. 38 (10%) දෙනෙක් වෙනත් පුද්ගලයෙකුගෙන් ණයට මුදල් ලබාගැනීම සිදුකරන බවට ප්‍රකාශ කර තිබූ අතර 12 (3%) දෙනෙක් අනිකාල දීමනා සඳහා ලැබෙන මුදලින් මත්ද්‍රව්‍ය මිලදී ගන්නා බව ප්‍රකාශ කර තිබිණ.

සමස්ත නියැදිය තුළ නියෝජනය වූ කාන්තාවන් 4 (1%) දෙනෙක් කම්කරු සේවයෙහි නියැළීමට අමතරව ගණිකා වෘත්තියෙහි නියැළී මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් උපයාගන්නා බවට තොරතුරු අනාවරණය විය. ඇතැම් පුද්ගලයින් තම ප්‍රධාන රැකියාවට අමතරව සමාජ විරෝධී සහ නීතිවිරෝධී ක්‍රියා සිදුකිරීම මඟින් ද මුදල් උපයාගනී. ඒ අනුව මත්ද්‍රව්‍ය අලෙවි කිරීම මඟින් කම්කරුවන් 14 (4%) දෙනෙක් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් සපයා ගනී. 12 (3%) දෙනෙක් තමා සේවය කරනු ලබන සේවා ස්ථානය තුළ තිබෙන සුළු උපකරණ සොරකම් කර අලෙවි කිරීම මඟින් එසේත් නැත්නම් සේවා ස්ථානයේ සේවයෙහි නියුතු පුද්ගලයින්ගෙන් හෝ බාහිර පුද්ගලයින්ගේ මුදල් පසුම්බි, අත්ඔරලෝසු හෝ ජංගම දුරකථන වැනි දෑ සොරකම් කර අලෙවි කිරීම මඟින් මුදල් සපයා ගැනීම, තම ඥාතියෙකුගෙන් හෝ මිතුරෙකුගෙන් මුදල් සපයා ගැනීම සිදුකරන බවට අධ්‍යයනය තුළින් තවදුරටත් තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 25 - මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කම්කරුවන් මුදල් උපයාගන්නා ආකාරය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.18 ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල ස්වභාවය හා කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාවේ ස්වභාවය

2.18.1 සේවා ස්ථානය තුළ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වාභාවය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගෙන් 320 (80%) දෙනෙක් තමා සේවය කරනු ලබන සේවා ස්ථානය තුළ කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බවට ප්‍රතිචාර දක්වා තිබිණි. ඔවුන්ගෙන් 247 (77%) දෙනෙක් සේවා ස්ථානය තුළ දිනපතා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් වූ අතර සෙසු කම්කරුවන් 73 (23%) දෙනා සේවා ස්ථානය තුළ දිනපතා මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ.

සේවා ස්ථානය තුළ කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් භාවිත කර ඇති මත්ද්‍රව්‍ය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී අනාවරණය වූයේ ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 306 (96%) දෙනෙක් සිගරැට්/ දුම්වැටි භාවිත කර ඇති බවයි. එකසිය විසිහය දෙනෙක් (39%) පෙති වර්ග භාවිත කළ බවටත්, 75 (23%) දෙනක් කේරළ ගංජා භාවිත කළ බවටත් තොරතුරු අනාවරණය විය. සේවා ස්ථානය තුළ දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කළ කම්කරුවන් 55 (17%) දෙනෙක් ද වූ අතර සිරප් වර්ග භාවිත කළ කම්කරුවන් 27 (8%) දෙනෙක් ද විය. ඊට අමතරව 21

(7%) දෙනෙක් දේශීය ගංජා භාවිත කර ඇති අතර 9 (3%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කර ඇත. 45 (14%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර ඇත.

ප්‍රස්තාර අංක 26 - කම්කරුවන් සේවා ස්ථානය තුළ කෙදිනක හෝ භාවිත කර ඇති මත්ද්‍රව්‍ය



මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

ඉහත විශ්ලේෂිත කරුණු අනුව සේවා ස්ථානය තුළ යම් මත්ද්‍රව්‍යක් භාවිත කළ කම්කරුවන් අතර ඉහළම ප්‍රචලිත බවක් සිගරට්/ දුම්වැටි සම්බන්ධයෙන් පවතින අතර පෙති වර්ග දෙවන ස්ථානයටත්, කේරළ ගංජා තෙවන ස්ථානයටත් ප්‍රචලිත බව තහවුරු වේ. එමෙන්ම සේවා ස්ථානය තුළ දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, සිරප් වර්ග, දේශීය ගංජා සහ නීත්‍යානුකූල මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් ද යම් ප්‍රචලිත බවක් පවතින බව තහවුරු වේ. අන්තරායකර ඖෂධ සම්බන්ධයෙන් සැළකූ විට සෙසු මත්ද්‍රව්‍යයන්ට සාපේක්ෂව කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින බව ඉහත විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ. මේ අනුව තහවුරු වන්නේ, සේවා ස්ථාන තුළ කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවයි.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ කම්කරුවන් එම මත්ද්‍රව්‍ය භාවිත කරනු ලැබුවේ කවුරුන් සමඟ ද යන්න පිළිබඳව ද අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ලද අතර තනිවම කම්කරුවන් 182 (57%) දෙනෙක් ද, ඥාතියෙකු සමඟ එක් කම්කරුවෙක් ද, සේවා ස්ථානයේ නොවන මිතුරන් සමඟ එක් කම්කරුවකු ද මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය වූ අතර බහුතර කම්කරු පිරිසක් එනම්, 210 (66%) දෙනෙක් සේවා ස්ථානයේ මිතුරන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය විය.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ කම්කරුවන් එම මත්ද්‍රව්‍ය භාවිත කර ඇත්තේ කවුරුන් සමඟ ද යන්න සම්බන්ධයෙන් විශ්ලේෂිත කරුණු තුළින් තහවුරු වන්නේ, කම්කරුවන් සේවා ස්ථානය තුළ මිතුරන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවයි.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන ස්ථාන පිළිබඳව අවධානය යොමු කිරීමේදී කම්කරුවන් බහුතරයක් එනම්, 139 (43%) දෙනෙක් වැසිකිලියේදී මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය වූ අතර දුම්පානය සඳහා වෙන්කර ඇති ස්ථානයේදී 72 (23%) දෙනෙක් ද, සේවා ස්ථානය තුළ තාවකාලිකව නවාතැන්ගෙන ඇති කාමරයේදී 55 (17%) දෙනෙක් ද, කිසිවෙකුත් නොගැවසෙන තැනකදී 54 (17%) දෙනෙක් ද, ආපන ශාලාවේදී 17 (5%) දෙනෙක් ද මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය විය. විවේක ගන්නා ස්ථානයේ, මුරකුටිය අසළ සහ ආවරණය වූ ස්ථානයක මත්ද්‍රව්‍ය භාවිත කළ කම්කරුවන් සංඛ්‍යාව පිළිවෙළින් 7 (2%), 6 (2%) සහ 5 (2%) විය.

කම්කරුවන් 3 (1%) දෙනා බැගින් ආහාර ගන්නා ස්ථානයේ දී සහ වාහනය තුළ දී මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තවදුරටත් තොරතුරු අනාවරණය විය.

ප්‍රස්තාර අංක 27 - කම්කරුවන් සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන ස්ථාන



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති බව මූලික තොරතුරු සපයන්නන්ගෙන් අනාවරණය වූ අතර ඒ හේතුව නිසාවෙන්ම කම්කරුවන් සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සිදුකරනු ලබන්නේ රහසිගත ස්ථානයන්හිදී බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු විය.

2.18.2 කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථා

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථාවන් සළකා බැලීමේ දී ඔවුන් පහත සඳහන් අවස්ථාවන්හි දී මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

වගු අංක 04 - කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථා

මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථාව	සංඛ්‍යාව	%
සේවය ආරම්භ කිරීමට පෙර	243	61
සේවයෙහි නිරතව සිටින අතරතුර	189	47
විවේක කාලය අතරතුර	343	86
සේවය නිම කිරීමෙන් පසු	389	97

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.18.3 සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

දත්ත විශ්ලේෂණයට අනුව සමස්ත නියැදියෙන් කම්කරුවන් 243 (61%) දෙනෙක් සේවය ආරම්භ කිරීමට පෙර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරයි. මේ සම්බන්ධයෙන් හේතු විමර්ශනය කිරීමේදී ප්‍රස්තුත ගණනාවක් හඳුනාගත හැකිවිය. ඒ අනුව සේවය ආරම්භ කිරීමට පෙර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 197 (81%) දෙනෙක් පුරුද්දක් ලෙස කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. දහතුන් දෙනෙක් (5%) කාර්යක්ෂමව

වැඩකිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 11 (4%) දෙනෙක් විශේෂ හේතුවක් නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ. සේවය ආරම්භ කිරීමට ප්‍රථම කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතූන් පහත පරිදි විය.

වගු අංක 05 - සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව

සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව	සංඛ්‍යාව	%
පුරුද්දට	197	81.07
විශේෂ හේතුවක් නැත	11	4.53
ශරීර වේදනාව නිසා	4	1.65
විනෝදයට	5	2.06
පාළුව නිසා	3	1.23
ප්‍රශ්න අමතක කරන්න	1	0.41
ආසාවට	3	1.23
කාර්යක්ෂමව වැඩ කිරීමට	13	5.35
යහළුවන් සමඟ එකතු වූ විට	2	0.82
ඇඟට ශක්තියක් එන නිසා	2	0.82
ආතතිය වැඩි නිසා	1	0.41
නිවැරදිව සේවය කරන්න	1	0.41
කික් එකක් ගන්න	2	0.82
එකතුව	243	100

මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

සේවය ආරම්භ කිරීමට පෙර කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන්ගෙන් 105 (43%) දෙනෙක් වැනි බහුතරයක් සේවය ආරම්භ කිරීමට පැයකට පෙර දී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 84 (35%) දෙනෙක් විනාඩි 30 කට පෙර දී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබුණි. විනාඩි 20 කට පෙර දී සහ පැය දෙකකට පෙරදී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් සංඛ්‍යාව 14 (6%) දෙනා බැගින් විය. සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍යයක් භාවිත කරන සෙසු කම්කරුවන් මේ සම්බන්ධයෙන් ලබා දී තිබූ පිළිතුරු පහත පරිදි විය.

2.18.4 සේවයෙහි නිරතව සිටින අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/ සාධක

සමස්ත නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගෙන් 189 (47%) දෙනෙක් සේවයෙහි නිරතව සිටින අතරතුර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 116 (61%) දෙනෙක් පුරුද්දක් ලෙස මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 24 (13%) දෙනෙක් විශේෂ හේතුවක් නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ. ඊට අමතරව 19 (10%) දෙනෙක් කාර්යක්ෂමව වැඩ කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. සේවය කරන අතරතුර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතූන් පහත පරිදි විය.

වගු අංක 06 - සේවය කරන අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු

සේවය කරන අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව	සංඛ්‍යාව	%
පුරුද්දට	116	61.38
විශේෂ හේතුවක් නැත	24	12.70
ශරීර වේදනාව නිසා	7	3.70
විනෝදයට	2	1.06
පාළුව නිසා	5	2.65
කාර්යක්ෂමව වැඩ කිරීමට	19	10.05
යහළුවන් සමඟ එකතු වූ විට	2	1.06
ඇඟට ශක්තියක් එන නිසා	1	0.53
මහන්සියට	8	4.23
ආතතිය වැඩි නිසා	1	0.53
කික් එකක් ගන්න	1	0.53
මහන්සිය නොදැනි වැඩකරන්න	5	2.65
ඒකාකාරීබවෙන් මිදීමට	1	0.53
එකතුව	189	100

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.18.5 විවේක කාලය අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

විවේක කාලය අතරතුරදී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන් ද නියැදිය තුළ නියෝජනය වූ අතර එම කම්කරු සංඛ්‍යාව 343 (86%) ක් විය. ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 144 (42%) දෙනෙක් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 87 (25%) දෙනෙක් විනෝදය සඳහා කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. මහන්සි නොදැනී වැඩ කිරීමට, යහළුවන් සමඟ එකතු වූ විට, විශේෂ හේතුවක් නොමැත යන්න ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් සංඛ්‍යාව පිළිවෙළින් 29 (8%), 22 (6%) සහ 20 (6%) දෙනෙක් විය. විවේක කාලය අතරතුර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතූන් පහත පරිදි විය.

වගු අංක 07 - විවේක කාලය අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව

විවේක කාලය අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව	**සංඛ්‍යාව**	**%**
පුරුද්දට	144	41.983
විශේෂ හේතුවක් නැත	20	5.831
ශරීර වේදනාව නිසා	6	1.749
විනෝදයට	87	25.364
පාළුව නිසා	17	4.956
ප්‍රශ්න අමතක කරන්න	2	0.583
ආසාවට	11	3.207
නිදිමත නැතිවීමට	1	0.292
යහළුවන් සමඟ එකතු වූ විට	22	6.414
මහන්සියට	5	1.458
ආතතිය වැඩි නිසා	1	0.292
කික් එකක් ගන්න	2	0.583
මහන්සිය නොදැනි වැඩකරන්න	29	8.455
එකතුව	343	100

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.18.6 සේවය නිම කිරීමෙන් පසු මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

සේවය නිම කිරීමෙන් පසු කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් සංඛ්‍යාව 389 (97%) දෙනෙක් විය. ඔවුන්ගෙන් බහුතරයක් ශරීර වේදනාව නිසා මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. පනස් නව දෙනෙක් (15%) පුරුද්දක් ලෙසටත්, 76 (20%) දෙනෙක් මහන්සිය නැතිවීමටත්, 33 (8%) දෙනෙක් පාළුව නිසාත් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. ඊට අමතරව 41 (11%) දෙනෙක් එයට විශේෂ හේතුවක් නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ. සේවය නිම කිරීමෙන් පසු කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතූන් පහත පරිදි විය.

වගු අංක 08 - සේවය අවසන් කළ පසු මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව

සේවය අවසන් කළ පසු මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව	සංඛ්‍යාව	%
පුරුද්දට	59	15.167
විශේෂ හේතුවක් නැත	41	10.540
ශරීර වේදනාව නිසා	149	38.303
විනෝදයට	15	3.856
පාළුව නිසා	33	8.483
ප්‍රශ්න අමතක කරන්න	5	1.285
ආසාවට	3	0.771
නින්දයාමට	18	4.627
නිදිමත නැතිවීමට	1	0.257
යහළුවන් සමඟ එකතු වූ විට	17	4.370
ඇඟට ශක්තියක් එන නිසා	2	0.514
මහන්සියට	76	19.537
ආතතිය වැඩි නිසා	3	0.771
ලිංගික කාර්යයේදී	3	0.771
කික් එකක් ගන්න	1	0.257
එකතුව	389	100

මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.19 කම්කරුවන් සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍යවල සුලබතාවය

පුද්ගල මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම සඳහා ජීව විද්‍යාත්මක/ ඥානමය සාධක, පරිසරය සහ මත්ද්‍රව්‍ය යන අවදානම් සාධක බලපානු ලැබේ. මත්ද්‍රව්‍ය යන ප්‍රධාන අවදානම් සාධකය යටතෙහි එන පුද්ගල මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම සඳහා බලපාන එක් සාධකයක් ලෙස මත්ද්‍රව්‍යවල සුලබතාවය හඳුනාගත හැකි වේ.

කම්කරුවන් වර්තමානයේ සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ද අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ලදි. ඒ අනුව නියැදියට ඇතුළත් බහුතර කම්කරුවන් සංඛ්‍යාවක් එනම්, 163 (41%) දෙනෙක් තමා සේවය කරනු ලබන ප්‍රදේශය තුළ ඉතා පහසුවෙන් මත්ද්‍රව්‍ය ලබාගැනීමට හැකියාවක් පවතින බව ප්‍රකාශ කර තිබූ අතර 150 (38%) දෙනෙක් පහසුවෙන් මත්ද්‍රව්‍ය ලබාගතහැකි බව ප්‍රකාශ කර තිබිණ. මත්ද්‍රව්‍ය ලබාගැනීමට අපහසු බවට කම්කරුවන් 47 (12%) දෙනෙක් ද, මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව සාමාන්‍ය බවට කම්කරුවන් 40 (10%) දෙනෙක් ද තවදුරටත් ප්‍රකාශ කර තිබිණ.

ප්‍රස්තාර අංක 28 - සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍යවල ඉහළ සුලබතාවක් පවතින බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ.

2.20 මත්ද්‍රව්‍ය භාවිතය සමඟ කම්කරුවන් සිදුකරන ලද නීතිවිරෝධී ක්‍රියා සහ ඔවුන්ට ඒ සඳහා ලැබී ඇති දඬුවම්

පුද්ගල මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සමාජය තුළ විවිධ නීතිවිරෝධී ක්‍රියාවන් සිදුවීම ඕනෑම සමාජයක හඳුනාගත හැකිය. අධ්‍යයනයට අනුව නියැදිය තුළ වූ ඇතැම් කම්කරුවන් ද විවිධ නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ වී ඇති බව අනාවරණය විය. ඒ අනුව ඔවුන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානය තුළ දී සහ සේවා ස්ථානයෙන් පිටත දී විවිධ නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ වී ඇත.

අධ්‍යයන අනාවරණයන්ට අනුව නියැදිය තුළ වූ සමස්ත කම්කරුවන්ගෙන් 90 (23%) දෙනෙක් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ අතර 310 (77%) දෙනෙක් කිසිඳු නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී නොතිබිණ. මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ තම සේවා ස්ථානය තුළදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ කම්කරුවන් 54 (14%) දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් 22 (41%) දෙනෙක් සොරකම් කිරීමේ වරද සිදුකර ඇත. මූලික තොරතුරු සපයන්නන්ගෙන් අනාවරණය වූ කරුණු අනුව ද මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් විසින් ජංගම දුරකථන, මුදල් පසුම්බි, කම්බි කැලි, සුළු ආයුධ සොරකම් කරනු ලැබූ අවස්ථාවන් පවතී. දහ දෙනෙක් (19%) මත්ද්‍රව්‍ය අලෙවි කිරීම ද, 4 (7%) දෙනෙක් සේවා ස්ථානය තුළ වූ දේපලවලට හානි කිරීම ද, එක් කම්කරුවෙක් (2%) මත්ද්‍රව්‍ය අලෙවියට සහාය වීම ද සිදුකර තිබුණි. මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානය තුළ නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 24 (44%) දෙනෙක් අනෙක් සේවකයන්ට පහරදීම සිදුකර ඇත.

ප්‍රස්තාර අංක 29 - සේවා ස්ථානය තුළ සිදු කරන ලද නීතිවිරෝධී ක්‍රියා



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

සේවා ස්ථානය තුළ සිදුවී ඇති නීතිවිරෝධී ක්‍රියාවන් දෙස අවධානය යොමු කිරීමේ දී මත්ද්‍රව්‍ය භාවිතයත් සමග අනෙක් සේවකයන්ට පහරදීම, සොරකම් කිරීම සෙසු වැරදි සිදුකිරීමට සාපේක්ෂව වැඩි බව තහවුරු වේ. එමෙන්ම සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ යම් ප්‍රවණතාවක් ද පවතින බව පැහැදිලි වේ.

මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානයෙන් පිටත දී නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ කම්කරුවන් 61 (15%) දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 27 (44%) දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවිය සිදුකර තිබිණ. විසි දෙනෙක් (33%) සොරකම් කිරීම ද, 11 (18%) දෙනෙක් ලිංගික අතවර ද, 8 (13%) දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවියට සහාය වීම ද සිදුකර තිබිණ. ගණිකා වෘත්තියෙහි නියැළි කාන්තාවන් දෙදෙනෙක් ද (13%) වූ අතර මංකොල්ලකෑම සහ අන්අයට පහරදීමේ වරද සිදුකරන ලද 4 (7%) දෙනෙක් බැගින් ද විය.

කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ විවිධ වූ නීතිවිරෝධී ක්‍රියාවන් සේවා ස්ථානයෙන් පිටතදී පමණක් නොව සේවා ස්ථානය තුළ දී ද සිදුකරනු ලබන බව මේ අනුව තහවුරු වේ.

මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ කම්කරුවන් 90 (23%) දෙනාගෙන් 50 (56%) දෙනෙක් එම වැරදි ක්‍රියා සම්බන්ධයෙන් දඩුවම් ලබා තිබූ අතර 40 (44%) දෙනෙක් කිසිඳු දඬුවමක් ලබා නොතිබිණ.

නීතිවිරෝධී ක්‍රියා සිදුකිරීම සම්බන්ධයෙන් දඩුවම් ලබා තිබූ කම්කරුවන් 50 (56%) දෙනාට රටේ පිළිගත් නෛතික පටිපාටිය අනුව හෝ සේවා ස්ථානය තුළ පවතින නීති පද්ධතිය යටතේ හෝ සමාජය තුළින් හෝ යම් දඬුවමක් ලබා තිබිණ. ඒ අනුව ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 32 (64%) දෙනෙක් සිර දඬුවම් ලබා තිබූ අතර 15 (30%) දෙනෙක් සේවා ස්ථානයට දඩ මුදල් ගෙවා තිබුණි. 4 (8%) දෙනෙක් සේවය අත්හිටුවීම් වලට ද, 2 (4%) දෙනෙක් සේවා ස්ථානයෙන් පිටත දී මිනිසුන්ගේ පහරකෑම්වලට ද ලක්ව තිබිණ. ඊට අමතරව එක් අයෙකුට තමා සිදුකරන ලද වරද සඳහා වන්දි මුදලක් ගෙවීමට සිදුව තිබිණ.

2.21 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී තිබෙන ගැටලු

සමස්ත නියැදියෙන් 124 (31%) දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානය තුළ කිසියම් ගැටලුවකට මුහුණ දී තිබෙන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර කිසිඳු ගැටලුවකට මුහුණ දී නොමැති බවට 276 (69%) දෙනෙක් ප්‍රතිචාර දක්වා තිබිණි. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ මුහුණ දී ඇති ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීමේදී තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානය තුළ කිසියම් ගැටලුවකට මුහුණ දී තිබෙන බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් අතරින් බහුතරයක් එනම්, 67 (54%) දෙනෙක් සෙසු සේවකයින් සමඟ ගැටුම් ඇතිකරගෙන තිබෙන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වීම සහ සේවා කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකි වීම යන ගැටලුවලට මුහුණ දී ඇති බව 52 (42%) දෙනා බැගින් ප්‍රකාශ කර තිබිණ. සුළු අනතුරුවලට මුහුණ දී ඇති බවට 26 (21%) දෙනෙක් ද, නිලධාරීන් සමඟ මත ගැටුම් ඇති වී තිබෙන බවට 4 (3%) දෙනෙක් ද ප්‍රකාශ කර තිබිණ. ඊට අතිරේකව සේවා ස්ථානයේ සෙසු සේවකයන් අතර තමා කොන් වී ඇති බවට එක් කම්කරුවෙක් ප්‍රකාශ කර තිබිණ.

ප්‍රස්තාර අංක 30 - මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානය තුළ මුහුණ දී ඇති ගැටලු



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඔවුන් විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වේ.

2.22 සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් පනවා ඇති රීති හා මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි වැළැක්වීමට ගෙන ඇති වෙනත් ක්‍රියා මාර්ග

ඕනෑම සේවා ස්ථානයක එහි සංවිධානය හා ව්‍යුහය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ත්, එහි මනා ක්‍රියාකාරිත්වය සඳහා ත් විවිධ විෂයයන්ට අදාළව රීති පනවා තිබිය හැකිය. ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය, අලෙවිය සහ ළඟ තබාගැනීම යනාදී මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි දෛනික රීති මඟින් තහනම් කර තිබේ ද? යන්න අධ්‍යයනයෙහි දී විමසා බලන ලදි. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සේවා ස්ථානයේ දෛනික රීති මඟින් තහනම් කර තිබෙන බවට නියැදියට ඇතුළත් සමස්ත කම්කරුවන් ප්‍රතිචාර දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් මූලික තොරතුරු සපයන්නන් විසින් ලබා දී තිබූ තොරතුරු අනුව ද ඒ බව තවදුරටත් තහවුරු විය.

"සේවා ස්ථානය තුළට මත්ද්‍රව්‍ය රැගෙන ඒම, ළඟ තබාගැනීම, අලෙවි කිරීම හෝ භාවිත කිරීම සිදුකළ නොහැකි වේ. යම් හෙයකින් මත්ද්‍රව්‍ය ළඟ තිබී හමුවුවහොත් සති දෙකකට වැඩ තහනම් කරන අතර භාවිත කර හසුවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ."

"සේවා ස්ථාන තුළ රීති හරිම තදයි. ඒගොල්ලන්ගේ බෑග් පවා පරීක්ෂා කරනවා. ඒ නිසා ඇතුළේ මත්ද්‍රව්‍ය අලෙවියක් වෙන්න ඉඩක් නෑ".

"මත්ද්‍රව්‍ය භාවිතය, ළඟ තබාගැනීම තහනම් අතර ඒවාට වෙන වෙනම දඩ මුදල් නියම කර තිබේ. කම්කරුවන් බඳවා ගන්නා ගිවිසුම යටතේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සිදු කළ නොහැකි බවට කරුණු ඇතුළත් කරලා තියෙන්නේ."

කම්කරුවන් විසින් සිදු කළ හැකි මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි අවම කිරීම සහ වැළැක්වීම සඳහා පනවා ඇති රීතිවලට අමතරව වෙනත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ද සිදු කරන බව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකිවිය. මත්ද්‍රව්‍ය භාවිත කර සේවයෙහි නිරතවීමෙහි ඇති බරපතලකම සම්බන්ධයෙන් දෛනිකව පවත්වනු ලබන රැස්වීම්වල දී කම්කරුවන් දැනුවත් කිරීමත් මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙහි ප්‍රතිවිපාක දැක්වෙන පෝස්ටර්, උපදෙස් දැක්වෙන පත්‍රිකා සේවා ස්ථානය තුළ ප්‍රදර්ශනය කිරීමත් සිදු කරන බවට මූලික තොරතුරු සපයන්නන්ගෙන් තොරතුරු අනාවරණය විය.

"සෑම උදෑසනකම 7.30 ට රැස්වීමක් කැඳවීම. එහි දී ආරක්ෂාව පිළිබඳව මෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන් ඇති වන තත්ත්වය හා අවධානම වටහා දීම සිදු කරනු ලබයි."

"සේවා ස්ථානය තුළ තැනින් තැන මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රතිවිපාක දැක්වෙන පෝස්ටර් ගහලා තියෙනවා."

"මත්ද්‍රව්‍ය භාවිත කිරීම තහනම් කර ඇති අතර ආයතනය තුළට පිවිසෙන ස්ථානයේ උපදෙස් ප්‍රදර්ශනය කිරීමක් ද සිදු කර ඇත."

2.23 කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන්ගේ දැනුවත්භාවය හා ඒ සමඟ ගෙන ඇති පියවර

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් අතරින් 201 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත් වී තිබූ අතර සෙසු කම්කරුවන්ගේ එනම්, 199 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත් වී නොතිබිණ.

කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වීමත් සමඟ ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර කෙබඳු ද? යන්නත් අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ලදි. ඒ අනුව කම්කරුවන් 201 (50%) දෙනා අතරින් 167 (83%) දෙනෙකුට අවවාද කර තිබූ අතර 82 (41%) දෙනෙකුට බැනවැදී තිබුණි. ඇතැම් කම්කරුවන්ගේ සේවය අත්හිටුවීමට පවා නිලධාරීන් කටයුතු කර තිබූ අතර එම කම්කරු සංඛ්‍යාව 14 (7%) දෙනෙකි. 14 (7%) දෙනෙකුට උපදෙස් ලබාදීමත්, 7 (3%) දෙනෙකුට දඩමුදල් නියම කිරීමත් සිදුකර තිබූ අතර කම්කරුවන් 5 (2%) දෙනෙකු සේවයෙන් ඉවත්කර තිබිණ. අධ්‍යයනයේ දී අනාවරණය වූ ආකාරයට තම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවයෙන් ඉවත්වීමට සිදුවූ සේවකයින්ගේ පෙරැත්ත කිරීම මත නැවත ඔවුන්ව සේවයෙහි පිහිටුවීමට අදාළ නිලධාරීන් කටයුතු කර ඇත. කම්කරුවන්ගේ 4 (2%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොතිබිණ.

මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සිදු කළහොත් උපදෙස් දීම, අවවාද කිරීම, බැනවැදීම, දඩමුදල් නියම කිරීම හෝ සේවයෙන් ඉවත් කිරීම යන දඬුවම් ලබා දීමට කටයුතු කරන බවත්, ඇතැම් අවස්ථාවන්හි දී පොලීසියට දැනුම් දීමට කටයුතු කරන බවත් මූලික තොරතුරු සපයන්නන් විසින් ලබාදෙන ලද කරුණු අනුව ද පැහැදිලි විය.

"හෙරොයින්, ගංජා භාවිත කර අහුවුනොත් අනිවාර්යයෙන් සේවයෙන් ඉවත් කරනවා. අරක්කු බීලා අහුවුනොත් මුලින් හදාගන්න උපදෙස් දෙනවා. එසේත් නැත්නම් අවවාද කරනවා. එහෙම කරලත් නතර කළේ නැත්නම් සේවයෙන් ඉවත් කරනවා."

"යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ප්‍රථම වතාවට අසුවුවහොත් රැස්වීම ඉස්සරහට ගෙනත් අවවාද කරනවා. පිරිස ඉස්සරහා බනිනවා, ඔවුන්ව අපහසුතාවට පත්වෙන්න. ලැජ්ජාව නිසාවෙන් නැවත නොකිරීමටයි එහෙම කරන්නේ. ඉන්පසුව මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් දඩමුදල් නියම කරනවා. ඉන් අනතුරුවත් මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් සේවයෙන් ඉවත් කරනවා"

2.24 සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග

නියැදියට ඇතුළත් කම්කරුවන්ගේ පදිංචි ස්ථානය සළකා බැලීමේ දී සමස්ත කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 179 (45%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචිව සිටින බව අනාවරණය විය. ඔවුන්ගෙන් 178 (99%) දෙනෙක් වැනි බහුතරයක් දැනට සිගරට්/ දුම්වැටි භාවිත කරන්නන් වූ අතර 158 (88%) දෙනෙක් කේරළ ගංජා භාවිත කරන්නන් විය. 145 (81%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද, 47 (26%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 23 (13%) දෙනෙක් දේශීය ගංජා ද, 11 (61%) දෙනෙක් නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) ද භාවිත කරන්නන් විය. ඊට අමතරව 42 (23%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කරන්නන් විය.

ප්‍රස්තාර අංක 31 - සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සළකා බැලීමේදී, කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් අතර පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වේ.

2.25 කම්කරුවන් දිනපතා භාවිත කරන මත්ද්‍රව්‍ය සහ පදිංචි වාසස්ථානය

2.25.1 දිනපතා කේරළ ගංජා භාවිතය සහ පදිංචි වාසස්ථානය

නියැදියට ඇතුළත් කේරළ ගංජා භාවිත කරන 314 (79%) දෙනාගේ කේරළ ගංජා භාවිත කිරීමේ වාර ගණන සම්බන්ධයෙන් සළකා බැලීමේදී ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 171 (54%) දෙනෙකු දිනපතා කේරළ ගංජා භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

දිනපතා කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් 171 (54%) දෙනාගේ පදිංචි ස්ථාන සළකා බැලීමේදී බහුතරයක් එනම්, 86 (50%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචිවූවන් විය. තිස්නව දෙනෙක් (23%) කුලී නිවාසවල ද, 25 (15%) දෙනෙක් තම නිවසෙහි ද, 17 (10%) දෙනෙක්

මිතුරකුගේ නිවසෙහි ද පදිංචිව සිටින බවට තොරතුරු අනාවරණය විය. ඊට අමතරව 4 (2%) දෙනෙක් නෑදෑ නිවෙස්වල පදිංචිවූවන් විය.

ප්‍රස්තාර අංක 32 - දිනපතා කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් පදිංචි ස්ථානය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

ඒ අනුව සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් අතර දිනපතා කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු වේ.

2.25.2 දිනපතා දේශීය ගංජා භාවිතය සහ පදිංචි වාසස්ථානය

නියැදියට ඇතුළත් වූ දේශීය ගංජා දැනට භාවිත කරන කම්කරුවන් 120 (30%) දෙනාගේ දේශීය ගංජා භාවිත කිරීමේ වාර ගණන සම්බන්ධයෙන් සළකා බැලීමේදී, 38 (32%) දෙනෙක් දිනපතා දේශීය ගංජා භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

දිනපතා දේශීය ගංජා භාවිත කරන කම්කරුවන් 38 (32%) දෙනාගේ පදිංචි ස්ථාන සළකා බැලීමේදී ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 15 (39%) දෙනෙක් කුලී නිවෙස්වල පදිංචි වූවන් විය. දහ දෙනෙක් (26%) සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථාන වලද, 6 (16%) දෙනෙක් මිතුරකුගේ නිවසෙහි ද, 3 (9%) දෙනෙක් තම නිවසෙහි ද වාසය කරන්නන් වූ අතර 4 (11%) දෙනෙක් නෑදෑ නිවෙස්වල පදිංචිවූවන් විය.

ප්‍රස්තාර අංක 33 - දිනපතා දේශීය ගංජා භාවිත කරන කම්කරුවන් පදිංචි ස්ථානය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

දේශීය ගංජා දිනපතා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් කුලී නිවෙස්වල පදිංචි කම්කරුවන් අතර පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු වේ.

2.25.3 දිනපතා හෙරොයින් භාවිතය සහ පදිංචි වාසස්ථානය

නියැදියට ඇතුළත් කම්කරුවන්ගෙන් 36 (9%) දෙනෙක් හෙරොයින් භාවිත කරන්නන් වූ අතර ඔවුන්ගෙන් 10 (28%) දෙනෙක් දිනපතා හෙරොයින් භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

දිනපතා හෙරොයින් භාවිත කරන කම්කරුවන් 10 (28%) දෙනාගේ පදිංචි ස්ථාන සළකා බැලීමේදී අනාවරණය වූයේ එයින් බහුතරයක් එනම්, 5 (50%) දෙනෙක් තම නිවසෙහි පදිංචිව සිටින බවයි. තුන් දෙනෙක් (30%) සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචිව සිටින අතර කුලී නිවෙස්වල එක් කම්කරුවෙක් ද (10%), නෑදෑ නිවෙස්වල එක් කම්කරුවෙක් ද පදිංචිව සිටියි.

ප්‍රස්තාර අංක 34 - දිනපතා හෙරොයින් භාවිත කරන කම්කරුවන් පදිංචි ස්ථානය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

දිනපතා හෙරොයින් භාවිත කිරීමේ ඉහළ ප්‍රවලිත බවක් තම නිවසෙහි ජදිංචි කම්කරුවන් අතර පවතින බව මේ අනුව පැහැදිලි වේ.

2.26 කම්කරුවන් විසින් සිදුකරන ලද නීතිවිරෝධී ක්‍රියා සහ ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය

අධ්‍යයන දත්තවලට අනුව මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ කම්කරු සංඛ්‍යාව 90 (23%) දෙනෙක් විය. ඔවුන්ගෙන් 54 (14%) දෙනෙක් සේවා ස්ථානය තුළදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකර තිබූ අතර 61 (15%) දෙනෙක් සේවා ස්ථානයෙන් පිටතදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබිණි.

සේවා ස්ථානය තුළ දී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකර තිබූ කම්කරුවන් 54 (14%) දෙනාගෙන් බහුතර කම්කරු සංඛ්‍යාවක් එනම්, 24 (44%) දෙනෙක් සේවා ස්ථානයේ සෙසු සේවකයින්ට පහරදීමේ වරද සිදුකර තිබූ අතර 22 (41%) දෙනෙක් සොරකම් කිරීමේ වරද සිදුකර තිබිණි. දහ දෙනෙක් (19%) මත්ද්‍රව්‍ය අලෙවිය ද, 4 (7%) දෙනෙක් දේපලවලට අලාභහානි කිරීම ද, එක් (2%) පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය අලෙවියට සහායවීමේ වරද ද සිදුකර තිබිණි.

කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානයේ සෙසු සේවකයින්ට පහරදීම, හොරකම් කිරීම, මත්ද්‍රව්‍ය අලෙවිය වැනි නීතිවිරෝධී ක්‍රියාවන් සිදු කිරීමේ තත්ත්වයක් පවතින බව මේ අනුව තහවුරු වේ.

තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානයේ සෙසු සේවකයින්ට පහරදීමේ වරද සිදුකරන ලද කම්කරුවන් 24 (44%) දෙනාගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව සළකා බැලීමේදී ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 23 (96%) දෙනෙක් සිගරැට්/ දුම්කුඩු කවදා හෝ භාවිත කර තිබුණි. 21 (88%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද, 20 (83%) දෙනෙක් කේරළ ගංජා ද, 16 (67%) දෙනෙක් විවිධ පෙති වර්ග ද භාවිත කර තිබුණි. ඊට අමතරව 12 (50%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 13 (54%) දෙනෙක් දේශීය ගංජා ද, 14 (58%) දෙනෙක් හෙරොයින් ද, කවදා හෝ භාවිත කර තිබිණි. නීතිවිරෝධී මද්‍යසාර, සිරජ් වර්ග, කොකේන් කවදා හෝ භාවිත කළ පුද්ගලයින් සිටි අතර එම පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 9 (38%), 4 (17%) සහ 1 (4%) විය. මදනමෝදක, හෂිස්, මෙතම්පිටමින් සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කෙදිනක හෝ භාවිත කළ කම්කරුවන් 6 (25%) දෙනෙක් ද ඒ අතර සිටි බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වන්නේ, සේවා ස්ථානය තුළ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ කම්කරුවන් අතර සිගරැට්/ දුම්වැටි වැනි ප්‍රාථමික මත්ද්‍රව්‍ය සහ කේරළ ගංජා නීත්‍යානුකූල මද්‍යසාර, හෙරොයින්, දේශීය ගංජා වැනි අන්තරායකර ඖෂධ කවදා හෝ භාවිත කර තිබීමේ ඉහළ ප්‍රවලිත බවක් පවතින බවයි.

නියැදියට ඇතුළත් කම්කරුවන් 54 (14%) දෙනෙක් සේවා ස්ථානය තුළදී කිසියම් වරදක් සිදුකර තිබූ අතර ඔවුන්ගෙන් 22 (41%) දෙනෙක් සොරකම් කිරීමේ වරද සිදුකර තිබිණි.

ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී අනාවරණය වූයේ, සොරකම් කිරීමේ වරද සිදුකරන ලද කම්කරුවන් සියලු දෙනාම කවදා හෝ කේරළ ගංජා භාවිත කර තිබූ බවයි. විසි එක් දෙනෙක් (95%) සිගරැට්/ දුම්වැටි ද, 18 (82%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 17 (77%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද කවදා හෝ භාවිත කර තිබුණි. දේශීය ගංජා සහ විවිධ පෙති වර්ග කවදා හෝ භාවිත කළ කම්කරු පිරිස 14 (64%) දෙනා බැගින් වූ අතර 10 (45%) දෙනෙක් හෙරොයින් කවදා හෝ භාවිත කර තිබුණි. ඒ අතර නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) සහ සිරජ් වර්ග කවදා හෝ භාවිත කළ කම්කරුවන් 7 (32%) දෙනා බැගින් ද විය. කොකේන් හා එල්. එස්. ඩී කවදා හෝ භාවිත කළ කම්කරුවන් පිළිවෙළින් 3 (14%) සහ 1 (5%) ක් විය. ඊට අමතරව 6 (27%) දෙනෙක් මදනමෝදක, හෂිස්, මෙතම්පිටමින් සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කවදා හෝ භාවිත කර තිබූ බවට තොරතුරු අනාවරණය විය.

සේවා ස්ථානය තුළ හොරකම් කිරීමේ වරද සිදුකරන ලද කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ඉහත විශ්ලේෂිත කරුණු අනුව සේවා ස්ථානය තුළ සොරකම් කිරීමේ වරද සිදුකරන ලද කම්කරුවන් කවදා හෝ කේරළ ගංජා භාවිත කර තිබෙන බව තහවුරු වේ.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය අලෙවිය සිදුකරන ලද කම්කරුවන් 10 (19%) දෙනාගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සළකා බැලීමේදී කම්කරුවන් 10 බැගින් සිගරට්/දුම්වැටි, නීත්‍යනුකූල මද්‍යසාර සහ කේරළ ගංජා කවදා හෝ භාවිත කර තිබූ බවට තොරතුරු අනාවරණය විය. හය දෙනෙක් (60%) පෙති වර්ග ද, 5 (50%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 4 (40%) දෙනෙක් නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) ද , 3 (30%) දෙනෙක් දේශීය ගංජා ද කවදා හෝ භාවිත කර තිබිණි. හෙරොයින් සහ සිරප් වර්ග කවදා හෝ භාවිත කර තිබූ කම්කරුවන් සංඛ්‍යාව 2 (20%) බැගින් විය. එක් කම්කරුවෙක් පමණක් කොකේන් කවදා හෝ භාවිත කර තිබූ අතර 3 (30%) දෙනෙක් මදනමෝදක, හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කවදා හෝ භාවිත කර තිබිණි.

ඉහත විශේෂිත තොරතුරු අනුව සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය අලෙවිය සිදුකරන ලද කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් හඳුනාගත හැකි විශේෂ කරුණ වූයේ ඔවුන් සිගරට්/දුම්වැටි, නීත්‍යනුකූල මද්‍යසාර, සහ කේරළ ගංජා කවදා හෝ භාවිත කර තිබීමේ ඉහළ ප්‍රචලිත බවක් පවතින බවයි.

2.27 කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා අධිමාත්‍රාවීම

සිහි මුර්ජාව හෝ සිහිවිකල් බව ඇතිකරන තරමට පමණට වඩා මත්ද්‍රව්‍ය ගැනීම හෝ විවිධ මත්ද්‍රව්‍ය එකට මිශ්‍ර කරගැනීම අධිමාත්‍රාවීම යන්නෙහි අදහස වේ. පොදුවේ මෙවන් අවස්ථාවන්හි දී හුස්ම ගැනීමේ අපහසුතාවය, දෙතොල් නිල්පැහැවීම, ඇසේ කළු ඉංගිරියාව/ දෑස සංකෝචනය වීම වැනි ලක්ෂණ මතුවේ. මෙවන් තත්ත්වයන්ට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුහුණදිය හැකි අතර මෙම අධ්‍යයනයෙහිදී ද නියැදියට ඇතුළත් වූ කම්කරුවන් කෙදිනක හෝ අධිමාත්‍රාවී තිබේ ද? යන්න විමසා බලන ලදි. ඒ අනුව සමස්ත නියැදියෙන් කම්කරුවන් 14 (4%) දෙනෙක් අධිමාත්‍රා වී තිබූ අතර ඔවුන්ගෙන් 8 (57%) දෙනෙක් අධිමාත්‍රාවීමත් සමඟ ප්‍රතිකාර සඳහා යොමු වී තිබුණ ද, 6 (43%) දෙනෙක් ප්‍රතිකාර සඳහා යොමු වී නොතිබිණ.

2.28 කම්කරුවන් සිය මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම සඳහා ප්‍රතිකාර ලබාගැනීම

සමස්ත නියැදියෙන් 105 (26%) දෙනෙක් සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට උත්සාහ ගෙන තිබිණ. 295 (73%) දෙනෙක් සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට කෙදිනක හෝ උත්සාහ කර නොතිබිණ.

සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට උත්සාහ කළ කම්කරුවන් ස්වයං උත්සාහයෙන් හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමෙන් හෝ පුනරුත්ථාපනය වීමෙන් එයින් මිදීමට උත්සාහ කර තිබිණ. ඒ අනුව බහුතරයක් එනම්, 66 (63%) දෙනෙක් ස්වයං උත්සාහයෙන් මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට උත්සාහ කර තිබිණ. තිස් අට දෙනෙක් (36%) පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා තිබූ අතර 7 (7%) දෙනෙක් රජයේ රෝහල්වලින් ප්‍රතිකාර ලබා තිබිණ. කම්කරුවන් 5 (5%) දෙනා බැගින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා තිබිණ. ඊට අමතරව 3 (3%) දෙනෙක් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් නේවාසික ප්‍රතිකාර ලබා තිබූ අතර 2 (2%) දෙනෙක් රාජ්‍ය නොවන වෛද්‍ය මධ්‍යස්ථානවලින් නේවාසික ප්‍රතිකාර ලබාගෙන තිබිණ.

ප්‍රස්තාර අංක 35 - කම්කරුවන් සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට උත්සාහ කර ඇති ආකාරය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

2.29 මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති සෞඛ්‍ය ගැටලු

දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිත කිරීම නිසා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට විවිධ ශාරීරික ව්‍යාධි හෝ මානසික ව්‍යාධි ඇති විය හැකිය. මෙම අධ්‍යයනයේදී ද නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ඔවුන් මුහුණ දී තිබෙන සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් විමසීමක් කරන ලදි. ඒ අනුව සමස්ත නියැදියෙන් කම්කරුවන් 24 (6%) දෙනෙක් කිසියම් රෝගී තත්ත්වයකින් පෙළෙන්නේ යැයි සඳහන් කර තිබිණ. ඔවුන් අතරින් 13 (54%) දෙනෙක් සෙම රෝගයෙන් පෙළෙන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර ඇදුම, ක්ෂය රෝගය, ලිංගික බෙලහීනතාවය යන ගැටලුවලට මුහුණ දී ඇති බවට කම්කරුවන් 2 (8%) දෙනා බැගින් ප්‍රතිචාර දක්වා තිබිණ. කම්කරුවන් එක් අයෙකු බැගින් පෙනහළු ආශ්‍රිත ගැටලු, හිසේ කැක්කුම, පපුවෙ කැක්කුම, මුඛයේ තුවාල ඇතිවීම සහ හුස්මගැනීමේ අපහසුතා ඇතිවීම යන සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දී තිබෙන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. නියැදියෙහි වූ කම්කරුවන් අතරින් 376 (94%) දෙනෙක් තමන්ට කිසිඳු රෝගාබාධයක් වැළඳී නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ.

ප්‍රස්තාර අංක 36 - මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති සෞඛ්‍ය ගැටලු



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

3 නිගමන

- ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බවත්, ඔවුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බවත් නිගමනය කළ හැකි වේ.

- කම්කරුවන් විසින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන කේරළ ගංජා, දේශීය ගංජා, සහ හෙරොයින් බහුලව භාවිත කරනු ලබන අතර කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළම ප්‍රවණතාවක් පවතී. එමෙන්ම නීත්‍යානුකූල මද්‍යසාර, වෛද්‍යමය අරමුණු සඳහා ගැනෙන ඖෂධ (පෙති වර්ග), දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් බහුලව භාවිතයෙහි ප්‍රවණතාවක් පවතී. ප්‍රාථමික මත්ද්‍රව්‍යක් ලෙස ගැනෙන සිගරැට් භාවිතයෙහි ද ඉහළ ප්‍රවණතාවක් පවතී. මීට අමතරව එල්. එස්. ඩී (LSD) සහ සිරප් වර්ග භාවිතයෙහි ඉතා සුළු ප්‍රවණතාවක් පවතී.

- දැනට කේරළ ගංජා භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් තම අවශ්‍යතාව සඳහා සේවා ස්ථානය තුළ වූ මිතුරන්ගෙන් කේරළ ගංජා සපයා ගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බව පෙනී යන්නේය.

- දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) ලබාගනී.

- පුහුණු ශ්‍රමිකයන්, නුපුහුණු ශ්‍රමිකයන් සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතාවක් පවතින බව හඳුනාගත හැකිය. පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබන කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළම ප්‍රවණතාවක් පවතින අතර පෙදරේරුවරුන්, යකඩ පැස්සුම්කරුවන්, කම්බි බඳින්නන්, වඩුවැඩ සිදුකරන්නන්, විදුලි කාර්මිකයින්, ගල් අතුරන්නන්, තීන්ත ආලේප කරන්නන් සහ ග්‍රයින්ඩර්කරුවන් ඒ අතර වන බව නිගමනය කළ හැකි වේ.

- සේවය සඳහා පැමිණි කෙදිනක හෝ කිසිඳු මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති පුද්ගලයින් හට මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීම සඳහා සේවායෝජක එමෙන්ම ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් බලපෑමක් වී ඇති බව නිගමනය කළ හැකි වේ. කම්කරුවන් 11 (3%) දෙනෙකුට එම සේවා ස්ථානයෙහි සේවයෙහි නියුතු මිතුරෙකු විසින් ප්‍රථම වරට මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇති බවටත්, කම්කරුවන් 3 (1%) දෙනෙකුට සේවායෝජක සහ රියදුරු සහායක මඟින් ප්‍රථම වරට මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇති බවටත් අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

- කම්කරුවන් සේවය කරනු ලබන ප්‍රදේශය තුළ ඉතා පහසුවෙන් මත්ද්‍රව්‍ය ලබාගැනීමට හැකියාවක් පවතී.

- කම්කරුවන් 201 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත් වී තිබූ බවට නිගමනය කළ හැකි වේ.

- කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වීමත් සමඟ නිලධාරීන් විසින් කම්කරුවන් සම්බන්ධයෙන් අවවාද කිරීම, බැනවැදීම, උපදෙස් දීම, දඩ මුදල් නියම කිරීම, සේවය අත්හිටුවීම, සේවයෙන් ඉවත් කිරීම යනාදී පියවර ගෙන ඇත. කම්කරුවන් 4 (2%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොතිබිණ.

- කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ විවිධ වූ නීතිවිරෝධී ක්‍රියාවන් සේවා ස්ථානයෙන් පිටතදී පමණක් නොව සේවා ස්ථානය තුළ දී ද සිදුකර ඇත. අනෙක් සේවකයන්ට පහරදීම, සොරකම් කිරීම, මත්ද්‍රව්‍ය අලෙවි කිරීම, දේපලවලට හානි කිරීම සහ මත්ද්‍රව්‍ය අලෙවියට සහායවීම යන වැරදි සේවා ස්ථානය තුළ සිදුකිරීම හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ අනෙක් සේවකයන්ට පහරදීම සහ සොරකම් කිරීම සෙසු වැරදි සිදුකිරීමට සාපේක්ෂව වැඩි බව නිගමනය කළ හැකිය.

- මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බව නිගමනය කළ හැකිය. සෙසු සේවකයින් සමඟ ගැටුම් ඇති කරගැනීම, අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වීම, සේවා කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකි වීම, සුළු අනතුරුවලට මුහුණ දීම, නිලධාරීන් සමඟ මත ගැටුම් ඇති කරගැනීම සහ සේවා ස්ථානයේ සෙසු සේවකයන් අතර තමා කොන් වීම යන ගැටලුවලට කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී ඇත.

4. යෝජනා

- ✓ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් ඉලක්ක කරගත් නිවාරණ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. එහිදී මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා සථානයන්හි දී සිදුවිය හැකි අනතුරු පිළිබඳව සහ මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු පිළිබඳව ද ඔවුන් දැනුවත් කළ යුතුය.

- ✓ මත්ද්‍රව්‍ය භාවිත කරන්නා වූ කම්කරුවන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් දියත් කිරීම හා දිනපතා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී සිටින කම්කරුවන් එම ඇබ්බැහිකාරීත්වයෙන් මුදවා ගැනීම සඳහා ප්‍රතිකාරවලට යොමු කිරීමට කටයුතු කිරීම.

- ✓ සේවා ස්ථාන තුළ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය අලෙවි කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීම වැළැක්වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්හි සහයෝගය අවශ්‍ය අවස්ථාවන්හි දී ලබාගැනීමට අදාළව සහ වැඩබිම් තුළ මත්ද්‍රව්‍යය භාවිතය හා අලෙවිය නතර කිරීමට බලාත්මක කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

5. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Alberta Addiction and Mental Health Research Partnership Programme. (2010). Workplace Addiction and Mental Health in the construction industry.

https://www.albertahealthservices.ca/assets/info/res/mhr/if-res-mhr-construction-industry-lit-review.pdf

Banwell C., Dance P., Quinn.C., Davies. R & Hall D., (2009). Alcohol, other drug use, and gambling among Australian Capital Territory (ACT) workers in building and related industries.

https://www.tandfonline.com/doi/abs/10.1080/09687630600577550

Gavioli A., Mathias T A., Rossi R M & Oliveira M L., (2014). Risk related to drug use among male construction workers.

https://www.civilatwork.blogspot.com/2015/05/types-of-labour-employed-in.html